අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

# 2024 වර්ෂයේ ප්‍රගතිය හා 2025 වර්ෂයේ ඉදිරි ගමන් මග

# 2024 வருடத்திற்கான முன்னேற்றம் மற்றும் 2025 வருடத்திற்கான எதிர்கால பயணப் பாதை

# The Progress of 2024 and the Way Forward 2025

වෙළුම I - සාමාන්‍ය අධ්‍යාපනය
இதழ் I - பொதுக் கல்வி
Volume I - General Education

### වෙළුම් පෙළගැස්ම

| | | |
|---|---|---|
| වෙළුම I | - | සාමාන්‍ය අධ්‍යාපනය |
| වෙළුම II | - | උසස් අධ්‍යාපන |
| වෙළුම III | - | වෘත්තීය අධ්‍යාපන |

### இதழ்களின் ஒழுங்கமைப்பு

| | | |
|---|---|---|
| **இதழ் I** | **-** | **பொதுக் கல்வி** |
| **இதழ் II** | **-** | **உயர் கல்வி** |
| **இதழ் III** | **-** | **தொழில் கல்வி** |

## Series of volumes

| | | |
|---|---|---|
| **Volume I** | **-** | **General Education** |
| **Volume II** | **-** | **Higher Education** |
| **Volume III** | **-** | **Vocational Education** |

# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# 2024 වර්ෂයේ ප්‍රගතිය

## හා

# 2025 වර්ෂයේ ඉදිරි ගමන් මග

## වෙළුම I

## සාමාන්‍ය අධ්‍යාපනය

# දැක්ම

ශ්‍රී ලාංකේය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මඟින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

# මෙහෙවර

පාර්ශ්වකරුවන් තෘප්තිමත්භාවයට පත් වන්නා වූ, කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවය තහවුරු කරන ලද්දා වූ, නවීකෘත අධ්‍යාපන ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන්නා වූ දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම.

# පටුන

| | | |
|---|---|---|
| **01.** | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | |
| | විෂය පථය | **01** |
| | කාර්යයන් හා කර්තව්‍යයන් | **01** |
| | පාසල් පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් **(2023)** | **04** |
| **02.** | අධ්‍යාපනයේ ඉදිරි ගමන් මඟ | **08** |
| **03.** | **2024** වර්ෂයේ ප්‍රගතිය | **18** |
| | විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු - | **59** |
| | ( මහා පරිමාණ/විදේශ අරමුදල් ව්‍යාපෘති සාරාංශය **(2024** දෙසැම්බර් **31** දිනට) | |
| **04.** | මූල්‍ය ප්‍රගතිය | **60** |
| **05.** | ශිෂ්‍ය සාධනය | **62** |
| **06.** | සාමාන්‍ය අධ්‍යාපන අංශයට අනුබද්ධ ආයතන | **66** |
| | ජාතික අධ්‍යාපන ආයතනය | **66** |
| | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | **70** |
| | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | **79** |
| | යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව | **85** |
| | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | **89** |
| | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | **90** |

# 01. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
# අමාත්‍යාංශයේ කාර්යභාරය

<u>විෂය පථය</u>

ජාතික ප්‍රතිපත්ති මත පිහිටා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අංශ සම්බන්ධ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, කාර්යක්ෂම හා මහජන හිතකාමී අයුරින් රාජ්‍ය සේවා සැපයීම සහතික කිරීම සහ නාස්තිය සහ දූෂණය පිටුදැකීම සඳහා පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම, මුල් ළමාවියේ සිට උසස් අධ්‍යාපනය දක්වා ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඇතුළු සියලු ම දරුවන්ට බාධාවකින් තොර අධ්‍යාපනයට ප්‍රවේශ වීම සහතික කිරීම, වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය ප්‍රවර්ධනය, තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දූරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා සහාය වීම, ජාතික පාසල් අධීක්ෂණය, පුද්ගලික සහ ජාත්‍යන්තර පාසල් නියාමනය, රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය හා අධ්‍යාපන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, රැකියා වෙළෙඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා වෘත්තීය අධ්‍යාපනය නවීකරණය, බෞද්ධ හා පාලි අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම ආදිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ.

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්ති මත පිහිටා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශ විෂයය පථයට අයත් වන මහජන සේවා කාර්යක්ෂම ව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතියික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවක් ඇති වන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ශ්‍රී ලාංකික ළමා හා යෞවන පරපුරට ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම
- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම
- පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම

- සෑම දරුවෙකුට ම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහතික කිරීම
- ජාතික ආර්ථිකයට සාධනීය දායකත්වයක් සහ ක්‍රියාශීලී ව සාමාජීය වගකීම් ඉටු කළ හැකි පුරවැසියන් බවට පත්කිරීමෙහිලා දරුවන් සූදානම් කරවීමට පාසල් තුළ විෂයය බාහිර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම
- ජාතික පාසැල් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල ව ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසැල් නියාමනය කිරීම
- අධ්‍යාපනයේ ගුණාත්මක භාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම
- විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම
- ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ අනෙකුත් අධ්‍යාපන සේවාවන්වල පිරිස් කළමනාකරණ කටයුතු
- පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය
- පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- සියලු පාසැල්වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පංති කාමර, ගුරුවරුන්ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියලු භෞතික පහසුකම් දියුණු කිරීම
- ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණික පහසුකම් යොදා ගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය
- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම
- දේශීය හා විදේශීය රැකියා වෙළඳ පොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම
- පාසල් අධ්‍යාපනය හැර යාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම
- යෝග්‍ය වෘත්තීය පුහුණු ආයතන තාක්ෂණවේදී උපාධි පිරිනමන ආයතන බවට පත් කිරීම
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූප ව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම

- වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම
- ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මගින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම

- 10 වසර සිට 13 වසර දක්වා වෘත්තීය අධ්‍යාපන ධාරාව හඳුන්වා දීම හරහා විවිධ කාර්මික ක්ෂේත්‍රවල සේවය කිරීමට සිසුන් සූදානම් කිරීම
- හෙද පාසැල්, ජාතික හෙද විශ්වවිද්‍යාලයක් වෙත ඒකාබද්ධ කිරීම
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- නව සොයා ගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිපාලනයට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය සහ සංවර්ධනය කිරීම
- විශ්වවිද්‍යාල වෙත ඇතුළත් කර ගැනීමේ දී පවතින ප්‍රමාදයන් තුරන් කිරීම
- තෘතීය අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම
- පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සැපයීම
- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර් ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධ වීම හා සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම
- උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්ණායක හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂය මාලා සංශෝධනය කිරීම
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම
- ශ්‍රී ලංකාවේ සුදුසුකම් සහිත සිසුන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ වීමට හැකි වන ලෙස ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය සහ ප්‍රතීතනය කිරීම
- බෞද්ධ හා පාලි අධ්‍යාපනය ඉහළ නැංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා

- ගෝලීය අවශ්‍යතාවට ගැළපෙන පරිදි සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය ම ආවරණය වන ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම
- ඵලදායි ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතනවල පැවරී ඇති අනෙකුත් සියලු ම විෂයයන්ට අදාළ කටයුතු
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් සියලු ම ආයතන අධීක්ෂණය කිරීම

## පාසල් පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් (2023)

- රජයේ මුළු පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| **10,096** | **237,787** | **3,882,688** |

- පාසල් වර්ගීකරණය හා පරිපාලනය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසල් වර්ගය | පාසල් සංඛ්‍යාව | | ශිෂ්‍ය සංඛ්‍යාව | | ගුරුවරු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | ජාතික පාසල් | පළාත් පාසල් | ජාතික පාසල් | පළාත් පාසල් | ජාතික පාසල් | පළාත් පාසල් |
| **1AB** | **362** | **626** | **801,784** | **742,449** | **41,437** | **39,020** |
| **1C** | **33** | **1,942** | **28,227** | **1,005,655** | **1,853** | **63,211** |
| **2** වර්ගය | **1** | **3,272** | **10** | **693,136** | **10** | **57,889** |
| **3** වර්ගය | | **3,860** | | **611,427** | | **34,367** |
| එකතුව | **396** | **9700** | **830,021** | **3,052,667** | **43,300** | **194,487** |

රජයේ පාසල්වල ශිෂ්‍ය ගුරු අනුපාත -2023

| වර්ගීකරණය | පාසල් ගණන | සිසුන් ගණන | ගුරු මණ්ඩලය | STR |
|---|---|---|---|---|
| ශිෂ්‍ය ජනගහනය අනුව පාසල් | | | | |
| 1-50 සිසුන් | 1,506 | 44,866 | 8,967 | 5.0 |
| 51-100 සිසුන් | 1,638 | 121,732 | 15,902 | 7.7 |
| 101-200 සිසුන් | 2,128 | 310,515 | 29,543 | 10.5 |
| 201-500 සිසුන් | 2,638 | 837,351 | 55,592 | 15.1 |
| 501-1,000 සිසුන් | 1,309 | 901,777 | 48,317 | 18.7 |
| 1,001-1,500 සිසුන් | 379 | 459,603 | 23,242 | 19.8 |
| 1,501-2,000 සිසුන් | 200 | 344,691 | 16,771 | 20.6 |
| 2,001-3,000 සිසුන් | 198 | 475,852 | 22,435 | 21.2 |
| 3,001-4,000 සිසුන් | 67 | 226,908 | 10,168 | 22.3 |
| සිසුන් 4,000 වැඩි | 33 | 159,393 | 6,850 | 23.3 |

- පළාත අනුව රජයේ පාසල් වර්ගීකරණය

| පළාත | ජාතික පාසල් | පළාත් පාසල් | මුළු රජයේ පාසල් |
|---|---|---|---|
| බස්නාහිර | 79 | 1,265 | 1,344 |
| මධ්‍යම | 56 | 1,452 | 1,508 |
| දකුණ | 70 | 1,031 | 1,101 |
| උතුර | 24 | 950 | 974 |
| නැගෙනහිර | 42 | 1,082 | 1,124 |
| වයඹ | 39 | 1,204 | 1,243 |
| උතුරු මැද | 17 | 791 | 808 |
| ඌව | 38 | 855 | 893 |
| සබරගමුව | 31 | 1,070 | 1,101 |
| මුළු එකතුව | **396** | **9,700** | **10,096** |

- පාසලේ පන්ති පරාසය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පන්ති පරාසය | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 1-5 | 3,860 | 34,367 | 611,427 |
| 1-9 | 64 | 625 | 6,759 |
| 1-11 | 3,185 | 56,975 | 683,752 |
| 1-13 | 1,997 | 93,626 | 1,667,000 |
| 6-11 | 24 | 299 | 2,635 |
| 6-13 | 966 | 51,895 | 911,115 |

- පාසලේ ශිෂ්‍ය සංඛ්‍යා පරාසය අනුව පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 1-50 | 1,506 | 8,967 | 44,866 |
| 51-100 | 1,638 | 15,902 | 121,732 |
| 101-200 | 2,128 | 29,543 | 310,515 |
| 201-500 | 2,638 | 55,592 | 837,351 |
| 501-1000 | 1,309 | 48,317 | 901,777 |
| 1001-1500 | 379 | 23,242 | 459,603 |
| 1501-2000 | 200 | 16,771 | 344,691 |
| 2001-3000 | 198 | 22,435 | 475,852 |
| 3001- 4000 | 67 | 10,168 | 226,908 |
| 4000ට වැඩි | 33 | 6,850 | 159,393 |

- ඉගෙනුම් මාධ්‍ය අනුව රජයේ පාසල් සංඛ්‍යාව

| ඉගෙනුම ලබන මාධ්‍ය | පාසල් සංඛ්‍යාව |
|---|---|
| සිංහල පමණක් | 6,247 |
| දෙමළ පමණක් | 3,011 |
| සිංහල හා දෙමළ | 39 |
| සිංහල හා ඉංග්‍රීසි | 581 |
| දෙමළ හා ඉංග්‍රීසි | 183 |
| සිංහල, දෙමළ හා ඉංග්‍රීසි | 35 |

- අ.පො.ස.(උසස් පෙළ) එක් එක් විෂය ධාරාව සහිත රජයේ පාසල් සංඛ්‍යාව

| විෂයධාරාව | පාසල් සංඛ්‍යාව |
|---|---|
| විද්‍යා විෂය ධාරාව සහිත මුළු පාසල් | 988 |
| ජීව විද්‍යා | 966 |
| භෞතික විද්‍යා | 931 |
| කලා | 2,944 |
| වාණිජ | 1,856 |
| තාක්ෂණ (ජෛව තාක්ෂණය/ ඉංජිනේරු තාක්ෂණය) | 528 |
| පොදු / වෘත්තීය විෂය ධාරා | 489 |

- පත්වීම් ස්වභාවය අනුව රජයේ පාසල්වල ගුරුවරු සංඛ්‍යාව

| පත්වීම් ස්වභාවය | පිරිමි | ගැහැණු | එකතුව |
|---|---|---|---|
| පුහුණුවලත් උපාධිධාරී | 25,906 | 75,355 | 101,261 |
| උපාධිධාරී | 9,278 | 28,517 | 37,795 |
| පුහුණුවලත් | 20,466 | 73,463 | 93,929 |
| නුපුහුණු | 850 | 3,608 | 4,458 |
| වෙනත් | 70 | 274 | 344 |
| එකතුව | 56,570 | 181,217 | 237,787 |

- පෞද්ගලික පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 95 | 8,170 | 137,869 |

- පිරිවෙන් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පිරිවෙන් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 822 | 7,118 | 69,108 |

| කලාප කාර්යාල සංඛ්‍යාව | කොට්ඨාස කාර්යාල සංඛ්‍යාව |
|---|---|
| 100 | 312 |

මූලාශ්‍රය : සංඛ්‍යාලේඛන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය පාදක දිනය 2023.12.31

# 02. අධ්‍යාපනයේ ඉදිරි ගමන් මඟ

අධ්‍යාපනය යනු පැවති හා පවතින සියලු සමාජ අවධි විසින් නිර්මාණය කරන ලද දැනුම අත්පත් කර ගනිමින් හා බෙදා හරිමින් නව දැනුම නිෂ්පාදනය කරන සංස්කෘතික ක්‍රියාවලියක් වන අතර ශිෂ්ට සම්පන්න හා වගකීම් සහගත පුරවැසි සමාජයක පැවැත්ම හා සංවර්ධනය තහවුරු කිරීම එම සමාජයේ ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියට පැවරී ඇත.

අවම වශයෙන් වසර 13ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ නොකර අතරමග පාසලින් ඇද හැලීම, පාසල් පද්ධතිය තුළ මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂමතාව මෙන් ම පළමු ශ්‍රේණියේ සිට ප්‍රථම උපාධිය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දෙන ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වුව ද දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපියන්ට දරන්නට සිදු වී ඇති ඉහළ වැය බර ජාතික අධ්‍යාපන ක්‍රියාවලියේ උද්ගත වී ඇති ගැටලු කිහිපයකි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය ගුණාත්මක පුරවැසියකු බිහිකිරීමට අසමත් බවට ද සමාජ විවේචන එල්ල වී ඇත. අධ්‍යාපනයේ පරමාර්ථය හුදෙක් රැකියා වෙළෙඳපොළ සඳහා පුද්ගලයන් නිර්මාණය කිරීම නොවුව ද අධ්‍යාපන ක්‍රියාවලියෙන් බිහිවන පුරවැසියා ජාතික ආර්ථිකයට දායකත්වය දෙමින් සමාජ වගකීම් වෙත සාධනීය ප්‍රතිචාර දැක්වීමට සමත් අයකු විය යුතු ය. කෙසේ වුව ද ආර්ථිකයේ ප්‍රධාන කුලුනු වන කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශයන්හි රැකියා වෙළඳපොළ අවශ්‍යතා සහ අධ්‍යාපනය අතර පවතින නොගැළපීම මෙහි දී බොහෝ සෙයින් අවධානයට ලක් වී ඇත.

රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ දියුණු මානවවාදී හා වගකීම් සහගත පුරවැසි සමාජයක් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමයි. එය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයට රාජ්‍ය ආයෝජන ඉහළ දමන අතර, දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා දැනට වෙන් කරනු ලබන ප්‍රමාණය ක්‍රමයෙන් 6% දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

♦ <u>අධ්‍යාපනයේ ඉදිරි ගමන් මග සඳහා පදනම් වන මූලධර්ම</u>

වර්තමාන රජය විසින් ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ යටතේ දේශයේ සංවර්ධන ක්‍රියාදාමයේ දී අධ්‍යාපනයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. එහි දී නිදහස් අධ්‍යාපනය හා සම ප්‍රවේශය, මානව සංවර්ධනයට සහ සේවා නියුක්තියට අදාළතාව, සියල්ලන්ට ම පිළිගත හැකි බව, සමාජයට වග වන පුරවැසියන්, තිරසර බව හා නවෝත්පාදනය සහ යාවජීව අධ්‍යාපනය යන මූලධර්ම පදනම් කර ගැනේ. ඒ අනුව අධ්‍යාපන ක්ෂෙත්‍රයේ විවිධ අංශ යටතේ පහත සුවිශේෂ ඉලක්ක ඉදිරිපත් කර ඇත.

<u>2025 වර්ෂය සහ ඉන් ඉදිරියට සුවිශේෂ ඉලක්ක</u>

♦ <u>පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය</u>

අවුරුදු 03 සිට 05 දක්වා වන සියලු දරුවන් සඳහා විධිමත් මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනයක් සැපයීමට කටයුතු කෙරේ. සෑම දරුවෙකුට ම සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර

දෙකක් ඇතුළත මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලබාදීමට අපේක්ෂිත ය. මෙහි දී දරුවන්ගේ කායික හා මානසික තත්ත්වයන්ට ගෝචර වන පරිදි හා සමාජ ජීවිතයට පිවිසීමට අවශ්‍යවන යහපත් පුරුදු, ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකාරකම් අන්තර්ගත වැඩසටහන්, මව් භාෂාවට අමතරව කථන සන්නිවේදන භාෂා ලෙස ඉංග්‍රීසි ඇතුළු අනෙක් ජාතික භාෂා වැඩසටහන් සහ බහුසංස්කෘතික විවිධත්වයට හුරු කරවන වැඩසටහන් ඇතුළත් කෙරේ. එම දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය වර්ධනය කෙරෙන ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛතාව ලැබේ. එසේ ම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය සඳහා ජාතික මුල් ළමාවිය සංවර්ධන නියාමන ආයතනයක් ස්ථාපිත කිරීමට ද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලක පාලිකාවන් සහ ගුරුවර ගුරුවරියන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම්, අනිවාර්ය වෘත්තීය පුහුණුව සහ ප්‍රමාණවත් අවම වැටුපක් ලබාදීමට ද කටයුතු කෙරෙනු ඇත. තව ද, මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා විධිමත් ජාතික ආයතනයක් හා ශාඛා පද්ධතියක් ස්ථාපිත කිරීමට අපේක්ෂිත ය.

♦ පාසල් අධ්‍යාපනය

පාසල් අධ්‍යාපනය ප්‍රධාන අවධි හතරක් යටතේ සංවිධානය කෙරේ. එනම් පළමු ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ප්‍රාථමික අධ්‍යාපනය, 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා වන කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය, 10 ශ්‍රේණියේ සිට 11 වසර ශ්‍රේණිය දක්වා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (පහළ) අධ්‍යාපනය සහ 12 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (ඉහළ) අධ්‍යාපනය යනුවෙනි.

♦ ප්‍රාථමික අධ්‍යාපනය

සාක්ෂරතාව, සංඛ්‍යාත්මක දැනුම, නිර්මාණශීලිත්වය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම ප්‍රාථමික අධ්‍යාපනයේ මූලික අරමුණයි. සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට හෝ කිලෝමීටර තුනක් ඇතුළත ප්‍රාථමික අධ්‍යාපනය සඳහා රජයේ පාසල් පද්ධතියට ඇතුළත්වීමේ අවස්ථාව සැලසීම රජයේ අපේක්ෂාව ය. ළමාවියට බාධාවක් නොවන පරිදි බුද්ධිමය කුතුහලය සහ දැනුම වර්ධනය උත්තේජනය කරන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් ලබාදීමට කටයුතු කෙරේ. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අවශ්‍ය අවම පහසුකම් පවත්වාගෙන යෑම පිණිස භෞතික සහ මානව සම්පත් පාසල්වලට සැපයීම රජයේ වගකීමක් ලෙස පිළිගැනේ. මෙම අවධියේ දරුවන්ගේ අවශ්‍යතාවලට හා පිළිගත් ප්‍රමිතිවලට අනුකූල ව පාසල් ප්‍රවාහන පද්ධතියක් සැපයීම රජයේ ඉලක්කය යි.

♦ කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය

ජනගහනය හා භූගෝලීය පිහිටීම සැලකිල්ලට ගනිමින් ප්‍රාථමික පාසල් දෙකක් හෝ තුනක් හෝ ආවරණය වන පරිදි කනිෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියක් හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියක් ලෙස පාසල් පද්ධතිය සංවිධානය කෙරේ. සිසුන්ගේ හැකියා සහ විශේෂ කුසලතාවලට අනුව උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය හෝ තෝරා ගත හැකිවන පරිදි ප්‍රධාන විෂයයන් හැදෑරීමට අවස්ථාව ලබාදෙනු ඇත.

විශේෂයෙන් ම සිසුන්ගේ වයස් කාණ්ඩ සහ ඊට අදාළ බුද්ධිමය තත්ත්වයන් හා කුසලතා වර්ධනය වන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් මෙන් ම සමාජ සාරධර්ම සහ පුරවැසි වගකීම් සංවර්ධනය කිරීමට අමතර විෂයයන් හා ක්‍රියාකාරකම්වල නිරතවීමට පහසුකම් ද සැපයේ. සිසුන්ට සිය ආගම පිළිබඳ ව අධ්‍යාපනයට අමතර ව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් පිළිබඳ ව අධ්‍යාපනික වැඩසටහන්, ඒ ඒ වයස් කාණ්ඩයන්ට ගැළපෙන පරිදි ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ අධ්‍යාපනයක්, සංස්කෘතිය, පරිසර හිතකාමිත්වය හා සොබා දහමේ පැවත්ම පිළිබඳ ආකල්ප සංවර්ධනය සහ නවෝත්පාදනය පිළිබඳ ව අත්දැකීම් ලබාදෙන වැඩසටහන් කනිෂ්ඨ ද්විතීයික අවධියේ විෂයමාලාවට ඇතුළත් කෙරේ.

♦ <u>ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය</u>

ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධියේ සිසුන්ට නවය වසරේ දී පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගයේ ප්‍රතිඵල සහ පාසල් පාදක අඛණ්ඩ ඇගයීම් වාර්තා මත ශිෂ්‍යයාගේ විභවයට සහ රුචිකත්වයට සරිලන පරිදි විද්‍යා, කලා, වාණිජ සහ තාක්ෂණ වැනි සාමාන්‍ය විෂය ධාරා හෝ වෘත්තීය විෂය ධාරාව (vocational education stream) (ඍජු ව ම කිසියම් වෘත්තියකට අදාළවන) තෝරා ගැනීමට අවස්ථාව සැපයේ. ද්විතීයික ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනය (පහළ) කාලය තුළ එක් විෂය ධාරාවකින් තවත් විෂය ධාරාවකට මාරු විය හැකි පරිදි සුනම්‍ය විෂයමාලාවක් සකස් කෙරේ. අධ්‍යාපන විෂය ධාරාවලට විශේෂිත වූ විෂයයන් මෙන් ම පොදු නිපුණතා වර්ධනයවන තාක්ෂණික සාක්ෂරතාව, භාෂා, ජීවන නිපුණතා, සාහිත්‍ය රසවින්දනය, මූලික නීතිය ආදි පොදු විෂයයන් ඉගෙනීමටත් සංස්කෘතික විවිධත්වයන්ට අනුගත ව එම විවිධත්වය ගරු කරමින් කටයුතු කිරීමටත් ළමුන් හුරු කරවන ඉගෙනුම් පරිසරයක් සහ නවෝත්පාදනය, ජීවන නිපුණතා හා සමාජානුයෝජනයට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය ඉලක්ක කෙරේ. සිසුන්ගේ ශාරීරික හා මානසික සමබරතාව පවත්වාගෙන යෑම සඳහා වැඩසටහන් මෙන් ම තාරුණ්‍යයට ගැළපෙන පරිදි ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ අධ්‍යාපනය සහ අවශ්‍ය විටක දී නීති උපදේශන සේවා හා අනෙකුත් සමාජ ආධාරක පද්ධති වෙත යෑමට ඇති අවබෝධය ලබා ගැනීමට අවස්ථාව සැපයේ.

♦ <u>ජාතික මට්ටමේ ඇගයීම් සහ විෂයමාලා සංවර්ධනය</u>

සියලු තාක්ෂණික සහ අනෙකුත් භෞතික පහසුකම් සහිත ජාතික විභාග ඇගයීම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමටත් ජාතික විභාග ඇගයීම් කටයුතු මසක් ඇතුළත අවසන් කිරීමට හා දෙමසක් ඇතුළත ප්‍රතිඵල ලබා දිය හැකිවන පරිදි වාර්ෂික පාසල් දින දර්ශනයක් සකස් කිරීමටත් අපේක්ෂිත ය. විභාග ඇගයීම් ක්‍රියාවලියට දායකවන පරීක්ෂකවරුන්ගේ බුද්ධිමය දායකත්වයට සරිලන ගෙවීම් ක්‍රමයක් ඇති කෙරේ. විෂයමාලා සංවර්ධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපන පර්යේෂණ සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ කටයුතු විධිමත් කෙරේ. ජාතික අධ්‍යාපන ආයතනය තුළ විෂයමාලා සංවර්ධනය කිරීම සඳහා පූර්ණ පහසුකම් සහිත විෂයමාලා සංවර්ධන ඒකකයක් ස්ථාපිත කෙරේ.

- <u>මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යෑම</u>

ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව කඩිනමින් ඉවත් කිරීමට කටයුතු කෙරේ. නව ගුරු සේවා ව්‍යවස්ථාවක් සහ ගුරු සභාවක් පිහිටුවීම මෙන් ම ගුරු වෘත්තීය ඉහළ ම වැටුප් ලබන වෘත්තීන් 10 අතරට එක් කිරීම රජයේ අපේක්ෂාව යි. ගුරු වෘත්තියට පිවිසීමට පෙර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ වසරක වෘත්තීය පුහුණුවක් ලබාදීමට කටයුතු සම්පාදනය කෙරේ. සියලු අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු අභ්‍යාස විද්‍යාල ඒකාබද්ධ කොට ජාතික අධ්‍යාපන විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කෙරේ. සෑම ගුරුවරයෙකුට ම වසර තුනකට වරක් පුහුණු වැඩසටහන්වලට සහභාගිවීමට අවස්ථාව සැලසේ. විෂයමාලා සංවර්ධනය, පෙළ පොත් සම්පාදනය සහ ඇගයීම් ක්‍රියාවලිය එකිනෙක සම්බන්ධකොට පවත්වාගෙන යාමට හැකිවන පරිදි ආයතන අතර සම්බන්ධීකරණ ව්‍යුහයක් ද, පාසල් පද්ධතිය තුළ සියලු ප්‍රජාව මුහුණදෙන ලිංගික හෝ වෙනත් හිංසන පිටුදැකීම සඳහා ශක්තිමත් ව්‍යුහයක් ද ස්ථාපිත කෙරේ.

- <u>වෘත්තීය අධ්‍යාපනය</u>

පෘථුල වෘත්තීය ක්ෂේත්‍රයන්හි ව්‍යවහාරික දැනුම ලබා ගනිමින් කිසියම් නිශ්චිත රැකියා ක්ෂේත්‍රයකට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමුවන වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලියක් සකස් කෙරේ. සාමාන්‍ය අධ්‍යාපන ධාරාවට සමාන්තරව 10 වසරේ සිට 13 වසර දක්වා ඉදිකිරීම් සහ යටිතල පහසුකම්, නිර්මාණාත්මක කර්මාන්ත, ප්‍රාථමික කර්මාන්ත, සේවා කර්මාන්ත, සමාජ සහ ප්‍රජා සේවා සහ නිෂ්පාදන හා තාක්ෂණය යන ක්ෂේත්‍ර ඔස්සේ වෘත්තීය විෂය ධාරා සකස් කෙරේ. රැකියා වෙළඳපොළ හා ලෝක ප්‍රවණතා සැළකිල්ලට ගනිමින් ඒ ඒ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු විය යුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක වෙනස්කම් පිළිබඳ ව නිර්දේශ කිරීම සඳහා කර්මාන්ත හා අධ්‍යාපනික ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගෙන් සමන්විත වෘත්තීය අධ්‍යාපනය නියාමන කාර්යාංශයක් ස්ථාපිත කෙරේ.

- <u>උපකෘත පාසල්</u>

පිරිවෙන් ඇතුළු අනෙකුත් උපකෘත පාසල්වලට ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදෙමින් ඒවායේ අධ්‍යාපනය විධිමත් කිරීමට පියවර ගනු ලැබේ.

- <u>උසස් අධ්‍යාපනය</u>

ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය උසස් න්‍යායික හා පර්යේෂණාත්මක අධ්‍යාපනය ලබාදෙන මධ්‍යස්ථාන බවට පත්කොට ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදෙන සමාන්තර විශ්වවිද්‍යාලයීය පද්ධතියක් ඇති කිරීමට කටයුතු කෙරේ.

- <u>රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය</u>

විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වයට ගරු කරමින් එම විශ්වවිද්‍යාලවල අධ්‍යාපන පාඨමාලා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල ව සකස් කිරීම සඳහා විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟ පෙන්වීම මත සමාජීය විවිධත්වය නියෝජනය සහතික කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා සහ අනෙකුත්

විශ්වවිද්‍යාලවල ගෞරවය ආරක්ෂාවන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් විශ්වවිද්‍යාල බාහිර පාලක සභා සාමාජිකයින් ලෙස ස්වාධීන පුද්ගලයන් පත් කිරීමට කටයුතු කෙරේ. සෑම පාලක සභාවක ම විවිධ වෘත්තීය ක්ෂේත්‍ර සහ ස්ත්‍රී පුරුෂ නියෝජනය සහතික වන පරිදි සාමාජිකයින් පත් කෙරෙන අතර ඒ සඳහා පිළිගත් වෘත්තීය ආයතනවලින් ලබා ගන්නා පොදු නිර්දේශිත නම් ඇතුළත් සංචිතයක් පිහිටුවනු ලැබේ. සුබසාධනය සහ අනෙකුත් ශිෂ්‍ය කටයුතු සීමිත අවකාශය තුළ කටයුතු කිරීම සඳහා ශිෂ්‍ය නියෝජිතයෙක් අදාළ විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ ඡන්දයෙන් පාලක සභාවට පත් කෙරෙනු ඇත. පාලක සභා සාමාජිකයකුගේ ධුර කාලය උපරිම අඛණ්ඩ වාර දෙකකට සීමා කෙරේ. අධ්‍යයන අංශයක අංශාධිපති හෝ වසර තුනක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයේ සුදුසුකම් ඇති සියලු පීඨ සාමාජිකයින්ට පීඨාධිපති ධුරය සඳහා පත් වීමට අවස්ථාව ලබාදෙන අතර පීඨාධිපතිවරයකුගේ කාලය උපරිම අඛණ්ඩ වාර දෙකකට සීමා කෙරේ.
සෑම විශ්වවිද්‍යාලයක ම අධ්‍යයන, අනධ්‍යයන සහ ශිෂ්‍ය ප්‍රජාවගේ දුක්ගැනවිලි සොයා බලා ඒවාට පිළියම් යෙදීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පීඨ මට්ටමින් සහ විශ්වවිද්‍යාල මට්ටමින් යාන්ත්‍රණ සකස් කෙරේ. විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ප්‍රමාදය ඉවත් කිරීමට කටයුතු කෙරේ. ඒ ඒ පාඨමාලාවේ අවම සුදුසුකම් හඳුනාගෙන ඒ සුදුසුකම් සපුරාලන සියලු දෙනාට අවස්ථාව ලැබෙන පරිදි තෘතීයික අධ්‍යාපන පද්ධතිය ක්‍රමික ව පුළුල් කෙරේ.
තෘතීයික අධ්‍යාපන ආයතනවල දේශන ශාලා, පර්යේෂණාගාර, පුස්තකාලය, ආපනශාලා, අන්තර්ජාල පහසුකම් නියමිත ප්‍රමිතීන්ට අනුකූල ව සකස් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා දෙනු ලැබේ. ශිෂ්‍යාධාර සහ මහපොළ ජීවන වියදමට සරිලන ලෙස ඉහළ නැංවීමට කටයුතු කෙරේ.
ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂා ඇතුළු අනෙකුත් මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා සෑම තෘතීයික අධ්‍යාපන ආයතනයක ම විශේෂ ඒකක පිහිටුවීම සහ එම ඒකක හරහා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට අවශ්‍ය සබඳතා පුළුල් කෙරේ. උසස් පෙළ සමතුන්ට ජාත්‍යන්තර ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවල උපාධි හැදෑරීම සඳහා වසරකට ශිෂ්‍යත්ව 200ක් පිරිනැමේ. තෘතීයික අධ්‍යාපන ආයතනවල නවක වදය හෝ වෙනත් හිංසන වැළැක්වීම සඳහා ඒකාබද්ධ ව්‍යුහයක් ස්ථාපිත කරන අතර ආබාධ සහිත සිසුන් සඳහා පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව අධ්‍යාපනය ලැබීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයේ.

- <u>පර්යේෂණ සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය</u>

පශ්චාත් උපාධි පර්යේෂණ හා සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කෙරේ. පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සම්පාදනය කරනු ලබන අතර කර්මාන්ත හා සේවා ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමට කටයුතු කෙරේ.

- <u>වෘත්තීය අධ්‍යාපන විශ්වවිද්‍යාලය</u>

ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයෙන් පසු තෘතීයික අධ්‍යාපන ප්‍රවේශ විභාගය සමත් වන අය සඳහා වෘත්තීය

♦ <u>පෞද්ගලික අධ්‍යාපනය</u>

උසස් අධ්‍යාපනයට මූලික සුදුසුකම් ලබන අය රාජ්‍ය අධ්‍යාපන ආයතනවලට ඇතුළත් කර ගැනීමට හැකි වන පරිදි එම පද්ධතිය ප්‍රමාණවත්ව පුළුල් නොවීම නිසා පෞද්ගලික අධ්‍යාපන ආයතන හා විශ්වවිද්‍යාල, අනෙකුත් පෞද්ගලික තෘතීයික අධ්‍යාපන ආයතනවලට විශාල ඉල්ලුමක් පවතී. එහෙත් එම පෞද්ගලික අධ්‍යාපන පද්ධතිවල ගුණාත්මකභාවය හෝ ඒ ඒ පාඨමාලා සඳහා අය කරනු ලබන ගාස්තු නියාමනය කිරීම සිදු නොවේ. පවතින පෞද්ගලික අධ්‍යාපන ආයතනවල පාඨමාලා නියාමනය කිරීම සඳහා රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන නියාමන ඒකකයක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ඇත.

♦ <u>වැඩිහිටි අධ්‍යාපනය</u>

ප්‍රාදේශීය අධ්‍යාපනික ආයතන, පුස්තකාල, සංස්කෘතික මධ්‍යස්ථාන සමග ඒකාබද්ධ ව නොවිධිමත් අධ්‍යාපනය ලබා දීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක ම ප්‍රජා අධ්‍යාපනික මධ්‍යස්ථාන ස්ථාපිත කෙරේ. පුරවැසියන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා, මූලික නීතිය, තොරතුරු තාක්ෂණය හා තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයේ.

♦ <u>විවෘත හා දූරස්ථ අධ්‍යාපනය</u>

විවෘත හා දූරස්ථ අධ්‍යාපනය තෘතීයික අධ්‍යාපනයේ කොටසක් බව පිළිගනිමින් විවිධ වෘත්තීන්හි නියැලී සිටින සහ විවිධ අවස්ථාවල තෘතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට පෙර විධිමත් අධ්‍යාපනයෙන් ගිලිහී ගිය අයට තෘතීයික අධ්‍යාපනය ලබාදීමට අවස්ථාව සැලසිය යුතු ය. සිය සේවා තත්වය හෝ භූගෝලීය සාධක පදනම් කරගෙන බාධා ඇති නොවන පරිදි උසස් අධ්‍යාපනයට ප්‍රවේශ විය හැකි වන ආකාරයට ම විවෘත හා දූරස්ථ අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පහසුකම් පුළුල් කෙරේ.

ආචාරධර්මීය ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීමට වඩාත් පිරිසිදු භෞතික පරිසරයක් සහ රට පුරා සදාචාරාත්මක කැපවීමක් සඳහා ආමන්ත්‍රණය කිරීම අරමුණු කරගෙන ආරම්භ කර ඇති Clean Sri Lanka ව්‍යාපෘතිය සමාජීය, පාරිසරික, ආචාරධර්මීය යන කුලුනු තුන මත ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය. පුරවැසියන් අතර වගකීම්, තිරසරභාවය සහ පාරිසරික විඥානය පිළිබඳ ආකල්ප පෝෂණය කරන පිරිසිදු මනසක් සංවර්ධනය කරනු ලබන අධ්‍යාපනික වැඩසටහන්වල නියැලීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙය පුද්ගල මනසින්, පාසල්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතන, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන, පොදු ස්ථානවලින් ආරම්භ වනු ඇති අතර සමස්තයක් වශයෙන්, 'සිනහවෙන් පිරුණු මිනිසුන් වෙසෙන ලස්සන රටක්' ඉලක්කකර ගනිමින් පිරිසිදු ශ්‍රී ලංකාවක් බවට පත්වීමේ සමස්ත රටේ ම දැක්ම ආවරණය කරයි. බලකිරීමකින් තොර ව, 'පුරුද්දක්' බවට පත් වන පුද්ගල මනෝභාවයක් ඇති කරවන තිරසර පරිචයන් අගයන්නා වූ ක්‍රමවේද නිර්මාණය කිරීම මීට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය දූෂණ විරෝධී ක්‍රියා වෙනුවෙන් පෙනී සිටීම, රාජ්‍ය සම්පත් අවභාවිතය අවම කිරීම සහ සමාජීය හා පාරිසරික මූලාරම්භයන් සඳහා වෙන් කරන ලද අරමුදල් එම අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වන බව සහතික කරනු ඇත. මේ ක්‍රියාවලියට අනුගත ව අධ්‍යාපන අමාත්‍යාංශයේ 2025 සහ ඉන් ඉදිරියට වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු

## 2025 වර්ෂය සඳහා වූ ප්‍රධාන/සුවිශේෂී ඉලක්ක

ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් මඟින් ශිෂ්ටසම්පන්න හා වගකීම් සහගත පුරවැසි සමාජයක් බිහි කිරීම සහ සංවර්ධනය සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික අභිප්‍රායයි. ඒ අනුව සාමාන්‍ය අධ්‍යාපන සඳහා වූ පහත වැඩ සටහන් ඉදිරි වසර තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- ♦ නිදහස් අධ්‍යාපන අයිතීන් තවදුරටත් සුරක්ෂිත කිරීම.
- ♦ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වාර්ෂික ප්‍රතිපාදන යටතේ අග්‍ර ප්‍රමුඛතාවක් පිරිනැමීමට කටයුතු කිරීමට අපේක්ෂිතය (උදා: නොමිලේ අධ්‍යාපන අවස්ථා සැලසීම, නොමිලේ පෙළ පොත්, ලිපි ද්‍රව්‍ය , පාසල් පාවහන් , නිල ඇඳුම්, දිවා ආහාර සහ රක්ෂණ පහසුකම් ආදී)
- ♦ පාසල් පද්ධතිය තුළ මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂමතාව අවම කිරීම හා පාසල් පද්ධතිය කෙරෙහි විශ්වාසය තහවුරු කිරීම.
- ♦ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අදාළව විෂයමාලා සංවර්ධනය , ගුරු පුහුණුව සහ පාසල් සඳහා යටිතල පහසුකම් සහ උසස් අධ්‍යාපන ක්‍රියාවලියට අදාළ පහසුකම් සැලසීමට යෝජිතව ඇත.

  - විභාග කේන්ද්‍රීය ක්‍රමවේදයක් වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන පද්ධතියක් සකස් කිරීම.
  - දරුවන්ගේ කුසලතා ඉහළ නැංවීම හා දැනුම් ආර්ථිකයටත් ගැළපෙන පරිදි හා තිරසර ලෙස විෂයමාලා රාමුව සකස් වී ඇති ද යන්න පිළිබඳව සමාලෝචනය හා විෂයමාලා රාමුව සකස් කිරීම.
  - ඒ අනුව, විෂයමාලා නවීකරණය හා සංවර්ධනය හා විවිධාංගීකරණය.
  - දරුවන්ගේ කුසලතා ඔප් නැංවෙන පරිදි ශිෂ්‍ය පාදක ලෙස විෂයමාලාව සංශෝධනය කිරීම.
  - අදාළ ගුරු භවතුන් විෂයමාලා නවීකරණය සංශෝධනය පිළිබඳව දැනුවත් කිරීම.

  මේ වන විට ප්‍රතිසංස්කරණ ශාඛාවේ මූලිකත්වයෙන් ජාතික අධ්‍යාපන ආයතනය මඟින්, නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2026 වර්ෂයේ සිට හඳුන්වා දීමට පියවර ගෙන ඇති අතර, විෂය මාලාව පාසල් පද්ධතිය තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා පියවරයන් දියත් කරමින් ඇත.

- ♦ ශ්‍රී ලංකා අධ්‍යාපන විශ්වවිද්‍යාලය පිහිටුවා සියලු ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල මණ්ඩප බවට පත් කර අධ්‍යාපනවේදී උපාධිය ලබාදීමේ තත්වයට උසස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගනිමින්, ඊට අදාළ පනත කෙටුම්පත් කිරීම අවසන් කර නීති කෙටුම්පත් සම්පාදක විසින් නව රජයේ අනුමැතිය ඉල්ලා ඇති අතර, ඒ සම්බන්ධ මේ වන විට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.
- ♦ ආර්ථිකයේ ප්‍රධාන කුලුනු වන කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශයන්හි රැකියා වෙළඳපොළ අවශ්‍යතාවන් සහ අධ්‍යාපනය අතර පවත්නා නොගැළපීම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ♦ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස පාරිසරික තිරසරභාවය ඉහළ නැංවීම, නාස්තිය අවම කිරීම හා සදාචාරාත්මක වටිනාකම් ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් Clean Sri Lanka ව්‍යාපෘතියට සමගාමී ව 2025 දී එහි අධ්‍යාපන මුලපිරීම ආරම්භ කිරීමට නියමිත ය. ඒ අනුව දියත් කෙරෙන වැඩසටහන වාර්ෂික ක්‍රියාකාරකම් යටතේ (සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත් සියලු ම ආයතනයන්හි) ක්‍රියාත්මක කිරීමට නියමිත ය. ඊට අදාළ චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය මේ වන විට සකස් කරමින් පවතී.

- අධ්‍යාපන පද්ධතියේ ඉදිරි ක්‍රියාමාර්ග පහත කරුණු සඳහා මූලිකත්වය දෙමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

<u>ක්‍රියාමාර්ග</u>

- පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය අංශ ගණනාවකින් වැඩිදියුණු කිරීමට පියවර ගනිමින් පවතී.
- ප්‍රාථමික අධ්‍යාපනය සාක්ෂරතාව, සංඛ්‍යාත්මක දැනුම, නිර්මාණශීලිත්වය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සිදු කිරීම.
- කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය බුද්ධිමය තත්වයන් හා කුසලතා වර්ධනයවන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් තුළින් දරුවන්ගේ කායික හා මානසික තත්වයන්ට උචිත වන පරිදි හා සමාජ ජීවිතයට අවශ්‍ය වන යහපත් පුරුදු , ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකරකම් ඇතුළත් වැඩසටහන් තුළින් ලබා දීම.
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය නවෝත්පාදනය, ජීවන නිපුණතා හා සමාජානුයෝජනයට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය වූ සමබර දරුවෙකු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සුනම්‍ය විෂයමාලාවක් යටතේ ක්‍රියත්මක කිරීම.
- ජාතික මට්ටමේ ඇගයීම් විධිමත් කිරීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ මානව සම්පත් ප්‍රවර්ධනය හා ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම හා වෘත්තීය පහසුකම් සැලසීම.
- වෘත්තීය අධ්‍යාපනය රැකියා වෙළඳපොළ හා ලෝක ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන හා තාක්ෂණය යන ක්ෂේත්‍ර ඔස්සේ පුළුල් කිරීම.
- උපකෘත පාසල් සඳහා ප්‍රතිපාදන ඉහළ නැංවීම හා උසස් අධ්‍යාපනය ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදෙන පරිදි දියත් කිරීමට කටයුතු කිරීම.
- පෞද්ගලික අධ්‍යාපනය නියාමන ක්‍රමවේදය ශක්තිමත් කිරීම තුළින් එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- වර්තමානයේ අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුගත වන පරිදි සාමාන්‍ය අධ්‍යාපනයේ ඉදිරි ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන් පහත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.
  - සමාජ ආර්ථික අවශ්‍යතාවට යෝග්‍ය පරිදි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සකස් විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදීම.
  - ඒ අනුව මානව සම්පත් සංවර්ධනය, අධ්‍යාපනයේ ව්‍යුහාත්මක වෙනස්කම් හා විෂයමාලා ප්‍රතිසංස්කරණයට මූලිකත්වය ලබා දීම.
  - විදුහල්පතිවරු සහ ගුරු පුහුණුව, ධාරිතා සංවර්ධනය සිදු කිරීම.
  - අධ්‍යාපන පද්ධතියේ ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා සැලසුම් සකස් කිරීම.

- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මූලික අදියර 2025 දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම හා 2026 වර්ෂයේ සිට ක්‍රමානුකූල ව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

♦ ප්‍රාථමික අධ්‍යාපනය තුළ පහත සුවිශේෂ කරුණු 2025 වර්ෂයේ දී ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

♦ අන්තර්කරණ අධ්‍යාපන පරිසරයක් ඇති කිරීම හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රාථමික අධ්‍යාපනය තුළ පුළුල් කිරීම.

- කියවීම, බහුතල ඉගෙනුම ප්‍රචලිත කිරීම.
- ප්‍රාථමික අංශවල භෞතික පහසුකම් සංවර්ධනය.
- ඩිජිටල් නවෝත්පාදනය හරහා සිසුන්ගේ වාචික කුසලතාව ශක්තිමත් කිරීම හා ගණිතමය නිපුණතා ඉලක්ක කර ගත් ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ නියාමන රාමුව ශක්තිමත් කිරීම.

♦ සෞන්දර්ය ගුරු පුහුණු, ප්‍රායෝගික කුසලතා සංවර්ධන, දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

♦ පාසල් සෞඛ්‍ය හා පෝෂණය ප්‍රවර්ධනය කිරීම.

- රජයේ සියලු ම ප්‍රාථමික පාසල් සඳහා " පාසල් ආහාර වැඩසටහන " ක්‍රියාත්මක කිරීම.
- සිසු රක්ෂණාවරණ ක්‍රියාත්මක කිරීම, ප්‍රජනක සෞඛ්‍ය හා ලිංගික අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීම සහ රජයේ පාසල් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

♦ තාක්ෂණික අධ්‍යාපනයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් විධිමත් පරිදි පැවැත්වීම.

- නව නිපැයුම් ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.
- NVQ සුදුසුකම් ලබාදීමට කටයුතු කිරීම හා තෘතීක අධ්‍යාපනයට පෙළ ගැසීම.

<u>2025 වර්ෂය අවසන් වන විට ඉටු කිරීමට අපේක්ෂිත වැඩසටහන්</u>

♦ ලෝක බැංකු නිරීක්ෂණ වැඩසටහන් හා GEMP ව්‍යාපෘතියේ අවසන් රැස්වීම (GEMP Wrap-up meeting).

♦ Clean Sri Lanka වැඩසටහන අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම.

♦ ඵලදායී පාසල් ජාලයක් නිර්මාණය කිරීම උදෙසා පාසල් ප්‍රතිසංවිධාන වැඩසටහන.

♦ 2026 වර්ෂයට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගැනීම.

♦ **<u>2025 වර්ෂයෙහි අපේක්ෂිත බඳවා ගැනීම්</u>**

- **අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණිය (විවෘත) - 113 (සීමිත) - 442**
- **ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ආ) ශ්‍රේණියට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් - 4140**
- **සැමට ඉංග්‍රීසි වැඩසටහන යටතේ ඉංග්‍රීසි ගුරුවරු - 2500**
- **ජාතික හා පළාත් පාසල් සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ගුරු සේවයට - 22000**

**(අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වීමට හෝ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්ව).**

- **සේවා ව්‍යවස්ථාව අනුව ගුරු උපදේශකවරුන් - 2100**
- **දෙමළ මාධ්‍ය වතු පාසල් සඳහා ගුරු සහායකවරුන් - 2935 (අංක 2389 හා 2024-06-14 දිනැති *ගැසට්* නිවේදනය) .**
- **විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම හා සේවය අතහැර යාම හේතුවෙන් හා විදුහල්පති සේවය සඳහා උසස් වීම් ලැබීම් හේතුවෙන් ඇති වූ ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු සේවයට බඳවා ගැනීම.**

# 03. 2024 වර්ෂයේ ප්‍රගතිය

## අධ්‍යාපනයේ ඉහළ සහභාගිත්වයක් සඳහා ශිෂ්‍ය සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මෑතකාලීන ව ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික පසුබෑම මධ්‍යයේ වුව ද, අධ්‍යාපනය ලැබිය යුතු වයසේ සෑම දරුවෙකු සඳහා ම සම-සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක වන ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා පියවර ගෙන ඇත. මෙමගින් නිදහස් අධ්‍යාපනය සඳහා සම ප්‍රවේශය තහවුරු කිරීමට අපේක්ෂිත ය.

| වැඩසටහන | ආයෝජනය (රුපියල් මිලියන) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| පාසල් නිල ඇඳුම් | * 850,387,966.27<br>** 226,057,497.83 | 4,559,420ක් සිසුන් සඳහා පාසල් නිල ඇඳුම් ලබා දී ඇත. |
| පාසල් පෙළපොත් | 3,936,460 | 1 – 11 ශ්‍රේණිවල සියලු ම සිසුන් සඳහා පාසල් පෙළපොත් ලබා දී ඇත. |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් සිසුන් සඳහා පාවහන් | ක්‍රියාත්මක නොවුණි | වෙන් වී තිබූ මිලියන 2500ක මුදල සනීපාරක්ෂක තුවා ලබා දීම හා දරුවන්ට දිවා ආහාර ලබා දීම සඳහා මාරු කරන ලදි. |
| සුරක්ෂා රක්ෂණය | 2,292 | ප්‍රතිලාභ ගෙවූ මුදල රුපියල් මිලියන 93ක් වන අතර ප්‍රතිලාභීන් ගණන මිලියන 4කි. |
| පාසල් පෝෂණ වැඩසටහන් | 100 | සිසුන් මිලියන 1.4ක් සඳහා පාසල් පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක වේ. |

* අමාත්‍යාංශයෙන් කරනු ලැබූ මිල දී ගැනීම් අවශ්‍යතාවෙන් 20% ක වියදම

* * චීන රජයෙන් ප්‍රදානයක් වශයෙන් ලැබුණු 80% ක නිල ඇඳුම් රෙදි ප්‍රමාණය නිශ්කාෂනය හා බෙදා හැරීමේ වියදම

ශිෂ්‍යාධාර ප්‍රදාන

| වැඩසටහන | ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිලාභය |
|---|---|---|
| නව නිපැයුම්, සෞන්දර්ය, ක්‍රීඩා යන ක්ෂේත්‍රවල දක්ෂතා දැක්වූ නිපුණයන්ට දෙන සුභග ශිෂ්‍යත්ව | 285<br><br>845 | 25,000 *285 = රු.7,125,000.00<br><br>25,000*845 = රු.21,125,000.00 |
| අඩු ආදායම්ලාභී පවුල්වල 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වලාභීන් සඳහා ශිෂ්‍යාධාර | 125,000 (වසරකට) | 125,000*750*10 = රු.937,500,000 |
| අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය හදාරන සිසුන් සඳහා ශිෂ්‍යාධාර | 700 | රු.10,500,000.00 |
| අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය හදාරන සිසුවියන්ට සුජාත දියණි ශිෂ්‍යත්ව | 250 | රු. 3,750,000.00 |
| අ.පො.ස. (උසස් පෙළ) අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව | 150 (වසරකට) | මෙම වර්ෂයේ ශිෂ්‍යත්වය ක්‍රියාත්මක වී නැත. |
| අ.පො.ස. (උසස් පෙළ) ගණිත විෂයධාරාවේ සිසුන්ට ඩයලොග් ශිෂ්‍යත්ව | 30 (වසරකට) | රු.75,000.00 |

<u>තොරතුරු තාක්ෂණය හා ඩිජිටල් අධ්‍යාපනය</u>

සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ නව තාක්ෂණයට අනුරූපව සංවර්ධනය කරා යන සමාජයක් ගොඩනැංවීම සඳහා තොරතුරු තාක්ෂණය හා ඩිජිටල් අධ්‍යාපනය ප්‍රවර්ධනයට 2024 වර්ෂයේ ද අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

<u>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය ප්‍රවර්ධනය</u>

- කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජ අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීම.

නියමු ව්‍යාපෘතියක් ලෙස පාසල් 100ක් තෝරා ගෙන ඇති අතර එම පාසල්වල විදුහල්පතිවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී. එම පාසල්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අයත් ගුරු භවතුන් 2 බැගින් තෝරා ගෙන ඔවුන් සඳහා අවශ්‍ය වන දැනුම ලබා දීමට ගුරු පුහුණු වැඩසටහන් පවත්වා ඇත. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පාසලට අවශ්‍ය යටිතල පහසුකම් හා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා පාසල් පාදක ප්‍රදානයක් වශයෙන් එක් පාසලකට රු.100,000 බැගින් ලබා දී ඇත.

♦ ජාතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරයෝ තරගාවලිය සංවිධානය කිරීම.

පහත කාණ්ඩ ඔස්සේ තරගාවලිය ක්‍රියාත්මක කෙරිණි.

- තරුණ පරිගණක විද්‍යාඥයා තරගය (YCS) අධ්‍යාපන අමාත්‍යාංශය හා තොරතුරු තාක්ෂණ කර්මාන්ත කරුවන්ගේ මණ්ඩලය එක්ව තරගය ක්‍රියාත්මක කෙරේ. මෙම තරගයේ විශිෂ්ට දක්ෂතා දැක්වූ රජයේ පාසල් සිසුන් තුන් දෙනෙකු හා ජාත්‍යන්තර පාසල් එක් සිසුවකු ජාත්‍යන්තර APICTA තරගය සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණ ලබා ඇත.

- ජාතික පාසල් මෘදුකාංග තරගය - අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා පරිගණක සංගමය එක්ව ක්‍රියාත්මක කෙරිණි.

- නිර්මාණාත්මක ගුරු භවතා තරගය - ගුරුවරුන් හා විද්‍යාපීඨ සිසුන්ගේ නිර්මාණ ඇගයීම් සිදු කෙරේ.

♦ සුරක්ෂිත ව අන්තර්ජාලය භාවිතය සම්බන්ධයෙන් පාසල් ප්‍රජාව දැනුවත් කිරීම.

- සෑම පාසලක ම පාසල් හදිසි පරිගණක ප්‍රතිචාර සංසදය (School Level Internet Safety Readiness Team) 869be සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හා පුහුණු කරුවන් පුහුණු කිරීමේ කටයුතු අවසන් කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශය තුළ පරිගණක සුරක්ෂිතතා හා සිද්ධි ප්‍රතිචාර සංසදයක් (EDUCSIRT) පිහිටුවීම සඳහා වන මූලික කාර්යයන් ආරම්භ කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග සර්වෝදය - පියුෂන් ආයතනය හා එක්ව IT යහමග වැඩසටහන යටතේ ධනාත්මක, සදාචාරාත්මක හා කාර්යයක්ෂම අන්තර්ජාල හා සමාජ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් පාසල් විදුහල්පතිවරුන්, තොරතුරු තාක්ෂණ ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

♦ අ.පො.ස (උසස් පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයක් ලෙස උගන්වන පාසල් 1000කට සුහුරු පුවරු ලබා දීමේ ව්‍යාපෘතියේ ගුරු පුහුණුව සිදුකිරීම.

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිපාදන යටතේ අ.පො.ස (උසස් පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස උගන්වන පාසල් 1000කට සුහුරු පුවරු ලබා දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. එම පාසල්වල විදුහල්පතිවරුන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- ඩිජිටල් උපාංග ප්‍රශස්ත භාවිතය හා නඩත්තුව පිළිබඳ පුහුණුව සඳහා පුහුණු අත්පොත සැකසීම හා ඒ සඳහා ගුරු භවතුන් පුහුණු කිරීම.

- සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල්කරණයට ලක්කිරීම. පාසල්වල ගුරු හිඟය සහ සම්පත් ප්‍රශස්ත උපයෝජනය සුහුරු පුවරු ආශ්‍රිත ව මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේද යොදා ගැනීම.
  - මේ සඳහා ශක්‍යතා අධ්‍යයනය සිදුකර එම ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව එකඟතාව සඳහා ශ්‍රී ලංකාව සහ චීන රජය අතර අධාර ගිවිසුම් අත්සන් කර ඇත.
  - පාසල් 500 සඳහා සම්ප්‍රේෂණ සුහුරු පුවරු 100ක් හා ප්‍රතිග්‍රහණ සුහුරු පුවරු 900ක්ද අධ්‍යාපන අමාත්‍යාංශයට සියලු ම පහසුකම් සහිත චිත්‍රාගාරයක් (Studio) ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයක් (Data Centre) සහ සම්මන්ත්‍රණ ශාලාවක් ද සකස් කිරීමට යෝජිත ය. (මේ සඳහා අපේක්ෂිත වියදම ඩොලර් මිලියන 20)
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ව ගුරුභවතුන් පුහුණු කිරීම.
  - ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයට ලක් කිරීමේ පුහුණු වැඩමුළුව යටතේ ශ්‍රී ජයවර්ධනපුර කලාපයේ තෝරා ගන්නා ලද තොරතුරු තාක්ෂණ නොවන ගුරු භවතුන් 100ක් සඳහා ඩිජිටල් උපාංග ප්‍රශස්ත භාවිතය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දී ඇත.
  - තොරතුරු තාක්ෂණ විෂය නංවාලීම සඳහා වන සාකච්ඡා හා වැඩසටහන් පැවැත්වීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ක්‍රමවේද බද්ධ කිරීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
  - ඒ සඳහා "Commonwealth Educational Media Center for Asia ආයතනයේ සම්පත් පුද්ගල දායකත්වයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ක්‍රමවේද බද්ධ කිරීම සඳහා වන තෙදින පුහුණු වැඩමුළුව පැවැත්වීම.

<u>දත්ත කළමනාකරණය හා තොරතුරු පද්ධති ප්‍රවර්ධනය</u>

- දැනට පවතින ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ ඇති ගුරු මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීමට අදාළව කලාප අධ්‍යාපන කාර්යාලවල විෂයය භාර නිලධාරීන් සඳහා නව දත්ත ඇතුළත් කිරීම සහ දත්ත යාවත්කාලීන කිරීම පිළිබඳ මාර්ගගත ව පුහුණුව (ඉල්ලීම් මත) ලබාදීම.

• දැනට පවතින ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ ඇති ගුරු මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS Teacher HRM) වෙතින් තථ්‍ය කාලීන දත්ත ලබා ගැනීම සඳහා API (Application Program Interface) සංවර්ධනය කර ඇති අතර API (Application Program Interface ) හරහා එම ගුරු මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS Teacher HRM) සම්බන්ධ කරමින් ජාතික පාසල් ගුරු මාරු තොරතුරු පද්ධතිය සම්පූර්ණයෙන් ම සංවර්ධනය කර ඇත. තව ද, මාර්ගගත ව ගුරු ස්ථාන මාරු නිර්දේශ කිරීමට පාසල් විදුහල්පතිවරුන්ට වෙන ම පිවිසුම් ලබා දෙන ලදී.

• ජාතික පාසල් ගුරු ස්ථාන මාරු තොරතුරු පද්ධතිය ස්වයංක්‍රියකරණය සංවර්ධනය කර, පරීක්ෂා කර සම්පූර්ණයෙන් නිම කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු ස්ථාන මාරු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කරන ලද ඉල්ලීම අනුව සකස් කරන ලද මාර්ගගත ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අභියාචනා ක්‍රියාවලිය සඳහා තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම ආරම්භ කර ඇති අතර මෙතෙක් පැවති ජාතික පාසල් ගුරු ස්ථානමාරු (NSTT) ක්‍රමයේ වැඩිදියුණු කිරීමක් ලෙස මෙම අභියාචනා ක්‍රියාවලිය සඳහා වන තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම සිදුකිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව එම ගුරු ස්ථාන මාරු අභියාචනා ක්‍රියාවලිය සඳහා වන මාර්ගගත තොරතුරු පද්ධතිය 2024.12.31 දින වන විට සම්පූර්ණයෙන් සංවර්ධනය කර ක්‍රියාත්මක වේ.

- ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ ඇති ගුරු මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS Teacher HRM) යාවත්කාලීන කිරීමට අදාළ ව ගම්පොළ කලාප අධ්‍යාපන කාර්යාලයේ විෂයය භාර නිලධාරීන් සඳහා මාර්ගගත ලෙස පරිශීලක පුහුණුව ලබා දෙන ලදී. (එම කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සිදුකරන ලද ඉල්ලීම පරිදි) මීට අමතර ව, එම තොරතුරු පද්ධතියට අදාළ ව දත්ත යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා බස්නාහිර, දකුණ, මධ්‍යම, වයඹ සහ උතුර යන පළාත්වල සියලු කලාප ආවරණය වන පරිදි, මාර්ගගත රැස්වීම් ආකාරයෙන් පවත්වන ලදි. තව ද, බස්නාහිර, වයඹ හා දකුණ යන පළාත්වල සියලු ම අධ්‍යාපන කලාප ආවරණය වන පරිදි, විෂය භාර නිලධාරීන් සඳහා ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියට අදාළව පරිශීලක පුහුණුව (User training) ලබා දෙන ලදී.
- දත්ත නිලධාරීන්ගේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) සහ දත්ත නිලධාරීන්ගේ නියාමන රාමුව (Monitoring framework) සඳහා වැඩි දියුණු කළ පුහුණු මොඩියුල සකස් කිරීම
- පාසල්, කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමින් දත්ත නිලධාරීන් පුහුණු කිරීම සඳහා වන ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ (LMS) පුහුණු මොඩියුල ව්‍යුහය සහ දත්ත නිලධාරීන් සඳහා පැවැත්වීමට සැලසුම් කර ඇති අභිප්‍රේරණ වැඩසටහනේ කෙටුම්පත සකස් කිරීම 2024.06.30 දින වන විට අවසන්

- dot.moe.gov.lk වසම යටතේ සත්කාරකත්වය දරන පවතින දත්ත නිලධාරී වෙබ් අඩවිය දත්ත නිලධාරී ස්වයං ලියාපදිංචි කිරීමේ පෝරමය (Data Officer self-registration form), පරිශීලක පිවිසුම (User login) වැනි අතිරේක වැඩිදියුණු කිරීම් ඇතුළත් කරමින් නවීකරණය කර ඇත. තව ද, වාර්තා බැලීම සඳහා පරිශීලක අතුරු මුහුණත සහ විමසීම් ග්‍රහණය කර ගැනීමට ගතික "අප අමතන්න" පෝරමය ("Contact us" form). ඇතුළත් කරන ලදී.
- පාසල්, කොට්ඨාස, කලාප සහ පළාත් මට්ටමින් දත්ත නිලධාරීන් පුහුණු කිරීමට අවශ්‍ය ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ වැඩි දියුණු කළ සිංහල සහ දෙමළ මාධ්‍ය වීඩියෝ පුහුණු මොඩියුල සකස් කිරීම සහ සංස්කරණය කිරීම සම්බන්ධයෙන් අටුළුගම ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ දී, සබරගමුව පළාත් අධ්‍යාපන කාර්යාල ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ දී සහ දකුණු පළාත් තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථානයේ (ITDLH) හි දී අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන්ගේ, පළාත් අධ්‍යාපන නිලධාරීන්ගේ සහ පාසල් තොරතුරු තාක්ෂණ ගුරුවරුන්ගේ සම්පත්දායකත්වයෙන් සහ දත්ත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වැඩමුළු පැවැත්විණි.
- "Establishment of Sri Lanka Education Information Management System and capacity building for data officers 2026 - 2030"යන මැයෙන් යුතු නිල සංවර්ධන ව්‍යාපෘතියේ අධීක්ෂණ සහ ශක්‍යතා අධ්‍යයනයට අදාළ ව පූර්ව නිරීක්ෂණ කටයුතු සිදුකරන ලද අතර ඊට සමගාමී ව ඌව පළාතට අදාළ පාසල්, කොට්ඨාස, කලාප, සහ පළාත් මට්ටමේ දත්ත නිලධාරීන් ප්‍රායෝගිකව දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී. **2024.11.26** සහ **2024.11.27** යන දිනයන්හි ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පිංගරාව දෙමළ විද්‍යාලය, බල්ලකැටුව සුගත මහා විද්‍යාලය, උඩුවැලිවිට්ටතලාව මහා විද්‍යාලය, බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලය, තණමල්විල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය ආවරණය කරමින් මෙම වැඩමුළු පවත්වන ලදී.
- දත්ත නිලධාරීන් පත්කිරීම සම්බන්ධ අධීක්ෂණ කටයුතු සහ **"Establishment of Sri Lanka Education Information Management System and capacity building for data officers 2026 - 2030"** මැයෙන් යුතු නිල සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් **KOICA** සහ **KEDI** ආයතන නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් **2024.12.03** සිට **2024.12.13** දින දක්වා ලංකාවේ රැඳී සිටිමින් ඊට අදාළ මූලික අධීක්ෂණය සහ ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම

## දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධනය

- ජාතික මට්ටමේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථාන සඳහා (ICT Hub) අදාළ උපදේශන සේවා ආයතනය තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදනයට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇත.
- රුපියල් මිලියන 260ක වියදමින් පාසල් 3000ක් සඳහා e-තක්සලාව ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතියේ සේවා පහසුකම් සැපයීම සඳහා සර්වර් ලබාගැනීම සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ වේදිකා පහසුකම් සනාථ කිරීම.
- තක්සලාව සහ නැණස අන්තර්ගත සංවර්ධනය සහ තාක්ෂණික කණ්ඩායම සහ විද්‍යුත් අන්තර්ගත සංවර්ධන විෂයය මාලාව සඳහා ධාරිතා සංවර්ධනය කිරීම.
  - 2022 අ.පො.ස. උසස් පෙළ හා 2023 අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රශ්නපත්‍ර මාර්ගගත ප්‍රශ්නපත්‍ර ලෙස සකස් කර 164ක් ඇතුළත් කිරීම. Java Script අන්තර්ගතයන් 98ක් සකස් කිරීම.
- පාසල් පද්ධතිය තුළ දුරස්ථ හා ඩිජිටල් අධ්‍යාපනය සඳහා දක්ෂ ගුරු සම්පත් කණ්ඩායමක් පිහිටුවීම
  - මේ යටතේ ගුරුවරුන් 108ක් පුහුණු කර ඇත.
- ගුරු ඩිජිටල් නිපුණතා විෂයය මාලාවේ ප්‍රධාන පුහුණුකරුවන් 500 සඳහා මට්ටම් තුනම සම්පූර්ණ කිරීම
  - මේ යටතේ ගුරුවරුන් 400ක් පුහුණු මට්ටම් තුන ම සම්පූර්ණ කර ඇත.

## ඩිජිටල් අධ්‍යාපනය සහ යටිතල පහසුකම් සංවර්ධනය

- පළාත් පාසල්වල ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන පැවැත්වීම.
- ජාතික පාසල් වල ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන පැවැත්වීම.
- පාසල් සඳහා ලබාදී ඇති ෆයිබර් අන්තර්ජාල බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම.
- Establish Network Monitoring System පැවැත්වීම.

**වෙනස් වන ලෝකයට ගැළපෙන පුරවැසියන් නිර්මාණය උදෙසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ**

<u>අධ්‍යාපන ප්‍රතිසංස්කරණ</u>

- 2024 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් ඉල්ලුම් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වෙන් වී නොතිබූ අතර, වර්ෂයේ මුල් කාර්තු තුළ, මූල්‍ය ප්‍රතිපාදන භාවිතයකින් තොර ව, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අදාළ කාර්යයන් කිහිපයක් පමණක් සිදු කරන ලද අතර, ද්විතියික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන (SESIP) වෙතින් රු.මිලියන 9ක ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2024.07.05 දිනැති ව සංශෝධනය කරන ලදි. එම සැලැස්ම සඳහා 2024.07.07 දිනැති ව අනුමැතිය ලැබී ඇත.
- එබැවින්, 2024 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් නියමිත කාල වකවානු තුළ, නියමිත මූල්‍ය ප්‍රතිපාදන දරමින් සිදු කිරීමේ අවස්ථාවක් නොලද අතර, ද්විතියික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන (SESIP) වෙතින් රු.මිලියන 9ක ප්‍රතිපාදන ලබා දීමත් සමඟ ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් තෝරා ගත් ක්‍රියාකාරකම් කිහිපයක් පමණක් සිදු කරන ලදි.
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ශාඛාව විසින්,2024.10.21 දිනැති ව SESIP වැඩසටහන් ප්‍රධානීගෙන් කරන ලද ඉල්ලීම ප්‍රකාර ව, ඔවුන් විසින් 2024.11.28 දින ශාඛාව සතු ප්‍රතිපාදනවලින් රු.මි.3.72 ක් පවරා ගෙන ඇති අතර,ඒ අනුව, වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2024.12.26 දිනැති ව දෙවන වරට ද සංශෝධනය කරන ලදි.

- මූල්‍ය ප්‍රතිපාදන භාවිතයකින් තොරව කරන ලද වැඩසටහන්

  - ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF) මගින් උපදෙස් දී ඇති පරිදි, 2024 වර්ෂය සඳහා අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) සඳහා සම්පූර්ණ කිරීමේ සහතිකයක් ලබාදීමට මූලික පියවර ගෙන ඇත. සහතිකයේ ආකෘතිය සඳහා මූලික එකඟතාව ලබා ගෙන ඇති අතර මුද්‍රණය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩිදුර සාකච්ඡා සිදු වෙමින් පවතී.

- පාසල් නියමු ව්‍යාපෘතියට අදාළ ව පහත සඳහන් පුහුණු සැසි ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සම්බන්ධීකරණය වෙමින් සිදු කරන ලදී.

  ගුරු පුහුණු වැඩසටහන - නියමු වැඩසටහනට අදාළ ද්විතීයික පාසල් ගුරුවරුන් සඳහා 1 වන අදියර
  ගුරු පුහුණු වැඩසටහන- නියමු වැඩසටහනට අදාළ ද්විතීයික පාසල් ගුරුවරුන් සඳහා 2 වන අදියර
  ගුරු පුහුණු වැඩසටහන - ද්විතියික පාසල් ගුරුවරුන් සඳහා 3වන අදියර.

අධ්‍යාපනික ඉගෙනුම් ක්‍රියාවලිය සහ නියමු වැඩසටහනේ අධීක්ෂණ ක්‍රියාපටිපාටිය පිළිබඳ නියමු පාසල්

- සාමාන්‍ය අධ්‍යාපනය වෘත්තීය අධ්‍යාපනය සමඟ සම්බන්ධ කිරීම සඳහා නිපුණතා අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සාකච්ඡා දෙකක් පැවැත්වීම.
- උසස් පෙළ විෂය මාලාව උසස් අධ්‍යාපනය සමඟ සම්බන්ධ කිරීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.
- පිරිවෙන් අධ්‍යාපනය සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සම්බන්ධයෙන් පිරිවෙන් අංශය සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.
- අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සහ සටහන් දෙකක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීම.

♦ ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) විශේෂ අනුමැතියක් සහිත ව ප්‍රතිපාදන ලබා ගන්නා ලද ,

- අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, විභාග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අනුබද්ධ ආයතනවල විධායක නිලධාරීන් සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF) හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයෙ හි සැලසුම් ශාඛාවේ නිලධාරීන් සහ පළාත් සැලසුම් නිලධාරීන් සමඟ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ සම්බන්ධ වැඩසටහනක් පැවැත්වීම.

SESIP වෙතින් රු.මිලියන 9 ක ප්‍රතිපාදන ලබා ගැනීමෙන් පසු ක්‍රියාත්මක කළ වැඩසටහන්

- විෂයමාලා ප්‍රතිසංස්කරණ පිළිබඳ ව පළාත් අධ්‍යාපන නිලධාරීන් දැනුම්වත් කිරීමේ නේවාසික වැඩමුළුවක් පැවැත්වීම.
- ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් යෝජිත විෂයමාලා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.
- නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් සමඟ වැඩසටහනක් පැවැත්වීම(අධ්‍යාපන අමාත්‍යාංශය,ජාතික අධ්‍යාපන ආයතනය,අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව).
- පාසල් මණ්ඩල සඳහා නැවත සිතියම්ගත කිරීම පිළිබඳ වැඩමුළුවක් පළාත් නිලධාරීන් සමඟ පැවැත්වීම.
- නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීමේ දිශානතිය සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීමේ තෙදින නේවාසික වැඩමුළුවක් පැවැත්වීම.
- ජාත්‍යන්තර පාසල් සහ අනෙකුත් පෞද්ගලික පාසල් සඳහා තත්ත්ව සහතික කිරීමේ රාමුව හඳුන්වා දීමේ වැඩටහනක් පැවැත්වීම.
- පවතින අධ්‍යාපන ක්‍රමය පරිවර්තනීය වෙනසකට ලක් කිරීම සඳහා උපායමාර්ග සකස් කිරීම සඳහා වන වැඩමුළුවක් පැවැත්වීම.

**විෂය සමගාමී, මාර්ගෝපදේශ, උපදේශන හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධනය**

**<u>ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය ප්‍රවර්ධනය</u>**

- **පාසල් ශාරීරික සුවතා ව්‍යායාම යාවත් කාලීන කිරීම හා තාක්ෂණික ක්‍රම හඳුන්වාදීමේ වැඩමුළුව, පවත්වන ලද වැඩමුළු හා වැඩසටහන්.**
- **එල්ලේ ක්‍රීඩාවේ පුහුණුකරුවන් හා විනිසුරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.**
- **ක්‍රීඩා පාසල් විදුහල්පතිවරුන් හා ක්‍රීඩා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන ශාරීරික සුවතා ව්‍යායාම වැඩසටහන බර ඉසිලීමේ ක්‍රීඩාවේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව පවත්වන ලදී.**
- **බැඩ්මින්ටන් විනිසුරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.**
- **2024 වර්ෂයේ සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියේ මූලික තරග පැවැත්වීම සඳහා අවශ්‍ය වියදම් පළාත් සඳහා වෙන් කිරීම.**
- **පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරුන් සමඟ පවත්වන ලද සමස්ත ලංකා පාසල් ක්‍රීඩා චක්‍රලේඛය යාවත්කාලීන කිරීමේ වැඩමුළුව.**
- **2024 වර්ෂයේ සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියේ පූර්ව සංවිධාන ඉන්ධන වියදම් සඳහා වෙන් කරන ලදී.**
- **2023 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා එල්ලේ තරග විනිසුරුවන්ට හා නිලධාරීන්ට පහසුකම් සපයන ලද ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානයට මුදල් ගෙවීමට ප්‍රතිපාදන වෙන් කරන ලදී.**
- **සමස්ත ලංකා කණ්ඩායම් තරග තාක්ෂණික නිලධාරීන් දැනුවත් කිරීමේ රැස්වීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී.**
- **සමස්ත ලංකා පාසල් ක්‍රීඩා 2024 සම්බන්ධව පවත්වන රැස්වීම සඳහා ප්‍රතිපාදන සපයන ලදී.**

**<u>විෂය සමගාමී ක්‍රියාකාරකම්, මාර්ගෝපදේශනය හා උපදේශනය</u>**

- **ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය වෙත ගුරු හා සිසු පුහුණු සඳහා ප්‍රතිපාදන ලබා දීම.**
  - **දිවයිනේ පළාත් 9 ම ආවරණය වන ලෙස ගුරු හා සිසු පුහුණු වැඩසටහන් පවත්වා ඇත.**
- **ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය වෙත ගුරු හා සිසු පුහුණු සඳහා ප්‍රතිපාදන ලබා දීම.**

- තෝරාගත් පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා මෘදු කුසලතා සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

  • පාසල්වලින් ඉදිරිපත් වූ ඉල්ලීම් අනුව ශිෂ්‍ය නායකයින් 450ක් සඳහා වැඩසටහන් පවත්වා ඇත.

- ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන - 2023 පැවැත්වීම හා ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයින් සඳහා නායකත්ව පුහුණුවක් ක්‍රියාත්මක කිරීම.

  • 2023 වර්ෂය සඳහා ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන පවත්වා ඇත.

- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව හා ඒකාබද්ධව පාසල් මාර්ග ආරක්ෂණ පදක්කම් වැඩසටහන හඳුන්වා දීම හා පාසල් මාර්ග ආරක්ෂණ සමාජ පිහිටුවීම පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කිරීම.

  • දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් පවත්වා ඇත.

- පාසල් ශිෂ්‍ය නායකයින් පත් කරගැනීමේ ක්‍රමවේදය පිළිබඳව චක්‍රලේඛයක් හා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.

  • 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය පාසල් වෙත නිකුත් කර ඇත. මුද්‍රණය සඳහා ඉදිරිපත් කර ඇත.

- පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම් විධිමත් කරලීම සඳහා චක්‍රලේඛයක් හා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම

  • චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය පාසල් වෙත නිකුත් කර ඇත.

- ආපදා කළමනාකරණය පිළිබඳ පළාත්, කලාප නිලධාරීන්ට පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පළාත් 09 වෙත ප්‍රතිපාදන ලබාදීම.

  • දිවයිනේ පළාත් 9ම ආවරණය වන ලෙස නිලධාරීන් දැනුවත්කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

- වෘත්තීය මාර්ගෝපදේශය සැපයීම හා සහාය සේවාවන් හඳුන්වා දීමේ අරමුණින් අදාළ සියලු ආයතන සම්බන්ධීකරණය කරගනිමින් පාසල් සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන් ඉලක්ක කරගෙන වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රදර්ශනයක් පැවැත්වීම.

  • එක් වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රදර්ශනයක් පවත්වා ඇත.

- පාසල් පද්ධතිය තුළ භාවිත කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයෙන් හඳුන්වා දී ඇති වෘත්තීය පරීක්ෂණ 5 පිළිබඳ ව සියලු ම පළාත්වල වෘත්තීය මාර්ගෝපදේශ ගුරුවරුන් දැනුවත් කිරීම.

• පහත වෘත්තීය පරීක්ෂණ පිළිබඳව උතුරු පළාත හැර අනෙකුත් සියලුම පළාත්වල ගුරුවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.(වෘත්තීය ළැදියා පරීක්ෂණය, බහුවිධ බුද්ධි පරීක්ෂණය, ළැදියා හා හැකියා පරීක්ෂණය, ළැදියා හැකියා හා පෞරුෂ තක්සේරු පරීක්ෂණය, වෘත්තීය ක්ෂේත්‍ර 16 හඳුනා ගැනීම)

- අ.පො.ස. සාමාන්‍ය පෙළ අවසන් කළ සියලු සිසුන් සඳහා උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ වන මාර්ගෝපදේශය සකස් කිරීම (Bright Future - පැහැබර අනාගතයක්")

  • Bright Future - පැහැබර අනාගතයක් මාර්ගෝපදේශ සංග්‍රහය සියලු පළාත් නිලධාරීන් වෙත යොමු කර ඇත. දැනුවත් කිරීමේ වැඩසටහන් 2025 වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම් කර ඇත.

- ශිෂ්‍ය උපදේශනය සම්බන්ධයෙන් පළාත් / කලාප නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

  • ඌව, බස්නාහිර, වයඹ පළාත්වල නිලධාරීන් 60ක් සඳහා පවත්වා අවසන් කර ඇත.

- ශිෂ්‍ය උපදේශනය හා වෘත්තීය මාර්ගෝපදේශ ඒකක කළමනාකරණය පිළිබඳ අත්පොතක් සහ ශිෂ්‍ය උපදේශනය පිළිබඳ ගුරු අත්පොතක් සකස් කිරීම හා ප්‍රගති සමාලෝචනය.

  • නැගෙනහිර, බස්නාහිර, දකුණ, මධ්‍යම හා සබරගමු පළාත්වල පළාත්/කලාප විෂය නිලධාරීන්, පළාත් මනෝ සමාජීය සහකාර මධ්‍යස්ථාන කළමනාකරුවන් දැනුවත් කර ඇති අතර, නියමු ව්‍යාපෘතිය සඳහා තෝරාගත් පාසල් 50 විදුහල්පතිවරුන් හා ගුරුවරුන් 100 දෙනෙක් පුහුණු කර අවසන් කර ඇත.

- මනෝ විද්‍යාත්මක ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ පළාත් 9 ම ආවරණය වන පරිදි විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

  • පළාත් 09 ම ආවරණය වන පරිදි වැඩසටහන් 11ක් (භාෂා ද්විත්වයෙන්ම) පවත්වා ඇති අතර, විදුහල්පතිවරුන් හා ගුරුවරුන් 550ක් දැනුවත් කර ඇත.

<u>සෞඛ්‍යය හා පෝෂණය</u>

- පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ වැඩසටහන, සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහන, ප්‍රජනන සෞඛ්‍යය වැඩසටහන (UNFPA) , සෞඛ්‍යය ප්‍රවර්ධන (GEMP) වැඩසටහන සහ පාසල් සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

**ප්‍රාථමික අධ්‍යාපනය ප්‍රවර්ධනය**

- ගෙවත්තයි - පෝෂණයයි වැඩසටහනේ මාර්ගෝපදේශය සකස් කර එය තෝරාගත් පාසල්වල නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම.
- ළමා මිතුරු පාසල් සංකල්පය යටතේ තෝරාගත් පාසල්වල විදුහල්පතිවරුන් 400කගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- ජාතික පාසල්වල ප්‍රාථමික අංශය සඳහා ගුණාත්මක යෙදවුම් ලබා දීම.
- තෝරාගත් ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සඳහා 1 වර්ගයේ සහ 2 වර්ගයේ ඩෙස්ක්/ පුටු, සහ ගුරු පුටු සැපයීම.
- ප්‍රාථමික අධ්‍යාපන විෂය භාර නියෝජ්‍ය, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රාථමික අංශවල අන්තර්කරණ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා ප්‍රාථමික අධ්‍යාපන නියෝජ්‍ය හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ගුරු උපදේශකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රාථමික අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතක පාසල්වල විදුහල්පතිවරුන් නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරුන්/ අංශ ප්‍රධානීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- "2023 වසරේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ අයිතම විශ්ලේෂණය පිළිබඳ පළාත් ප්‍රාථමික නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් වීම.
- පළාත් ප්‍රාථමික නියෝජ්‍ය සහකාර අධ්‍යාපන අධ්‍යකවරුන් සමග ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- ජාතික පාසල්වල ප්‍රාථමික අංශයේ ගොඩනැගිලි අලුත් වැඩියා කිරීම හා නව ගොඩනැගිලි ඉදිකිරීම.
- තෝරාගත් ප්‍රාථමික පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීම.
  ප්‍රාථමික පාසල්වල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම.
- ප්‍රාථමික පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම.
- ප්‍රාථමික සිසුන්ගේ මූලික භාෂා සහ ගණිත කුසලතා මත පදනම් වූ ඉගෙනුම් ප්‍රතිකාර්ය වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2024
- පළාත්වල සම්පත් පුද්ගල කණ්ඩායම් සඳහා බහුතල ඉගෙනුම් ක්‍රමවේදය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

**ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන**

<u>සැමට අධ්‍යාපනය</u>

- **තිරසර සංවර්ධන දර්ශක අංක 4.1.1 වෙත ළඟා වීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ගෝලීය නිපුණතා රාමුව අනුව සකස් කළ 3 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ සාක්ෂරතා හා ගණිත හැකියා ඇගයීම ජාතික මට්ටමින් පැවැත්වීම.**

  • **තෙවන ශ්‍රේණිය සාක්ෂරතා හා ගණිත හැකියා ජාතික ඇගයීම සියලු පාසල්වල පාසල්වල ක්‍රියාත්මක කිරීම දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම.**

- **ශ්‍රී ලංකාවට සුවිශේෂ තිරසර සංවර්ධන දර්ශක 13කට අදාළ සන්ධිස්ථාන අගයන් තීරණය කිරීම සහ දත්ත වාර්තාකරණය සිදු කරන ලදී.**

  • **අදාළ දර්ශක අගයන් හා සන්ධිස්ථාන අගයන් ගණනය කර අදාළ පාර්ශ්ව වෙත දත්ත වාර්තා කර ඇත.**

- **2021 වර්ෂයේ පවත්වන ලද තෙවන ශ්‍රේණිය සාක්ෂරතා හා ගණිත හැකියා ඇගයීම් වාර්තාව මුද්‍රණය කර ඇත.**

  • **සිංහල දෙමළ ඉංග්‍රීසි භාෂා තුනෙන් ම පිටපත් 1900ක් මුද්‍රණය කර අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ශාඛා, පළාත් අධ්‍යාපන දෙපාර්තමෙන්තු යන සියලු කලාප අධ්‍යාපන කාර්යාල වෙත බෙදා හැර ඇත.**

- **අ.පො.ස. (උ.පෙ) වෘත්තිය විෂය ධාරාව ක්‍රියාත්මක පාසල් සඳහා පාසල් පාදක මූල්‍ය ප්‍රදාන ලබා දීම සිදු කර ඇත.**

  • **2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළව වෘත්තීය විෂයධාරාව සඳහා අනුමත ක්‍රියාත්මක කිරීමේ සැලසුම අප වෙත එවන ලද පාසල් 26කට රු. 150000ක බැගින් මූල්‍ය ප්‍රදාන ලබා දී ඇත.**

- **සිසුන් සඳහා පැමිණීම පදනම් කරගත් සිසු දීමනා ලබා දීම සිදු කර ඇත.**

  • **උසස් පෙළ වෘත්තීය පුහුණු පාඨමාලා වෙත බඳවා ගත් සිසුන්ගේ පැමිණීම පිළිබඳ දත්ත ලබා ගැනීමට අදාළ Google දත්ත පත්‍රය පාසල් වෙත යොමු කිරීම.**

  • **පුහුණු පාඨමාලා සඳහා සහභාගිත්වය පිළිබඳව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ සිසුන් 1713 ක් සඳහා පැමිණීම පදනම් කර ගත් දෛනික සිසු දීමනාව ගෙවා අවසන් කිරීම.**

- **2023 වර්ෂයේ උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවට ඇතුළත් වූ සිසුන් 10099ක් වෘත්තීය පුහුණු ආයතන 18 වෙත යොමු කර ඇත.**

- ♦ වෘත්තීය පුහුණුව සඳහා යොමු කර ඇති සිසුන්ගේ පාඨමාලා ගාස්තු ගෙවීම සිදු කර ඇත.
  - වෘත්තීය පුහුණු ආයතන 13ක් වෙත අදාළ කාර්තු සඳහා පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කර ඇත.
- ♦ වෘත්තීය පුහුණු ආයතන වෘත්තීය විෂය ධාරාවේ සිසුන් යොමු කළ හැකි ආයතන සංඛ්‍යාව පුළුල් කිරීම කර ඇත.
  - වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම සම්බන්ධ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇත.
  - නව ආයතන තෝරා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා 4ක් පවත්වා ඇත.
  - ආබාධ සහිත සිසුන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෙනිවැල්කොළ ශිෂ්‍යෝදා පුහුණු මධ්‍යස්ථානය තුළ පහසුකම් සංවර්ධනය කර පාඨමාලා අවශ්‍යතා ලබා දී වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරීම
- ♦ පාසල් සහ ආයතන අධීක්ෂණය සිදු කර ඇත.
  - පාසල් 28ක හා ආයතන 26ක අධීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

<u>මානව සම්පත් සංවර්ධනය</u>

- ♦ අමාත්‍යාංශයේ අනෙකුත් ආයතන සහ ජාතික පාසල්වල නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන වැඩසටහන් පවත්වා ඇත.
- ♦ දේශීය සහ අනුමත විදේශීය ශිෂ්‍යත්ව සහිත ව පශ්චාත් උපාධි හදාරන නිලධාරීන් සඳහා මූල්‍ය දායකත්වයක් ලබා දී ඇත.
- ♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II වන ශ්‍රේණිය සිට I ශ්‍රේණිය දක්වා, III ශ්‍රේණියේ සිට II ශ්‍රේණිය දක්වා සහ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණිය දක්වා සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණිය දක්වා සහ ගුරු අධ්‍යාපනඥ සේවයේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා උසස්වීමට නියමිත නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සම්පූර්ණ කර ඇත.
- ♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විවෘත සහ විශේෂ ශ්‍රේණියේ ගුරු අධ්‍යාපනඥ සේවයේ සීමිත සහ ශ්‍රී ලංකා විදුහල්පති ශ්‍රේණියේ දිශාභිමුඛ වැඩසටහන් පවත්වා ඇත.
- ♦ කාර්ය මණ්ඩල පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

## ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව

- GEM ව්‍යාපෘතිය යටතේ පාසල් 500ක් ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් ප්‍රතිඵල සංවර්ධන ඉලක්ක සපුරා ඇත.
- පාසල් 500ක ගණිතය ඉගෙනුම් ප්‍රතිඵල සංවර්ධන ඉලක්ක සපුරා ඇත.
- 10,11 ශ්‍රේණි ඉංග්‍රීසි භාෂා සහ 2 සහ 3 ශ්‍රේණිය ගණිතය ඩිජිටල් ඉගෙනුම් ද්‍රව්‍ය පාසල් වෙත ලබා දී ඇත.
- 3 සහ 5 ශ්‍රේණි ඉංග්‍රීසි භාෂා සහ 4 සහ 5 ශ්‍රේණිය ගණිතය ඩිජිටල් ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධන ආරම්භ කර ඇත.
- අධ්‍යාපන කලාප 75%ක පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ඉලක්ක සම්පූර්ණ කර ඇත.
- පාසල් 3000ක අභ්‍යන්තර හා බාහිර ප්‍රජා පාදක පාසල් ගුණාත්මක තහවුරුව සම්පූර්ණ කර ඇත.
- අධ්‍යාපන කලාප 75%ක පාසල් නගා සිටුවීම බලගැන්වීමේ වැඩසටහනේ ප්‍රතිඵල අත්කර ගෙන ඇත.

## නියාමන හා කාර්යසාධන සමාලෝචනය

- නියාමන හා ඇගයීම් රාමුවේ හඳුනා ගත් දර්ශක සකස් කිරීම/ගණනය කිරීම සහ සැලසුම් ක්‍රියාවලිය සඳහා එහි භාවිතය පිළිබඳ තාක්ෂණික වැඩ සැසියක් පැවැත්වීම
- නියාමන හා ඇගයීම් රාමුව මත පළාත් 09 නිලධාරීන් සඳහා මාර්ගගත සැසි පැවැත්වීම
- NEMIS මත පදනම් ව නියාමන ආකෘති සකස් කර පරිශීලක මාර්ගෝපදේශය සංශෝධනය කිරීම
- වාර්ෂික කාර්යසාධන වාර්තාව හා අයවැය ප්‍රගතිය සඳහා ඉදිරිපත් කරන ප්‍රගති වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අධ්‍යාපන සංවර්ධන කමිටු රැස්වීම් සහ අනෙකුත් රැස්වීම් පැවැත්වීම
- අධ්‍යාපන සංවර්ධනය සඳහා ක්‍රියාත්මක මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ව්‍යාපෘතිවල නියාමන සහ ඇගයීම් කටයුතු කිරීම.
- මධ්‍ය කාලීන හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම් නියාමනය තුළින් ඉදිරි අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම.

**<u>පර්යේෂණ හා සංවර්ධන ශාඛාව</u>**

- උපායමාර්ගික සැලසුම් වැඩ සැසි පැවැත්වීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ අනෙකුත් රැස්වීම් පැවැත්වීම
  - පළාත් මට්ටමින් සිදු කළ යුතු අධ්‍යාපන පර්යේෂණ සම්බන්ධයෙන් පළාත් පර්යේෂණ නිලධාරින් සමඟ උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සඳහා යෝජනා ලබා ගැනීම හා ජාතික මට්ටමින් සිදු කරනු ලබන කාර්යයන් පිළිබඳ දැනුම්වත් කිරීම.
- පර්යේෂණ යෝජනා, ලිපි හා අධ්‍යයන වාර්තා නියාමනය, සමාලෝචනය හා ඇගයීම
  - අධ්‍යාපන වෘත්තිකයින්ට සිය පර්යේෂණ අධ්‍යයන එළි දැක්වීමට අවස්ථා සැලසීම සඳහා අත්වැලක් සපයමින් පර්යේෂණ ලිපි සමාලෝචනය කිරීම හා අධ්‍යාපන පර්යාලෝක සඟරාව සඳහා ලැබුණු ලිපි 10ක් සමාලෝචනයට බඳුන් කිරීම.
- පුහුණුව සහ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම තුළින් අධ්‍යාපන පර්යේෂණවල නියුතු පාර්ශ්වකරුවන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම
  - පර්යේෂණ අධ්‍යයනවල අනාවරණ ප්‍රචලිත කිරීමේ මාධ්‍යයක් ලෙස පාසල් සිසු පර්යේෂණ කණ්ඩායම් භාර ගුරුභවතුන් පුහුණු කිරීමේ මාර්ගගත කාර්ය සැසි පැවැත්වීම.
  - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා ඒකාබද්ධව පර්යේෂකයින් සඳහා ශාස්ත්‍රීය ලේඛන කලාව පිළිබඳ දින 3ක සහතිකපත් පාඨමාලාවක් පැවැත්වීම .
- පර්යේෂණ සතිය / දින ක්‍රියාකාරකම් පැවැත්වීම
  - සාක්ෂ්‍ය පදනම් කර ගත් තීරණ ගැනීමේ සංස්කෘතියක් පාසල් පද්ධතිය තුළ නිර්මාණය කිරීම තුළින් දැනුමින් පිරි අනාගතයකට දැයේ පාසල් දරුවන් යොමු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන "සිසු පර්යේෂකයෝ" වැඩසටහනේ අවසාන වශයෙන් තේරී පත් වූ සිසු පර්යේෂණ කණ්ඩායම් ඇගයීමට ලක් කිරීම හා සිසු පර්යේෂණ සමුළුව (symposium) පැවැත්වීම.
  - 'පාසල් පර්යේෂණ සතිය'ට සමගාමී ව ප්‍රථම වතාවට 2024 පාසල් පර්යේෂණ දිනය ජාතික මට්ටමින් 2024.10.09 වැනි දින කොළඹ ආනන්ද විද්‍යාලයේදී පැවැත්වීම.
  - සිසු පර්යේෂණ යෝජනාවලි ඇගයීමේ කාර්ය සැසි පැවැත්වීම.
- පර්යේෂණ ක්ෂේත්‍ර තීරණය කිරීම සඳහා අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීමෙන් පර්යේෂණ ප්‍රමුඛතා හඳුනා ගැනීම
  - සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මක සංවර්ධනය උදෙසා අවශ්‍ය කාලීන වැදගත්කමින් යුතු පර්යේෂණ අධ්‍යයන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා පළාත් හා කලාප අධ්‍යාපන නිලධාරින් සමඟ බුද්ධිකලම්භන කාර්ය සැසි හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

• පර්යේෂණ අනාවරණ ප්‍රකාශන මගින් එළි දැක්වීම, බෙදා හැරීම, සම්මන්ත්‍රණ පැවැත්වීම හා පර්යේෂණ මත පදනම් ව අධ්‍යාපනික ද්‍රව්‍ය සංවර්ධනය කිරීම

• සිසු පර්යේෂණ අධ්‍යයනවල අනාවරණ එළි දැක්වීමට අවස්ථා සැලසීම සඳහා සිසු පර්යේෂණ ජර්නලය පිටපත් 1500ක් මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කිරීම.

• අධ්‍යාපන පර්යාලෝක සඟරාව වෙළුම 10 පිටපත් 2000ක් මුද්‍රණය කිරීම.

♦ අධ්‍යාපන පර්යේෂණ මාර්ගෝපදේශය භාෂා ත්‍රිත්වයෙන් සකස් කිරීම

• අධ්‍යාපන පර්යේෂණ මාර්ගෝපදේශය දේශීය සමාලෝචකයින් දෙදෙනෙකු ලවා සමාලෝචනය කරවා ගැනීම.

♦ මාර්ගෝපදේශය පිළිබඳ සහ ගුණාත්මක පර්යේෂණ පිළිබඳ තාක්ෂණික පුහුණු සැසි පැවැත්වීම

• නියාමන හා කාර්යසාධන ශාඛාව සමඟ එක් ව ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන නොවැම්බර් 20, 21 හා 22 යන තෙදින පැවැත්වූ අතර එහිදී ජාතික නියාමන හා ඇගයීම් රාමුව හා පළාත් නියාමන ඇගයීම් රාමුව හා ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් හා ඒ ආශ්‍රිත ව පළාත් මට්ටමින් සිදු කළ යුතු පර්යේෂණ අධ්‍යයන හඳුනා ගැනීම.

♦ SESIP වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම හා බාහිර ආයතන ලවා සිදු කර ගැනීම

• අධ්‍යයන 3ක් සිදු කිරීම සඳහා තෝරා ගෙන ඇති අතර ඉන් 2ක් බාහිර ආයතන ලවා සිදු කර ගැනීමට අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ මූලික පියවර ගැනීම සඳහා අදාළ ලංසු ලියවිලිවල ඇතුළත් කිරීම සඳහා වන සේවා කොන්දේසි අඩංගු පත්‍රිකාව සකසා අවසන් කර ඇත.

<u>විදේශ ආයතන හා විදේශ කටයුතු ශාඛාව</u>

♦ විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගත් නිලධාරින්ගේ තොරතුරු විදේශ සම්පත් දෙපාර්තමේතුව වෙත යැවීම.

• නාමයෝජනා 101ක් ඉදිරිපත් කර ඇත.

♦ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ හා අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් රාජ්‍ය අමාත්‍යවරුන්ගේ නිල විදේශ සංචාරය සම්බන්ධ කටයුතු කිරීම.

♦ අධ්‍යාපන අමාත්‍යාංශය හා එයට අයත් වන අනෙකුත් ආයතනවල නිලධාරින්ගේ රාජකාරි විදේශ සංචාර සම්බන්ධ කටයුතු කිරීම.

• නිලධාරින් 279ක් විදේශ සංචාර සඳහා සහභාගි වී ඇත.

- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයට ධනාත්මක ප්‍රතිලාභ සහතික කෙරෙන ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් සම්බන්ධ කටයුතු කිරීම.
- **Commonwealth Learning** සඳහා වාර්ෂික දායක ගාස්තු ගෙවීම **(USD 30000)**
- ජාත්‍යන්තර විශේෂඥයින්ට අධ්‍යාපනයට අදාළ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා නොමිලේ වීසා නිකුත් කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතනවලට විදේශීය ජාතිකයන් බඳවා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් පිළිබඳව විදේශ අමාත්‍යාංශයට / ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- අධ්‍යාපන/පාසල් සිසුන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම (සියලු ආධාර හා ව්‍යාපෘති සෘජුව ම එම ආධාර ලබා දෙන ආයතන විසින් පාසල් වෙත ලබා දෙන පරිදි සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු කරනු ලැබේ.)

## අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන

### ගණිත අධ්‍යාපනය ප්‍රවර්ධනය

- ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සැකසීම, සැලසුම් කිරීම සහ සමාලෝචනය.
- ගණිත අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම.
- ගුරුවරුන් 150ක් සඳහා ගණිතමය චින්තනය කුසලතා සංවර්ධනය කිරීම.
- සම්පත් පුද්ගලයින් 142ක් සඳහා ගණිත ප්‍රතිකාර්යය අධ්‍යාපන වැඩසටහන පවත්වන ලදී.
- ව්‍යාපෘතිය සඳහා තෝරාගත් පාසල් 500 හි 3-11 ශ්‍රේණිවල සිසුන්ගේ ජයග්‍රහණ මට්ටම් මැනීම.
- බස්නාහිර, සබරගමුව සහ දකුණ නියමු වැඩසටහන ක්‍රියාත්මක පාසල්හි 6 ශ්‍රේණි සිසුන් 540ක් සඳහා STEAM වැඩසටහන පවත්වන ලදී.
- NCOE ගුරු සිසුන් 200ක් සඳහා"විමසීම් මූලික වැඩසටහන්", "පෙර ඉගෙනුම් පන්තිකාමර වැඩසටහන්" සහ "ක්‍රියාකාරකම් පදනම් කරගත් ගණිත වැඩසටහන" පවත්වන ලදී.

- සංවර්ධනය මත පදනම් ව පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- සිසුන්ගේ උසස් මට්ටමේ චින්තන කුසලතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.
- ගුරුවරුන්ගේ උසස් මට්ටමේ චින්තන ප්‍රවේශයන් වර්ධනය කිරීම සඳ හා අවස්ථා ලබා දීම (ගුරුවරුන් 200කට)
- 'ගුරු සිසු නැණ පවුර' වැඩසටහන පවත්වන ලදී.
- ගණිත ගුරුවරුන් 386ක් සඳහා උසස් පෙළ ගණිතය (07) විෂයයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.
- 6 - 11 ශ්‍රේණි සිසුන් සඳහා 'නව්‍ය ඉගැන්වීම් ඉගෙනුම් භාවිතයන් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.
- 'තෝරා ගත් පාසල් 750 තුළ 'නවෝත්පාදන විද්‍යාගාර ක්‍රියාකාරකම්' වැඩසටහන පැවැත්වීම.
- අන්තර්ජාතික ඔලිම්පියාඩ් වැඩසටහන සහ සමස්ත ලංකා ගණිත තරගාවලිය පැවැත්වීම.
  - ජාතික ඔලිම්පියාඩ් තරගාවලිය (cat I,II,III) පවත්වන ලදී.

රන් - 9 රිදී - 19 ලෝකඩ - 29 කුසලතා සමත් - 143

ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරගය

ii) කාණ්ඩය

රිදී පදක්කම 1

ලෝකඩ පදක්කම් 2

කුසලතා 4

iii) කාණ්ඩය

කුසලතා කාණ්ඩය I 2

රිදී පදක්කම 1

ලෝකඩ පදක්කම් 10 ක්

- සමස්ත ලංකා ගණිත තරගාවලිය පැවැත්වීම

## විද්‍යාව අධ්‍යාපනය ප්‍රවර්ධනය

- තෝරා ගත් පාසල් 190ක් සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ ලබා දීම.
- විද්‍යා ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන 20ක් සඳහා රු.50,000 බැගින් වූ ප්‍රතිපාදන ලබා දීම.
- "STEAM student camp Star Gate" විද්‍යාව ප්‍රචලිත කිරීමේ ශිෂ්‍ය වැඩසටහන (ගුරුවරුන් සඳහා නියමු වැඩසටහනක් ලෙස) සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 08 වෙත රු. 2,75,000 බැගින් ප්‍රතිපාදන ලබා දීම.
- ක්ෂේත්‍ර මධ්‍යස්ථාන කළමනාකරුවන් 22ක් සඳහා පාරිසරික ක්‍රියා සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම.
- 6-11 විද්‍යා ගුරුවරුන් සඳහා පර්යේෂණ පාදක මිශ්‍ර හා සූතථ්‍ය ඉගෙනීම පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- රසායනාගාර සහායකයින්/ රසායනාගාර සේවකයින් 120 දෙනෙකුගේ ධාරිතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම.
- සියලු ම කලාප විද්‍යා අධ්‍යක්ෂවරුන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම.
- පෙර වසරේ වවුචර (2023 දී වගකීම්)
- 6-11 විද්‍යා ගුරුවරුන් සඳහා නව්‍ය ව්‍යවහාරයන් පිළිබඳ වැඩසටහන් පැවැත්වීම.
- "නැණ පවුර" සම්මන්ත්‍රණ මාලාව සඳහා ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා "නැණ පවුර" යටතේ A/L විද්‍යා ගුරුවරුන් පුහුණු කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර කනිෂ්ඨ විද්‍යා ඔලිම්පියාඩ් තරගය සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, සිසුන් තෝරා ගැනීම හා ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරග සඳහා සහභාගි වීම.
- තරුණ විද්‍යාඥයින්ගේ සමස්ත ලංකා තරගය පැවැත්වීම
- ජාත්‍යන්තර තරග සඳහා සහභාගි වීම

## ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය ප්‍රවර්ධනය

- RECS කාර්යය මණ්ඩලය සඳහා මිශ්‍රිත ඉගෙනුම් ක්‍රම (Blended lerning method) සංවර්ධනය කිරීමේ ධාරිතා සංවර්ධන වැඩමුළු ක්‍රියාත්මක කිරීම
- "English Score" භාවිතයෙන් ඉංග්‍රීසි ගුරුවරුන්ගේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා මට්ටම පරීක්ෂා කිරීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම
- විදේශ භාෂා ගුරුවරුන් පුහුණු කිරීම (ප්‍රංශ,කොරියන්,චීන,ජපන්,ජර්මන්,හින්දි,රුසියන්)
- අ.පො.ස. සා.පෙළ/උ.පෙළ අවසන් කරන ලද සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවර්ධන වැඩසටහන.

- බ්‍රිතාන්‍ය කවුන්සිලය සමඟ සහභාගිත්වයෙන් ඉංග්‍රීසි ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන් සඳහා පර්යේෂණ සමුළුවක් (SELTEC) පැවැත්වීම.
- පළාත් මට්ටමින් ඌන කාර්යසාධනයක් සහිත පාසල්වල අ.පො.ස. සා.පෙළ/උ.පෙළ සමස්ත අවශෝෂණය (Total Immersion) විමර්ශනය දින 2 වැඩසටහන් සඳහා පළාත් 9ට ප්‍රතිපාදන වෙන් කිරීම.
- ප්‍රාථමික අංශයේ ඉංග්‍රීසි වාග්මාලා පෝෂණය සඳහා පින්තූර ශබ්දකෝෂ සම්පාදනය කිරීම.
- 2 ශ්‍රේණිය ABOE ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ගැනීම. (බස්නාහිර හා වයඹ).
- EFA සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීමක් සහ අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවර්ධන වැඩසටහන(ELLE) ක්‍රියාත්මක කිරීම පාසල්වලම විශිෂ්ට ව්‍යවහාර හඳුනාගෙන පාසල් සඳහා ප්‍රතිපාදන ලබා දීම.

<u>තාක්ෂණ අධ්‍යාපනය ප්‍රවර්ධනය</u>

- උසස් පෙළ මෙම විෂයයන් හදාරන දිවයිනේ සියලු ම සිසුන් සඳහා ඉංජිනේරු තාක්ෂණවේදය හා නිර්මාණකරණ තාක්ෂණවේදය යන විෂයයන්වල පෙරහුරු ප්‍රශ්න පත්‍ර සැකසීමේ වැඩමුළුව පැවැත්වීම.
- ගෘහ ආර්ථික විද්‍යා පෙරහුරු ප්‍රශ්න පත්‍ර සැදීමට සහභාගි වන ගුරුවරුන් 10 දෙනෙකුට ගුරු පුහුණු වැඩසටහන පැවැත්වීම.
- ඉංජිනේරු තාක්ෂණවේදය විෂය උගන්වනු ලබන ගුරුවරුන් 24දෙනෙකුට ගුරු පුහුණු වැඩසටහන (කෘත්‍රිම බුද්ධිය, රොබෝ තාක්ෂණය) පැවැත්වීම.
- උසස්පෙළ සඳහා මෙම විෂය හදාරන දිවයිනේ සියලු ම සිසුන්ට නිර්මාණකරණ හා තාක්ෂණවේදය විෂයෙහි පෙරහුරු ප්‍රශ්න පත්‍ර සැකසීමේ වැඩමුළුව පැවැත්වීම.
- උසස්පෙළ සඳහා මෙම විෂයයන් හදාරන දිවයිනේ සියලු ම සිසුන්ට ඉංජිනේරු තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයන්වල පෙරහුරු ප්‍රශ්න පත්‍ර සැකසීමේ වැඩමුළුව පැවැත්වීම.
- ගෘහ ආර්ථික විද්‍යාව තරගාවලිය සඳහා පළාත් 09න් සහභාගි වන සියලු ම සිසුන්ට සමස්ත ලංකා තරගාවලියේ ප්‍රශ්න පත්‍රය සැකසීම.

- සාමාන්‍ය පෙළ සඳහා මෙම විෂයයන් හදාරන දිවයිනේ සියලු ම සිසුන්ට සාමාන්‍ය පෙළ ගෘහ ආර්ථික විද්‍යාව පෙරහුරු ප්‍රශ්න පත්‍රය සැකසීමේ වැඩමුළුව පැවැත්වීම.

- සාමාන්‍ය පෙළ සඳහා මෙම විෂයයන් හදාරන දිවයිනේ සියලු ම සිසුන්ට සාමාන්‍ය පෙළ නිර්මාණකරණ තාක්ෂණවේදය විෂයෙහි පෙරහුරු ප්‍රශ්න පත්‍රය සැකසීමේ වැඩමුළුව පැවැත්වීම.

- නවෝත්පාදන විද්‍යාගාර 750 සහිත පාසල්වල සියලු ම දරුවන්ට Portfolio මුද්‍රණය කිරීම.

- නවෝත්පාදන විද්‍යාගාර භාර ගුරුවරු 71දෙනෙකුට නවෝත්පාදන විද්‍යාගාර භාර ගුරුවරුන්ගේ පුහුණු වැඩසටහන පැවැත්වීම.

- නවෝත්පාදන විද්‍යාගාර භාර ගුරුවරු 82දෙනෙකුට නවෝත්පාදන විද්‍යාගාර භාර ව සිටින ගුරුවරු පුහුණු වැඩසටහන (වයඹ පළාත) පැවැත්වීම.

- උසස්පෙළ සඳහා මෙම විෂයයන් හදාරන දිවයිනේ සියලු ම සිසුන්ට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ නිකුත් කිරීමට නියමිත මොඩියුල පරීක්ෂාව හා නිර්මාණකරණ තාක්ෂණවේදය විෂය පෙරහුරු ප්‍රශ්න පත්‍රය සැකසීම.

- සමස්ත ලංකා තරගාවලිය සඳහා තේරීපත්වන දිවයිනේ පළාත් 09 නියෝජනය කරනු ලබන සිසුන් 270 දෙනෙකු සඳහා සමස්ත ලංකා රොබෝ තාක්ෂණ හා නව නිපැයුම් තරගාවලිය පැවැත්වීම.

<u>ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන ශාඛාව</u>

- සමස්ත ලංකා සිංහල භාෂා තරග (ලිඛිත/ වාචික) පැවැත්වීම.
- සිංහල, දෙමළ, දෙවන බස හා සමාජ විද්‍යා ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සකස් කිරීම.
- "ගුරු සිසු නැණ පවුර" වැඩසටහන පැවැත්වීම (සිංහල, දෙමළ හා සමාජ විද්‍යා විෂයන් සඳහා)
- සමස්ත ලංකා සමාජ විද්‍යා තරග (ලිඛිත/ වාචික) පැවැත්වීම.
- සමස්ත ලංකා දෙමළ භාෂා තරග, සමස්ත ලංකා දෙවන ජාතික භාෂා සහ සම්මාන ප්‍රදාන උත්සවය පැවැත්වීම 2024.
- ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සකස් කිරීම හා සම්පාදනය.

<u>ද්වි භාෂා අධ්‍යාපනය ප්‍රවර්ධනය</u>

- ද්විභාෂා ගුරුවරුන් 50 සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, ද්විභාෂා ගුරුවරුන් සඳහා CLIL පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවට අදාළ ශිෂ්‍යත්ව ප්‍රදානය.

- පළාත් මට්ටමින් ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවරුන් සවිබල ගැන්වීමේ වැඩසටහන.

- ගුරු උපදේශකවරුන් හා සම්පත් පුද්ගලයින් සවිබල ගැන්වීම (සිංහල සහ දෙමළ මාධ්‍ය) ට අදාල පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.
- පළාත් මට්ටමින් පවත්වන සැසි සඳහා අරමුදල් වෙන් කිරීම සහ මාර්ගෝපදේශ සැපයීම.
- ද්විභාෂා අධ්‍යාපනය සම්බන්ධ ක්‍රියාමූලික පර්යේෂණ වැඩසටහනක් පැවැත්වීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම.
- ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් සංවිධානය කිරීම (විදේශීය විශේෂඥයින්ගේ සම්පත්දායකත්වය ලබා ගනිමින්)
- ද්විභාෂා සිසුන්ගේ ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් පළාත් මට්ටමින් ද්විභාෂා තරග පැවැත්වීම
- ජාතික මට්ටමින් හා පළාත් මට්ටමින් සම්මන්ත්‍රණ / සහතික ප්‍රදානය කිරීමේ උත්සව සංවිධානය කිරීමට අදාළ ප්‍රතිපාදන වෙන් කිරීම
- අ.පො.ස. (උ.පෙළ) හා අ.පො.ස. (සා.පෙළ) ට අදාළ ව ආදර්ශ ප්‍රශ්න පත්‍ර සැකසීම (පළාත් මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරීම)
- අ.පො.ස. (උ.පෙළ)ට අදාළ ව අන්තර්ජාල සම්මන්ත්‍රණ (webinars ) පැවැත්වීම (පළාත් මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරීම)
- 5 ශ්‍රේණියේ සිසුන් සඳහා ද්විභාෂා අධ්‍යාපනය සම්බන්ධ අභිප්‍රේරණ වැඩසටහන් පැවැත්වීමට අදාළ ව සම්පත් දායකයින් පුහුණු කිරීමේ වැඩසටහන
- 5 ශ්‍රේණියේ සිසුන් සඳහා ද්විභාෂා අධ්‍යාපනය සම්බන්ධ අභිප්‍රේරණ වැඩසටහන් පැවැත්වීමට අදාළ ව ප්‍රාථමික හා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන ( පළාත් මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරීම.) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අවසන් වූ සිසුන් සඳහා ද්විභාෂා අධ්‍යාපනය සම්බන්ධ අභිප්‍රේරණ කඳවුරු පැවැත්වීම ( පළාත් මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරීම)
- ද්විභාෂා අධ්‍යාපන පාසල් වැඩි කිරීම සඳහා පළාත් නිලධාරීන් සහ විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම (පළාත් මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරීම)
- ඉංග්‍රීසි මාධ්‍ය සියලුම පාසල්වල 6 ශ්‍රේණිය සඳහා ICT හඳුන්වා දීම
- විෂය පදමාලා අත්පොත් මුද්‍රණය කිරීම
- Toast Masters තරුණ නායකත්ව වැඩසටහන් පැවැත්වීම හා (NCOEs හි) අලුතින් ඉංග්‍රීසි මාධ්‍ය පන්ති ආරම්භ කර ඇති පාසල් 50ක Gavel Clubs ස්ථාපිත කිරීම

- **Pre- service and** සේවා ස්ථානික ගුරු පුහුණු වැඩසටහන - අලුතින් බඳවා ගත් ගුරුවරුන් 1100ක් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් **British Council** හා එක් ව පැවැත්වීම
- ද්වි-මාධ්‍ය පාසල් පන්තිකාමර අධීක්ෂණය
- ප්‍රගති සමාලෝචන රැස්වීම සහ පළාත් ද්විභාෂා අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරීන් සමඟ අධීක්ෂණ මෙවලම සකස් කිරීමේ වැඩමුළුව
- ද්විභාෂා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා හදාරන ගුරුභවතුන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ඔවුන්ගේ ක්‍රියාමූලික පර්යේෂණ (Action Researches) සකස් කිරීමේ වැඩමුළුව පැවැත්වීම
- ද්විභාෂා අධ්‍යාපනය චක්‍රලේඛ හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් පුහුණු ගුරුවරුන්, ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් සහ කථිකාචාර්යවරුන් සඳහා CLIL ප්‍රවේශය හඳුන්වා දීම සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුව පැවැත්වීම
- පාසල් අධීක්ෂණ මෙවලමක් සකස් කිරීම සඳහා පුහුණු සැසි පැවැත්වීම
- ද්වි මාධ්‍ය සිසුන් සඳහා විෂය පදමාලා අත්පොත් සකස් කිරීම

<u>ආගමික හා සාරධර්ම අධ්‍යාපනය</u>

- O/L සඳහා සියලු ම ආගමික විෂයයන් සඳහා ප්‍රතිපෝෂණ පත්‍ර 64ක් සකස් කිරීම
- ලකුණු 40ට අඩු සාමාන්‍ය පෙළ සිසුන් සඳහා මාර්ගගත ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත්වීම
- සියලුම ආගමික විෂයයන් සඳහා ආපො.ස. (සා. පෙළ) සිසුන් සඳහා ආදර්ශ Google ආකෘති පත්‍ර සකස් කිරීම
- සිසුන් සඳහා සතිමත් බව පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ආගමික විෂයයන් පිළිබඳව, නිලධාරීන් සහ ගුරු උපදේශකවරුන් සඳහා දැනුවත් කිරීමේ සහ ප්‍රගති සමාලෝචන වැඩසටහන් පැවැත්වීම
- වෙසක් උත්සවය, නත්තල් උත්සවය, නව රාත්‍රී උත්සවය, මිලාත් නබි උත්සවය සැමරීම සඳහා වැඩසටහන් පැවැත්වීම
- පාසල් සිසුන් සඳහා ගංගාරාම විහාරස්ථානයේ දායකත්වයෙන් වෙසක් කූඩු ඇගයීම් වැඩසටහන් පැවැත්වීම
- ආගමික උපදේශක උපදේශක මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම

- සිසුන් සඳහා ආගමික විෂයයන් පිළිබඳ උසස් පෙළ අයිතම විශ්ලේෂණය භාවිත කරමින් උසස් පෙළ සම්මන්ත්‍රණ පැවැත්වීම
- සියලු ම ආගමික විෂයන් සඳහා අ.පො.ස. උසස් පෙළ සිසුන් සඳහා ආදර්ශ ගුගල් ආකෘති ප්‍රශ්න පත්‍ර ලබා දීම
- උසස් පෙළ ආගමික විෂයයන් සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ විෂය දැනුම ඉහළ නැංවීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම
- මිශ්‍ර ඉගෙනුම සඳහා උසස් පෙළ ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම
- විදුහල්පතිවරුන් සතිමත් බව පුහුණු කිරීම සඳහා පුහුණු කිරීම
- සති පාසල් පදනම එක්ව ගෝලීය සති සම්මේලනය 2024 පැවැත්වීම

<u>කෘෂිකර්ම අධ්‍යාපනය හා පරිසර අධ්‍යයන ප්‍රවර්ධනය</u>

- කෘෂිකර්ම අධ්‍යාපනය සම්බන්ධ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- කෘෂිකර්ම හා ජෛව පද්ධති තාක්ෂණවේදය නිලධාරීන්/ ගුරු උපදේශකවරුන්/ ගුරුවරුන්/ විද්‍යාගාර සහයකයින් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- සුහුරු කෘෂිකර්මාන්තය, නව කෘෂිකාර්මික තාක්ෂණය හා විදූ බිමෙන් ගොවි බිමක් වැඩසටහන් යටතේ, කෘෂිකර්ම හා ජෛව පද්ධති තාක්ෂණවේදය නිලධාරීන්/ ගුරු උපදේශකවරුන්/ සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- කෘෂි විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය හා පරිසර අධ්‍යාපනය සම්බන්ධ උපදෙස් අත්පොත් සකස් කිරීම, ප්‍රතිකාර්ය වැඩසටහන් සකස් කිරීම
- "ගුරු සිසු නැණ පවුර" වැඩසටහන යටතේ කෘෂි විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම
- කෘෂි විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය හා පරිසර විෂයයන් පිළිබඳ පළාත් කලාප නිලධාරී දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- කෘෂිකර්ම හා ජෛව පද්ධති තාක්ෂණවේදය නිලධාරීන්/ ගුරු උපදේශකවරුන්/ ගුරුවරුන් සඳහා පරිසර අධ්‍යාපන, GLOBE, හරිත පාසල් වැඩසටහන/ පරිසර නියමු වැඩසටහන පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම

- සමස්ත ලංකා කෘෂි විද්‍යා දැනුම මිනුම වැඩසටහන පැවැත්වීම

- පළාත් මට්ටමින් සිසුන් සඳහා ජෛව පද්ධති තාක්ෂණවේදය ප්‍රායෝගික පරීක්ෂණ කඳවුරු පැවැත්වීම

- ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය පිළිබඳ පර්යේෂණ වාර්තාවක් සකස් කිරීම

- ජෛව පද්ධති තාක්ෂණවේදය ප්‍රායෝගික පරීක්ෂණ සඳහා මූල්‍ය ප්‍රදානයක් ලබා දීම

- ජෛව පද්ධති තාක්ෂණවේදය ප්‍රායෝගික ක්‍රියාකාරකම් මධ්‍යස්ථාන සඳහා උපකරණ ලබා දීම

<u>වානිජ අධ්‍යාපනය හා ව්‍යාපාර අධ්‍යයන ප්‍රවර්ධනය</u>

- අ.පො.ස.(උසස් පෙළ) වාණිජ ධාරාවට අයත් ගිණුම්කරණය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් සඳහා ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන් (සිංහල මාධ්‍ය 09ක් සහ දෙමළ මාධ්‍ය 03ක්) පැවැත්වීම
- අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂයය ප්‍රවර්ධනය සඳහා ගිණුම්කරණය හා ව්‍යාපාර අධ්‍යයනය යන විෂයන් සඳහා ගුරු උපකරණ හා ආධාරක සංවර්ධනය කිරීම
- වාණිජ විෂයය ධාරාව හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා කලාප මට්ටමින් වානිජ ශිෂ්‍ය කඳවුරු පැවැත්වීම, සිසුන් සඳහා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන් හා වෘත්තීය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පළාත් හා කලාප විෂයය භාර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- හොඳම පාසල් වානිජ දින තරගාවලිය පැවැත්වීම
- ප්‍රාග්ධන වෙළඳපොළ සංගම් සඳහා ප්‍රශ්න විචාරාත්මක තරගය පැවැත්වීම
- හොඳම වාර්ෂික මූල්‍ය වාර්තාව තේරීමේ තරගාවලිය පැවැත්වීම

<u>සෞන්දර්ය අධ්‍යාපනය ප්‍රවර්ධනය</u>

- උතුරු මැද හා නැගෙනහිර පළාත් නර්තන තරග විනිශ්චය  කටයුතු කිරීම

- සමස්ත ලංකා චිත්‍ර කඩදාසි මුද්‍රණය කිරීම

- සමස්ත ලංකා පාසල් නර්තන තරගය 2024, සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - 2024 ,සමස්ත ලංකා බටහිර සංගීත හා නර්තන උලෙළ - 2024, සමස්ත ලංකා සංගීත තරගය, 2024 හා සමස්ත ලංකා පාසල් භරත නාට්‍යම් හා කර්ණාටක තරග - 2024 පූර්ව සංවිධාන කටයුතු සිදු කිරීම
- සමස්ත ලංකා නර්තන තරගය අවසන් වටය - 1 අදියර අවසන් කිරීම.
- සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උලෙළ - 2024 (නැගෙනහිර පළාත් වටය) පැවැත්වීම
- සමස්ත ලංකා සෞන්දර්ය සහතිකපත් සඳහා දත්ත සැකසීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ජාතික නැටුම් - සංගීත විභාග විෂයය නිර්දේශය යාවත්කාලීන කර ජාතික සෞන්දර්ය සහතික විභාගය පැවැත්වීම
- ජාතික තරුණ වාදක මණ්ඩලය පුහුණු කිරීම
- නැගෙනහිර පළාත් නර්තන ගුරුභවතුන් සඳහා විශේෂ ගුරු පුහුණු වැඩසටහන පැවැත්වීම
- සෞන්දර්ය විෂයයන්හි ආදර්ශ ප්‍රශ්න පත්‍ර සැකසීමේ කුසලතා වැඩසටහන - 1 අදියර බස්නාහිර
- බටහිර සංගීත ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන ,මහරගම බටහිර සංගීත සම්පත් මධ්‍යස්ථානය
- සෞන්දර්ය විෂයයන්හි ආදර්ශ ප්‍රශ්න පත්‍ර සැකසීමේ කුසලතා වැඩසටහන 2 වයඹ පවත්වන ලදී
- අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා බටහිර සංගීත විෂයය හදාරනු ලබන දරුවන් ඉලක්ක කර ගනිමින් පවත්වන සම්මන්ත්‍රණය - මහරගම බටහිර සංගීත සම්පත් මධ්‍යස්ථානය
- පරිගණක සංගීත නිර්මාණකරණය පිළිබඳ වැඩමුළුව - මීජේ 1, 2 කොටස පවත්වන ලදී
- නාට්‍ය හා රංග කලා පුහුණු වැඩසටහන පවත්වන ලදී

<u>අධ්‍යාපන සංවර්ධනය</u>

- පාසල් 154හි සා. පෙළ හා උ. පෙළ දරුවන් සඳහා SESIP වැඩසටහන යටතේ විෂයයන් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම

<u>ප්‍රාචීන භාෂා අධ්‍යාපනය ප්‍රවර්ධනය</u>

- කාරක සභිකයින් තෝරා ගැනීමේ නිලවරණය පැවැත්වීම 2024 පෙබරවාරි 09 වැනි දින පැවැත්වීම
- 2024 වර්ෂය සඳහා කාරක සභා රැස්වීම් 2ක් පැවැත්වීම
- 2022 (2023) වර්ෂයේ ප්‍රාචීන විභාගවලින් විශිෂ්ට සාමර්ථ්‍ය ලබා ගත් ශිෂ්‍යයින් හට 2024.08.13 වැනි

- විෂයය නිර්දේශ යාවත්කාලීන කිරීම හා ප්‍රාචීන අධ්‍යාපනයට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා අධ්‍යාපන මණ්ඩල රැස්වීම් 6ක් පැවැත්වීම
- 2023 (2024) වර්ෂයේ ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාග පැවති සියලු දිස්ත්‍රික්කවල විභාග අධීක්ෂණ කටයුතු සිදු කිරීම
- ඉහළ සාධන මට්ටම් ඇති පිරිවෙන් 73ක් සඳහා විෂයය නිර්දේශයට අදාළව රුපියල් ලක්ෂ 10ක් වටිනා පොත් කට්ටල බෙදා දීම

<u>කළමනාකරණ හා ප්‍රමිති</u>

- තෝරා ගත් GEMP පාසල්වල ප්‍රගතිය නියාමනය කිරීම
- කොට්ඨාස අධ්‍යාපන කාර්යාල අධීක්ෂණ මෙවලම අවසන් කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- කලාප කාර්යාල අධීක්ෂණය කිරීම සඳහා සකස් කළ මෙවලම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම
- පළාත් සහ කලාප QA සම්බන්ධීකාරකවරුන් දැනුවත් කිරීම
- 2024/2025 සඳහා තෝරා ගත් GEMP පාසල්වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- පළාත් සහ කලාප නිලධාරීන් සමඟ පාසල් QA ක්‍රියාවලිය පිළිබඳ පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමේ වැඩමුළු පැවැත්වීම
- පාසල්වල භාවිත වන ලිපි ලේඛන සඳහා ක්‍රමවත් කේතන ක්‍රමයක් හඳුන්වා දීම
- පාසල්වල ගුණාත්මක තහවුරුව පිළිබඳ වාර්ෂික වාර්තාව සකස් කිරීම හා මුද්‍රණය කිරීම
- කලාප අධ්‍යාපන කාර්යාල අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ මෙවලම නැවත සලකා බැලීම හා සකස් කිරීම
- තත්ත්ව සහතික (AOESQA) සඳහා ඒකාබද්ධ මාර්ගගත ඇගයීම් පද්ධතියක් සකස් කිරීම
- QA ක්‍රියාවලිය පිළිබඳ පර්යේෂණ සඳහා ප්‍රකාශනය මුද්‍රණය කිරීම සහ සම්මන්ත්‍රණය පැවැත්වීම
- පාසල්වල ක්‍රියාත්මක වූ විශිෂ්ට ව්‍යවහාර වෙනුවෙන් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ජාතික මටට්මේ ඇගයීම (ගුරු ප්‍රතිභා)

**පාසල් කටයුතු**

**ජාතික පාසල්වලට පහසුකම් සැපයීම**

- **ද්විතියික අංශයේ ගුණාත්මක යෙදවුම් මිල දී ගැනීම**

  • රු.මි.25.0 / (ජා.පාසල් ශාඛාව) ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිතයට ගනු ලබන ද්‍රව්‍ය මිල දී ගැනීමට එක් පාසලකට රු.මි.0.1 බැගින් ජාතික පාසල් 250කට ලබා දී ඇත.

  • රු.මි. 5.0 (ගෙවීම් - මුදල් ශාඛාවේ මූලිකත්වයෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට ලබාදීමට කටයුතු කර ඇත.)

- **යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ හා පිරියත අලුත්වැඩියා කිරීම**

  • ජාතික පාසල්වල පවතින යන්ත්‍රසූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව සඳහා උපරිමය රු.මි.0.1 වන ලෙස ජාතික පාසල් 110කට ලබා දී ඇත.

  • මාර්ගගත තාක්ෂණය ඔස්සේ (Zoom) විදුහල්පති දැනුවත් කිරීමේ වැඩසටහන- (2024.05.29)

  • සියලු ම ජාතික පාසල් විදුහල්පතිවරු (396) සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන - 2024.09.28)

  • බස්නාහිර පළාත් ජාතික පාසල් විදුහල්පතිවරු (79) (2024.11.07)

  • දකුණ/සබරගමුව/උතුරුමැද පළාත් 03හි ජාතික පාසල් නියෝජ්‍ය විදුහල්පතිවරු/ භාණ්ඩාගාරික දැනුවත් කිරීමේ වැඩසටහන (2024.12.10)

- **ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම (ජාතික පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම/ වැසිකිළි - කැසිකිළි අලුත්වැඩියාව)**

  • ජාතික පාසල් 266ක් සඳහා රු.මි. 133 කි. ආරම්භක අවස්ථාවේ දී ලබා දෙන 50%ක ප්‍රදාන මුදල ජාතික පාසල් 266කට(රු.මි.66.5) ලබා දී අවසන්ව ඇති අතර විදුහල්පතිවරුන් විසින් පළාත් ඉංජිනේරු කාර්යාල නිලධාරීන් වෙතින් ඇස්තමේන්තු අනුමත කර ගැනීමෙන් පසු එම අනුමත ඇස්තමේන්තුවලට අනුව ප්‍රදාන මුදල් ලැබූ ජාතික පාසල්වල වැසිකිළි/ කැසිකිළි අලුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.

  • මුළු ප්‍රදාන මුදලින් ඉතිරි 50% රු.මි.66.5ක මුදල 2024.12.31 දින පාසල් සංවර්ධන සමිති ගිණුම්වලට බැර කිරීම අවසන් ව ඇති අතර පාසල් පරිශ්‍ර තුළ එකී අලුත්වැඩියා කටයුතු කර ගෙන යනු ලබයි.

- කඩා ඉවත් කිරීම්/ ඉදිකිරීම්වලට අදාළ ගොඩනැගිලි අවශ්‍යතා තහවුරු කිරීම සඳහා ස්ථානීය පරීක්ෂාව, නිර්දේශ ලබාදීම් සිදු කිරීම * තෝරාගත් ජාතික පාසල් 192කට අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් අනුඥා නිවේදන නිකුත් කර ඇති අතර එකී පාසල්වල භෞතික ප්‍රගතිය ඉංජිනේරු ශාඛාව වෙත වාර්තා කරනු ලබන බව දන්වා ඇත. ප්‍රතිපාදන වෙන්වීම ගොඩනැගිලි (ඉංජිනේරු) ශාඛාව සඳහා වන අතර සම්බන්ධීකරණ, නිර්දේශ ලබාදීම් හා නියාමන කටයුතු ජාතික පාසල් ශාඛාව වෙතින් සිදු වේ)

## නොවිධිමත් හා විශේෂ අධ්‍යාපනය

- නොවිධිමත් අධ්‍යාපන නව නිලධාරින් වැඩිහිටි අධ්‍යාපනය, ජීවිත කාලය පුරා අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- 'ශිෂෝද්‍යා' විශේෂ සහ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීම හා භෞතික පහසුකම් නඩත්තු කිරීම

- පළාත් සහ ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

- පාසල් ළමුන් සඳහා ශ්‍රවණාධාර සහ ඇස් කණ්ණාඩි ලබා දීමට පළාත් 06ක් සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

- ශ්‍රවණාබාධිත දරුවන්ගේ ශ්‍රවණ ප්‍රස්තාර කියවීම සහ දෘශ්‍යාබාධිත දරුවන්ගේ දෘශ්‍ය පරීක්ෂණ වාර්තා පිළිබඳ ගුරු පුහුණු වැඩසටහන පැවැත්වීම

- ප්‍රජා අධ්‍යාපනය පිළිබඳ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන නිලධාරීන් හා පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම

- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීමට කලාප තක්සේරුකරණ කමිටු සඳහා තක්සේරු මෙවලම් කට්ටල ලබා දීම

- ආදායම් ඉපයීමේ වැඩසටහන් සඳහා උපකරණ සැපයීම (2023 වර්ෂයේ බැඳීම් සඳහා ගෙවීම)

- "පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික සැකැස්ම" චක්‍රලේඛ සහ මාර්ගෝපදේශය සහ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ 'අධ්‍යාපනයේ සාධාරණ ඉඩහසරක් මාර්ගෝපදේශය' මුද්‍රණය කිරීම

- විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා 'අන්තර්කරණ අන්තර්ගත අධ්‍යාපනය කරා......' ගුරු මාර්ගෝපදේශ පොත (I කොටස) මුද්‍රණය කිරීම

- වර්ගීකරණය මගින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීම සඳහා මොඩියුලය සකස් කිරීම මුද්‍රණය හා පුහුණු කිරීම

- අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ගුරු පුහුණු වැඩසටහන (විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා ගුරු මාර්ගෝපදේශ පොත I කොටස සහ II කොටස පුහුණු කිරීම)

- අධ්‍යාපන කලාපවල විශේෂ අධ්‍යාපන වෘත්තිකයන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම

- අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ සම්බන්ධීකාරකවරුන් සඳහා පුහුණු වැඩසටහන

- පාසල්වල නව විශේෂ අධ්‍යාපන ඒකක පිහිටුවීම (ප්‍රවේශ්‍යතා පහසුකම් සංවර්ධනය කිරීම)

- විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා 'ශිෂෝද්‍යා' විශේෂ සහ අන්තර්කරණ අධ්‍යාපන ජාතික ආයතනය අලුත්වැඩියා කිරීම හා තාක්ෂණික අධ්‍යාපන ගොඩනැගිල්ල ඉදි කිරීම

- අනිවාර්ය අධ්‍යාපන පාසල් කමිටු සාමාජිකයින් (පළාත් මට්ටම) දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- විශේෂ අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටු රැස්වීම් පැවැත්වීම

- බ්‍රේල් සහ සංඥා භාෂාව පිළිබඳ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

- විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා විභාග පහසුකම් සැපයීමේ මොඩියුලය සකස් කිරීම

- උපකෘත විශේෂ පාසල් අධීක්ෂණ වැඩසටහන පැවැත්වීම

- ජාත්‍යන්තර ආබාධිත දින වැඩසටහන හා ජාත්‍යන්තර සාක්ෂර දින වැඩසටහන පැවැත්වීම

- ප්‍රජා ඉගෙනුම් වැඩසටහන්, ජීවිත කාලය පුරාවට ඉගෙනීමේ වැඩසටහන්, වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් (පළාත් මට්ටම) පැවැත්වීම

- විශේෂ අධ්‍යාපන වෘත්තිකයන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් (පළාත් මට්ටම) පැවැත්වීම

<u>දෙමළ පාසල් සංවර්ධන ශාඛාව</u>

- අඩු කාර්ය සාධනයක් ඇති දෙමළ ජාතික පාසල් 10ක් නංවාලීම

- විදුහල්පතිවරුන්, ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සඳහා O/L සහ A/L සිසුන්ගේ කාර්යසාධනය වැඩි කිරීම පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම

<u>මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව</u>

- විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන් සඳහා සංවර්ධන වැඩමුළු පවත්වන ලදි.
- මවුලවි ගුරුවරුන්ගේ අරාබි භාෂාව සහ අරාබි සාහිත්‍යය ඉගැන්වීමේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා මවුලවි ගුරු ධාරිතා සංවර්ධන වැඩමුළු පවත්වන ලදි.
- සමස්ත ලංකා පාසල් මුස්ලිම් සංස්කෘතික තරගය - 2024 පවත්වන ලදි.
- මද්‍රසා අධ්‍යාපන විශේෂඥ කමිටු සමාජිකයින් හා අදාළ පාර්ශ්වකරුවන් සඳහා වන වැඩමුළු පවත්වන ලදි.

සාමය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යාපන ඒකකය

- විද්‍යාපීඨ ශික්ෂණ ලාභී ගුරුවරුන් 3000ක් සඳහා සංහිඳ පාමුල වැඩමුළු 11ක් පවත්වන ලදි.
- පාසල් ළමයි 360ක් හා පාසල් ගුරුවරුන් 72ක් සඳහා සහෘද යාත්‍රා වැඩමුළු පවත්වන ලදි.

වතු පාසල් සංවර්ධන ශාඛාව

- ගෘහ භාණ්ඩ සැපයීම සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම
- ධාරිතා සංවර්ධන වැඩසටහන් (කාර්ය මණ්ඩල පුහුණුව) පැවැත්වීම
- පාසල් නව ගොඩනැඟිලි ඉදි කිරීම හා පාසල් ගොඩනැඟිලි අලුත්වැඩියාව සිදු කිරීම
- ඉන්දියානු ප්‍රදානය යටතේ වතු පාසල් 9ක් සංවර්ධනය කිරීම
- පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය මහා විද්‍යාලයේ යටිතල පහසුකකම් සංවර්ධනය කිරීම
- දත්ත පද්ධතිය සැකසීම වතු පාසල් විදුහල්පතිවරුන් සමඟ මාර්ගගත ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- වතු පාසල් විදුහල්පතිවරුන් සමඟ මාර්ගගත ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සිදු කරන ලදි.
- වතු පාසල් නිරීක්ෂණය කිරීම
- වතු සමාගම්වලින් වතු පාසල් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
- STEM වැඩසටහන පවත්වන ලදි.

පෞද්ගලික පාසල් ශාඛාව

- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරු ආයතනික කටයුතු සිදු කිරීම
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල සහ අනිකුත් බාහිර ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියා පටිපාටි ශක්තිමත් කිරීම
    - රජයේ අනුමත පෞද්ගලික පාසල් නියාමනය සහ අධීක්ෂණය කිරීම (මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා කලාප, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල ගුරු උපදේශකවරුන්ගෙන් සමන්විත කණ්ඩායමක්, ඉගෙනුම්- ඉගැන්වීමේ ක්‍රියාවලිය, පාසලේ මානව සම්පත් හා භෞතික සම්පත් පිරියත හා කළමනාකරණය පිළිබඳ ව සොයා බලා අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කරනු ලබයි)
    - අභ්‍යන්තර පාසල් ඇගයීම්/අධීක්ෂණ වැඩසටහන් සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීම
- අනෙකුත් රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන හා (ජාත්‍යන්තර පාසල්, වෙනත් පෞද්ගලික පාසල්) සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම

## පාසල් පුස්තකාල සංවර්ධනය

- පාසල් පුස්තකාල සහායකවරුන් සඳහා පුහුණු මොඩියුලය සැකසීම
- පාසල් පුස්තකාල විෂය අධීක්ෂණය භාරව කලාප මට්ටමින් කටයුතු කරන ගුරු උපදේශක/ සම්පත්දායකයින් පුහුණු කිරීමේ දෙදින නේවාසික වැඩමුළු පැවැත්වීම.
- කියවීම් කඳවුරු ක්‍රියාත්මක කිරීම පුහුණු කිරීමේ දෙදින නේවාසික වැඩමුළු පැවැත්වීම.
- පුස්තකාල පුහුණු අත්පොත සකස් කිරීම
- පාසල් පුස්තකාල උපදෙස් සංග්‍රහය අනුව පාසල් පුස්තකාල ක්‍රියාත්මක කිරීම
- කියවීම් කඳවුරු ක්‍රියාත්මක කිරීම (බස්නාහිර පළාත)

## පාසල් කටයුතු ශාඛාව

- 5 ශ්‍රේණි ශිෂ්‍යාධාර ලබා දීම
- සුහග ශිෂ්‍යත්ව ලබා දීම
- සුජාත දියණිය ශිෂ්‍යත්ව ලබා දීම
- EPSI/SBPTD වැඩසටහන් පැවැත්වීම

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය

- ධාරිතා සංවර්ධන වැඩසටහන - ග්‍රන්ථ සමීක්ෂකයින් සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම
- පාසල් පුස්තකාල සඳහා සුදුසු ගුණාත්මක පොත් තෝරා එම පොත් සඳහා පාසල් පුස්තකාල බලපත්‍රය ලබා දීම - අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩල රැස්වීම් පැවැත්වීම
- කියවීම් කඳවුරු පැවැත්වීම
- පාසල් පුස්තකාල ග්‍රන්ථ නාමාවලිය මුද්‍රණය කිරීම

## අභ්‍යන්තර විගණක

- මූලික වාර්තාව
- විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන සම්බන්ධව අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ඇගයීම් වාර්තාව සකස් කිරීම

## ගුරු ආයතන

ගුරු ආයතන ශාඛාව

- උපාධිධාරීන් **163**ක් විදේශ භාෂා විෂයන් ඉගැන්වීම සඳහා **2024.02.05** දින සිට ක්‍රියාත්මක වන පරිදි ගුරු සේවයට බඳවා ගන්නා ලදි.

- ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් **320**ක් ජාතික සහ පළාත් පාසල් සඳහා **2023.06.19** දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දෙන ලදී.

- අ.පො.ස (උසස් පෙළ) විද්‍යාව, විද්‍යාව සහ තාක්ෂණ වේදය විෂයන් ඇතුළු විෂයන් **46**ක් සඳහා උපාධිධාරීන් **1706**ක් (ජාතික පාසල්) **2024.07.08** දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවය **3 - I** (අ)ශ්‍රේණියට බඳවා ගන්නා ලදී.

- ජාතික හා පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරු පුරුප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ **3-1**(ඇ) ශ්‍රේණියට ඩිප්ලෝමාධාරීන් **427** ක් **2024.07.08** දින සිට ක්‍රියාත්මක වන පරිදි ගුරු සේවයට බඳවා ගන්නා ලදි. විශේෂ අධ්‍යාපන විෂය සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් දෙදෙනෙකු ජාතික පාසල් වෙත **2024.08.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දෙන ලදී.

- සංවර්ධන නිලධාරීන් ලෙස පත්වීම් ලද භික්ෂූන් වහන්සේලා **07** දෙනෙකු සඳහා **2024** වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුරු සේවයේ **3-1**(අ) ශ්‍රේණියට පත්වීම් ලබා දෙන ලදි.

- ගුරු උපදේශක සේවය සඳහා සීමිත පදනම මත ගුරු උපදේශකවරු බඳවා ගැනීමට පෙර සේවා ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීම සඳහා අදාළ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීමට අදාළව ඉදිරිපත් වන කාර්යක්ෂමතා කඩයිම් හා වෘත්තීය සමාලෝචනය පිළිබඳව වූ ගැටලු ඇතුළු ව අනෙකුත් ගැටලු සඳහා විසඳුම් ලබා දීම සිදු කර ඇත.

- ජාතික පාසල්හි ගුරුවරුන්ගේ ආයතනික කටයුතු හා සම්බන්ධ සියලු ගැටලු සඳහා උපදෙස් ලබා දීම සිදු කර ඇත.

- ගුරු සේවයට අදාළ මහජන පෙත්සම් කාරක සභාව. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය හා මානව හිමිකම් කොමිෂන් සභාව මඟින් කැඳවන වාර්තා යොමු කර ජාතික පාසල්හි ගුරුවරුන් වෙනත් තනතුරු/ සේවාවන් සඳහා තාවකාලික ව / ස්ථිර ව ම මුදා හැරීම් සඳහා අනුමැතියන් ලබා දීම හා ඒ සම්බන්ධ ගැටලු පිළිබඳ ආයතනික කටයුතු සිදු කර ඇත.

- ගුරුවරුන්ගේ නිවාඩු සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් කර අත් පොතක් නිකුත් කිරීමට එහි

විද්‍යාපීඨ ශාඛාව

- සුහුරු පන්ති කාමර ප්‍රායෝගික භාවිතය පිළිබඳ හා චිත්‍ර, නැටුම්, සංගීත හා නාට්‍ය පිළිබඳ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ අධ්‍යයන කාර්යමණ්ඩල පුහුණු කිරීමේ කිරීමේ වැඩමුළුව පවත්වන ලදි.
- අඛණ්ඩ ගුරු වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම සැකසීම හා අයවැය ඇස්තමේන්තුව සැකසීමේ වැඩසටහන
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ව හා විද්‍යා විෂය සඳහා ප්‍රායෝගික පුහුණු වැඩමුළුව
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළුව, ඩිජිටල් පුහුණු වැඩමුළුව, සිංහල, දෙමළ,ගණිත විෂය වැඩමුළු සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පුහුණු- වැඩමුළු පවත්වන ලදී.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සුපරික්ෂණය පවත්වන ලදි
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවා ගැනීම

ගුරු අධ්‍යාපනඥ සේවා ශාඛාව

- ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය සවි බල ගැන්වීම- ලෝක බැංකු ආධාර (GEMP)
    - ගුරු අධ්‍යාපනඥයින් සඳහා ධාරිතා වැඩසටහන් පැවැත්වීම
    - ගුරු මධ්‍යස්ථාන නියාමන උපකරණය සකස් කිරීම
    - ගුරු වෘත්තීය මධ්‍යස්ථාන වෙත ගුරු අත්පොත සකස් කිරීම
    - පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන නියාමනය සඳහා නියාමන උපකරණය සකස් කිරීම
    - ගුරු කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා වන අධ්‍යාපනයේ ඩිජිටල් තාක්ෂණය මොඩියුලයේ , ඉගෙනුම් ආධාරක ලෙස වීඩියෝ මාලාවක් සකස් කිරීම
    - ගුරු කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා වන මොඩියුල දෙමළ බසට පරිවර්තනය
    - පළාත් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා ගුරු විද්‍යාල ගුරු මධ්‍යස්ථාන අධීක්ෂණ කටයුතු කරන ලදි.
    - ගුරු අභ්‍යාස විද්‍යාල සහ ගුරුවරුන් සඳහා වන වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා භෞතික හා යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී.
- ගුරු මධ්‍යස්ථානවල ශ්‍රී ලංකා ගුරු සේවය නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම

- **SESIP ව්‍යාපෘතිය යටතේ 10-12 ශ්‍රේණි ඉගැන්වීම්වල නිරත ගුරුවරුන්ගේ ඉගැන්වීම් කුසලතා වර්ධනය කිරීමේ අරමුණින්, ප්‍රධාන ව්‍යවහාරික සම්පත් මධ්‍යස්ථානය ලෙස ජාතික අධ්‍යාපන කේන්ද ගතවන පරිදි සියලු ම දිස්ත්‍රික් නියෝජනය වන පරිදි තෝරා ගත් ගුරු මධ්‍යස්ථාන 25ක් සහ පාසල් 175ක් සඳහා ව්‍යවහාරික සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම(ගුරු පුහුණු සඳහා)**
- **අධ්‍යයනය හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අමාත්‍යාංශයේ හැඳුනුම්පත් ලබා දීම**
- **නිපුණතාවලින් පිරි ගුරු පරපුරක් පද්ධතියට දායක කිරීම . - සේවාස්ථ ගුරු පුහුණුව**

  **• නුපුහුණු ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය අපේක්ෂා කරමින් ගුරු විද්‍යාල දෑ අවුරුදු ගුරු පුහුණුව ක්‍රියාත්මක කිරීම**
- **ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පූර්ව සේවා ගුරු පුහුණු වැඩසටහන්**

  **• ජාතික පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගන්නා ලද නවක ගුරු සිසුන්ගේ සේවාරම්භක පුහුණුව පවත්වන ලදී.**

## අධ්‍යාපන සේවා ආයතන

**<u>අධ්‍යාපන සේවා ආයතන</u>**

- **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත බඳවා ගැනීම 2020/2021(2022)**

  **• ලිඛිත විභාගය හා සේවා පළපුරුද්ද හා කුසලතා යන අංශ දෙකෙන් ම ලැබූ මුළු ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගනු ලැබූ 62 දෙනෙකු සඳහා 2024.05.18 හා 19 දෙදින සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වා 2024.07.03 දින 60 දෙනෙකු සඳහා පත්වීම් ලබා දී ඇත.**

  **• 02 දෙනෙකු සඳහා පත්වීම් තාවකාලිකව අත්හිටුවා ඇත.**
- **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2020/2021 (2023)**

  **• 2023.09.23 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ලිඛිත තරඟ විභාගය සමත් 735 දෙනෙකු සඳහා 2024.08.21 දින සිට 2024.09.07 දක්වා දින 10යක දී සාමාන්‍ය හා වාචික සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.**

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ **III** ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම **2020/2021**

  - අංක **2237** හා **2021.07.16** දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද බඳවා ගැනීමේ නිවේදනය අනුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් **2023.07.29** දින පවත්වන ලද උක්ත තරඟ විභාගයේ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අයත් තනතුරුවලට බඳවා ගැනීම සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට හා වාචික සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් **147** දෙනෙකුගේ නම් ඇතුළත් නාම ලේඛනය ප්‍රකාශයට පත් කර ඇති අතර **2024.10.23** හා **24** දෙදින තුළ දී සාමාන්‍ය හා වාචික සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

- අධ්‍යාපන අධ්‍යක්ෂ/ කොමසාරිස් තනතුරු සඳහා පත්කිරීම් සිදු කර ඇත.

  - අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල පුරප්පාඩුව පවතින අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු දහනවයක් **(19)** සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ **I** ශ්‍රේණියේ නිලධාරීන් තෝරා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය **2024** අප්‍රේල් මස අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පවත්වන ලද අතර සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු **16**ක් සඳහා නිලධාරීන් පත් කර ඇත.

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ,
  - I ශ්‍රේණියට උසස් කිරීම් - **65**
  - II ශ්‍රේණියට උසස් කිරීම් - **300**
  - ස්ථාන මාරු හා තාවකාලික අනුයුක්ත - **192**
  - විශ්‍රාම ගැන්වීම් - **85**
  - වාහන බලපත්‍ර - **150**

විදුහල්පති ශාඛාව

**2023** වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලද නිලධාරීන් **164** දෙනෙකු සඳහා **2024.04.02** දින විදුහල්පති පත්වීම් ලබා දීමට කටයුතු කර ඇත.

අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/HRD/126/19/2024 හා **2024.01.03** දිනැති ලිපිය අනුව ආයතනික විභාග පැවැත්වීම සඳහා රු මිලියන **920** ක මුදලක් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඒ අනුව **2024** වර්ෂවට අදාලව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන II වන කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය **- 2024 (11),** ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය **- 2024 (1)** පැවැත්වීම සම්බන්ධව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කටයුතු සම්පාදනය කර ඇත. අදාළ පරීක්ෂණය **2025** වර්ෂයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා

ඒකාබද්ධ සේවා

- විභාග දෙපාර්තමේන්තුවේ ගෙවීම් (නීති නිලධාරි ||| පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා) සිදු කරන ලදී.
- කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (ඒකාබද්ධ රියදුරු සේවයේ හා කාර්යාල සේවක සේවයේ) සිදු කරන ලදී.
- මාරු මණ්ඩල ගෙවීම් සිදු කරන ලදී.
- ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා වන දීමනාව ගෙවන ලදී.
- ඒකාබද්ධ සේවා නිල ඇඳුම් දීමනාව ( ඒකාබද්ධ රියදුරු සේවයේ හා කාර්යාල සේවක සේවයේ ) සිදු කරන ලදී.
- අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා පරිගණක දත්ත ක්‍රියා කරුවන් සඳහා පුහුණු දීමනාව ගෙවන ලදී.

ඒකාබද්ධ නොවන සේවා

- කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම
- නව බඳවා ගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම
- වාර්ෂික ස්ථාන මාරු කමිටු සඳහා ගෙවීම් සිදු කරන ලදී.
- බහුකාර්ය සංවර්ධන සහයක පත්වීම් ලබා දීම

## ප්‍රසම්පාදන

**2024 වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සාරාංශය**

| අංශය | මුළු ව්‍යාපෘති | සම්පූර්ණ කරන ලද (100%) | සම්පූර්ණ කිරීමට ආසන්න (75-99%) | ක්‍රියාත්මක වෙමින් පවතින (<75%) | අවලංගු කරන ලද | අයවැය පරාසය (Budget Range) රු.මි. |
|---|---|---|---|---|---|---|
| භාණ්ඩ(G) | 45 | 26 | 9 | 3 | 7 | 0.5 - 6,000 |
| සේවා (S) | 20 | 10 | 4 | 0 | 6 | 0.1 - 872.3 |
| GEMP | 4 | 2 | 1 | 0 | 1 | 0.6 - 34.5 |
| විශේෂ ව්‍යාපෘති (SP) | 6 | 1 | 2 | 2 | 1 | 2.71 - 25 |

ප්‍රධාන ව්‍යාපෘති කාණ්ඩ අනුව

- ප්‍රධාන සම්පූර්ණ කළ ව්‍යාපෘති (රු.මි. 100ට වැඩි)

  පාසල් නිල ඇඳුම් රෙදි චීන සමූහාණ්ඩුවෙන් ප්‍රදානයක් ලෙස ලබා දෙන ලදී.

  පාසල් 1000ක් සඳහා ස්මාර්ට් පන්ති කාමර විසඳුම් (රු.මි. 1,600) - 80%

  පාසල් සපත්තු වවුචර් (රු.මි. 1,500) - අවලංගු කරන ලදී★

  පාසල් දැරියන් සඳහා සනීපාරක්ෂක තුවා (රු.මි. 960) - 100% සම්පූර්ණයි.

  ප්‍රාථමික අංශ සඳහා සිසු ඩෙස්ක් හා පුටු (රු.මි. 134.8) - 95%

- ප්‍රධාන ක්‍රියාත්මක යටිතල පහසුකම් ව්‍යාපෘති (Key Ongoing Infrastructure Projects)

  ඊ-තක්සලාව සඳහා Server පහසුකම් (රු.මි. 260) - සම්පූර්ණයි.

  PABX දුරකථන පද්ධතිය (රු.මි. 34) - 30% සම්පූර්ණයි.

  CCTV කැමරා පද්ධතිය (රු.මි. 4) - 10% සම්පූර්ණයි.

  සූර්ය බල පැනල පද්ධති (විවිධ ස්ථානවල) - විවිධ අදියරයන්හි පවතී.

- ප්‍රධාන අධ්‍යාපනික මූලාරම්භයන් (Major Educational Initiatives)

  තාක්ෂණික නවීකරණ විද්‍යාගාර උපකරණ (රු.මි. 83.06) - 95% සම්පූර්ණයි.

  ජෛව පද්ධති තාක්ෂණ උපකරණ (රු.මි. 60) - 95% සම්පූර්ණයි.

  පිරිවෙන් සඳහා ලැප්ටොප් හා උපකරණ (රු.මි. 400) - 95%සම්පූර්ණයි.

  ගුරු පුහුණු පද්ධති ගෘහ භාණ්ඩ (KOICA) (රු.මි. 19.28) - 95% සම්පූර්ණයි.

- සැලකිය යුතු සේවාවන් (Notable Services)

  ශිෂ්‍ය රක්ෂණය (සුරක්ෂා) (රු.මි. 7112.3) - සම්පූර්ණයි.(වසර 3ක් සඳහා ගිවිසුම්ගත වී ඇත)

  ආරක්ෂක සේවා (රු.මි. 50) - සම්පූර්ණයි.

  සනීපාරක්ෂක සේවා (රු.මි. 40) - සම්පූර්ණයි.

  ගොඩනැගිලි නඩත්තුව (රු.මි. 30) - 65% සම්පූර්ණයි.

  අරමුදල් මූලාශ්‍ර

  CF (ඒකාබද්ධ අරමුදල) , KOICA, GEMP(සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය) ,

  TRC, SESIP (ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන ව්‍යාපෘතිය) , UNESCO

ඉංජිනේරු අංශය - ඉංජිනේරු ශාඛාව

- ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම(ඉසුරුපාය ගොඩනැගිල්ල අලුත්වැඩියා)
- කොළඹ ජාතික පුස්තකාලයේ පිහිටුවීම (අලුත්වැඩියා කිරීම)
- ජාතික පාසල්වල ද්විතියික අංශවල නව ඉදිකිරීම් කටයුතු කිරීම (ජාතික පාසල්වල ද්විතියික අංශයේ පන්තිකාමර ගොඩනැගිලි, ආපණශාලා, ක්‍රීඩා පිටි, වැසිකිළි, වහලවල් ආදියේ නව ඉදිකිරීම්)
- උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ සිසුන්ගේ අධ්‍යාපනික සහ පුහුණුව සඳහා පහසුකම් සැලසීමේ කටයුතු (අලුත්වැඩියා හා නව ඉදිකිරීම්) (පන්ති කාමර සුහුරු පන්ති කාමර බවට පරිවර්තනය කිරීම)
- විශේෂ අධ්‍යාපන ඒකකවල අලුත්වැඩියා කටයුතු (විශේෂ අධ්‍යාපන ඒකකවල පන්තිකාමර ගොඩනැගිලි, ආපනශාලා, ක්‍රීඩා පිටි, වැසිකිළි, වහලවල්, ව්‍යුහාත්මක අලුත්වැඩියා කිරීම් ආදිය)
- ගුරු විද්‍යාලවල අලුත්වැඩියා කටයුතු (ගුරු විද්‍යාලවල ගොඩනැගිලි, වහලවල්, ව්‍යුහාත්මක අලුත්වැඩියා කටයුතු)
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අලුත්වැඩියා කටයුතු (ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ගොඩනැගිලි, වහල, වැසිකිලි ආදී නව ඉදිකිරීම්)
- වතු පාසල් ද්විතියික මට්ටමට උසස් කිරීම (අලුත්වැඩියා කිරීම / නව ඉදිකිරීම්) (වතු පාසල්වල පන්තිකාමර ගොඩනැගිලි, ආපනශාලා, ක්‍රීඩා පිටි, වැසිකිළි, වහලවල් ආදී නව ඉදිකිරීම් කටයුතු)
- පාසල්වල දන්ත සෞඛ්‍ය පහසුකම් සඳහා පහසුකම් සැලසීම (නව ඉදිකිරීම් හා දන්ත ඒකක ඉදිකිරීම)
- සියලුම පාසල් සඳහා සනීපාරක්ෂක හා ජල පහසුකම් සැපයීම (නව ඉදිකිරීම්)
- ප්‍රාථමික පාසල් 3577ක පහසුකම් වැඩිදියුණු කිරීම (නව ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම)
- ග්‍රාමීය හා ප්‍රාදේශීය පාසල් සඳහා ගුරු නිවාස සහ විවේකාගාර ආදී පහසුකම් සැපයීම

## විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු - මහා පරිමාණ/විදේශ අරමුදල් ව්‍යාපෘති සාරාංශය (2024 දෙසැම්බර් 31 දිනට)

| | ව්‍යාපෘතිය | අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන වෙන් කිරීම (2024) | කාලසීමාව | භෞතික ප්‍රගතිය (2024) |
|---|---|---|---|---|---|
| 1 | තාක්ෂණික ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සහ ගුරු පුහුණු පද්ධතිය ස්ථාපිත කිරීම. | KOICA/GOSL | රු.මි. 2620.00 | 2017-2025 | 100 % |
| 2 | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වන ජාතික හා පළාත් සම්පත් මධ්‍යස්ථානය | CF | රු.මි. 73.00 | 2015-2024 | 95% |
| 3 | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වන ජාතික හා පළාත් සම්පත් මධ්‍යස්ථානය | JICA | රු.මි. 20.00 | 2019-2024 | 100 % |
| 4 | ද්විතීයික අධ්‍යාපනය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම (ICT Hub) | EDCF/GOSL | රු.මි. 1100.00 | 2019-2026 | 0.5% |
| 5 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) | ලෝක බැංකුව | රු.මි. 2000.00 | 2018-2024 | 88% |
| 6 | තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන | OFID/GOSL | | 2018-2024 | 80% |
| 7 | ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) | ADB | රු.මි. 1410.00 | 2020-2025 | 87% |
| 8 | බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත ජාතික පාසල පොළොන්නරුව ඉදිකිරීම | ඉන්දියානු අරමුදල් | රු.මි. 100 | 2017-2024 | 83% |
| 9 | UNICEF ව්‍යාපෘතිය (පූර්ව ළමාවිය අධ්‍යාපනය, ඩිජිටල් පුරවැසි කුසලතා, ආදිය) | UNICEF | | 2024 | 100% |
| 10 | ඉන්දියානු අරමුදල් යටතේ වතු පාසල් 9 ක් වැඩිදියුණු කිරීම | ඉන්දියානු අරමුදල් (Indian Grant) | රු.මි. 300 | 2022 – 2024 | 85 % |

**සැ. යු. 1. බොහෝ ව්‍යාපෘති මුල් කාලසීමාවන් දීර්ඝ කර ඇත.**

**2. ප්‍රගතිය පිළිබඳ දත්ත 2024 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කර ඇත.**

**3. සමහර ව්‍යාපෘති සඳහා වටිනාකම් පසුව සංශෝධනය කර ඇත.**

# 04. මූල්‍ය ප්‍රගතිය

**අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් ( 2024.11.30 දිනට) - සාමාන්‍ය අධ්‍යාපනය**

| වැඩසටහන | 2024 ඇස්තමේන්තුව (රුපියල් මිලියන) | 2024.11.30 දිනට වියදම (රුපියල් මිලියන) |
|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | 26,000,000 | 19,978,293.47 |
| පරිපාලන හා ආයතන සේවා (සාමාන්‍ය අධ්‍යාපනය) | 344,000,000 | 155,888,650.84 |
| පරිපාලන හා ආයතන සේවා (උසස් අධ්‍යාපනය) | 2,155,000,000 | 1,559,870,164.77 |
| පරිපාලන හා ආයතන සේවා (පර්යේෂණ හා නවෝත්පාදන) | 6,851,000 | 1,788,300 |
| පරිපාලන හා ආයතන සේවා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපනය) | 786,850,000 | 444,609,187.06 |
| ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය | 1,692,174,000 | 529,219,194.90 |
| විශේෂ අධ්‍යාපනය | 305,000,000 | 91,638,438.62 |
| ගුරු සංවර්ධනය | 324,076,000 | 121,224,472 |
| සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | 16,608,750,000 | 5,400,141,049.67 |
| - විදේශ ආධාර | 11,510,000,000 | 4,331,790,320.63 |
| - දේශීය (NSBS) | 2,188,750,000 | 369,618,070.16 |
| - දේශීය | 2,910,000,000 | 698,732,658.88 |
| උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | 23,795,000,000 | 17,426,758,025.86 |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ආයතනික සහය ලබා ගැනීම | 300,000,000 | 95,070,000 |
| විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය | 914,000,000 | 394,238,652 |
| ග්‍රහලෝකාගාරය | 106,000,000 | 62,000 |
| වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධනය | 3,315,930,000 | 906,364,091.95 |
| විද්‍යාතා සංවර්ධනය | - | - |
| එකතුව | 50,679,631,000 | 27,146,850,521.14 |

මූලාශ්‍රය : විවිධ ගිණුම් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් (2024.11.30) - සාමාන්‍ය අධ්‍යාපනය

| වැඩසටහන | 2024 ඇස්තමේන්තුව (රුපියල් මිලියන) | 2024.11.30 දිනට වියදම (රුපියල් මිලියන) |
|---|---|---|
| අමාත්‍ය කාර්යාලය (126 - 1– 1) | 142.01 | 87.81 |
| ආයතන හා පරිපාලන කටයුතු (126 - 1– 2) | 34,275.20 | 16,160.39 |
| ආයතන හා පරිපාලන - උසස් අධ්‍යාපන අංශය (126 - 1– 9) | 256.21 | 212.55 |
| ප්‍රාථමික අධ්‍යාපනය (126 - 2 - 3 – 1) | 7,062.23 | 5,743.47 |
| ද්විතීයික අධ්‍යාපනය (126 - 2 – 3 - 2) | 41,887.01 | 37,836.93 |
| ජාතික ක්‍රීඩා උලෙළ සඳහා අනුග්‍රාහකත්වය (126 - 2– 3 - 3 - 1409) | 50.00 | 28.59 |
| වෘත්තීය පුහුණුව සඳහා ආයතනික සහය (126 - 2– 3 - 4 - 1409) | 200.00 | 47.78 |
| විශේෂ අධ්‍යාපනය (126 - 2– 5 - 1) | 20.50 | 18.28 |
| ආබාධිත අධ්‍යාපනය (126 - 2– 5 - 3) | 309.54 | 247.23 |
| ආධාර ලබන පාසල් සඳහා (126 - 2– 5 - 4) | 3,035.04 | 2,478.34 |
| ගුරු සංවර්ධනය - ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන (126 - 2– 6 - 1) | 553.70 | 425.03 |
| ගුරු සංවර්ධනය - ජාතික විද්‍යාපීඨ (126 - 2– 6 - 2) | 2,668.39 | 2,257.56 |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ආයතනික සහය ලබා ගැනීම (126 - 2– 11) | 2,138.74 | 1,896.58 |
| එකතුව | 92,598.55 | 67,440.54 |

මූලාශ්‍රය: මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

# 05. ශිෂ්‍ය සාධනය

## ශිෂ්‍ය කාර්යසාධනය

### (අ) පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය සාධනය (2017 – 2023)**




**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (2017– 2023)**

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 350,462 | 350,191 | 332,179 | 326,264 | 335,158 | 329,668 | 332,949 |
| ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 69.4 | 79.09 | 78.1 | 86.83 | 77.12 | 82.97 | 77.75 |
| මධ්‍යන්‍ය ලකුණ | 106.43 | 117.98 | 114.38 | 125.65 | 109.31 | 115.11 | 111.74 |

මූලාශ්‍රය : ඇගයීම් වාර්තාව 2023, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අ.පො.ස. (උසස් පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2016 – 2022)

| | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 286,251 | 296,812 | 296,029 | 305,427 | 308,134 | 311,321 | 317,326 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 200,208 | 216,815 | 222,281 | 225,539 | 236,015 | 231,982 | 236,041 |
| සමත් ප්‍රතිශතය % | 69.9 | 73.05 | 75.09 | 73.84 | 76.59 | 74.52 | 74.38 |

පළාත් අනුව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අ.පො.ස. (උසස් පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2021 - 2022)

| පළාත | 2021 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % |
| දකුණ | 39,487 | 30,860 | 78.15 | 41,446 | 32,165 | 77.61 |
| වයඹ | 36,874 | 26,613 | 72.17 | 37,275 | 27,780 | 74.53 |
| බස්නාහිර | 81,299 | 61,854 | 76.08 | 81,093 | 60,789 | 74.96 |
| ඌව | 20,901 | 15,257 | 73 | 21,367 | 15,876 | 74.30 |
| මධ්‍යම | 40,160 | 29,584 | 73.67 | 40,840 | 29,701 | 72,73 |
| සබරගමුව | 28,849 | 21,492 | 74.5 | 29,642 | 22,285 | 75.18 |
| උතුරු මැද | 21,293 | 15,119 | 71 | 21,987 | 15,351 | 69.82 |
| නැගෙනහිර | 25,895 | 19,201 | 74.15 | 26,874 | 19,819 | 73.75 |
| උතුර | 16,563 | 12,002 | 72.46 | 16,802 | 12,275 | 73.06 |
| මුළු එකතුව | 311,321 | 231,982 | 74.52 | 371,326 | 236,041 | 74.38 |

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය (2017–2022) ඒ ඒ විෂය සමත් ශිෂ්‍ය ප්‍රතිශතය




මූලාශ්‍රය: ඇගයීම් වාර්තාව 2017 - 2022 , ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

(ඇ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය (පාසල් අයදුම්කරුවන්) 2019 - 2023

| | 2019 (නව නිර්දේශය) | 2019 (පැරණි නිර්දේශය) | 2020 (නව නිර්දේශය) | 2020 (පැරණි නිර්දේශය) | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 173,781 | 61,769 | 251,168 | 24146 | 236,035 | 232,797 | 229,057 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව | 108,353 | 46,552 | 165,711 | 15,960 | 149,946 | 149,487 | 151,343 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 62.35 | 75.36 | 65.98 | 66.1 | 63.53 | 64.21 | 66.07 |

මූලාශ්‍රය: ඇගයීම් වාර්තාව 2023, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**එක් එක් විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය**

**(පළමු වරට පෙනී සිටින 2019 - 2023)**






















මූලාශ්‍රය : ඇගයීම් වාර්තාව 2023, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## 06. සාමාන්‍ය අධ්‍යාපන අංශයට අනුබද්ධ ආයතන

### ජාතික අධ්‍යාපන ආයතනය

**2024.12.31 දක්වා භෞතික ප්‍රගතිය**

- ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා වන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවට ගැළපෙන ලෙස ජාතික විෂයමාලා රාමුව පෙළගැස්වීම.
- 2025 වර්ෂයේ දී පාසල්වල නියාමනය කිරීමට නියමිත ව තිබූ **1, 2, 6, 7, 10** සහ **11** ශ්‍රේණිවලට අදාළ ක්‍රියාකාරකම් පොත්, මොඩියුල සහ ගුරු මාර්ගෝපදේශ (මාධ්‍ය තුනෙන් ම) සකස් කරන ලද අතර, මේ සම්බන්ධයෙන් අත්කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ:

| | | අවසන් පිටපත් | කෙටුම්පත් | එකතුව |
|---|---|---|---|---|
| 1 ශ්‍රේණිය | ක්‍රියාකාරකම් පොත් | 43 | - | 43 |
| | ගුරු මාර්ගෝපදේශ | 17 | - | 17 |
| 2 ශ්‍රේණිය | ක්‍රියාකාරකම් පොත් | 10 | - | 10 |
| | ගුරු මාර්ගෝපදේශ | 04 | - | 04 |
| 6 සහ **10** ශ්‍රේණි | මොඩියුල | 811 | - | 811 |
| | ගුරු මාර්ගෝපදේශ | 442 | - | 442 |
| 7 සහ 11 ශ්‍රේණි | මොඩියුල | 163 | 60 | 223 |
| | ගුරු මාර්ගෝපදේශ | 115 | 10 | 125 |

නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් පාසල්වල ගුරුවරුන් සහ අදාළ නිලධාරීන් පුහුණු කිරීම සහ සමස්ත පද්ධතිය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම පහත පරිදි වේ:

| | | 1 වන වාරය | 2 සහ **3** වන වාර | එකතුව |
|---|---|---|---|---|
| 1 ශ්‍රේණිය | ගුරුවරුන්/ ගුරු උපදේශකවරුන්/ විදුහල්පතිවරුන්/අනෙකුත් නිලධාරීන් | 224 | 92 | 316 |
| 6 සහ **10** ශ්‍රේණි | ගුරුවරුන්/ ගුරු උපදේශකවරුන්/ විදුහල්පතිවරුන්/අනෙකුත් නිලධාරීන් | 938 | 628 | 1,566 |

- 1, 6 සහ **10** ශ්‍රේණි සඳහා සකස් කර ඇති නව විෂයමාලා ප්‍රතිසංස්කරණ මෙම වසරේ තෝරා ගත් පාසල්වල සිසුන් **5000**ක් යොදා ගෙන නියාමනය කිරීම සහ එම නියාමනයෙන් ලැබුණු ප්‍රතිපෝෂණ මත මෙම ශ්‍රේණිවලට අදාළ ක්‍රියාකාරකම් පොත්, මොඩියුල සහ ගුරු මාර්ගෝපදේශ සංස්කරණය කර මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාර දීම.
- 1 ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා දරුවන් හඳුනා ගැනීම සඳහා දැනට යොදා ගැනෙන ක්‍රියාකාරකම් සංශෝධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය දත්ත පූර්ව නියාමනය කිරීමෙන් පසු ක්‍රියාකාරකම්වල අවසන් පිටපත් සකස් කිරීම. ඊට අමතරව ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා වීඩියෝවක් සකස් කිරීම.
- පවතින ජාතික මුල් ළමාවිය විෂයමාලා රාමුව **(NECCF)** සමාලෝචනය කිරීමෙන් පසු ජාතික මුල් ළමාවිය විෂයමාලා රාමුවේ අවසාන කෙටුම්පත සකස් කිරීම.
- **10-13** ශ්‍රේණි සඳහා කොරියානු භාෂා ගුරුවරුන් **400** දෙනෙකු දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ මාර්ගගත ධාරිතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.
- **8-11** ශ්‍රේණියේ සිසුන් අතර ඩිජිටල් පුරවැසිභාවයට අදාළ කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා මොඩියුල **05**ක් සංවර්ධනය කිරීම සහ නියමු පාසල්වල ගුරුවරුන් **45**දෙනෙකු යාවත්කාලීන කිරීම
- ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවල **(RESC) 26** වන ජාතික සමුළුව සහ භාෂා තක්සේරුව පිළිබඳ **11** වන ජාතික සමුළුව **(2024)** පැවැත්වීම
- පාසල් දරුවන් අතර යහපුරවැසිභාවය, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා අතිරේක වීඩියෝ වැඩසටහන් **13**ක් සහ කෙටි වීඩියෝ වැඩසටහන් **05**ක් නිෂ්පාදනය කිරීම
- ජාතික අධ්‍යාපන ආයතනයේ යූ ටියුබ් නාලිකාව සඳහා විෂයානුබද්ධ වැඩසටහන් **14**ක්, ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් **07**ක් සහ ප්‍රවණතා සහ ප්‍රවෘත්ති වැඩසටහන් **11**ක් නිෂ්පාදනය කිරීම
- "සාමාන්‍ය අධ්‍යාපනයේ ද්විතීයික විෂයමාලා ද්‍රව්‍යවල යහපත් පුරවැසිභාවය පිළිබඳ සංකල්පය නිරූපණය කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්" යන පර්යේෂණ වාර්තාව කෙටුම්පත් කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා විසින් පවත්වන ලද "කන්නන්ගර අධ්‍යාපන දර්ශනය සහ කුසලතා පූර්ණ ශ්‍රම බලකායක් බිහි කිරීම උදෙසා උසස් අධ්‍යාපනයේ කාර්යභාරය" මැයෙන්, ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශනය සංවිධානය කිරීම.
- ද්විතීයික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ව උපදේශන නායකත්වය පිළිබඳ විදුහල්පතිවරුන් හා සහකාර විදුහල්පතිවරුන් **275**ක් සහ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් **102**ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- "අධ්‍යාපන කළමනා **2024**" සඟරාව මාධ්‍ය තුනකින් ප්‍රකාශයට පත් කිරීම.

- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයට අනුකූල වන පරිදි ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමාව පිළිබඳ ලේඛනය සකස් කිරීම
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් හඳුනා ගැනීමට හා තක්සේරුව සඳහා වීඩියෝ පට **05**ක් සහ තක්සේරු වාර්තා **10**ක් සකස් කිරීම.
- **"අන්තර්කරණ 2024"** සඟරාව සකස් කිරීම.
- මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් විෂයමාලා අනුවර්තනය පිළිබඳ ප්‍රාථමික සම්පත්ධාරීන් **292**ක කණ්ඩායමක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සහ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන් **33** දෙනෙකු පුහුණු කිරීම.
- ගුරු පුහුණුකරුවන් 200 දෙනෙකු සඳහා වෘත්තීය මාර්ගෝපදේශය සහ උපදේශනය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- නියාමනය සඳහා තෝරා ගත් පාසල්වල 6 සහ 10 ශ්‍රේණිවල වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරුන් 25 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- විවිධ හේතූන් මත පාසල් අධ්‍යාපනය අහිමි වූවන් සඳහා අධ්‍යාපන මාර්ග විවෘත කිරීමේ අරමුණෙන් විවෘත පාසල් ඒකකය විසින් දූරස්ථ පාඨමාලා තුනක් (සාක්ෂරතා පාඨමාලාව, පදනම් පාඨමාලාව සහ ද්විතීයික පාඨමාලාව) ආරම්භ කිරීම හා 1300ක පමණ පාඨමාලාලාභීන් එම පාඨමාලා හදාරමින් සිටීම.
- ඩිජිටල් තාක්ෂණය ඒකාබද්ධ කිරීම මඟින් සාක්ෂරතාව වැඩි දියුණු කිරීම සඳහා විවෘත පාසල් ඉගෙනුම් මධ්‍යස්ථාන දෙකක තොරතුරු තාක්ෂණය පදනම් කරගත් නියමු වැඩසටහනක් දියත් කිරීම. එම වැඩසටහන්වලට අදාළ ව අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් අත්දැකීම් පිළිබඳ පහසුකම් සැලසීම සඳහා සිසුන් වෙත ටැබ්ලට් පරිගණක නොමිලේ ලබා දීම.
- දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය මධ්‍යස්ථාන ඔස්සේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා දර්ශනපති උපාධියේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පාඨමාලා 14ක් ක්‍රියාත්මක කිරීම. වර්තමානයේ සිසුන් 14,589ක් ඒවායේ අධ්‍යාපනය ලැබීම.

**<u>2024.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය</u>**

**2025 වසර සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්වල සාරාංශය**

- විෂයමාලාව නැවත සමාලෝචනය කිරීම සහ අධ්‍යාපන පරිවර්තනය පිළිබඳ නව දැක්මේ ඉලක්ක සමඟ අනුගත කිරීම.
- අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනස සඳහා වූ නව දැක්මෙහි අරමුණුවලට සමපාත වන අයුරින් විෂයමාලාව සමාලෝචනය හා පුනරීක්ෂණය කිරීම.
- විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ රාමුව සහ ඊට අදාළ ලේඛන සමාලෝචනය කර අධ්‍යාපන අමාත්‍යාංශයට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට ලබා දීම
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කළ ශක්‍යතා සංවර්ධන වැඩසටහන් සමාලෝචනය කොට ඊට අදාළ සැපයුම්වලට සැලසුම්කරණය (logistical planning) සඳහා ඒවා අධ්‍යාපන අමාත්‍යාංශයට බාර දීම
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යය යටිතල පහසුකම් සැපයීම පිළිබඳ මාර්ගෝපදේශ අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දීම
- විෂයමාලා තක්සේරුකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව සමඟ සමීපව කටයුතු කිරීම
- විවිධ හේතූන් මත පාසල් අධ්‍යාපනය අහිමි වූ සිසුන් සඳහා අධ්‍යාපන මාර්ග විවෘත කිරීමේ අරමුණෙන් විවෘත පාසල් ඒකකය මඟින් දූරස්ථ පාඨමාලා තුනක් (සාක්ෂරතා, පදනම් සහ ද්විතීයික) ආරම්භ කිරීම
- වෘත්තීය මාර්ගෝපදේශය සහ උපදේශනය පිළිබඳ ගුරු පුහුණුකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා දර්ශනපති (අධ්‍යාපන) උපාධියේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පාඨමාලා 20ක් ක්‍රියාත්මක කිරීම
- දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සහිත ආදර්ශ පෙර පාසලක් පිහිටුවීම සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම.
- NIE Alpha U දෘශ්‍ය ශ්‍රව්‍ය විදුලි නාලිකාව සඳහා අධ්‍යාපනික ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය කිරීම
- ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා ඉවහල් කර ගත හැකි ශ්‍රව්‍ය සහ දෘශ්‍ය වැඩසටහන් නිෂ්පාදනය කිරීම
- විවෘත පාසල් ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ශිෂ්‍යයන් 1500ක් සඳහා පාඨමාලා තුනක් (සාක්ෂරතා, පදනම් සහ ද්විතීයික) පැවැත්වීම

# 2024/ 2025 අයවැය කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව

# අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

දැයේ දූ දරුවන්ට නිදහස් අධ්‍යාපනයේ ඵල ලබන්නට අවශ්‍ය පාසල් පෙළපොත් නොමිලේ ලබාදීමේ සහ එයට ම බද්ධ වූ අතිරේක කියවීම් පොත් හා ඉගෙනුම් ආධාරක සම්පාදනය කර දීමේ ජාතික කර්තව්‍යය ඉටු කරනු වස්, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් ලෙස අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

## පසුබිම් තොරතුරු

**1965** මාර්තු **27** දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදනය මඟින් වෙනම වැය ඒකකයක් ලෙස හා **1966** සැප්තැම්බර් මස **30** දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදනයකින් එවකට පැවති අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ කටයුතු කරන දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රතිස්ථාපනය කරන ලදී.

**1965** දී " බී " ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරන ලද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව **2004. 07. 14** දින සිට අධිශ්‍රේණිගත දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රතිස්ථාපනය කර දෙපාර්තමේන්තු ප්‍රධාන තනතුරු නාමය අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ලෙස සංශෝධනය කොට අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තනතුරකට සමාන වන සේ ඉහළ නංවන ලදී.

මූලික කාර්යභාරය අධීක්ෂණය කිරීමේ පහසුව උදෙසා දෙපාර්තමේන්තුව සංවර්ධන, සැලසුම්, නිෂ්පාදන, ප්‍රකාශන, බෙදාහැරීම්, අලෙවි ප්‍රවර්ධන, මුදල්, ආයතන, තොරතුරු තාක්ෂණ හා විගණන ලෙස අංශවලට බෙදා ඒ යටතේ නියෝජ්‍ය හා සහකාර කොමසාරිස්වරුන්, සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන්, කාර්යාල සේවක සේවයේ සේවකයන්, රියදුරන් ආදී කාර්ය මණ්ඩලය අනුයුක්ත කර කටයුතු කිරීමට ව්‍යුහගත කර ඇත.

## ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

**අන්තර්ජාතික අධ්‍යාපනික සංවර්ධනය හා අනුගතවන ඉහළ ගුණාත්මකබවකින් යුතු පෙළපොත් සම්පාදනය කිරීමෙන් සැමට අධ්‍යාපනය ලබාදීම සහතික වීම.**

### මෙහෙවර ප්‍රකාශය

**රජය මඟින් නොමිලේ පෙළපොත් ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් ද අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සෙසු පෙළපොත්, වැඩපොත්, පරිවර්තන ග්‍රන්ථ, පාරිභාෂික ශබ්දමාලා, අතිරේක කියවීම් පොත්, කෝෂ ග්‍රන්ථ හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ඇතුළු අනෙකුත් ආධාරක සම්පාදනය කොට සැපයීමෙන් ද අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම ඔස්සේ රටට වැඩදායී ගුණවත්, නැණවත් පුරවැසි පිරිසක් බිහිකරලීමට දායක වීම.**

## අරමුණු

අධ්‍යාපනයේ ගුණාත්මකබව වර්ධනය කිරීම තුළින් රටට වැඩදායී ගුණවත් නැණවත් පුරවැසි පිරිසක් බිහිකරලීම

- රජයේ පාසල් හා පිරිවෙන්වල ඉගෙන ගන්නා 1 සිට 11 දක්වා සියලු ම ශ්‍රේණිවල දරුවන් සඳහා අවශ්‍ය වන පාසල් පෙළපොත් නොමිලේ ලබා දීම
- අතිරේක කියවීම් පොත් සම්පාදනය මඟින් පාසල් විෂය මාලාව හා අතිරේක දැනුම සිසුන්ට ලබා දීම
- ප්‍රශ්නෝත්තර පොත් මුද්‍රණය මඟින් ප්‍රසිද්ධ විභාගවලට පෙනී සිටින සිසුන්ට විභාගයට මුහුණ දීම සඳහා සූදානමක් ඇති කිරීම
- ගුරු මාර්ගෝපදේශ මුද්‍රණය කිරීම හා බෙදා හැරීම මඟින් විෂය නිර්දේශ පිළිබඳ දැනුම ගුරුවරුන් වෙත ලබා දීම
- විෂය නිර්දේශයට අදාළ ඉගෙනුම වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක ලබා දීම

## ප්‍රධාන කාර්යයන්

අංක 14, 715/3 1966 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා දිනැති ලංකාණ්ඩුවේ අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් පහත දැක්වෙන කාර්යයන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

- මූලික, ද්විතීයික හා උසස් අධ්‍යාපනයේ භාවිතය උදෙසා සම්මත පොත් පරිවර්තනය කිරීම, ප්‍රසිද්ධ කිරීම, බෙදාහැරීම හා විකිණීම, ප්‍රකාශන හිමිකම් මිලට ගැනීම.
- අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාඩම් පොත්, පාරිභාෂික ශබ්ද මාලා, කෝෂ ග්‍රන්ථ හා වෙනත් පොත් නිෂ්පාදනය, ප්‍රසිද්ධ කිරීම, බෙදා හැරීම හා විකිණීම
- ශික්ෂණාධාර, ශ්‍රව්‍ය දෘශ්‍ය හා වෙනත් උපකරණ නිෂ්පාදනය, බෙදා හැරීම හා විකිණීම
- කියවන ද්‍රව්‍ය නිෂ්පාදනය උනන්දු කිරීම

## <u>විශේෂ කරුණු</u>

- **බ්‍රේල් පෙළපොත් පිළිබඳව**

**බ්‍රේල් පෙළපොත් ඇණවුම් ලේඛනවලට අනුව,**

**1. 2025 වර්ෂයේ දී දිවයින පුරා අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත සිසු දරුදැරියන් වෙනුවෙන් ලබා දීමට අවශ්‍ය බ්‍රේල් පෙළපොත් පිටපත් සංඛ්‍යාව 7,970 කි.**

**2. බ්‍රේල් පෙළපොත් බෙදා හරින ලද විශේෂ අධ්‍යාපන පාසල් සංඛ්‍යාව 14 කි.**

**3. කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ පවතින විශේෂ අධ්‍යාපන ඒකක සංඛ්‍යාව 43 කි.**

**4. බ්‍රේල් පෙළපොත් ඉල්ලුම් කරන ලද දෘශ්‍යාබාධිත සිසුන් සංඛ්‍යාව 230 ක් පමණ වේ.**

- **දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය එක්ව පැවැත් වූ 2024 බක් මහ උළෙල....**

## 2025 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘති හා වැඩසටහන්

**2026 වර්ෂයට අවශ්‍ය පෙළපොත් මුද්‍රණය කිරීම**

**2026 වර්ෂයට අවශ්‍ය පෙළපොත් පාසල්වලට හා බෙදාහැරීමේ මධ්‍යස්ථාන වෙත බෙදාහැරීම**

**අතිරේක කියවීම් පොත් සම්පාදනය කිරීම**

**දෘශ්‍යාබාධිත සිසුන් ට අවශ්‍ය බ්‍රේල් පෙළපොත් සම්පාදනය හා බෙදා හැරීම**

| අනු අංකය | ක්‍රියාකාරකම් | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | | | භෞතික ප්‍රගතිය | 2024-12-31 වන විට අපේක්ෂිත කාර්ය සාධනය |
|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත මුදල | වැය වූ මුදල | වැය වූ මුදල ඇස්තමේන්තු ගත මුදලේ ප්‍රතිශතයක් ලෙස (%) | | |
| 1 | 11 | 19986.00 | 8578.00 (අනු අංක 1 සිට 4 දක්වා මූල්‍ය ප්‍රගතිය මෙහි දැක්වේ.) | 42.92 % (අනු අංක 1 සිට 4 දක්වා මූල්‍ය ප්‍රගතිය මෙහි දැක්වේ.) | 2,3,4,5,7,8,9,11ශ්‍රේණි සඳහා 2025 වර්ෂයට මුද්‍රණය කිරීමට අපේක්ෂිත පෙළපොත් 100% මුද්‍රණය කර අවසන් ය.<br>1,6,10 ශ්‍රේණි සඳහා 2025 වර්ෂයට මුද්‍රණය කිරීමට අපේක්ෂිත පෙළපොත් මුද්‍රණය වෙමින් පවතී. | 2025 වර්ෂය සඳහා පාසල් ළමුන්ට ලබාදීමට අවශ්‍ය සියලු පෙළපොත් මුද්‍රණය කර අවසන් කිරීම. |
| 2 | පෙළපොත් බෙදා හැරීම | | | | 2025 සඳහා අවශ්‍ය පාසල් පෙළපොත් 72 % ක් පමණ බෙදා හැර අවසන්ය (1,6,10 ශ්‍රේණි සඳහා අවශ්‍ය පෙළපොත් බෙදා හරිමින් පවතී. | සියලුම පාසල් ළමුන් ට නිසි කලට වේලාව ට පෙළපොත් ලබා දීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3 | බෙදාහැරීමේ දීමනා ගෙවීම (පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා විදුහල්පතිවරුන් සඳහා) | | | | 2023 වර්ෂයේ පෙළපොත් බෙදා හැරීම සඳහා අදාළ දීමනා සියල්ල ගෙවා ඇත. 2024 වර්ෂයේ බෙදා හැරීමේ දීමනා වවුචර්පත් මේ වන විට ලැබෙමින් පවතී. | බෙදා හැරීමේ දීමනා 100% ක් ගෙවා අවසන් කිරීම. |
| 4 | අතිරේක පොත් සම්පාදනය | | | | අතිරේක පොත් 13ක් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ ආයතන වෙත භාර දී ඇති අතර, ඉන් පොත් 10ක් මුද්‍රණය කර අවසන්ය. | වර්ෂය තුළ දී අපේක්ෂිත අතිරේක පොත් ප්‍රමාණය මුද්‍රණය කිරීම. |
| 5 | 2023 වර්ෂයට අදාළ කාර්යයන් සඳහා ගෙවිය යුතු මුදල් පියවීම | 8.2 | 8.18 | 100% | 100%ක් ගෙවා අවසන් කර ඇත. | 2023 වර්ෂයට අදාළ කාර්යයන් සඳහා සියලු මුදල් පියවීම් සිදු කිරීම. |
| 6 | අතිරේක පොතක් වන "16+ යෞවනයට ආමන්ත්‍රණයක් " පොත දෙමළ මාධ්‍යයෙන් නිෂ්පාදනය කිරීම | 5 | 1.49 | 29.8% | 100%ක් මුද්‍රණය අවසන් කර ඇත. | "16+ යෞවනයට ආමන්ත්‍රණයක්" පොත දෙමළ මාධ්‍යයෙන් සම්පාදන කටයුතු නිම කිරීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **7** | කාර්යාල ස්වයංක්‍රීයකරණ පද්ධතිය සංවර්ධනය කිරීම | **14.2** | **0** | **0%** | පද්ධති බෙදාහැරීමේ අංශයට අදාළ කොටස් නිමකර ඇත. අනෙකුත් අංශවලට අදාලව පද්ධතිය සකස් කරමින් සිටී. | කාර්යාල ස්වයංක්‍රීයකරණ පද්ධතිය සංවර්ධනය කර, ස්ථාපිත කිරීම |
| **8** | දෙපාර්තමේන්තුව සඳහා **POS** පද්ධතියක් ස්ථාපනය කිරීම | **4** | **0** | **0%** | **POS** පද්ධතිය ආරම්භ කිරීම සඳහා මූලික සාකච්ඡාවට පවත්වා ඇත. | පද්ධතිය ස්ථාපනය නිම කිරීම |
| **9** | **POS** පද්ධතිය හා ස්වයංක්‍රීය පද්ධතිය පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම | **0.5** | **0** | **0%** | සිදුකිරීමට නියමිතයි. | **POS** පද්ධතිය හා ස්වයංක්‍රීය පද්ධතිය පිළිබඳ නිලධාරීන්ට මනා දැනුමක් හා අවබෝධයක් ලබාදීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පාසල්වලට නොමිලේ සපයනු ලබන ඉගෙනුම් ආධාරක පිළිබඳ ඇගයීම් අධ්‍යයනය | 0.2 | 0 | 0% | සිදුකිරීමට නියමිතයි. | ඇගයීම් වාර්තාවක් සැකසීම |
| 11 | අධ්‍යාපන අමාත්‍යාංශය හා විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව අධ්‍යාපනික මෙවලම් මුද්‍රණය කිරීම | 15.9 | 13.5 | 84.9% | පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර පොත් 11 ක් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංග්‍රීසි, ගණිත අංශයන්ට අදාළ පොත් 03ක් ද මුද්‍රණය අවසන් කර ඇත. | අධ්‍යාපනික මෙවලම් මුද්‍රණය කිරීම |
| 12 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සඳහා යන්ත්‍ර (Brightness and Opasity Tester) මිලදී ගැනීම | 2 | 0 | 0% | විවෘත ලංසු කැඳවීමෙන් ලබාගැනීමට කමිටුවෙන් තීරණය කර ඇත. ලංසු ලැබුණු පසු ප්‍රසම්පාදන කටයුතු ඇරඹීමට නියමිතය. | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙහි යන්ත්‍ර (Brightness and Opacity Tester) ස්ථාපනය කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 1 | 0.87 | 86.6 % | නිලධාරීන් 102 ක් පුහුණු වැඩසටහන් 07කට යොමු කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වර්ධනය කිරීම |
| 14 | <u>යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ</u><br>වාහන | <u>වැඩසටහන්</u><br>3 | 2.35 | 78.34 % | | ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය සහ පවත්නා මට්ටමෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම |
| 15 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1.25 | 1.25 | 100 % | | |
| 16 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1 | 0.86 | 86.09 % | | |
| 17 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 4 | 3.56 | 89.04 % | | |
| 18 | <u>පුනරාවර්තන වියදම්</u><br>නඩත්තු වියදම් | 9.31 | 7.42 | 79.71 % | | |
| 19 | වැටුප් හා වේතන ගෙවීම් | 64.5 | 62.37 | 96.7 % | | |
| 20 | අතිරේක සේවා සැපයීම් | 37.84 | 27 | 71.37 % | | |

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ 2024.01.01 දින සිට 2024.12.31 දක්වා ප්‍රගතිය**

**01. පාසල් විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම**

**රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් හා ඉන් අනතුරුව ඇති වූ ආර්ථික හා සාමාජීය අර්බුද හමුවේ එක් එක් වර්ෂයන්හි පැවැත්වීමට නියමිතව තිබූ ජාතික මට්ටමේ විභාග කිසිවක් සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් 2024 වර්ෂයේ දී 2023 වර්ෂයට අදාළ විභාග ද පැවැත්වීමට සිදු විය.**

**අ.පො.ස. (උසස් පෙළ) විභාගය 2023 (2024)**

විභාගය පැවැත්වූ දිනය - 2024.01.04 සිට 2024.01.31

| | අයදුම්කරුවන් සංඛ්‍යාව | | | | මුළු අයදුම්කරුවන් | |
|---|---|---|---|---|---|---|
| | පාසල් | | පෞද්ගලික | | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| | ගැහැණු | පිරිමි | ගැහැණු | පිරිමි | | |
| විෂයයන් 03ක් සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව | 135,010 | 94,047 | 24,795 | 15,761 | 269,613 | |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය අවම සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | 97,305 | 54,038 | 14,639 | 7,462 | 173,444 | 64.30 % |
| ප්‍රතිඵල අත්හිටවූ සංඛ්‍යාව | 55 | | 35 | | 90 | |



අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය 2023 (2024)

විභාගය පැවැත්වූ දිනය - 2024.05.06 සිට 2024.05.15

විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව - 453,420

ප්‍රතිඵල නිකුත් කළ දිනය - 2024.09.28

අ.පො.ස. (උ/පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව - 244,228

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2024

විභාගය පැවැත්වූ දිනය - 2024.09.15

විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව - 323,879

අ.පො.ස. (උසස් පෙළ) විභාගය 2024

| *විභාග වර්ගය* | *පැවැත්වූ සංඛ්‍යාව* | *ප්‍රතිඵල නිකුත් කළ සංඛ්‍යාව* |
|---|---|---|
| බඳවා ගැනීම් විභාග | 38 | **42** |
| සහතික පත්‍ර විභාග | 13 | **13** |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 28 | **28** |
| උසස් කිරීමේ විභාග | 06 | **06** |
| වෙනත් විභාග | 03 | **10** |
| එකතුව | **88** | **99** |

විභාගය පැවැත්වූ කාල සීමාව - **2024.11.20 සිට 2024.12.31**

විභාගය සඳහා අයදුම් කළ අපේක්ෂකයින් සංඛ්‍යාව - **333,188**

02. <u>ආයතනික විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම</u>

03. <u>සහතිකපත්‍ර නිකුත් කිරීම (මුල් පිටපත් හා දෙවන පිටපත්) හා ප්‍රතිඵල සනාථ කිරීම</u>

**04.** ධාරිතා සංවර්ධන වැඩසටහන්

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලැබූ වැඩසටහනකට අනුව මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් 04 දෙනෙකු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මගින් මෙහෙයවනු ලබන අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා යොමු කරන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ කළමනාකරණ කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් මාණ්ඩලික නිලධාරීන් 70 දෙනෙකු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මගින් මෙහෙයවනු ලැබූ ''කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහනක්'' සඳහා යොමු කරන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට අනුයුක්ත ව සේවය කරනු ලබන කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා කළමනාකරණ සේවා නිලධාරී හා සංවර්ධන නිලධාරී සේවයේ III වැනි ශ්‍රේණියට අයත් නිලධාරීන් 100 දෙනෙකු සඳහා කාර්යාල ක්‍රම, මූදල් රෙගුලාසි, ප්‍රසම්පාදනය, භාණ්ඩ සමීක්ෂණය හා පුද්ගල ආකල්ප සංවර්ධනය පිළිබඳ තෙදින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා ප්‍රවාහන අංශයේ රාජකාරී පිළිබඳ මනා අවබෝධයක් ලබා දීමේ අරමුණින්, ප්‍රවාහන අංශයේ සේවයේ නියුතු නිලධාරියෙකු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මඟින් මෙහෙයවනු ලබන ''ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව'' සඳහා යොමු කරන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරේ සේවයේ නියුතු නිලධාරීන් දෙදෙනෙකුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (SLIIT) මඟින් මෙහෙයවනු ලැබූ "Cyber Security and Digital Forensics" සහ "Web Development" යන පාඨමාලා සඳහා යොමු කරන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේ සේවයේ නියුතු නිලධාරියෙකු ''Metropolitan Campus KDU'' ආයතනය මඟින් මෙහෙයවනු ලබන ''Payroll System'' සම්බන්ධ පුහුණු පාඨමාලාවට යොමු කර අදාළ පුහුණුව ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ද්වීතියික මට්ටමේ තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන් 50 දෙනෙකු රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්වනු ලබන දෙමළ භාෂා පාඨමාලාවක්

## 05. ගුණාත්මක සංවර්ධන වැඩසටහන්

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ තක්සේරුකරණය පිළිබඳව පහත ගුණාත්මක සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

විද්‍යා සහ ගණිතය විෂයයන් සඳහා අ. පො. ස. (සා. පෙළ) තක්සේරුකරණ රාමු යාවත්කාලීන කිරීමේ වැඩමුළුව

භාෂා විෂයයන් (සිංහල , දෙමළ සහ ඉංග්‍රීසි ) සඳහා අ. පො. ස. (සා. පෙළ) තක්සේරුකරණ රාමු සකස් කිරීමේ වැඩමුළුව

සමාජ විද්‍යා විෂයයන් (ඉතිහාසය , භූගෝල විද්‍යාව සහ පුරවැසි අධ්‍යාපනය) සඳහා අ. පො. ස. (සා.පෙළ) තක්සේරුකරණ රාමු සකස් කිරීමේ වැඩමුළුව

ආගම සහ සාරධර්ම විෂයයන් (බුද්ධ ධර්මය, ශෛවනරි, ඉස්ලාම්, කතෝලික ධර්මය, ක්‍රිස්තියානි ) සඳහා අ. පො. ස. (සා. පෙළ) තක්සේරුකරණ රාමු සකස් කිරීමේ වැඩමුළුව

SAMIS පද්ධතිය ස්ථාපනය කිරීම, අධ්‍යාපන අමාත්‍යංශයේ NEMIS පද්ධතිය සමඟ ඒකාබද්ධව සිදු කරන ලද සාකච්ඡාව

SATGS, SLARR හා SAMIS ව්‍යාපෘතිවල ඉදිරි කටයුතු සිදු කිරීම පිළිබඳ නිර්දේශ ලබා දීමේ සාකච්ඡාව.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ව පාසල් මට්ටමේ තක්සේරුකරණය පිළිබඳ රැස්වීම

ජාතික මට්ටමේ තක්සේරුකරණ සහ පාසල් මට්ටමේ තක්සේරුකරණ රාමු සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ, ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ රැස්වීම් පැවැත්වීම

යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ කාණ්ඩ 1 වර්ගයේ විෂයයන් සඳහා තක්සේරුකරණ රාමු සකස් කිරීම

| | |
|---|---|
| විද්‍යාව, ගණිතය, භාෂා විෂයයන් | - සිංහල, දෙමළ, ඉංග්‍රීසි |
| සමාජ විද්‍යා විෂයයන් | - ඉතිහාසය, භූගෝල විද්‍යාව හා පුරවැසි අධ්‍යාපනය |
| ආගම් විෂයයන් | - බුද්ධ ධර්මය, ශෛවනරී, ඉස්ලාම්, කතෝලික ධර්මය, ක්‍රිස්තියානි |

විද්‍යාව හා ගණිතය විෂයයන් සඳහා මූලාකෘති ප්‍රශ්න සකස් කිරීම

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජාතික ශිෂ්‍ය තක්සේරුකරණ රාමුව (National Student Assessment Framework) හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (National Education Policy Framework) අනුව යාවත්කාලීන කිරීම

## 06. භෞතික සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ඉදි කෙරෙමින් පැවති නවීන විභාග ශාලා, ඇගයීම් ශාලා සහ බහුකාර්යය ශ්‍රවණාගාරයක් යනාදි පහසුකම්වලින් සමන්විත සයමහල් බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිමාවට පත් විය.

## 07. අනෙකුත්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් පාර්ශ්වකාර ආයතනවල පරිපාලනය සහ ධාරිතා සංවර්ධනය සඳහා ක්ලවුඩ් සේවා සහ ඊ-සේවා ලබා ගැනීම.

| වැය විෂය | 2024 ඇස්තමේන්තුව (රු. මිලි.) | 2024.12.31 දිනට වියදම (රු. මිලි.) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | | |
| පුද්ගලික වැටුප් | 652,720,000.00 | **544,554,638.20** |
| ගමන් වියදම් | 6,000,000.00 | **2,527,833.45** |
| සැපයීම් | **1,030,700,000.00** | **526,144,517.83** |
| නඩත්තු වියදම් | **90,500,000.00** | **84,677,430.00** |
| සේවා | **9,248,300,000.00** | **6,094,848,818.85** |
| මාරුවීම් | 5,000,000.00 | **4,024,897.55** |
| ප්‍රාග්ධන වියදම් | | |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම | 58,000,000.00 | **50,400,957.88** |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | **61,500,000.00** | **53,418,622.56** |
| ධාරිතා සංවර්ධනය | 1,000,000.00 | **995,145.00** |
| සංවර්ධන සැලැස්ම | **185,000,000.00** | **174,582,997.45** |
| අධ්‍යාපන ප්‍රතිසංස්කරණ | **15,000,000.00** | **0.00** |
| එකතුව | **11,353,720,000.00** | **7,536,175,858.77** |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය

## 2025 වර්ෂයේ සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා සංවර්ධන ව්‍යාපෘති

අර්ධ ස්වයංක්‍රීය පරීක්ෂණ උත්පාදන පද්ධතිය (SATGS), පාසල් මට්ටමේ තක්සේරුකරණ සම්පත් සංචිතය (SLARR) සහ ශිෂ්‍ය තක්සේරුකරණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (SAMIS) යන ආධාරක පද්ධති තුනක් සංවර්ධනය කිරීම (දැනට ක්‍රියාත්මක වෙමින් පවතී)

DLI-1 යටතේ සියලුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය කාර්යාල

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජාතික තක්සේරුකරණ රාමුව, ජාතික විෂයමාලා රාමුව (NCF) හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPP) යාවත්කාලීන කිරීම.

පාසල් මට්ටමේ තක්සේරුකරණ පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා එම පර්යේෂණ මත පදනම් ව පවතින හා යෝජිත පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා තක්සේරුකරණය හා ඇගයීමට අදාළ උසස් අධ්‍යාපන අවස්ථා සහ පුහුණු (දේශීය, විදේශීය, දිගු කාලීන හා කෙටි කාලීන) ලබා දීම

නව තක්සේරුකරණ වැඩපිළිවෙළ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපනික ඇගයීම් ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම

අ.පො.ස.(සා/පෙළ) විභාගය සඳහා මිණුම් සලකුණු අධ්‍යයනය කිරීම. (Bench marking studies)

ආයතනික විභාග සම්බන්ධ අයිතම සංචිතයට අයිතම සකස් කරන සම්පත්දායක නිලධාරීන් සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය සඳහා ද්වි වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් (Two Color Printing Machine) මිල දී ගැනීම.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සතු පැරණි, දිරාපත් වෙමින් පවතින සහ මෙතෙක් පරිගණක ගත නොවූ විභාග ප්‍රතිඵල ලේඛනවල ඇති දත්ත සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ දෙවැනි අදියර ආරම්භ කිරීම , ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සහ දෙපාර්තමේන්තුවෙන් සේවා ලබා ගැනීමට පැමිණෙන මහජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා දෙපාර්තමේන්තුවේ සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

විභාග ක්‍රියාවලිය සහ සහතික පත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

විභාග මෙහෙයුම් ක්‍රියාවලිය බාධාවකින් තොරව ඉටු කිරීම සහතික කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව සඳහා 1000kv ක ජනක යන්ත්‍රයක් ස්ථාපනය කිරීම.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම.

විභාග දත්තවල අඛණ්ඩතාව හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ක්‍රියාවලිය හා සහතිකපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාළ ප්‍රධාන පරිගණක පද්ධතිය වන AS 400 පරිගණක පද්ධතිය නඩත්තු හා සේවා කිරීම නවීකරණය.

## යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව

යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව 2024-12-31 දක්වා ඉටු කරන ලද රාජකාරිවල ප්‍රගතිය

- 1949 දී යුනෙස්කෝ සාමාජිකත්වය ලබා ගත් ශ්‍රී ලංකාව 2024 දී ශ්‍රී ලංකා යුනෙස්කෝ හවුල්කාරිත්වයේ 75 වසර උත්සවාකාරයෙන් සමරන ලදී.
- යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා 2024 ජූලි මස මැද දී පැවති සංවත්සර සැමරුම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීම
- ශ්‍රී ලංකාව දැනට යුනෙස්කෝවේ විධායක මණ්ඩලයේ සාමාජික රජයක් ලෙස කටයුතු සේවය කිරීම.
- යුනෙස්කෝ ව්‍යවස්ථාවට අනුව නීත්‍යනුකූල ආයතනයක් ලෙස "යුනෙස්කෝ සඳහා ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පිහිටුවීමේ 2024 අංක 38" දරන පනත 2024 ජූලි මාසයේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.
- 2024 දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම කොමිෂන් සභාව සඳහා තනතුරු හතක් අනුමත කරන ලදී.

USD 58 000 වටිනා යුනෙස්කෝ 2024-2025 ද්වි වාර්ෂික ව්‍යාපෘති යෝජනා 3ක් සම්මතව ඇති අතර දැනට ඒවායේ මූලික කටයුතු ආරම්භ කර ඇත.

අධ්‍යාපනය අංශය:

**UNESCO** අධ්‍යාපනය පිළිබඳ මෑතකාලීන ක්‍රියාකාරකම්:

- යුනෙස්කෝ මාර්ගෝපදේශයන්ට අනුව ජාතික හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් ශ්‍රී ලංකාව සඳහා හරිත පාසල් සහතික කිරීමේ වැඩසටහන සංවර්ධනය කිරීමත් සමඟ හරිතකරණ අධ්‍යාපන හවුල්කාරිත්ව වැඩසටහන ආරම්භ කරන ලදී.
- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද SDG 4 ( තිරසාර සංවර්ධන ඉලක්ක) පිළිබඳ මධ්‍ය කාලීන සමාලෝචන වාර්තාව සහ යුනෙස්කෝව විසින් 2024 සඳහා සකස් කරන ලද අධ්‍යාපනය පිළිබඳ ගෝලීය අධීක්ෂණ වාර්තාව සඳහා සම්බන්ධීකරණය.
- SDG 4.7 - තිරසාර සංවර්ධන ආශ්‍රිත ව්‍යාපෘති සඳහා පුරවැසි අධ්‍යාපනය සහ අධ්‍යාපනය සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ SDG 4 අධීක්ෂණය
- යුනෙස්කෝ පුහුණු අත්පොත් සිංහල සහ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම
- උසස් අධ්‍යාපනයට අදාළ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ ගෝලීය සම්මුතිය අනුමත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
- අධ්‍යාපනය පිළිබඳ පැසිෆික් රැස්වීම සම්බන්ධීකරණය 2030 (APMED 6), 2024 සැප්තැම්බර් 10 සිට 13 දක්වා තායිලන්තයේ බැංකොක්හි පවත්වන ලද සමුළු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- සම්බන්ධීකරණය කරන ලද වැඩසටහන්
  - Road to Right සංවිධානය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර කාන්තා දින සංසදය සහ විවෘත මයික් නයිට් වැඩසටහන
  - ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලද "Curriculum Piloting program" සඳහා වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
  - 2024 ග්‍රීසියේ පස්වන ලෝක සංස්කෘතික උරුමයන් පිළිබඳ තරුණ සම්මන්ත්‍රණය සම්බන්ධීකරණය කිරීම
  - හරිතකරණය අධ්‍යාපන හවුල්කාරිත්වය පිළිබඳ තොරතුරු වැඩසටහන සම්බන්ධීකරණය කිරීම
  - පාසල් නායකත්ව පැතිකඩ සංශෝධනය කිරීම සඳහා නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව සමග සම්බන්ධීකරණය කිරීම (SCHOOL PROFILE) GEMP Report සඳහා දායක වීම
  - 1960 සම්මුතිය ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපනයේ වෙනස් කොට සැලකීමට එරෙහිව නිර්දේශ කිරීම

- සහභාගී වූ සමීක්ෂණ

o විධිමත් අධ්‍යාපනය පිළිබඳ සමීක්ෂණය අමාත්‍යාංශයේ දත්ත කළමනාකරණ ශාඛාව වෙත යොමු කිරීම,

o **ASP net** හි ජාතික සම්බන්ධීකාරකවරුන් සහ පාසල් සාමාජිකයින් සඳහා වන සමීක්ෂණය

o නව ඩිජිටල් මෙවලම් භාවිතය පිළිබඳ **IIEP-UNESCO** සමීක්ෂණය

අධ්‍යාපන ක්ෂේත්‍රයේ සැලසුම් සහ කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා (මෙම සමීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයෙහි දත්ත කළමනාකරණ ශාඛාව වෙත බෙදා හරින ලදී)

**UNESCO A S P net** පාසල් සමඟ සිදු කරන ලද ක්‍රියාකාරකම්

- Mitsubishi Asian Children's Enikki Festa ජපාන ජාතික කොමිෂන් සභාව සමඟ ASP Net පාසල් ඇතුළු ශ්‍රී ලංකාවේ පාසල් අතර පවත්වන ජාත්‍යන්තර ළමා චිත්‍ර තරගය සඳහා මූලික කටයුතු සූදානම් කරන ලදී.
- **2024** දී ග්‍රීසියේ ඇතන්ස්හි ASP net **70** වැනි සංවත්සර උත්සවයට ගුරුවරුන් සමඟ සිසුන් **12** දෙනෙකු සහභාගී විය.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත ශාඛාවේ නිලධාරීන් දත්ත කළමනාකරණය සඳහා පුහුණු වැඩසටහන් කිහිපයකට සහභාගී විය
- පෝලන්ත ජාතික කොමිෂන් සභාව සහ හර්බිච් පදනම විසින් **2** වැනි වරටත් ආරම්භ කරන ලද කවි වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- Mitsubishi Asian Children’s Enikki Festa 2024-2025 චිත්‍ර තරගයේ වැඩ කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණය කිරිම.
- Greening Education Partnership(GEP) වැඩසටහන යටතේ ජාතික වශයෙන් ශ්‍රී ලංකාවේ පාසල් හරිත පාසල් (Green Schools) ලෙස නම් කිරීම සඳහා Green Building Council of Sri Lanka සහ MAS Holdings Pvt. Ltd. සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම, ඒ සම්බන්ධ අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම,
- UNESCO MGIEP ආයතනය වෙත ගුරු පුහුණු වැඩසටහනක් සඳහා නාමයෝජනා යැවීම,
- 6th World Cultural Heritage Youth Symposium 2025 වැඩසටහනට අදාළ කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණය කිරීම.
- Sri Lanka Association of the Advancement of Science(SLAAS) දියත් කරන “Young Agriculturist” වැඩසටහනයෙහි ජයග්‍රාහිකයින් සඳහා වූ සහතිකපත් මුද්‍රණය සඳහා වූ අනුග්‍රහය ලබා දීමට වැඩසටහනට අදාළ කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණය කිරීම.

- ASPnet schools සඳහා වූ වැඩසටහන් සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණය කිරීම.

යුනෙස්කෝ ස්වභාවික විද්‍යා අංශය

- යුනෙස්කෝ මිනිසා සහ ජෛවගෝල වැඩසටහන සඳහා ජාතික කමිටුව -
- යුනෙස්කෝ ජෛවගෝල රක්ෂිත 4ක කාලාන්තර සමාලෝචන වාර්තා සකස් කිරීම
- පෘථිවි ජෛවජනක ව්‍යාපෘතියට සම්බන්ධ වීම සඳහා SWOT විශ්ලේෂණය
- UNESCO භූ විද්‍යා සහ භූ උද්‍යාන සඳහා වන ජාතික කමිටුව -
- යුනෙස්කෝ භූ උද්‍යාන/ ලෝක උරුම ලැයිස්තුගත කිරීම සඳහා උස්සන්ගොඩ සහ නාමල් උයන නම් කිරීම සලකා බැලීම
- යුනෙස්කෝ මූලික විද්‍යා වැඩසටහන සමඟ සම්බන්ධ කිරීම සඳහා මූලික විද්‍යා වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විද්‍යාවේ දියුණුව සඳහා වූ සංගමය (SLAAS) සමඟ එක්ව කටයුතු කිරීම

♦**UNESCO -** දකුණු ආසියා ජල කළමනාකරණ මධ්‍යස්ථානය මොරටුව විශ්වවිද්‍යාලය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ යුනෙස්කෝ ජාත්‍යන්තර ජල විද්‍යා වැඩසටහන සමඟ සම්බන්ධීකරණය කිරීම.

♦**Bioethics Program –**

♦ශ්‍රී ලංකාව යුනෙස්කෝ මූලස්ථානයේ ජාත්‍යන්තර ජෛව ආචාර ධර්ම කමිටුවේ සාමාජිකයෙක් ලෙස සේවය කරයි.

♦**IHP-WWAP** ජලය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය වැඩසටහන, නාභීය ලක්ෂ වෙත කැඳවා තිබූ මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම.

♦ජලය සහ ස්ත්‍රී පුරුෂ කේන්ද්‍රස්ථානය ශ්‍රී ලංකාව සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම

♦ප්‍රවේණික ජීව විද්‍යාව සඳහා වූ ආයතනය - **Genomic Biology** සඳහා **Carl R. Woese** ආයතනය සමඟ සාකච්ඡාව, **Earth Bio Genome** ව්‍යාපෘතියේ සම-නිර්මාතෘවරයා වන **IGB** අධ්‍යක්ෂ මහාචාර්ය ජීන් රොබින්සන් සමඟ සම්බන්ධ වී සහ ශ්‍රී ලාංකීය ජාතික ව්‍යාපෘතියක් සඳහා කරුණු විශ්ලේෂණය

♦**IGBC, IBC, COMEST** ඒකාබද්ධ රැස්වීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම - මහාචාර්ය ශමණී ප්‍රතාපන්) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

♦ඉන්දියානු සාගර සංගමය (**IORA**)

♦සමස්ත ලංකා චිත්‍ර තරගය සංවිධානය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කිරීම සහ මූල්‍යමය ඉල්ලීම් සඳහා සහාය වීම. වැඩසටහන සඳහා **SLNCU** මහලේකම්වරයාගේ ඉල්ලීම පරිදි **UNESCO- New Delhi** කාර්යාලයෙන් **USD 6000** ක අරමුදලක් අනුමත කරන ලදී.

♦**IORA** වැඩ සටහන අවසානයේ ඉතිරිව ඇති මුදල් **(4800.00 USD)** යුනෙස්කෝ ජෛවගෝල පද්ධති පිළිබඳව වීඩියෝ පටයක් නිපදවීම සඳහා යොදා ගැනීමට නව කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීම. **(2024-12-17)**

♦**UNESCO National Science & Geopark Committee** යුනෙස්කෝ භූ විද්‍යා හා භූ උද්‍යාන සඳහා

♦**UNESCO Basic Science ( යුනෙස්කෝ මූලික විද්‍යා වැඩසටහනට අදාළ ව විද්‍යාත්මක උපදේශක මණ්ඩලය වෙත හිටපු ලේකම් ජනරාල් සිරිමලි ප්‍රනාන්දු මැතිණිය නම්කර යැවීම.**

**යුනෙස්කෝ සංස්කෘතික අංශය**

**දඹුල්ල, සීගිරිය, ගාල්ල සහ පොළොන්නරුව යන ස්ථාන වල ඇති ලෝක උරුම සඳහා සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදී.**

**75 වැනි සංවත්සර උළෙල සඳහා පොත් 2ක් ප්‍රකාකාශයට පත් කර එළිදැක්වීම සඳහා කටයුතු කිරීම.**

**වසර 75 ක ඓතිහාසික සන්ධිස්ථාන සඳහා -**

**UNESCO විසින් ශ්‍රී ලංකාවේ නම් කරන ලද අඩවි සහ අයිතම - පොතක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.**

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාවංශය ජාත්‍යන්තර මතකය පිළිබඳ ලෝක වැඩසටහනට ඇතුළත් කර තිබීම පිළිබඳ ව සමරු පාලකයක් යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් නිරාවරණය කරන ලදී.**

**ලෝක මතකය සඳහා ජාතික ලැයිස්තු සකස් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග මූලික කටයුතු සූදානම් කරන ලදී.**

- **අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සඳහා ජාතික ලැයිස්තුව සකස් කිරීමට සංස්කෘතික අමාත්‍යංශයට සහාය වීම.**

- **අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාලානුරූප වාර්තාව සකස් කිරීම සඳහා සංස්කෘතික අමාත්‍යාංශය වෙත සහය දැක්වීම.**

- **වින්ඩ් ඔෆ් ද මියුසික් - නිකොලෝ ෆරාසි ඉතාලි නිර්මාපකයාගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට, ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපති කාර්යාලය සමඟ එක් ව 2024 මැයි 31 දින ගාලු කොටුවේ ලන්දේසි ප්‍රතිසංස්කරණ දේවස්ථානයේ දී පැවැත්වූ ප්‍රසංගයට අනුග්‍රහය දක්වන ලදී.**

**2024 ලෝක දර්ශන දිනය සැමරීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයන අංශය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය (SLMA) සමඟ සංවිධානය කර ඇත.**

**ලෝක උරුම කාලාවර්තන වාර්තාකරණය 2023-2024 සම්බන්ධයෙන් දෙදින වැඩමුළුවක් දකුණු ආසියානු ගුරුපුහුණු මධ්‍යස්ථානයේ දී 2024-12-09 සහ 2024-12-10 පැවැත්වීම.**

**එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශ කරන ලද "ලෝක භාවනා දිනය" 2024-12-21 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ භාවනා පරීක්ෂණ මධ්‍යස්ථානය හා එක්ව මාර්ගගත සම්මන්ත්‍රණයක් අන්තර්ජාතික භාවනා ප්‍රවීණයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීම (On line Webinar)**

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

**2023/2024 අයවැය කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව සඳහා තොරතුරු**

1. (i) **2024.12.31** දිනට භෞතික ප්‍රගතිය

| ව්‍යාපාර ඒකකය | ඉලක්කගත නිෂ්පාදනය | සත්‍ය නිෂ්පාදනය | ප්‍රගතිය |
|---|---|---|---|
| පාසල් පෙළපොත් | මිලියන 13.5 | 7.2 | 53% |
| අභ්‍යාස පොත් මුද්‍රණය | මිලියන 17.2 | 3.94 | 23% |
| ලොතරැයිපත් මුද්‍රණය | මිලියන 379 | 509.1 | 134% |
| වාණිජ මුද්‍රණ (මුද්‍රණ සංඛ්‍යාව) | 1200 | 1500 | 125% |

(ii) **2024.12.31** දිනට මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපාර ඒකකය | ඉලක්කගත නිෂ්පාදන ආදායම | සත්‍ය නිෂ්පාදන ආදායම | ප්‍රගතිය |
|---|---|---|---|
| පාසල් පෙළපොත් | මිලියන 4000 | 1782.3 | 44.9% |
| අභ්‍යාස පොත් මුද්‍රණය | මිලියන 1250 | 217.1 | 17.3% |
| ලොතරැයිපත් මුද්‍රණය | මිලියන 379 | 420.1 | 110% |
| වාණිජ මුද්‍රණ | මිලියන 350 | 310.9 | 88.8% |

(iii) සංශෝධිත ඉලක්ක අනුව ප්‍රගතිය

| ව්‍යාපාර ඒකකය | ඉලක්කගත නිෂ්පාදන ආදායම | සත්‍ය නිෂ්පාදන ආදායම | ප්‍රගතිය |
|---|---|---|---|
| පාසල් පෙළපොත් | මිලියන 2400 | 1782.3 | 74.26% |
| අභ්‍යාස පොත් මුද්‍රණය | මිලියන 400 | 217.1 | 54.27% |
| ලොතරැයිපත් මුද්‍රණය | මිලියන 379 | 420.1 | 110% |
| වාණිජ මුද්‍රණ | මිලියන 350 | 310.9 | 88.8% |

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

| | ක්‍රියාකාරකම | අපේක්ෂිත කාර්යසාධනය 2024.12.31 | |
|---|---|---|---|
| | | භෞතික | භෞතික % |
| 01 | Present Status Assessment of the 13 -year Guaranteed Education Programme the Descriptive Research Study | පර්යේෂණ යෝජනාව සකස්කර ඇත<br>ප්‍රධාන පාර්ශ්වකරුවන් (ගුරුවරුන්, විදුහල්පතිවරුන්...) සමඟ මූලික සාකච්ඡාවන් සිදු කර ඇත<br>විදුහල්පතිවරු සඳහා සහ ගුරුවරුන් සඳහා වන ප්‍රශ්නාවලිය සකස් කර ඇත<br>ප්‍රශ්නාවලිය බෙදා හැරීම අවසන් කර ඇත. දත්ත රැස් කිරීම සහ දත්ත ඇතුළත් කිරීම සිදු කර ඇත<br>සම්පූර්ණ කරන ලද කෙටුම්පත් පර්යේෂණ වාර්තාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිතුමියගේ ඇගයීම සඳහා ඉදිරිපත් කර ඇත | අධ්‍යයනයෙන් සියයට 95ක් පමණ අවසන් ව ඇත. |
| 02 | Primary School Teachers' Perception on Readiness for Schooling of Children Entering Grade 1 | පර්යේෂණ යෝජනාව සම්පූර්ණකර ඇත<br>ගුරුවරුන් සඳහා ලබාදෙන ප්‍රශ්නාවලි සකස්කර ඇත<br>නියමු අධ්‍යයනය සම්පූර්ණ කර ඇත<br>දිවයින පුරා තෝරා ගත් නියැදිය සඳහා ප්‍රශ්නාවලි යොමු කර ඇත | අධ්‍යයනයෙන් සියයට 50ක් පමණ අවසන් ව ඇත. |
| 03 | Formulation of Quality Assurance Framework and mechanism for International Schools and other Private Schools in Sri Lanka | අවසන් කෙටුම්පත් වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර ඇත | අධ්‍යයන කාර්යය අවසන් (100%) |
| 04 | Teenage Career Readiness: An Assessment of Career Readiness of Senior Secondary Students | පර්යේෂණ යෝජනාව සම්පූර්ණ කර ඇත<br>සිසුන් හා ගුරුවරුන් සඳහා ලබා දෙන ප්‍රශ්නාවලි සකස්කර ඇත. ප්‍රශ්නාවලි පළාත් 9 තුළ බෙදා දීමට සුදුසු නියැදිය සකස් කර ඇත.<br>නියමු අධ්‍යයනය සම්පූර්ණ කර ඇත<br>දිවයින පුරා තෝරා ගත් නියැදිය සඳහා ප්‍රශ්නාවලි යොමු කර ඇත | අධ්‍යයනයෙන් සියයට 50ක් පමණ අවසන් ව ඇත. |
| 05 | Recommendations on the National Policy on Medium of Instruction in Schools | අවසන් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යාංශයට හා Parliament Oversight Committee වෙත ලබා දී ඇත | 100% |
| 06 | The Readiness of the School System to Fulfil the Learning Requirement of Children with Special Educational Needs | පර්යේෂණ යෝජනාව කෙටුම්පත් කර ඇත.<br>අධ්‍යාපන අමාත්‍යාංශ විශේෂ අධ්‍යාපන ශාඛාවේ නිලධාරීන් හා සාකච්ඡා කර ඇත.<br>ප්‍රශ්නාවලිය සකස් කරමින් පවතී | ක්‍රියාවලියෙන් සියයට 40ක් පමණ අවසන් ව ඇත. |

**Financial Progress as at 31.12.2024**

| Object Code / Allowance | No. | Research Activities | | Rs. | Total Cost. Rs | |
|---|---|---|---|---|---|---|
| **Object Code (335-01-01-2507 )** | 1 | Recommendations for the National Policy on Medium of instruction inSchool | = | 1,514,585.00 | | |
| | 2 | Primary School Teacher Perception on Readiness for Schooling Children entering to Grade I ( E C D ) | = | 215,357.52 | | |
| | 3 | Situational Analysis of Bilingual Education Approach in Sri Lankan Government & Government Assisted Schools Towards Informed Policy Recommendation | = | 300,400.00 | | |
| | 4 | International School in Sri Lanka Origin Current Status & way forwad (Printing Book ,50 Nos) | = | 113,718.96 | | |
| | 5 | Fomulation of Quality Assurance Framework & Mechanism for International School & other Private Schools in Sri Lanka | = | 881,315.00 | | |
| | 6 | Present Staus assessment of 13 year Guaranteed Education Programme | = | 38,018.85 | | |
| | 7 | 1st Biennial Research Simposiyum on Education Proceedinds (Printing Book 2022 ,100 Nos ) | = | 720,066.44 | | |
| | 8 | STEM Education in Sri Lankan General Educatio System Current Status and way Forward (Printing Book , 50 Nos ) | = | 76,187.29 | **4,433,312.86** | **52%** |
| **Bodged Allowance RS.8,500,000.00** | 9 | Statical Digest on Education 2023/2023 ( Postial Charges ) | = | 12,000.00 | | |
| | 10 | TVET Diploma & Higher National Diploma programmes (N V Q 5 & 6 )Demand & Supply, Physical &Human Resoures, Success rates & limitations & way Forward (Printing Book ,) | = | 85,396.60 | | |
| | 11 | Quality & Standards of Care & education Provided by Early Chil hood Development in Sri Lanka: Current Status & way forwardAssurance Framework (Printing Book ,) | = | 84,319.85 | | |
| | 12 | Teacher Professional Development :Current Status & way forward for professionaliation of Teacher in Sri Lanka(Printing Book ,) | = | 91,155.00 | | |
| | 13 | Congruence of Human resources Produced by Universities with Employment Market ;Alignnents, Mismatches & way forward ((Printing Book , 50 Nos ) | = | 113,716.60 | | |
| | 14 | An ssessment of Career Readiness of Senior Secondary Students in Sri Lanka | = | 186,675.75 | | |
| | 15 | SDG 4 | = | 400.00 | | |

# 1. Activity Plan, Time Line and Output/Outcome

| Area of responsibility | Activities | Responsible Officer | Jan | Feb | Mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec | Budget (Mn) | Output | Outcome |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1. Present Status Assessment of the 13-year Guaranteed Education Programme (Descriptive Research Study)** | | | | | | | | | | | | | | | | | |
| General Education<br><br>Technical and Vocational Education | Publication | SPRO (VR)<br>PO (KG) | Continuation (2025) | | | | | | | | | | | | 0.2 | Final Report with Analysis of Current Status of 13 year guaranteed Education Program and Recommendations | Provide Policy Directives to Improve 13-Year Guaranteed Education and Reduce Issues and Gaps |
| | **Total Budget** | | | | | | | | | | | | | | **0.2** | | |
| **2. Primary School Teachers' Perception on Readiness for Schooling of Children Entering Grade 1** | | | | | | | | | | | | | | | | | |
| Early Childhood and Primary Education | Data Collection & Analysis | SPRO (NW)<br>AD (Acting PRO) | Continuation (2025) | | | | | | | | | | | | 1.0 | Final Report with Policy Recommendation | Improve the Awareness of Grade 1 Teachers on Smooth Transition of Children from Preschool to Primary |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **3. Teenage Career Readiness: An Assessment of Career Readiness of Senior Secondary Students** | | | | | | | | | | | | | | | | | |
| | | | Continuation (2025) | | | | | | | | | | | | | | |
| | Distribution of questionnaire and Data collection | SPRO (RR) DJ ((Acting PRO) | | | | | | | | | | | | | 0.60 | | |
| | Data analysis and representation | | | | | | | | | | | | | | 0.20 | | |
| | Report writing (expert) | | | | | | | | | | | | | | 0.20 | | |
| | Printing | | | | | | | | | | | | | | 0.30 | | |
| | Publication & Dissemination | | | | | | | | | | | | | | 0.40 | | |
| | **Total Budget** | | | | | | | | | | | | | | **1.7** | | |
| **4. Review of the National Preschool Policy (2025)** | | | | | | | | | | | | | | | | | |
| Early Child-hood and Pri-mary Edu-cation | Draft Preparation (Expert panel discussions) | SPRO (NW) AD (Acting PRO) | | | | | | | | | | | | | 0.5 | | |
| | Stakeholders meetings | | | | | | | | | | | | | | 0.5 | | |
| | Preparation & submission of final report | | | | | | | | | | | | | | 0.5 | | |
| **Total Budget** | | | | | | | | | | | | | | **1.5** | | | |

## 5. Evaluation of the Current Digital Education in Sri Lanka (2025)

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| General Education | Situation Analysis and workshops | SPRO (VR) DJ ((Acting PRO) KG (PO) | | | | | | | | | | | | | 0.5 | | |
| | Stake holder meetings | | | | | | | | | | | | | | 0.5 | | |
| | Formulation of the research proposal | | | | | | | | | | | | | | 0.2 | | |
| | Focus group discussion and Questionnaire preparation | | | | | | | | | | | | | | 0.3 | | |
| | Validation workshops | | | | | | | | | | | | | | 0.2 | | |
| | Survey and data collection | | | | | | | | | | | | | | 0.6 | | |
| | Report writing | | | | | | | | | | | | | | 0.2 | | |
| | **Total Budget** | | | | | | | | | | | | | | **2.5** | | |

**2024 වසර සඳහා වැඩමුළු සඳහා කාර්ය මණ්ඩලය සහභාගීකරවීම් සම්බන්ධ තොරතුරු.**

| අංකය | නිලධාරියාගේ නම | පාඨමාලාව | පාඨමාලාව පවත්වා ඇත/ නැත | ගාස්තුව (රු. ශත) | ගෙවීම් කර ඇත/නැත |
|---|---|---|---|---|---|
| 01 | එච්. ඩී. කත්‍රිආරච්චි මිය | ප්‍රවාහන කළමනාකරණය (දින 01) | ඇත | 14,000.00 | √ |
| 02 | ඊ. ජී. අයි ගමගේ මිය | | | | |
| 03 | ජී. එල්. නිමේෂා | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම පිළියෙල කිරීම | ඇත | 14,000.00 | √ |
| 04 | එම්. ඒ. දිහාරා ධනංජනී මිය | | | | |
| | | බඳවා ගැනීම් පරිපාටිය (දින 02) | ඇත | 13,000.00 | √ |
| 05 | ඊ. ඩී. එස්. ප්‍රියදර්ශන මයා | කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම (දින 02) | ඇත | 13,000.00 | √ |
| 06 | එම්. ඇලෙක්ස් පිගුරාඩෝ මහතා | Stores Management & Purchasing Procedures (දින 02) | ඇත | 13,000.00 | √ |
| | | රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය දැනුවත් කිරීම සහ අවසාන ගිණුම් පිළියෙල කිරීම සඳහා වූ දෙදින පුහුණු වැඩමුළුව | ඇත | 13,000.00 | √ |
| 07 | එච්. ඩී. කත්‍රිආරච්චි මිය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය | ඇත | 26,000.00 | √ |
| 08 | එම්. ඒ. දිහාරා ධනංජනී මිය | | | | |
| 09 | SPRO, PRO & PO | අධ්‍යයන පර්යේෂණ සම්බන්ධ වැඩමුළුව | ඇත | 3,000.00 | √ |
| 10 | ඩබ්ලිව්. ඒ. ඩී.ටී. ජයසිංහ මිය | පැය 150 දෙමළ පාඨමාලාව | ඇත | 0.00 | පාඨමාලාව සංවිධානය කරන ලද ප්‍රධාන ආයතනය පාඨමාලා ගාස්තුව ගෙවීම් කිරීම හෝ සහභාගීවන අය අතර අනුපාතිකව අයකිරීම. |
| 11 | එච්. ඩී. එම්. කේ. ගීතමාලි මිය | | | | |
| 12 | ඩබ්. ඒ. සී. සමන් කුමාර මයා | පැය 100 දෙමළ මාධ්‍ය පාඨමාලාව | ඇත | | |
| 13 | ආචාර්ය ආර්. කේ. ආර්. එස්. රණසිංහ මිය | පැය 200 දෙමළ මාධ්‍ය පාඨමාලාව | ආරම්භ කර ඇත. | 2,288.14 | |
| 14 | ආචාර්ය ඩබ්. ඩබ්. පී. එන්. වීරකෝන් මිය | | | | |
| 15 | එන්. පී. ජේ. හේවගේ මහතා | | | | |
| 16 | ජී. එල්. නිමේෂා මිය | පැය 150 දෙමළ පාඨමාලාව | ආරම්භ කර ඇත | 0.00 | |
| 17 | සමස්ත කාර්ය මණ්ඩලය | ධාරිතා සංවර්ධන දෙදින (02) පුහුණු වැඩමුළුව. | ඇත. | 140,042.42 | √ |
| 18 | ඩබ්ලිව්. ඒ. ඩී.ටී. ජයසිංහ මිය | Master of Public Administration in Education Management | ආරම්භ කර ඇත | 77,500.00 | √ |
| | | එකතුව | | 328,830.56 | |

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

# 2024 වර්ෂයේ ප්‍රගතිය හා 2025 වර්ෂයේ ඉදිරි ගමන් මග

# 2024 வருடத்திற்கான முன்னேற்றம் மற்றும் 2025 வருடத்திற்கான எதிர்கால பயணப் பாதை

# The Progress of 2024 and the Way Forward 2025

වෙළුම II - උසස් අධ්‍යාපන
இதழ் II - உயர் கல்வி
Volume II - Higher Education

# ප්‍රගති වාර්තාව

# 2024

උසස් අධ්‍යාපන

# පටුන

## උසස් අධ්‍යාපන


1. **හැඳින්වීම ..... 1-2**

2. **මූල්‍ය ප්‍රගතිය..... 3-10**

2.1. හැඳින්වීම ..... 3
2.2. පුනරාවර්තන වියදම් ..... 4
2.3. ප්‍රාග්ධන වියදම් ..... 5
2.4. සමස්ත වියදමෙහි ආයතනික දායකත්වය ..... 6
2.5. විදේශීය සිසුන්ගෙන් ලද ආදායම ..... 7

3. **උසස් අධ්‍යාපනයේ ප්‍රවේශය සහ අවස්ථා ..... 11-18**

3.1. හැඳින්වීම ..... 11
3.2. උසස් අධ්‍යාපනය සඳහා ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ..... 11
3.3. උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍ය ප්‍රවේශය ..... 12
3.4. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන පද්ධති ..... 13
3.5. ශ්‍රී ලාංකික සිසුන් සඳහා විදේශ ශිෂ්‍යත්ව ..... 14
3.6. විදේශීය ශිෂ්‍ය ලියාපදිංචිය ..... 15
3.7. ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහය ..... 16
3.8. අධ්‍යයන සංවර්ධනය සහ නවීකරණය ..... 16
3.9. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර අධ්‍යාපනික සහයෝගීතාවය වර්ධනය කිරීම ..... 17

4. **උපාධිධාරී නිමැවුම සහ උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය ..... 19-37**

4.1. හැඳින්වීම ..... 19
4.2. උපාධිධාරී නිමැවුම ..... 19
4.3 උපාධිධාරීන්ගේ රැකියා නියුක්තභාවය ..... 21
4.4. අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ පද්ධති සවිමත් කිරීම ..... 23
4.5. වැඩමුළු සහ සම්මන්ත්‍රණ ..... 26
4.6. අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා උසස් අධ්‍යාපන අවස්ථා ..... 27
4.7. විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම් ..... 36

5. **කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය ..... 38-44**

5.1. හැඳින්වීම ..... 38
5.2. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය ..... 38
5.3. අනධ්‍යයන කාර්ය මණ්ඩල ධාරිතාව ඉහළ නංවාලීම ..... 41
5.4 අධ්‍යයන සහ අනධ්‍යයන සේවකයන්ගේ ධාරිතා වර්ධනය ..... 41

5.5. තොරතුරු හා සන්නිවේදනා තාක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය විසින් 2023.11.01 සිට 2024.12.31 දක්වා ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් ........ 42

5.6 උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධන අංශයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා ගෙන ඇති පියවර සහ යෝජනා ........ 43

5.7. උසස් අධ්‍යාපන අංශයේ විදේශ අධ්‍යාපන අංශයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා ගෙන ඇති පියවර ........ 44

5.8 ධ්‍යාපන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිගේ තත්ත්වාගණනය කළ මතය ........ 44

**6. යටිතල පහසුකම් සංවර්ධනය ........ 45-53**

6.1. හැඳින්වීම ........ 45

6.2. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ........ 45

6.3. ඉදිකිරීම් ව්‍යාපෘති ........ 46

6.4. ප්‍රසම්පාදන කටයුතු ........ 53

**7. පර්යේෂණ, නවෝත්පාදන, වාණිජකරණය සහ ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් ........ 54-66**

7.1. හැඳින්වීම ........ 54

7.2. පර්යේෂණ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම ........ 54

7.3. විදේශ අරමුදල් යටතේ පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය ........ 55

7.4. 2023 වසරේ ලබා ගත් පේටන්ට්බලපත්‍ර ........ 65

7.5. අයවැය යෝජනා මත ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘති ........ 66

**8. ඉදිරි ගමන් මඟ 2024 ........ 67-71**

8.1 උසස් අධ්‍යාපන ප්‍රවේශයේ සාධාරණත්වය සහ අන්තර්ගතබව සහතික කිරීම ........ 67

8.2 සස් අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම ........ 68

8.3. ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය විශ්වීයකරණය ........ 68

8.4 උසස් අධ්‍යාපනය නිසි ලෙස විවිධාංගීකරණය කිරීම ........ 68

8.5. උසස් අධ්‍යාපන විෂය පථය සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන යාන්ත්‍රණය හඳුන්වාදීම ........ 69

8.6. ටෝකියෝ සම්මුතිය සහ උසස් අධ්‍යාපනයට අදාළ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ ගෝලීය සම්මුතිය සහ ජාතික තොරතුරු මධ්‍යස්ථානයක් (NIC) ස්ථාපිත අපරානුමත කිරීම ........ 69

8.7. උසස් අධ්‍යාපනයේ ඩිජිටල්කරණය සහ ඩිජිටල් සාක්ෂරතාවය දියුණු කිරීම ........ 69

8.8. උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික-රාජ්‍ය හවුල්කාරිත්ව ආකෘති හඳුන්වාදීම ........ 69

8.9 පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ........ 70

8.10 ගෝලීය විශ්වවිද්‍යාලයන් ලෙස විශිෂ්ටත්වයට පත්වීම සඳහා උපායමාර්ගික ජාත්‍යන්තරකරණය ........ 70

# වගු ලැයිස්තුව

2. මූල්‍ය ප්‍රගතිය

2.1. ආයතනික වශයෙන් පුනරාවර්තන වෙන්කිරීම් හා ප්‍රාග්ධන වෙන් කිරීම් වියදම් කළ ආකාරය 2024 දෙසැම්බර් 31 දක්වා ........ 6

2.2. එක් එක් පාඨමාලාව අනුව විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම (2024 දෙසැම්බර් 31 දිනට) ........ 7

2.3. එක් එක් විශ්වවිද්‍යාලය අනුව විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම (2024 දෙසැම්බර් මස 31 වන දිනට) ........ 9

2.4. 2024 දෙසැම්බර් මස වන විටදී එක් එක් පාඨමාලා අනුව විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම ........ 10

2.5. ආයතන අනුව විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම (2024 දෙසැම්බර් මස 31 වන දිනට) ........ 10

3. උසස් අධ්‍යාපනයේ ප්‍රවේශය සහ අවස්ථා

3.1 2023 වර්ෂය තුල රාජ්‍ය උසස් අධ්‍යාපන පද්ධතිය තුල අධ්‍යයන කටයුතු වල නිරත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ........ 12

3.2 විශ්වවිද්‍යාල සිසුන් ඇතුලත් කර ගැනිම ........ 12

3.3 ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කරනු ලබන ලියාපදිංචි කිරීම් ........ 13

3.4 විශ්වවිද්‍යාල ප්‍රවේශයෙහි වර්ධනය ........ 13

3.5 2018-2024 වර්ෂය සඳහා පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම ........ 14

3.6 ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව අවස්ථා (2021 – 2024.12.31) ........ 14

3.7 පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා (2021 – 2024.12.31) ........ 14

3.8 මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය සහ ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ ලබා දුන් මූල්‍ය අනුග්‍රහය. ........ 16

3.9 2024.12.31 දින දක්වා හඳුන්වා දුන් විශේෂ උපාධි පාඨමාලා ........ 17

3.10 2024.12.31 දින දක්වා හඳුන්වා දුන් නව ප්‍රථම උපාධි පාඨමාලා ........ 17

4. උපාධිධාරී නිමැවුම සහ උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය

4.1. උපාධිධාරී නිමැවුම (ස්ත්‍රී පුරුෂභාවය අනුව) ........ 19

4.2. උපාධිධාරී නිමැවුම (විෂය ධාරාව අනුව) ........ 20

4.3. පශ්චාත් උපාධිධාරී නිමැවුම ........ 20

4.4. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නිමැවුම ........ 21

4.5. විෂය ධාරා අනුව සමස්ත උපාධිධාරී රැකියා නියුක්තභාවය ........ 22

4.6 උපාධි පාඨමාලා සංඛ්‍යාව (2024.12.31 දිනට) ........ 25

4.7. ලබාගත් ණය සඳහා බැංකු වෙත ගෙවන ලද පොළී මුදල ........ 25

4.8. 2023 වසර තුළ ශිෂ්‍යත්ව ලබා දී ඇති ප්‍රමාණය ........ 28

4.9. ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ආයතනය විසින් ප්‍රදානය කිරීමට නියමිත ශිෂ්‍යත්වය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්වය........ 33

4.10. සන්සන්දනාත්මක තොරතුරු ........ 37

**5. කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය**

5.1. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වත්මන් කාර්ය මණ්ඩලය ........ 38
5.2. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ථිර අධ්‍යයන සේවක සංඛ්‍යාව ........ 39
5.3. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ථිර අනධ්‍යයන සේවක සංඛ්‍යාව හා ඇබෑර්තු ........ 40
5.4. උසස් අධ්‍යාපන අංශයේ ස්ථිර කාර්ය මණ්ඩලයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ 2024.12.31 දිනට සේවයේ යොදවා තිබූ සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව ........ 40
5.5. රජයේ සහ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනවලින් ලබාදුන් දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ........ 41
5.6. අමාත්‍යාංශයේ වෙබ් අඩවියට තොරතුරු ඇතුලත් කිරීම් හා යාවත්කාලීන කිරීම් ........ 42
5.7. අමාත්‍යාංශයේ එක් එක් අංශයන් වෙත සේවා සැපයීම් (2023.06.01 සිට 2024.06.30 දක්වා) ........ 43
5.8. මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කරනු ලැබූ පරිගණක/ලැප්ටොප් සංඛ්‍යාව (2023.06.01 සිට 2024.06.30 දක්වා) ........ 43
5.9. වාහන බලපත්‍ර නිකුතුව (2023.11.01 සිට 2024.12.31 දක්වා) ........ 43

**6. යටිතල පහසුකම් සංවර්ධනය**

6.1. ඉදිකිරීම් ව්‍යාපෘති සංයුතිය - 2024........ 46
6.2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වැය ශීර්ෂය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබීම් හා වියදම්හි තොරතුරු - 2023 සහ 2024........ 47
6.3 උසස් අධ්‍යාපන වැය ශීර්ෂය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන - 2024........ 48
6.4. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පීය ඉදිකිරීම. ........ 51

**7. පර්යේෂණ, නවෝත්පාදනය, වාණිජකරණය සහ ජාතික සංවර්ධන ක්‍රියාකාරකම්**

7.1. 2024.12.31 දිනට ප්‍රාග්ධන ප්‍රතිපාදන සහ වියදම ........ 54
7.2. 2024.12.31 දිනට පුනරාවර්තන වියදම........ 55
7.3. 2024.12.31 දිනට විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවල පිරිවැය ........ 55
7.4. විවිධ විශ්වවිද්‍යාල විසින් දිනා ගත් ICE\RIC\DR ව්‍යාපෘතිවල විස්තර ........ 57
7.5. විශ්වවිද්‍යාල ICE\RIC\DOR වෙතින් ලත් ජයග්‍රහණ පිළිබඳ සාරාංශය ........ 58
7.6. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 6ක් දිනා ගත් RIC/DOR ව්‍යාපෘති ........ 59
7.7. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන RIC/DOR වෙතින් ලත් ජයග්‍රහණ පිළිබඳ සාරාංශය........ 59
7.8. ආයෝජනයේ වටිනාකම........ 61
7.9 නවෝත්පාදන සහ ඉදිරිපත් කරනු ලබන විශ්වවිද්‍යාල........ 63
7.10 ප්‍රදානය කිරීමේ පර්යේෂණ යෝජනාවේ ප්‍රගතිය - 2024.12.31 වන විට (විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය) ........ 65

# රූප සටහන්

2. මූල්‍ය ප්‍රගතිය

2.1. උසස් අධ්‍යාපන පද්ධතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම 2014 -2024 ........................ 3

2.2. 2024 වර්ෂය සඳහා මූල්‍ය සංයුතිය.......................................................................................... 3

2.3. ප්‍රතිපාදන වෙන් කිරීම හා වියදම 2023 හා 2024 ................................................................ 4

2.4. වෙන්කරන ලද පුනරාවර්තන වියදම්කිරීමේ සංයුතිය - 2024 ...................................................... 4

2.5. පුනරාවර්තන වෙන් කිරීම් වියදම් කළ ආකාරය - 2024 ............................................................ 5

2.6. පුද්ගල පඩිනඩි සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වියදම් කල ආකාරය - 2024 ............................. 5

2.7. වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් සංයුතිය - 2024 .................................................................... 5

2.8. ප්‍රාග්ධන වෙන් කිරීම් වියදම් කළ ආකාරය - 2024 .................................................................. 6

3. උසස් අධ්‍යාපනයේ ප්‍රවේශය සහ අවස්ථා

3.1. විදේශීය ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය.................................................................................. 15

3.2. විදේශීය පශ්චාත් උපාධි සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ................................................................... 15

4. උපාධිධාරී නිමැවුම සහ උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය

4.1. පශ්චාත් උපාධිධාරී නිමැවුම ................................................................................................. 21

4.2. විශ්වවිද්‍යාලය අනුව සමස්ත උපාධිධාරී රැකියා නියුක්තභාවය.................................................... 21

4.3 විෂය ධාරා අනුව සමස්ත උපාධිධාරී රැකියා නියුක්තභාවය......................................................... 22

4.4 ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාඨමාලා අනුව ඩිප්ලෝමාධාරීන්ගේ රැකියා නියුක්තභාවය............................................................................................................... 23

4.5 NCAS ප්‍රතිපාදන ලද සංඛ්‍යාව................................................................................................ 29

4.6 දරන ලද වියදම..................................................................................................................... 29

5. කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය

5.1. වි.වි.ප්‍ර.කො.ස යටතේ ඇති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සේවක මණ්ඩල සංයුතිය - 2024 ................................................................................................. 39

5.2. උසස් අධ්‍යාපන අංශයේ කාර්යය මණ්ඩල සංයුතිය - 2024......................................................... 40

6. යටිතල පහසුකම් සංවර්ධනය

6.1. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන හා වියදම - 2024 ............................................... 45

6.2. නැනෝ විද්‍යා තාක්ෂණ දෙපාර්තමේන්තුව, තාක්ෂණ පීඨය, වයඹ විශ්වවිද්‍යාලය.......................................... 49

6.3. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය, ATI මධ්‍යස්ථානය, මන්නාරම ................................................ 49

6.4. පරිගණක තාක්ෂණ පීඨයේ ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම, කැලණිය විශ්වවිද්‍යාලය............................................................................................................... 50

6.5. තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම, සබරගමුව විශ්වවිද්‍යාලය ............................................................................................................... 50

6.6 පුස්තකාල ගොඩනැගිල්ල, වයඹ විශ්වවිද්‍යාලය - කුලියාපිටිය පරිශ්‍රය ........ 52
6.7 බහු කාර්ය මධ්‍යස්ථානය, වයඹ විශ්වවිද්‍යාලය - මාකඳුර පරිශ්‍රය ........ 52
6.8 වෛද්‍ය පීඨය සඳහා තට්ටු දොළහක ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, රුහුණ විශ්වවිද්‍යාලය ........ 52
6.9 වෛද්‍ය පීඨය සඳහා මහාචාර්ය ඒකකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, රුහුණ විශ්වවිද්‍යාලය ........ 53

7. **යටිත පර්යේෂණ, නවෝත්පාදන, වාණිජ්‍යකරණය සහ ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් ල පහසුකම් සංවර්ධනය**

7.1. විශ්වවිද්‍යාලවල පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජ්‍යකරණය (RDIC) ශක්තිමත් කිරීම ........ 56
7.2. ආමන්ත්‍රණය කළ හැකි දත්ත සන්නිවේදනය -කැලණිය විශ්වවිද්‍යාලය ........ 63
7.3. නැවත වින්‍යාස කළ හැකි සංවලිත ස්නායුක ජාල පොසෙසරය (Reconfigurable convolution neural network processor) - රුහුණ විශ්වවිද්‍යාලය ........ 64
7.4. බුද්ධියක් සහිත (Intelligent) කැමරාව - මොරටුව විශ්වවිද්‍යාලය ........ 64

## දැක්ම

ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ටතම ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

## මෙහෙවර

ප්‍රතිඵල අරමුණු කොටගත් සහ ක්‍රමෝපායයන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන පද්ධතියේ ශිෂ්‍යයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම.

## පරමාර්ථ

1. උසස් අධ්‍යාපනය සඳහා අවස්ථා හා ප්‍රවේශය ඉහළ නැංවීම.
2. ඉහළ ලෝක මානනීය දර්ශයන් හිමි පරිණාමිත සහ නව විශ්වවිද්‍යාල.
3. උපාධිධාරීන්ගේ රැකියා නියුක්තභාවය සහ ගුණාත්මය වැඩි දියුණු කිරීම.
4. පාර්ශ්වකරුවන්ගේ තෘප්තිමත් බව ඉහළ නැංවීම.
5. උසස් අධ්‍යාපනයේ ගෝලීය අනුකූලතාව, ගෝලීය සබඳතා සහ හුවමාරු ඉහළ නැංවීම.
6. පර්යේෂණ, ප්‍රකාශන සහ වාණිජ්‍යකරණය වැඩි දියුණු කිරීම.
7. ආයෝජන සහ විදේශ විනිමය ආකර්ෂණය කර ගන්නා පරිණාමිත උසස් අධ්‍යාපනයක්.
8. තරගකාරී සහ අද්විතීය තත්ත්වයට පත් වීමට විශ්වවිද්‍යාල සහ ආයතන බල ගැන්වීම සහ ස්වාධීනත්වය ලබා දීම.
9. උපාධිධාරීන්ගේ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම.
10. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
11. ජාතික සංවර්ධනය, සමහිසන්ධානය සහ සාමය සඳහා ඉහළ දායකත්වය.
12. උසස් අධ්‍යාපන පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

# උසස් අධ්‍යාපන පද්ධති

## විශ්වවිද්‍යාල

### 17 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ

- කොළඹ විශ්වවිද්‍යාලය
  - **ශ්‍රීපාලි මණ්ඩපය**
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැළණිය විශ්වවිද්‍යාලය
- මොරටුව විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණු විශ්වවිද්‍යාලය
- විවෘත විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය
  - **ත්‍රිකුණාමලය මණ්ඩපය**
- අග්නිදිග විශ්වවිද්‍යාලය
- රජරට විශ්වවිද්‍යාලය
- සබරගමුව විශ්වවිද්‍යාලය
- වයඹ විශ්වවිද්‍යාලය
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
- වවුනියා විශ්වවිද්‍යාලය

### 2 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

### 19 ආයතන

දෙහිවල, කොළඹ, නුවර, කුරුණෑගල, බදුල්ල, යාපනය, ගම්පහ, අම්පාර, ත්‍රිකුණාමලය, ගාල්ල, කෑගල්ල, අනුරාධපුරය, රත්නපුර, වව්නියාව, සමන්තුරේ, මඩකලපුව,තංගල්ල, නාවලපිටිය, මන්නාරම

## පශ්චාත් උපාධි ආයතන

### 10 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ

**කොළඹ විශ්වවිද්‍යාලය**

- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
- දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

- කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
- විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
- මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

- කළමණාකරණ පශ්චාත් උපාධි ආයතනය

**කැළණිය විශ්වවිද්‍යාලය**

- බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය
- පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

- ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

## උසස් අධ්‍යාපන ආයතන

### 08 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ

- මානවශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

**කොළඹ විශ්වවිද්‍යාලය**

- මානව සම්පත් අභිවර්ධන ආයතනය
- කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක පාසල
- ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය
- අනුක ජීව විද්‍යා හා ජෛව රසායන ආයතනය
- කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනය

**මොරටුව විශ්වවිද්‍යාලය**

- ජාතික තාක්ෂණ ආයතනය

**නැගෙනහිර විශ්වවිද්‍යාලය**

- ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය

**රාජ්‍ය නොවන උපාධි පිරිනැමීමට අවසර ලත් ආයතන 28**
**1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය යටතේ-ක්‍රියාකාරී ආයතන**

1. මිනුම් හා සිතියම් ආයතනය
2. තොරතුරු තාක්ෂණ ආයතනය
3. ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය
4. ජාතික සමාජ සංවර්ධන ආයතනය
5. ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය
6. දකුණු ආසියානු තාක්ෂණ හා වෛද්‍ය ආයතනය
7. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට්
8. කොළඹ ජාත්‍යන්තර නාවික හා ඉංජිනේරු විද්‍යාලය
9. ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය
10. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
11. සණස කැම්පස්
12. හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි
13. කේ.අයි.යු.කැම්පස් (ප්‍රයිවට් ) ලිමිටඩ්
14. නාගන්දා ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යන ආයතනය
15. එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්
16. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝටෙක්නොලොජි (ප්‍රයිවෙට්) ලිමිටඩ්
17. සිගිස් කැම්පස්
18. සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්
19. ලංකා රසායන විද්‍යා ආයතනය
20. ඉන්ටනැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ටෙක්නොලජි ලිමිටඩ්
21. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල්ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩ්යුකේෂන්
22. රෝයල් ඉන්ස්ටිටියුට් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්.
23. බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්
24. ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
25. ශ්‍රී ලංකා නිපෝන් බිස්ටෙක් ඉන්ස්ටිටියුට් ප්‍රයිවට් ලිමිටඩ්
26. ගේට්වේ කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
27. ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්
28. බ්‍රිටිෂ් ස්කූල් ඔෆ් කොමස් (ප්‍රයිවට්) ලිමිටඩ්

# 01

# හැඳින්වීම

අධ්‍යාපනය, සාමාන්‍යය දැනුම ලබා දීමේ හෝ ලබා ගැනීමේ ක්‍රියාවලියක් වන අතර එමගින් තාර්කික සහ තේරීමේ ගුණය වර්ධනය කිරීමට ද, සාමාන්‍යය පරිණත සමාජීය ජීවිකාවක් සඳහා තමා හෝ අනු අය බුද්ධිමය වශයෙන් සූදානම් කිරීම ද සිදු කරයි.

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන සහ ආර්ථිකමය අර්බුදයන් හා විවිධ සමාජීය ප්‍රතිරෝධ ක්‍රියාකාරකම් හේතුවෙන් දේශයේ ස්ථාවරත්වයට දැඩි බලපෑමක් සිදු විය. බලශක්ති අර්බුදය මෙන්ම අත්‍යාවශ්‍ය භාණ්ඩ වල හිඟය සහ අධික මූල්‍ය වියදම් දරමින් ජීවන කටයුතු වල නියැලීමට සිදුවීම හේතුවෙන් ජනතාව පීඩාවට පත් වූ අතර, මෙම අවස්ථාවේ දී අධ්‍යාපන ක්ෂේත්‍රයේ තත්ත්වය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ද අධික උත්සාහයක් දැරීමට ද සිදුවිය. එබඳු තත්ත්වයන් මැදින් අධ්‍යාපන කටයුතු යථා තත්වයට පත් කර, ක්‍රමවත් ක්‍රියාමාර්ග සමඟින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරක්ෂා කිරීමට අමාත්‍යාංශය සමත් විය.

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතිය තුල, රාජ්‍යය මැදිහත් වීම යටතේ පවත්නා විශ්වවිද්‍යාල 17 ක් සහ උසස් අධ්‍යාපන ආයතන 18 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ සෘජු පාලනයට යටත් වේ. එයට අමතර ලෙස බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය අමාත්‍යාංශය යටතෙහි ක්‍රියාත්මක වේ. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය බෞද්ධ අධ්‍යාපනය ඉහළ නැංවීම වෙනුවෙන් කටයුතු කරන අතර, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය රටේ උසස් තාක්ෂණික අධ්‍යාපනය ඉහළ නැංවීම වෙනුවෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මීට අමතරව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 28ක් උපාධි පිරිනැමීම සඳහා අවස්ථාව සලසා දී ඇත.

උසස් අධ්‍යාපන අංශය වෙනුවෙන් රාජ්‍ය කරනු ලබන ආයෝජනයන් අනුව, 2024 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනය රු.බි. 103.3කි. උසස් අධ්‍යාපන අංශය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.බි. 30.6කි. සමස්ත ප්‍රතිපාදනයන්ගෙන් රු.බි. 69.5 පුනරාවර්තන වියදම් සඳහාත් ඉතිරි රු.බි. 33.8 ප්‍රාග්ධන වියදම් සඳහාත් වේ.

වර්ෂ 2024 වන විට රාජ්‍ය උසස් අධ්‍යාපන පද්ධතිය තුල අධ්‍යයන කටයුතු වල යෙදෙන සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 444,057 පමණ වේ. 2023 වර්ෂයේ දී අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා සිසුන් 269,613 පෙනී සිටි අතර විශ්ව විද්‍යාල වරම් ලබා ගැනීමට සුදුසුකම ලැබූ සිසුන් ගණන 173,444 කි. නමුත් පවතින සම්පත් උපයෝගී කර ගෙන විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත සිසුන් ගණන 43,204 ක් වේ.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 2024 වර්ෂය සඳහා 10,623 ක් ඇතුළත් වී ඇත. මීට අමතරව 2023/2024 සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයට හා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය සඳහා ලියාපදිංචි වීම් 312ක් වාර්තාවේ.

2024 වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උපාධි පිරිනැමීම සඳහා අනුමැතිය ලබා දී ඇති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව 28 කි. ඒ අනුව පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ පසුගිය වසර පහ තුල සිසුන් 16,019 ක් සඳහා අධ්‍යයන කටයුතු වෙනුවෙන් අවස්ථාව ලබා දී ඇති අතර මෙම වසර සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

දේශීය සිසුන් සඳහා විදේශ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හැදෑරීම සඳහා අමාත්‍යාංශය මගින් විදේශ ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දී ඇත. ඒ අනුව 2024 දී විදේශීය ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව සඳහා සිසුන් 26

දෙනෙකුට ද පශ්චාත් උපාධි සඳහා සිසුන් 101 දෙනෙකුට ද ශිෂ්‍යත්ව ලබා දී ඇත. දේශීය මෙන් ම විදේශීය සිසුන්ට ද ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල වල උසස් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව උදා කර දී ඇත. ඒ අනුව 2024 වර්ෂය වන විට ප්‍රථම උපාධිය හැදෑරීම සඳහා විදේශීය සිසුන් 356 ක්ද, පශ්චාත් උපාධිය සඳහා විදේශීය සිසුන් 561 දෙනෙක් ද ලියාපදිංචි වී ඇත.

උසස් අධ්‍යාපන ප්‍රවේශය ලැබූ ආර්ථික දුෂ්කරතා ඇති ශිෂ්‍යයන් සඳහා ප්‍රධාන ක්‍රම 03 ක් යටතේ මූල්‍ය අනුග්‍රහයන් සපයනු ලැබේ. එනම් මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය, විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ක්‍රමය හා විවිධ ආයතන සහ සමාගම්, පුද්ගලයන් මගින් ලබා දෙන පරිත්‍යාගයන් වේ. ඒ අනුව මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය හා විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ 2024 වර්ෂයේදි සිසුන් 92,550 දෙනෙකුට රුපියල් මිලියන 1,865.14 ක් ලබා දී ඇත.

උසස් අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය ඉහල නැංවීම තුලින් කුසලතාවයෙන් පරිපූර්ණ උපාධිධාරීන් බිහි කිරීම අරමුණ වේ. ඒ අනුව, 2023/2024 කාලපරිච්ඡේදයේ දී විශ්වවිද්‍යාල පද්ධතියෙන් බිහි කරන ලද උපාධිධාරීන් (පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය හා භික්ෂු විශ්වවිද්‍යාලය ඇතුළුව) 30,703 වන අතර පශ්චාත් උපාධිධාරීන් 10,454 ක් බිහි කර ඇත. 2023 වර්ෂයේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙන් ඩිප්ලෝමාධාරීන් 5,100 බිහිකර ඇත.

උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය ඉහලනැංවීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා ආචාර්ය සහ පශ්චාත් උපාධි අවස්ථාවන් ලබා දීමටත්, විවිධ ජාත්‍යන්තර වැඩමුළු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමග අත්සන් කරනු ලබන ද්විපාර්ශික ගිවිසුම් යටතේ විදේශ රට වලින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව පිරිනැමීමත් අඛන්ඩව සිදු කරනු ලබයි.

උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය ඉහල නැංවීමට සමගාමීව, උසස් අධ්‍යාපන පද්ධතියේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා විවිධ ක්‍රියාමාර්ග සිදු කරනු ලබයි. ඒ සඳහා අමාත්‍යාංශය මට්ටමින් මෙන්ම විශ්වවිද්‍යාල මට්ටමින් සියළු කාර්යමණ්ඩල සඳහා දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩසටහන් අවස්ථා ලබාදීම වැනි පියවරයන් අනුගමනය කරයි. 2024 වර්ෂයේ උසස් අධ්‍යාපන පද්ධතියේ සමස්ථ (ස්ථිර හා තාවකාලික) අධ්‍යයන කාර්යමණ්ඩලය 10,277 වන අතර අනධ්‍යයන කාර්යමණ්ඩලය 12,926කි.

සියළු විශ්වවිද්‍යාල ප්‍රමුඛ උසස් අධ්‍යාපන පද්ධතිය මගින් 21 වන සියවසේ ඉදිරි දශකය සඳහා තාක්ෂණයෙන් පිරිපුන් ගෝලීය ආර්ථිකයට සමගාමී වන උපාධිධාරීන්, මෙන්ම ඩිප්ලෝමාධාරීන් ද බිහිකිරීම අප හමුවේ පවතින ප්‍රධානතම අභියෝගයකි. ඒ අනුව, විශ්වවිද්‍යාල වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, පාඨමාලා සංවර්ධනය කිරීම, නව තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගනීම සඳහා අමාත්‍යාංශය විසින් දේශීය සහ විදේශීය මූල්‍ය අනුග්‍රහය යටතේ විවිධ ව්‍යාපෘති ආරම්භ කර ඇත.

2024 වර්ෂය සඳහා වෙන්වූ සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 88%ක් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කර ඇත. එයින් රු.මි. 22,214 හෙවත් 75% ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් කර ඇත. එම ප්‍රතිපාදනයන්ගෙන් රු.මි. 8,366ක් දේශීය අරමුදල් මගින් ද, විදේශීය ණය හා ආධාර මඟින් රු.මි. 13,848 ක් මූල්‍යයනය කරනු ලබයි. මේ මඟින් 2024 ට පෙර ආරම්භ කල ව්‍යාපෘති 34ක් ද ඉදිකිරීම් කටයුතු අවසන් කල ව්‍යාපෘති 08 සඳහා ද නව ව්‍යාපෘති 01 වෙනුවෙන් ද ආයෝජනය කරන ලදි.

රටක සංවර්ධනය ඉදිරියට ගෙනයාමට නම්, එම රට තුල ජනනය වන නවෝත්පාදන සහ පර්යේෂණ ප්‍රතිඵල ඵලදායී ලෙස යොදා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වේ. අමාත්‍යාංශය මගින්, 2024 වර්ෂයේදී පර්යේෂණ කටයුතු සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු.මි. 892.5 ක්ද පුනරාවර්තන වියදම ලෙස රු.මි. 3,267.10 ලෙසද වෙන් කර තිබේ. එසේම රු.මි. 579.5 විදේශ ව්‍යාපෘති මගින් ප්‍රතිපාදන සලසා ඇත. මෙම ප්‍රතිපාදන යටතේ විශ්වවිද්‍යාල වල පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජකරණය වෙන් වෙන් ව සිදු කිරීමට විවිධ ව්‍යාපෘති හඳුන්වා දී පර්යේෂණ හරහා පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කරන ලදි.

.

# 02
# මූල්‍ය ප්‍රගතිය

## 2.1 හැඳින්වීම

උසස් අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීමේ අරමුණින් 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලෙස රුපියල් බිලියන 103.3ක මුදලක් වෙන් කර තිබෙන අතර එය 2023 වසර හා සසඳන විට 11.5 % ක වැඩිවීමකි. 2007 වර්ෂයේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් ස්ථාපනය කිරීමේ දී රු.බි 19.8ක් වෙන් කර තිබුණි. එතැන් සිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විවිධ විෂය පථයන් අනුව සිය කාර්ය භාරයන් සිදු කරන ලදී. මෙම අමාත්‍යාංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ක්‍රමානුකූලව ඉහල ගොස් ඇත. පසුගිය වසර 10 ක කාල පරාසය තුල මෙම වෙන්කිරීම් 260.8% පමණ වර්ධනය වී ඇත. උසස් අධ්‍යාපන පද්ධතිය සඳහා 2014 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන්කිරීම 2.1 රූපය මගින් දක්වා ඇත.

2.1 රූපය : උසස් අධ්‍යාපන පද්ධතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම 2014– 2024




(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

2024 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන පද්ධතියෙහි ඇස්තුමේන්තුගත සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රු.බි. 103.3 ක් වේ. මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදනය සලකා බැලූ විට මෙය දේශීය අරමුදල් රු.බි. 83.2 කින් ද, විදේශීය ණය හා ප්‍රදාන ලෙස රු.බි. 20.1 කින් ද මූල්‍යනය කර ඇත.

2024 වර්ෂය සඳහා මූල්‍ය සංයුතිය 2.2 රූපය මගින් දක්වා ඇත.

2.2 රූපය: 2024 වර්ෂය සඳහා මූල්‍ය සංයුතිය




(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

2024 වසරේ වෙන්කරන ලද රු.බි.103.3ක් වූ ප්‍රතිපාදන වලින් රු.බි. 33.8ක් ප්‍රාග්ධන ප්‍රතිපාදන වන අතර රු.බි.69.5ක් පුනරාවර්තන ප්‍රතිපාදන වේ. මෙම ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.බි. 33.8 න් රු.බි. 20.1 ක් විදේශ ව්‍යාපෘති මගින් ලද ප්‍රතිපාදන වේ.

2024 දෙසැම්බර් 31 වන විට වැය කළ මුළු මුදල රු.බි.105.2ක් වන අතර, එය වෙන්කළ ප්‍රතිපාදන වලින් 101.8% ක් වේ. ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් වැය කිරීමේ ප්‍රතිශතය 86.8% ක් වන අතර පුනරාවර්තන වෙන් කිරීම් වැය කිරීමේ ප්‍රතිශතය 109.1%ක් වේ. 2023 දෙසැම්බර් 31 දිනට හා 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිපාදන වියදම් කළ ආකාරය 2.3 රූපයෙන් දැක්වේ. එම සංසන්දනයට අනුව 2023 වසරේ දී 93.3% ද 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 101.8% ක් ලෙස ද වෙන්කරන ලද ප්‍රතිපාදන වියදම් කර ඇත.

2.3 රූපය: ප්‍රතිපාදන වෙන් කිරීම හා වියදම 2023 හා 2024




(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

## 2.2 පුනරාවර්තන වියදම්

2024 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු.බි. 69.5 ක් වෙන් කර ඇති අතර, පසුගිය වසර හා සැසඳීමේදී ප්‍රතිපාදන වෙන් කිරීම බිලියන 6.3 කින් වැඩිවී ඇත.

2024 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා වෙන්කළ මුදලෙහි 81%ක් වූ වැඩි ම අගය පුද්ගල පඩි නඩි සඳහා වෙන් කර ඇත. සේවා වියදම්, සැපයුම් වියදම්, ගමන් වියදම්, නඩත්තු වියදම් හා වෙනත් වියදම් සඳහා 12.3%ක් ද සිසුන් සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම වෙනුවෙන් 6.5%ක් ද අය වැය යෝජනා ව්‍යාපෘතීන් වන ශිෂ්‍ය ණය යෝජණා ක්‍රමය හා ලැප්ටොප් පරිගණක සඳහා ණය පහසුකම් ලබාදීමට 0.1% ක් ද වෙන් කර ඇත.

වෙන් කරන ලද පුනරාවර්තන වියදම්හි සංයුතිය 2.4 රූපය මගින් දක්වා ඇත.

**2.4** රූපය වෙන් කරන ලද පුනරාවර්තන වියදම්කිරීමේ සංයුතිය**-2024**




(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

මෙකී පුනරාවර්තන වෙන්කිරීම් වලට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපයා තිබෙන ආදායම් වලින් රු.බි. 6.9ක් පුනරාවර්තන වියදම් ලෙස වැය කර ඇත.

2024 දෙසැම්බර් 31 වන විට පුද්ගල පඩිනඩි සඳහා වූ වෙන් කිරීම් වලින් වියදම් කිරීමේ ප්‍රතිශතය 100.5% ක් වන අතර සිසුන් සඳහා මූල්‍ය පහසුකම්

ලබා දීම වෙනුවෙන් වෙන්කල මුදලින් වියදම් කිරීමේ ප්‍රතිශතය 100% කි. විස්තරාත්මක සංයුතිය 2.5 රූපය මගින් දක්වා ඇත.

2.5 රූපය පුනරාවර්තන වෙන් කිරීම් වියදම් කළ ආකාරය-2024




(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

වියදම් කල ප්‍රතිපාදන වලින් වැඩිම ප්‍රතිශතයක් වූ 31.2% ක් වියදම් කර ඇත්තේ පුද්ගල පඩිනඩි වෙනුවෙනි. දෙවනුවට වැඩිම ප්‍රතිශතය වූ 26.6% ක් දරා ඇත්තේ අධ්‍යයන කාර්ය මණ්ඩල දීමනා වෙනුවෙනි. මෙහි සවිස්තරාත්මක සංයුතිය 2.6 රූපය මගින් දක්වා ඇත.

2.6 රූපය: පුද්ගල පඩිනඩි සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වියදම් කළ ආකාරය -2024




(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

## 2.3 ප්‍රාග්ධන වියදම්

උසස් අධ්‍යාපන පද්ධතිය සඳහා 2024 වසරේ දී රු.බි.33.8ක මුදලක් ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දී ඇත. ප්‍රාග්ධන වියදම් සංයුතිය තුළ වැඩි ම වෙන් කිරීම වූ 78.8%ක කොටස ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා වෙන් වී ඇත. තවද 4.8%ක් ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා ද, 4.7%ක් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා ද වෙන් වී ඇත. පර්යේෂණ කටයුතු මෙන් ම නවෝත්පාදන වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් 3.8%ක් ද වෙන් කර ඇත. තවද රැකියා නියුක්තිය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා 0.7% ක් ද ණය වාරිකයන් සඳහා 5.5% ක් ද වෙනත් ප්‍රාග්ධන වියදම් සඳහා 1.7% ක් ද වෙන් කර ඇත.

2024 ප්‍රාග්ධන වියදම් වෙන්කිරීමේ සංයුතිය 2.7 රූපයෙන් දක්වා ඇත.

2.7 රූපය: වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් සංයුතිය - 2024 (රු.බිලි)



(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

ඉහත කී වෙන් කිරීම් වලට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපයාගෙන තිබෙන ආදායම් වලින් රු.මි 6,630 ක් ද වැය කර ඇත. මෙය පුනරාවර්තන වියදම් වලින් රු.මි. 6,295 ද ප්‍රාග්ධන වියදම් වලින් රු.මි. 335 ලෙස වේ.

ප්‍රාග්ධන වියදම් සංයුතියේ එක් එක් සංරචකයන් සඳහා 2024 දෙසැම්බර් 31 වන විට වෙන් කළ මුදලින් සත්‍ය වශයෙන් වියදම් කළ මුදල සලකා බැලීමේ දී ඉදිකිරීමේ ව්‍යාපෘති වලින් 85.7%ක් ද, ගුණාත්මකභාවය ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහල නැංවීමෙන් 93.9% ක් ද පර්යේෂණ කටයුතු මෙන් ම නවෝත්පාදන වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය සඳහා පහසුකම් සැපයීමෙන් 19.9% ක් ද ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීමෙන් 94.6% ක් ද ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමෙන් 154.8% ක්ද ණය වාරික ගෙවීම සඳහා 79.1% ද අනෙකුත් ප්‍රාග්ධන වියදම් වලින් 99.6 %ක් ද වියදම් කර ඇත.

ප්‍රාග්ධන වෙන් කිරීම් වියදම් කළ ආකාරය 2.8 රූපය මගින්

2.8 රූපය: ප්‍රාග්ධන වෙන් කිරීම් වියදම් කළ ආකාරය 2024




(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල)

**2.1 වගුව: ආයතනික වශයෙන් පුනරාවර්තන වෙන්කිරීම් හා ප්‍රාග්ධන වෙන්කිරීම් වියදම් කළ ආකාරය - 2024 දෙසැම්බර් 31 දක්වා** (මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)

| විශ්වවිද්‍යාල හා ආයතන | පුනරාවර්තන 2024 (රු.මි.) | | | ප්‍රාග්ධන 2024 (රු.මි.) | | | මුළු එකතුව 2024 (රු.මි) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | වියදම් | % | වෙන් කිරීම | වියදම් | % | වෙන් කිරීම | වියදම් | % |
| උසස් අධ්‍යාපන අංශය | 256 | 237 | 92 | 10 | 8 | 80 | 266 | 245 | 92.1 |
| උසස් තාක්ෂණ ආයතනය | 1,093 | 1,206 | 110.3 | 75 | 74 | 100 | 1,168 | 1,281 | 109.7 |
| බෞද්ධ පාලි විශ්වවිද්‍යාලය | 552 | 563 | 102.0 | 75 | 51 | 68.0 | 627 | 614 | 97.9 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 493 | 492 | 99.8 | 150 | 21 | 14.0 | 643 | 513 | 79.8 |
| විදේශ ව්‍යාපෘති | - | - | - | 20,155 | 16,675 | 82.7 | 20,155 | 16,675 | 82.7 |
| *රාජ්‍ය අමාත්‍ය කාර්යාලය* | *26* | *19* | 72 | 3 | 3 | 100 | 29 | 22 | 75.3 |
| අයවැය යෝජනා | 1,892 | 1,845 | 97.5 | 5,864 | 4,726 | 80.6 | 7,756 | 6,571 | 84.7 |
| ***අමාත්‍යාංශයේ මුළු එකතුව*** | ***4,312*** | ***4,362*** | ***101.2*** | ***26,332*** | ***21,559*** | ***81.9*** | ***30,644*** | ***25,921*** | ***84.6*** |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 65,211 | 71,506 | 109.7 | 7,500 | 7,835 | 15.2 | 72,711 | 71,341 | 59.1 |
| **මුළු එකතුව** | **69,523** | **75,868** | **109.1** | **33,832** | **29,394** | **86.9** | **103,355** | **105,262** | **101.8** |

(පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් සඳහා බැලීමේදී 2024.12.31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය යටතේ ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා භික්ෂු,බෞද්ධහා පාලි විශ්වවිද්‍යාල හා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් උපයාගත් ආදායම ද ඇතුලත් කර ඇත)

## 2.4 සමස්ත වියදමෙහි ආයතනික දායකත්වය

වියදම් සඳහා සමස්ත ප්‍රතිපාදනය ප්‍රධාන වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යන අයවැය ශීර්ෂ දෙක යටතේ වෙන් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ උසස් අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලැබූ රුපියල් මිලියන 30,644 ක ප්‍රතිපාදන මුදල, රුපියල් මිලියන 26,332 ක් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන හා රුපියල් මිලියන 4,312ක් වූ පුනරාවර්තන ප්‍රතිපාදන වලින් සමන්විත වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා වෙන් කළ රුපියල් මිලියන 72,711 තුළ රුපියල් මිලියන 7,500 ක් ප්‍රාග්ධන වියදම් ද රුපියල් මිලියන 64,211 ක් පුනරාවර්තන වියදම් ද ඇතුළත් වේ. ආයතනික වශයෙන් වෙන් කරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා වැය කරන ලද මුදලෙහි අනුබණ්ඩනය වගු අංක 2.1වගුව මගින් දක්වා ඇත.

## 2.5 විදේශිය සිසුන්ගෙන් ලද ආදායම

රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි සහ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි හදාරන විදේශිය සිසුන් රාජ්‍ය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ආදායම් ගෙන දෙන එක් ප්‍රභවයක් වේ. විදේශ සිසුන් 1201, දෙනෙකුගෙන් 2023 වර්ෂය තුළ උපයා ගත් ආදායම රුපියල් මිලියන 911.9 ක් විය. 2024 වර්ෂයේ දෙසැම්බර් මස වන විට විදේශිය සිසුන් 893 දෙනෙකු වෙතින් උපයා ගත් ආදායම රුපියල් මිලියන 929.8 ක් විය.

### 2.5.1 විදේශිය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ගෙන් ලද ආදායම

2023 වර්ෂයේදී විදේශිය සිසුන් ගෙන් උපයා ගනු ලැබූ මුළු ආදායමෙන් 55.8% ක් විදේශිය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් වූ අතර එය සිසුන් 411 දෙනෙකු ගෙන් රුපියල් මිලියන 508.6 ක් ලෙස විය. 2024 දෙසැම්බර් වන විට විදේශීය සිසුන්ගෙන් උපයා ගනු ලැබූ මුළු ආදායමෙන් 59.3% ක් ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ගෙන් වූ අතර එය සිසුන් 339 දෙනෙකුගෙන් රුපියල් මිලියන 551.3 ක් විය.

2023 වර්ෂයේ දී විදේශිය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම පාඨමාලා අනුව සලකා බැලීමේදී වැඩිම ආදායම උපයා ගෙන ඇත්තේ වෛද්‍ය සිසුන්ගෙන් වන අතර එය 2023 වර්ෂයේදී සිසුන් 188 දෙනෙකුගෙන් රුපියල් මිලියන 461.7 ක් වන අතර ප්‍රතිශතයක් ලෙස ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ගෙන් ලද ආදායමෙන් 90.8% කි

2024 දෙසැම්බර් මස වන විට වැඩිම ආදායම උපයා ගෙන ඇත්තේ ද වෛද්‍ය සිසුන්ගෙනි. සිසුන් සංඛ්‍යාව 220 ක් වූ අතර ආදායම රුපියල් මිලියන 520 ක් විය. එය 94.3%ක ප්‍රතිශතාත්මක අගයක් ගෙන ඇත. දෙවැනි වැඩිම ආදායම උපයා ගෙන ඇත්තේ ඉංජිනේරු විද්‍යා පාඨමාලාව හැදැරීම සඳහා පැමිණි සිසුන් ගෙන් වන අතර එය 2024 වර්ෂයේ ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ගෙන් ලැබූ මුළු ආදායම මිලියන 11.9ක් වූ අතර එය මුලු ආදායමෙන් 2.2% කි. 2024 දෙසැම්බර් මස වන විට තෙවැනියට වැඩිම ආදායමක් උපයාගෙන ඇත්තේ බෞද්ධ අධ්‍යයන පාඨමාලා හැදැරීම සඳහා පැමිණි සිසුන් ගෙන් වන අතර එය මිලියන 9.7 ක් වූ අතර මුළු ආදායමෙන් 1.8% කි.

එක් එක් පාඨමාලාව අනුව 2024 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට එක් එක් පාඨමාලාව අනුව විදේශිය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම 2.2 වගුව මගින් දක්වා ඇත.

**2.2 වගුව: එක් එක් පාඨමාලාව අනුව විදේශිය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම ( 2024 දෙසැම්බර් මස 31 දිනට )**

| පාඨමාලාව | සිසුන් සංඛ්‍යාව | 2024.12.31 ට ආදායම (රු.) |
|---|---|---|
| වෛද්‍ය විද්‍යා | 220 | 520,088,185.57 |
| ඉංජිනේරු | 7 | 11,958,044.80 |
| බෞද්ධ අධ්‍යයන | 87 | 9,721,130.60 |
| කලා | 22 | 5,409,630.93 |
| ජෛව විද්‍යාව | 1 | 368,060.00 |
| පරිගණක විද්‍යාව | 2 | 3,778,500.00 |
| **එකතුව** | **339** | **551,323,551.90** |

(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

විදේශිය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම විශ්ව විද්‍යාල හා ආයතන අනුව සැසඳීමේදී 2023 වර්ෂයේදී පිළිවෙලින් 47.2% ක් වූ ආදායම කොළඹ විශ්වවිද්‍යාලයද, 17.2% ක් වූ ආදායම කැළණිය විශ්වවිද්‍යාලය ද, 9.3% ක් වූ ආදායම පේරාදෙණිය විශ්වවිද්‍යාලය ද, උපයා ගෙන ඇත.

2024 වසරේ දෙසැම්බර් මස වන විට ලැබූ මුළු ආදායමෙන් 47.2% ක් වූ වැඩිම ආදායම උපයා ගෙන ඇත්තේ ද කොළඹ විශ්ව විද්‍යාලයයි. දෙවන වැඩිම ආදායම වූ 15.9%ක් කැළණිය විශ්වවිද්‍යාලය උපයා ගෙන ඇති අතර තෙවැනියට ඉහළම 13.6% ක් වූ ආදායම උපයා ඇත්තේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි. 2024 වර්ෂයේ දෙසැම්බර් මස වන විට එක් එක් විශ්වවිද්‍යාලය අනුව විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම 2.3 වගුව මඟින් දැක්වේ.

**2.3 වගුව: එක් එක් විශ්වවිද්‍යාලය අනුව විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම (2024 මස දෙසැම්බර් මස 31 වන දිනට)**

| විශ්වවිද්‍යාලය | සිසුන් සංඛ්‍යාව | 2024.12.31 ට ආදායම (රු.) |
|---|---|---|
| **කොළඹ** | 83 | 260,499,500.00 |
| **කැළණිය** | 83 | 87,849,109.69 |
| **පේරාදෙණිය** | 67 | 75,168,663.25 |
| **ශ්‍රී ජයවර්ධනපුර** | 13 | 40,600,000.00 |
| **රුහුණ** | 12 | 24,307,376.14 |
| යාපනය | 6 | 23,006,250.00 |
| නැගෙනහිර | 7 | 15,615,027.87 |
| **මොරටුව** | 5 | 13,606,934.80 |
| **බෞද්ධ හා පාලි** | 59 | 4,615,035.15 |
| **වයඹ** | 1 | 3,703,125.00 |
| **කොළඹ (UCSC)** | 1 | 1,840,500.00 |
| **විවෘත විශ්වවිද්‍යාලය** | 2 | 512,030.00 |
| **එකතුව** | **339** | **551,323,551.90** |

(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

2023 වර්ෂයේ රටවල් 36 කට අයත් සිසුන් 411 දෙනෙකු තම ප්‍රථම උපාධි අධ්‍යයන කටයුතු සඳහා මෙරටට පැමිණ ඇති අතර 102 ක බැගින් වූ වැඩිම සිසුන් පිරිස පැමිණ ඇත්තේ භූතානයෙනි. වැඩිම ආදායම උපයාගෙන ඇත්තේ භූතානයෙන් පැමිණි සිසුන්ගෙන් වන අතර එය රුපියල් මිලියන 133.5 කි. එය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලැබූ මුළු ආදායමෙන් 26.2% ක් විය.

2024 වර්ෂයේ රටවල් 31 කින් සිසුන් 339 දෙනෙකු මෙරට ප්‍රථම උපාධි හැදෑරීමේ කටයුතු වල නිරතව සිටින අතර, 2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේ ද ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලැබූ ආදායමෙන් වැඩිම ආදායම උපයාගෙන ඇත්තේ ද භූතානයෙන් පැමිණි සිසුන් ගෙන් වන අතර එය සිසුන් 115 දෙනෙකුගේ රුපියල් මිලියන 163.1 කි. ප්‍රතිශතාත්මකව 29.6% කි.

2023 වර්ෂයේ හා 2024 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලැබූ ආදායම රටවල් අනුව ඇමුණුම A මඟින් දක්වා ඇත.

### 2.5.2 විදේශිය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම.

2023 දී පශ්චාත් උපාධි අපේක්ෂක විදේශ සිසුන්ගෙන් ලද ආදායම විදේශ සිසුන්ගෙන් ලද මුළු ආදායමෙන් 44.2% ක් වූ අතර එය සිසුන් 790 දෙනෙකුගෙන් රුපියල් මිලියන 403.2 ක් ලෙස විය. 2024 දෙසැම්බර් වන විටදි පශ්චාත් උපාධි අපේක්ෂක විදේශ සිසුන්ගෙන් ලද ආදායම විදේශ සිසුන්ගෙන් ලද ආදායමෙන් 40.7% ක් වූ අතර එය සිසුන් 554 දෙනෙකුගෙන් රුපියල් මිලියන 378.4 ක් විය.

2023 වර්ෂයේදි පශ්චාත් උපාධි අපේක්ෂක විදේශ සිසුන්ගෙන් ලැබූ මුළු ආදායමෙන් වැඩිම ආදායම වූ 27.2%ක් උපයා ගෙන ඇත්තේ ආර්ථික කළමනාකරණ පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් වන අතර එය සිසුන් 89 දෙනෙකුගෙන් රුපියල් මිලියන 109.7 ක් වේ.

2024 වර්ෂයේ දෙසැම්බර් මස වන විට පශ්චාත් උපාධි අපේක්ෂක විදේශ සිසුන්ගෙන් ලැබූ මුළු ආදායමෙන් වැඩිම ආදායම වූ 53.8% ක් උපයා ගෙන ඇත්තේ කළමනාකරණ පශ්චාත් උපාධි

අපේක්ෂක සිසුන්ගෙන් වන අතර එය සිසුන් 158 දෙනෙකුගෙන් රුපියල් මිලියන 203.4 ක් වේ. 2024 වර්ෂයේ දෙසැම්බර් මස වන විට එක් එක් පාඨමාලාව අනුව විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම 2.4 වගුව මඟින් දක්වා ඇත.

2.4 වගුව: 2024 දෙසැම්බර් මස වන විටදී එක් එක් පාඨමාලාව අනුව විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම

| පාඨමාලාව | සිසුන් සංඛ්‍යාව | 2024.12.31 ට ආදායම (රු.) |
|---|---|---|
| **කළමනාකරණය** | 158 | 203,431,500.00 |
| **බෞද්ධ අධ්‍යයන** | 259 | 57,691,018.31 |
| **කලා** | 68 | 41,321,513.00 |
| **වෛද්‍ය විද්‍යා** | 5 | 36,806,008.00 |
| **විද්‍යා** | 9 | 10,620,675.92 |
| **නීති** | 4 | 6,137,000.00 |
| **අධ්‍යාපනවේදී** | 29 | 4,676,500.00 |
| **ආර්ථික විද්‍යා** | 4 | 1,866,953.78 |
| **ඉංජිනේරු** | 2 | 1,672,836.02 |
| **තොරතුරු තාක්ෂණ** | 1 | 305,424.37 |
| **ව්‍යවහාරික විද්‍යාව** | 1 | 148,750.00 |
| **එකතුව** | **554** | **378,456,748.99** |

(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

විශ්ව විද්‍යාල හා ආයතන අනුව විදේශිය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම සලකා බැලීමේදී 2023 වර්ෂයේදී කොළඹ විශ්වවිද්‍යාලය විදේශීය පශ්චාත් උපාධි සිසු ආදායමෙන් වැඩිම ආදායම වූ රුපියල් මිලියන 207.4 ක් උපයා ගැනීමට සමත් වී ඇති අතර එය පශ්චාත් උපාධි ආදායමෙන් 51.4% ක් වේ. 2023 වර්ෂයේදී දෙවනියට වැඩිම ආදායම උපයාගෙන ඇත්තේ බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය (PGIPBS) වන අතර එය රුපියල් මිලියන 71.3කි. එය පශ්චාත් උපාධි ආදායමේ ප්‍රතිශතයක් ලෙස 17.7% ක් වේ. 2023 වර්ෂයේදී මෙන්ම 2024 දෙසැම්බර් මස වන විට විදේශිය පශ්චාත් උපාධි සිසු ආදායමෙන් වැඩිම ආදායමක් උපයා ගෙන ඇත්තේ කොළඹ විශ්වවිද්‍යාලයයි. එය මිලියන 184.5 ක් වන අතර පශ්චාත් උපාධි ආදායමෙන් 48.8 % ක් වේ.

2024 දෙසැම්බර් මස වන විට විශ්වවිද්‍යාල හා ආයතන අනුව විදේශිය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම 2.5 වගුවේ දක්වා

**2.5.වගුව ආයතන අනුව විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලද ආදායම (2024 දෙසැම්බර් මස 31 වන දිනට)**

| ආයතන / විශ්වවිද්‍යාලය | සිසුන් සංඛ්‍යාව | 2024.12.31 ට ආදායම (රු.) |
|---|---|---|
| කොළඹ | 113 | 184,589,828.80 |
| පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය - (PIM) | 98 | 110,102,500.00 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 264 | 54,174,000.00 |
| විවෘත විශ්ව විද්‍යාලය | 17 | 14,828,523.37 |
| ජෛව රසායනය,අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනය (IBMBB) | 3 | 4,374,897.12 |
| කැළණිය | 11 | 2,775,525.85 |
| මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIHS) | 7 | 2,013,900.00 |
| ශ්‍රී ජයවර්ධනපුර | 5 | 1,788,801.33 |
| මොරටුව | 2 | 1,672,836.02 |
| පේරාදෙණිය | 1 | 1,380,375.00 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 2 | 432,517.50 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS) | 29 | 248,346.00 |
| භික්ෂු විශ්ව විද්‍යාලය | 2 | 74,698.00 |
| **එකතුව** | 554 | 378,456,748.99 |

(මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල)

2023 වර්ෂයේ රටවල් 32 කට අයත් සිසුන් 790 දෙනෙකු තම පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා මෙරටට පැමිණ ඇති අතර 363 ක් වු වැඩිම සිසුන් පිරිස පැමිණ ඇත්තේ චීනයෙනි. ආදායම රුපියල් මිලියන 267.1 කි. එය පශ්චාත් උපාධි අධ්‍යයන සිසුන්ගෙන් ලැබූ මුළු ආදායමෙන්

66.2%කි. ඊලඟට පිළිවෙලින් වැඩිම ආදායමක් උපයාගෙන ඇත්තේ මියෙන්මාරයෙන් වන අතර එය සිසුන් 243 කින් රුපියල් මිලියන 50.1 ක් වන අතර ප්‍රතිශතාත්මකව 12.4% කි.

2024 වර්ෂයේ දෙසැම්බර් වන විට ද, වැඩිම සිසුන් පිරිස පැමිණ ඇත්තේ චීනයෙනි. එය සිසුන් 290 දෙනෙකු වන අතර ආදායම රුපියල් මිලියන 268.5කි. ප්‍රතිශතාත්මකව එය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලැබු ආදායමෙන් 70.9%කි. දෙවනියට වැඩිම ආදායම උපයා ගෙන ඇත්තේ මැලේසියාවෙන් පැමිණි සිසුන් 10 දෙනකුගෙන් රු.මි. 41.4 ක් වන අතර එය මුළු ආදායමෙන් 10.9% කි.

2023 වර්ෂයේ හා 2024 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගෙන් ලැබූ ආදායම රටවල් අනුව, ඇමුණුම A1 මගින් දක්වා ඇත.

# 03

# උසස් අධ්‍යාපනයේ ප්‍රවේශය සහ අවස්ථා

## 3.1 හැඳින්වීම

අධ්‍යාපන යනු පැවති සහ පවතින සියලු සමාජ අවධීන් විසින් නිර්මාණය කරන ලද දැනුම අත්පත් කරගනිමින් හා බෙදාහරිමින් නව දැනුම නිෂ්පාදනය කරන ලබන ක්‍රියාවලියකි. මේ අනුව ගුණාත්මක පුරවැසියකු බිහිකිරීමෙහිලා සියලු දෙනා හට උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමට ප්‍රතිපත්ති සකස් කොට ක්‍රියාත්මක කිරීම සෑම රජයකම කාර්යයභාරය වේ.

දේශීය හා ගෝලීය ආර්ථික ඉලක්කයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමේ අරමුණෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියතුලට සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරන අතරම දැනට පවතින සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාවලීයේ ප්‍රමාදයන් මග හරවා ගනිමින් ඒ ඒ පාඨමාලාව සඳහා අවශ්‍ය කරනු ලබන අවම සුදුසුකම හඳුනාගෙන එය සපුරාලන සියලු දෙනාට අවස්ථාව ලැබෙන පරිදි තෘතික අධ්‍යාපන පද්ධතිය ක්‍රමිකව පුළුල් කිරීමට ඉලක්ක තවදුරටත් සැකසිය යුතුය. ඒ අනුව දේශනශාලා, පර්යේෂණාගාර, පුස්තකාල, ආපනශාලා, අන්තර්ජාල පහසුකම් නියමිත ප්‍රමිතීන්ට අනුව සකස් කිරීමට නිරන්තරයෙන්ම කටයුතු සම්පාදනය කරනු ලබයි.

උසස් අධ්‍යාපනයට ඇති අවස්ථා සහ ප්‍රවේශය වැඩිකිරීම අමාත්‍යාංශයේ ප්‍රධානතම අරමුණක් වන අතර, ඒ සඳහා විවිධ උපාය මාර්ග අනුගමනය කරනු ලබයි. විශේෂයෙන්ම දේශීය මෙන්ම විදේශීය ව්‍යාපෘති මගින් ලැබෙන ප්‍රතිපාදන විශ්වවිද්‍යාල පද්ධතිය, උසස් අධ්‍යාපන ආයතන බෞද්ධ හා පාලි, භික්ෂු විශ්වවිද්‍යාල, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශ වෙත යොමු කරමින් එහි භෞතික හා මානව සම්පත් වර්ධනය කිරීමට කටයුතු සිදු කරනු ලබයි. මීට අමතරව විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා ද කටයුතු කරන අතරම, රාජ්‍යනොවන විශ්වවිද්‍යාල සඳහා ඇතුලත් වීමට පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයන් ද හඳුන්වා දී ඇත.

අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා යාවත්කාලීන කරන ලද නිර්දේශයන් ට අනුකූලව නව පාඨමාලා මෙන්ම පීඨ/ අධ්‍යයන අංශ ස්ථාපිත කිරීමට කටයුතු කරන අතරම ශිෂ්‍ය සුභසාධනය සඳහා අවශ්‍ය පිරිවැයද දරනු ලබයි.

## 3.2 උසස් අධ්‍යාපනය සඳහා ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව.

2023 වර්ෂය වන විට අභ්‍යන්තර, බාහිර සහ පශ්චාත් උපාධි අපේක්ෂක සිසු සිසුවියන් ද ඇතුලත්ව සමස්ත රාජ්‍ය උසස් අධ්‍යාපන පද්ධතියෙහි අධ්‍යයන කටයුතු වල නිරත වීම සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 444,057 කි. මෙම සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් “ Z ” අගය මත පදනම්ව තෝරාගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි ලියාපදිංචිව සිටින සිසුන් සංඛ්‍යාව 143,203 කි.

විවෘත විශ්වවිද්‍යාලයෙහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 30,324 කි. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය යන බෞද්ධ විශ්වවිද්‍යාල දෙක සතුව ද අභ්‍යන්තර සිසුන් 1,016 ක් සිටිති. සමස්ත රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුල සිටින බාහිර සිසුන් සංඛ්‍යාව 189,774 ක් වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක උසස් අධ්‍යාපන අයතනයන් හි ලියාපදිංචි වි සිටින සිසුන් සංඛ්‍යාව 5,321 ක් වේ. 2023 වර්ෂය සඳහා ජාතික උසස් ඩිප්ලෝමා හැදැරිමට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි ලියාපදිංචි වි ඇති සිසුන් සංඛ්‍යාව 24,577කි. එසේම උසස් අධ්‍යාපන පද්ධතිය තුල පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වල නිරත සිසුන් ද

49,359 ක් සිටිති. ආයතනික වශයෙන් සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව ඇමුණුම B මගින් දක්වා ඇත. එම සංයුතියේ සාරංශය වගු අංක 3.1 හි දක්වා ඇත.

**3.1 වගුව 2023 වර්ෂය තුල රාජ්‍ය උසස් අධ්‍යාපන පද්ධතිය තුල අධ්‍යයන කටයුතු වල නිරත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව.**

| ශිෂ්‍ය කාණ්ඩය | පිරිමි | ගැහැණු | එකතුව |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල සහ අනුබද්ධිත ආයතන | 49,751 | 93,452 | 143,203 |
| විවෘත විශ්වවිද්‍යාලය | 8,822 | 21,502 | 30,324 |
| බෞද්ධ හා පාලි වි.වි / භික්ෂු විශ්වවිද්‍යාලය | 1,016 | | 1,016 |
| බාහිර උපාධි සඳහා ලියාපදිංචි සිසුන් | 49,117 | 140,657 | 189,774 |
| මූලික උපාධි අධ්‍යයනය සඳහා | 108,706 | 255,611 | 364,317 |
| වි.වි.ප්‍ර.කො.ස. යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතන | 2,472 | 2,849 | 5,321 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) | 7,404 | 17,173 | 24,577 |
| බෞද්ධ හා පාලි වි.වි / භික්ෂු විශ්වවිද්‍යාලය | 158 | 325 | 483 |
| සහතිකපත්‍ර/ ඩිප්ලෝමාව | 10,034 | 20,347 | 30,381 |
| පශ්වාත් උපාධි අධ්‍යයනය | 23,071 | 26,288 | 49,359 |
| එකතුව | 118,740 | 275,958 | 444,057 |

මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල.

## 3.3 උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍ය ප්‍රවේශය.

### 3.3.1 රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම.

2023 අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව 43,204 කි. පසුගිය වසර 11ක කාලයක් තුල උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාවත්, අවම සුදුසුකම් සපුරන ලද සිසුන් සංඛ්‍යාවත්, විශ්වවිද්‍යාල සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාවත් 3.2 වගුවේ දක්වා ඇත.

**3.2 වගුව විශ්වවිද්‍යාල සිසුන් ඇතුලත් කර ගැනිම.**

| වර්ෂය | අ.පො.ස. උ/පෙ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | අවම සුදුසුකම් සපුරන ලද සිසුන් සංඛ්‍යාව | තෝරාගත් සිසුන් සංඛ්‍යාව | තෝරාගත් සිසුන් සංඛ්‍යාව (2) හි ප්‍රතිශතය ක් ලෙස |
|---|---|---|---|---|
| | (1) | (2) | (3) | |
| 2013 | 246,665 | 143,740 | 25,200 | 17.5 |
| 2014 | 247,376 | 149,572 | 25,643 | 17.1 |
| 2015 | 302,434 | 155,550 | 29,550 | 18.7 |
| 2016 | 263,184 | 160,517 | 30,662 | 19.1 |
| 2017 | 253,357 | 163,160 | 31,415 | 19.3 |
| 2018 | 267,202 | 167,992 | 31,902 | 19.0 |
| 2019 | 290,313 | 181,206 | 41,669 | 23.0 |
| 2020 | 301,771 | 194,297 | 43,927 | 22.6 |
| 2021 | 283,616 | 171,532 | 43,568 | 25.4 |
| 2022 | 274,304 | 166,967 | 44,005* | 26.4 |
| 2023 | 269,613 | 173,444 | 43,204** | 24.9 |

මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

* යාවකාලික. **යෝජිත බඳවා ගැනීම.

2013 වර්ෂයේ දී විශ්වවිද්‍යාල සඳහා ඇතුලත් කරනු ලැබූ සිසුන් සංඛ්‍යාව 25,200 ක් වූ අතර 2023 වර්ෂයේ දී 43,204 ක් (යෝජිත බඳවා ගැනීම) වේ. ඒ අනුව වාර්ෂිකව සලකා බැලීමේ දී 2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුල විශ්වවිද්‍යාල සඳහා ඇතුලත් කරගනු ලැබූ සිසුන් ප්‍රමාණය 18,004 කින් වර්ධනය වී ඇත.

මීට අමතර අනුරාධපුරයේ පිහිටි ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සඳහා 2022/2023 වර්ෂයේ දී සිසුන් 156ක් ඇතුළත් කර ගන්නා ලද අතර ඉන් විදේශ රටවල් නියෝජනය දෙකක් වේ. 2023/2024

අධ්‍යයන වර්ෂ සඳහා ලියාපදිංචි වීම් ලෙස 171ක් ඇතුළත් කර ගන්නා ලද අතර ඉන් විදේශ රටවල් නියෝජනය දෙකක් වේ. හෝමාගම පිහිටි බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 2022/2023 වර්ෂයේ දී ලියාපදිංචි කිරීම 168 ක් සිදු කර ඇති අතර මේ තුල විදේශ ශිෂ්‍ය ලියාපදිංචිය 15 දෙනෙකු ගෙන් නියෝජනය වේ. මෙම විශ්වවිද්‍යාලයන් හි අධ්‍යාපන කටයුතු සඳහා 2023/2024 වර්ෂයේ දී සිසුන් 141 ක් ලියාපදිංචි වි ඇති අතර ඒ තුල 24 දෙනෙකු විදේශීය රටවල් නියෝජනය කරයි. විස්තර 3.3 වගුවෙන් දැක්වේ.

3.3 වගුව ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කරනු ලබන ලියාපදිංචි කිරීම්

| ආයතනය | 2022/2023 | 2023/2024 |
|---|---|---|
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 168 | 141 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 156 | 171 |
| එකතුව | 324 | 312 |

මූලාශ්‍රය: බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විෂය ධාරාවන් 5ක් යටතේ මෙන්ම පොදු විශයන් යටතේ මෙවරද ලියාපදිංචි කටයුතු සිදු කර ඇති අතර එම බඳවා ගැනීම් 3.4 වගුවෙන් දක්වා ඇත.

කෙසේ වුවද සමස්තයක් ලෙස ගත් කල බඳවා ගැනීමේ දී 2021/2022 වර්ෂයට සාපේක්ෂව 2022/2023 වර්ෂයේ 8.79% ක වැඩි වීමක් දක්නට ලැබේ. සංඛ්‍යාත්මකව ජීව විද්‍යා අංශයෙහි සිසුන් 66 කින් පමණ වැඩි වී ඇති අතර, භෞතික විද්‍යා අංශයේ සිසුන් 41 කින් පමණ අවස්ථා වැඩිවී ඇත.

3.4 වගුව: විශ්වවිද්‍යාල ප්‍රවේශයෙහි වර්ධනය

| උසස් පෙළ විෂය ධාරාවන් | 2021/2022 | 2022/2023 | වැඩිවීම |
|---|---|---|---|
| කලා | 12,825 | 13,055 | 1.76% |
| ජීව විද්‍යා | 10,038 | 10,104 | 0.65% |
| භෞතික විද්‍යාව | 8,245 | 8,204 | (0.50%) |
| වානිජ්‍ය | 7,899 | 8,001 | 1.27% |
| තාක්ෂණ | 3,844 | 3,886 | 1.08% |
| පොදු විෂයයන් | 695 | 728 | 4.53% |
| එකතුව | 43,546 | 43,978 | 8.79% |

මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

### 3.3.2 ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 2024 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා සිසුන් 10,623ක් ඇතුලත් වී ඇත. ප්‍රාදේශිය මට්ටමින් ද ඉතා පුළුල් ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන උසස් තාක්ෂණ ආයතන ගණකාධිකරණය, කෘෂිකාර්මික, සිවිල් හා ඉලෙක්ට්‍රිකල් ඉංජිනේරු, ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය, කළමණාකරණය හා සංචාරක කර්මාන්තය යනාදි ක්ෂේත්‍ර රැසකට අදාල පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි. එසේම ඉදිරි වසර තුල දී තව දුරටත් පාඨමාලා සඳහා සිසුන් වැඩිකර ගැනීමට අපේක්ෂා කෙරේ.

2023 වර්ෂය හා සසඳන විට, 2024 වර්ෂය තුල දී ලංකාව පුරා විහිදී ඇති සියලුම උසස් තාක්ෂණ ආයතන සඳහා සිසුන් අයදුම් කිරීමෙහි වැඩි වීමක් දක්නට ලැබේ. ප්‍රාදේශියව පවතින උසස් තාක්ෂණ ශාඛා අනුව සිසුන් ඇතුලත් කර ගැනීම පිළිබඳ තොරතුරු ඇමුණුම B1 මගින් දැක්වේ.

උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යාපන ලබන සිසුන් අතරින් ගණකාධිකරණය පූර්ණ කාලින (පූ.කා.), උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (පූ.කා.), තොරතුරු තාක්ෂණය (පූ.කා.) යන විෂයයන් ජනප්‍රියත්වයට පත්වී ඇත.

පාඨමාලා අනුව සිසුන් ඇතුලත් කර ගැනිම ඇමුණුම B2 මගින් දැක්වේ.

## 3.4 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන පද්ධති.

**උපාධි පිරිනැමීම සඳහා අනුමැතිය ලබාදුන් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන.**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන හා නියෝග මඟින් උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශයේ ලේකම් මෙම කාර්යයේ දී නිශ්චිත බලධරයා වශයෙන් පත්කර ඇත. ඒ අනුව, නිශ්චිත බලධරයා විසින් උපාධි හා උපාධි ප්‍රදානය කිරීමේ ආයතන නිර්දේශ කිරීම පිණිස පිහිටවූ "ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව" මේ වන විට 8 වන බඳවා ගැනීම සඳහා කටයුතු ආරම්භ කරන ඇත. ඒ අනුව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 20 කින් යෝජනා කැඳවා ඇත. උපාධි වැඩසටහන් 97ක් යටතේ ලියාපදිංචි කරගැනීම් 10,335ක් පිණිස

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 18කින් යෝජනා ලැබී ඇත.

උපාධි ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලත් ආයතන ලෙස පිළිගෙන ඇති ආයතනවල 2023 වර්ෂයට අදාළ සිසුන් බඳවා ගැනීම් පිළිබඳ තොරතුරු ඇමුණුම B3 මගින් දැක්වේ.

තවද, අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත්, එහෙත් රජයේ විශ්වවිද්‍යාල සඳහා ඇතුල් වීමට සුදුසුකම් නොලත් ශිෂ්‍යයන් හට උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථා වැඩි කිරීමේ අරමුණින් පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය හඳුන්වාදෙන ලදි.

3.5 වගුව 2018-2024 වර්ෂය සඳහා පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම.

| වසර | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව | උපාධි පාඨමාලා සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2019 | 10 | 50 | 2,330 |
| 2020 | 12 | 69 | 2,308 |
| 2021 | 15 | 95 | 4,157 |
| 2022 | 16 | 101 | 4,752 |
| 2023 | 17 | 93 | 3,766 |
| 2024 | 18 | 110 | සැකසෙමින් පවතී |
| එකතුව | | | 16,019 |

මූලාශ්‍රය: රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය

## 3.5 ශ්‍රී ලාංකික සිසුන් සඳහා විදේශ ශිෂ්‍යත්ව.

වාර්ෂිකව විවිධ රටවල් විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ශ්‍රී ලාංකික සිසුන් සඳහා ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන ප්‍රමුඛතම කාර්යයකි.

විදේශීය ශිෂ්‍යත්ව සඳහා වාර්ෂිකව රටවල් කිහිපයක් මගින් ශිෂ්‍යත්ව ප්‍රදානය සිදු කරනු ලබන අතර ඒ පිළිබඳ තොරතුරු භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රසිද්ධ පුවත් පත් මගින් හා අපගේ වෙබ් අඩවිය (www.mohe.gov.lk) මගින් ප්‍රචාරය කරනු ලබන අතර, මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම සිදුකර විධිමත් හා විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් යටතේ සිසුන් තෝරා ගැනීම සිදු කරනු ලබයි. අයදුම්පත් අතරින් සුදුසු අයදුම්කරුවන් සම්මුඛ පරික්ෂණයකින් පසුව තෝරා ගන්නා ලද අතර අයදුම්කරුවන් අදාල පිරිනමන රට හෝ අදාල නියෝජිත ආයතනයයි. එමෙන්ම අමතරව සෘජුව අයදුම් කල හැකි විදේශීය ශිෂ්‍යත්ව අවස්ථා අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීම මගින් සිසුන් දැනුවත් කිරීම සිදු කරනු ලබයි. 2021 වසරේ සිට 2024.12.31 දක්වා ප්‍රථම සහ පශ්චාත් උපාධි සඳහා තෝරා ගන්නා ලද මුළු සිසුන් සංඛ්‍යාව 3.6 හා 3.7 වගු වලින් දැක්වේ.

3.6 වගුව ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව අවස්ථා (2021 – 2024.12.31)

| රට | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| ඉන්දියාව | 32 | 37 | 44 | 11 |
| චීනය | - | - | - | 05 |
| කියුබාව | - | 01 | 01 | 01 |
| ජපානය | - | 01 | 02 | ජපන තානාපති කාර්යාලය මගින් අදාළ තෝරාගැනීම් සිදු කරනු ලබයි. |
| සර්බියාව | - | 01 | - | 01 |
| හන්ගේරියාව | - | - | 08 | 08 |

මූලාශ්‍රය: අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය| උසස් අධ්‍යාපන අංශය

3.7 වගුව පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා (2021 – 2024.12.31)

| රට | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| ඉන්දියාව | 56 | 06 | 28 | 75 |
| චීනය | 13 | 07 | 30 | 24 |
| ජපානය | - | 07 | 07 | සම්මුඛ පරීක්ෂණ පවත්වා කුසලතා අනුපිළිවෙල මත ලැයිස්තුගත ශිෂ්‍ය ලේඛනය ජපාන තානාපති කාර්යාලය වෙත ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇත. |
| එක්සත් රාජධානිය | 05 | 03 | 02 | 02 |
| හන්ගේරියාව | - | - | 12 | 12 |

මූලාශ්‍රය: අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය| උසස් අධ්‍යාපන අංශය

## 3.6 විදේශීය ශිෂ්‍ය ලියාපදිංචිය

### 3.6.1 විදේශීය ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය

2023 වර්ෂය සඳහා විදේශීය සිසුන් 431 ප්‍රථම උපාධි හැදෑරීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල වල ලියාපදිංචි වි ඇත. එම සංඛ්‍යාව 2024.12.31 දිනට 356 කි. 2014 වර්ෂයේ සිට විදේශීය ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය 3.1 රූපයෙන් දක්වා ඇත.

3.1 රූපය: විදේශීය ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය




මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල.

රටවල් අනුව විදේශීය ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය 2024 වර්ෂයේ දී රටවල් 31 කින් ප්‍රථම උපාධිය හැදෑරීම සඳහා සිසුන් මෙරටට පැමිණ ඇත. 2024 වර්ෂයේ දී ප්‍රථම උපාධිය සඳහා වැඩිම සිසුන් පිරිසක් ලියාපදිංචි වී ඇත්තේ භූතානයෙනි. එම සිසුන් ගණන 115 කි. එය මුළු සිසුන් පිරිසෙන් 32% කි. දෙවනියට වැඩිම සිසුන් පිරිසක් ලියාපදිංචි වී ඇත්තේ මියන්මාරයෙනි. රටවල් අනුව ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය ඇමුණුම A මඟින් දක්වා ඇත.

2023 වර්ෂයේ පාඨමාලා අනුව විදේශීය ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය වැඩිම සිසුන් පිරිස වූ 197 ක් ලියාපදිංචිය වී ඇත්තේ වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා වේ. 2024.12.31 දිනට එම පාඨමාලාව සඳහා ලියාපදිංචි සංඛ්‍යාව 229 කි. වෛද්‍ය විද්‍යාව සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය මුළු ශිෂ්‍ය ලියාපදිංචියෙන් 64% ක් පමණ වේ. දෙවනියට වැඩිම සිසුන් පිරිසක් ලියාපදිංචි වි ඇත්තේ බෞද්ධ දර්ශනය විෂය හැදෑරීම සඳහායි. එම සංඛ්‍යාව 2023 වර්ෂයේ 118 හා 2024.12.31 දිනට 90 කි. පාඨමාලා අනුව ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය ඇමුණුම B4 මඟින් දක්වා ඇත.

විශ්වවිද්‍යාල අනුව ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය විශ්වවිද්‍යාල 15 ක ප්‍රථම උපාධිය සඳහා විදේශීය සිසුන් අධ්‍යන කටයුතු වල නිරතව සිටින අතර වැඩිම සිසුන් පිරිසක් ලියාපදිංචි වී ඇත්තේ කැළණිය විශ්වවිද්‍යාලයේයි. එය 2024.12.31 දිනට 86 කි. දෙවෙනියට වැඩිම සිසුන් පිරිසක් ලියාපදිංචි වී ඇත්තේ කොළඹ විශ්වවිද්‍යාලයේ වන අතර එය 2024.12.31 දිනට 85 කි. තෙවනියට පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ සිසුන් 68 ක් 2024.12.31 දිනට ලියාපදිංචි වී ඇත. විශ්වවිද්‍යාල අනුව ප්‍රථම උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය ඇමුණුම B5 මඟින් දක්වා ඇත.

### 3.6.2 විදේශිය පශ්චාත් උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය

පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා විදේශීය සිසුන් 2023 වර්ෂයේ 794 ක් හා 2024.12.31 දින වන විට 561 දෙනෙක් ලියාපදිංචි වී ඇත. 2014 වර්ෂයේ සිට පශ්චාත් උපාධි හැදෑරීම සඳහා විදේශීය සිසුන් ලියාපදිංචිය 3.2 රූපය මඟින් දක්වා ඇත.

3.2 රූපය: විදේශීය පශ්චාත් උපාධි සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය




මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල.

රටවල් අනුව විදේශීය පශ්චාත් උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය 2023 වර්ෂයේ දී රටවල් 32 කින් සිසුන් 794 ක් මෙරටට පැමිණ ඇති අතර 2024.12.31 දිනට රටවල් 28 කින් පැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව 561 කි. 2024 වර්ෂයේ දී වැඩිම සිසුන් පිරිසක් පැමිණ

ඇත්තේ චීනයෙන් ය. රටවල් අනුව පශ්චාත් උපාධිය සඳහා විදේශීය ශිෂ්‍ය ලියාපදිංචිය ඇමුණුම A1 මගින් දැක්වේ.

පාඨමාලා අනුව විදේශීය පශ්චාත් උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය 2023 වර්ෂයේ විදේශීය පශ්චාත් උපාධි හැදෑරීමට පැමිණි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වූ 794 ක් වන පිරිස අතරින් 433 දෙනෙකු පැමිණ ඇත්තේ බෞද්ධ අධ්‍යයන විෂය හැදෑරීම සඳහාය. එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 55% කි. 2024.12.31 දිනට ලියාපදිංචි වී ඇති මුළු ශිෂ්‍ය පිරිස වූ 561 දෙනා අතරින් 262 දෙනෙකු පැමිණ ඇත්තේ බෞද්ධ අධ්‍යයන විෂය හැදෑරීම සඳහාය. එම සංඛ්‍යාව මුළු ශිෂ්‍ය පිරිසෙන් 47% කි. පාඨමාලා අනුව පශ්චාත් උපාධිය සඳහා විදේශීය ශිෂ්‍ය ලියාපදිංචිය ඇමුණුම B6 මගින් දැක්වේ.

විශ්වවිද්‍යාල අනුව විදේශීය පශ්චාත් උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය 2023 වර්ෂයේ දී වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි වී ඇත්තේ බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය සඳහා වන අතර එය මුළු ශිෂ්‍ය ලියාපදිංචිය වූ 773 දෙනාගෙන් සිසුන් 329 ක් වේ. එනම් 43% ක් වේ. 2024.12.31 දිනට වැඩිම විදේශිය ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි ඇත්තේ ද බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනයෙහි වන අතර එය මුළු සිසුන් 561 දෙනාගෙන් සිසුන් 264 කි. එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 47% ක් වේ. පශ්චාත් උපාධිය සඳහා දෙවනියට වැඩිම සිසුන් පිරිසක් ලියාපදිංචි වී ඇත්තේ කොළඹ විශ්වවිද්‍යාලයෙන් වන අතර එය 2024.12.31 දිනට 113 ක් වේ. විශ්වවිද්‍යාල අනුව පශ්චාත් උපාධිය සඳහා විදේශීය ශිෂ්‍ය ලියාපදිංචිය ඇමුණුම B7 මගින් දැක්වේ.

## 3.7 ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහය

උසස් අධ්‍යාපන ප්‍රවේශය ලැබූ ආර්ථික දුෂ්කරතා ඇති විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා තම අධ්‍යයන කටයුතු පහසුවෙන් කරගෙන යාමට ප්‍රධාන ක්‍රම 02ක් යටතේ මූල්‍ය අනුග්‍රහයන් ලබාදෙනු ලැබේ. ඒවා නම්,

- මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය
- විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර

### 3.7.1 මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ක්‍රමය.

2024 වර්ෂයේ දී සිසුන් 92,550 දෙනෙක් සඳහා රුපියල් මිලියන 1,865.14 ක් මහපොළ, විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර හා වෙනත් දායකත්ව ලෙස ලබා දී ඇත. එහි දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ, භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ සිසුන් 2,138 දෙනෙකු සඳහා මහපොළ යෝජනා ක්‍රමය යටතේ රු. මි. 79.34 ක් 2024 වසරේ දී ලබා දී ඇත. 2023 හා 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මහපොළ සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර යටතේ ශිෂ්‍යයන්ට ලබා දුන් මූල්‍ය අනුග්‍රහය 3.8 වගුවේ දැක්වේ.

**3.8 වගුව මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය සහ ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ ලබා දුන් මූල්‍ය අනුග්‍රහය.**

| | 2023 | | 2024 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|
| | සිසුන් ගණන | මුළු මුදල (රු. මි.) | සිසුන් ගණන | මුළු මුදල (රු. මි.) |
| වි.වි.ප්‍ර.ක සභාව යටතේ ඇති ආයතන | **95,345** | **2,016.3** | **89,490** | **1,774.8** |
| *ශිෂ්‍යාධාර* | 63,026 | 1,012.0 | 62,400 | 1,141.0 |
| *මහපොළ** | *32,292* | *1,003.0* | *27,063* | *633.0* |
| වෙනත් | *27* | *1.3* | *27* | *0.8* |
| බෞද්ධ හා පාලි වි.වි. | 573 | 2.40 | 530 | 2.20 |
| *ශිෂ්‍යාධාර* | *480* | *1.90* | *465* | *1.90* |
| *මහපොළ** | *93* | *0.50* | *65* | *0.30* |
| භික්ෂු වි.වි | 383 | 15.66 | 470 | 9.40 |
| *ශිෂ්‍යාධාර* | *342* | *13.70* | *457* | *9.10* |
| *මහපොළ* | *39* | *1.95* | *13* | *0.30* |
| වෙනත් | *2*** | *0.01462* | - | - |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය | 3,636 | 62.50 | 2,060 | 78.74 |
| *මහපොළ** | *3,636* | *62.50* | *2,060* | *78.74* |
| **එකතුව** | **99,937** | **2,096.86** | **92,550** | **1,865.14** |

මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අයතනය හා බෞද්ධ විශ්වවිද්‍යාල.

*මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ මහපොළ භාරකාර අරමුදල මගින් ලබා දෙන මුදල මෙහි ඇතුලත් නොවන අතර එම ශිෂ්‍යත්ව ලාභීන් සඳහා භාණ්ඩාගාර අරමුදල් මගින් වෙන්කල කොටස පමණක් දක්වා ඇත.

**සොමිලාවති බෙලිගොඩපිටිය

## 3.8 අධ්‍යයන සංවර්ධනය සහ නවීකරණය

### 3.8.1 නව පාඨමාලා හඳුන්වාදීම.

විවිධ විශ්වවිද්‍යාල, උසස් අධ්‍යපන ආයතන විසින් ඉදිරිපත් කරන ලද යොජනා සලකා බලා 2024 තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රථම උපාධි පාඨමාලා 03 ක් අනුමත කර ඇති අතර වර්ෂය විශේෂ උපාධි පාඨමාලා 03 ක් හඳුන්වා දී තිබේ. මේ පිළිබඳ 3.9 හා 3.10 වගු මඟින් දැක්වේ.

3.9 වගුව 2024.12.31 දින දක්වා හඳුන්වාදුන් විශේෂ උපාධි පාඨමාලා

| ආයතනය | උපාධි පාඨමාලා |
|---|---|
| නැගෙනහිර විශ්වවිද්‍යාලය , ශ්‍රී ලංකාව | Bachelor of Information and Communication Technology Honours in Software Development Techniques |
| | Bachelor of Information and Communication Technology Honours in Multimedia Design Techniques |
| කැලණිය විශ්වවිද්‍යාලය | Bachelor of Science Honours Degree in Electronics |

මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

3.10 වගුව 2024.12.31 දින දක්වා හඳුන්වාදුන් නව ප්‍රථම උපාධිපාඨමාලා

| ආයතනය | උපාධි පාඨමාලා |
|---|---|
| නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | Bachelor of Information and Communication Technology Honors |
| යාපනය විශ්වවිද්‍යාලය | Bachelor of Arts Honors in English Language Teaching |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | Bachelor of Science Honors in Service Management |

මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

### 3.8.2 ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා නියමානුකූල කිරීම.

රටෙහි ආර්ථික සංවර්ධනයෙහි විශේෂිත ක්ෂේත්‍රවල ඉහළ මිනිස් බල මට්ටම සඳහා වන උග්‍ර ශ්‍රම අවශ්‍යතාව සපුරා ගැනීමට ඉවහල් වන පශ්චාත් උපාධි අධ්‍යයන අවශ්‍යතා ප්‍රසාරණය කිරීම සඳහා 2024 වර්ෂයේ දී පශ්චාත් උපාධි පාඨමාලා 01 ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇත. 2024.12.31 දක්වා අනුමත කරන ලද පශ්චාත් උපාධි පාඨමාලා පිළිබඳ විස්තර, බාහිර උපාධි පාඨමාලා හා යාවත්කාලීන කරන ලද පාඨමාලා හි විස්තර ඇමුණුම B8 මඟින් දැක්වේ.

### 3.8.3 ස්ථාපිත නව පීඨ/ අධ්‍යයන අංශ සහ ඒකක

අධ්‍යයන අවස්ථා පුළුල් කිරීම සහ සෙසු ක්‍රියාකාරකම් වර්ධනය කිරීමේ අරමුණින් ස්ථාවර කමිටු නිර්දේශයන්ගේ පූර්ව අවශ්‍යත්වයන් සලකා බලා නව අධ්‍යයන අංශ හා නව පීඨ ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදී. නව අධ්‍යයන අංශ ඇමුණුම B9 මඟින් දක්වා ඇත. 2024 වර්ෂයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයක් ස්ථාපිත කර ඇත.

## 3.9 උසස් අධ්‍යපන ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර අධ්‍යාපනික සහයෝගීතාවය වර්ධනය කිරීම.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමේ දර්ශකවල ඉහළ අගයකට ඔසවා තැබීම උදෙසා උසස් අධ්‍යාපනික සහයෝගීතාවයන් සඳහා ජාත්‍යාන්තර සබඳතා වර්ධනය කිරිම සහ අන්තර්ජාතික පර්යේෂණ සඳහා සහභාගීවීම අරමුණු කරගනිමින් මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාලයන්, විදේශ විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සමඟ ගිවිසුම්ගතවීමේ දී නෛතික අනුමැතීන් ලබා දීම සිදු කරනු ලබයි.

එබැවින් උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් රාමුවක් හඳුන්වා දීම රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් මෙන්ම දීර්ඝ කාලීනව හඳුනාගෙන තිබූ කාලීන අවශ්‍යතාවයකි. එසේම උසස් අධ්‍යාපනයේ කලාපීය වශයෙන් හා ගෝලීය වශයෙන් සිදුවන ශ්‍රම සංචලනය ඉහල යාමත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සහ දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදවල වර්ධනය හේතුවෙන් උසස් අධ්‍යාපනය සඳහා

සුදුසුකම් රාමුවක් හඳුන්වා දීම මෙන්ම කලාපීය නිර්දේශන රාමු අනුමත කිරීම සහ ගෝලීය සම්මුතීන් අපරානුමත (Ratify) කිරීම සඳහා අවශ්‍ය මුලික කටයුතු සම්පාදනය කරමින් ඇත.

ඒ අනුව,

- උසස් අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවක් හඳුන්වා දීම.
- කලාපීය නිර්දේශන රාමු අනුමත කිරීම.
- ගෝලීය සම්මුතීන් අපරානුමත (ratify) කිරීම.

සාකච්ඡාවට බඳුන්කර ඇත.

- අවබෝධතා ගිවිසුම්වලට/ අධ්‍යාපනික සහයෝගීතා ගිවිසුම්වලට එළැඹීම.

I . 2024 - 2026 කාලය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වියට්නාම් සමාජවාදී ජනරජය අතර අධ්‍යාපනික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමකට එළැඹීම.

II. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ නේපාල රජය අතර උසස් අධ්‍යාපනික ක්ෂේත්‍රයේ සහයෝගීතාවන් සඳහා ගිවිසුමකට එළැඹීම.

III. ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල අතර අධ්‍යාපනික සහයෝගීතාවය අරමුණු කර ගනිමින් අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් වලට එළැඹීම.

# 04

# උපාධිධාරී නිමැවුම සහ උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය

## 4.1 හැඳින්වීම

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උපාධිධාරී නිමැවුම් මට්ටම සියයට සියයක් පවත්වා ගැනීමට පියවර ගන්නා අතරම, තත්ත්ව සහතිකකරණ පද්ධතිය සවිමත් කිරීමත්, අධ්‍යයන කාර්ය මණ්ඩල වල ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා උසස් අධ්‍යාපන අවස්ථාවන් ලබා දීමත්, අන්තර්ජාතික වශයෙන් වැදගත් සම්මන්ත්‍රණ හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන සාධක පදනම් කොට උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව ප්‍රධාන වශයෙන්, **2023/2024** කාලපරිච්ඡේදය සඳහා විශ්වවිද්‍යාල පද්ධතියෙන් පිට වූ ප්‍රථම උපාධිධාරීන් සංඛ්‍යාව **30,703**ක් වන අතර පශ්චාත් උපාධිධාරීන් **10,454** ක් ඉහත කී කාලය ඇතුළත ඔවුන්ගේ උපාධි සම්පූර්ණ කොට ඇත. එසේම, **2023** වර්ෂයේ දී ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය **(SLIATE)** මඟින් ඩිප්ලෝමාධාරීන් **5,100**ක් බිහි කර ඇත.

## 4.2 උපාධිධාරී නිමැවුම

### 4.2.1 ප්‍රථම උපාධිධාරී නිමැවුම

2023/2024 කාලපරිච්ඡයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලවල සමස්ත උපාධිධාරී නිමැවුම 30,041ක් වන අතර එය අභ්‍යන්තර උපාධිධාරීන් 20,429 ක් සහ බාහිර උපාධිධාරීන් 9,612 කින් සමන්විත වේ. එසේම, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් අභ්‍යන්තර සිසුන් 75 ක් ද බාහිර සිසුන් 311 ක් ද, භික්ෂු විශ්වවිද්‍යාලයෙන් අභ්‍යන්තර සිසුන් 97 ක් ද, ද බාහිර සිසුන් 179 ක් ද, තම උපාධි සම්පූර්ණ කළහ.

ඒ අනුව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සමස්ත උපාධිධාරී නිමැවුම **30,703** ක් වේ. ස්ත්‍රී පුරුෂභාවය අනුව අනුඛණ්ඩනය 4.1 වගුවේ දක්වා ඇත.

**වගුව 4.1 උපාධිධාරී නිමැවුම (ස්ත්‍රී - පුරුෂභාවය අනුව)**

| | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| අභ්‍යන්තර | 7,378 | 13,223 | 20,601 |
| බාහිර | 2,172 | 7,930 | 10,102 |
| එකතුව | 9,550 | 21,153 | 30,703 |

(මූලාශ්‍රය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය)

සමස්ත උපාධිධාරී නිමැවුම තුළ බහුතරය කලා උපාධිධාරීන් වන අතර එම සංඛ්‍යාව 13,232ක් එනම් 43% කි. එසේම, උපාධිධාරීන් 7,286ක් කළමනාකරණ හා වාණිජ අංශවලින් උපාධි සම්පූර්ණ කර ඇති අතර එය සමස්ත නිමැවුමෙන් 23%කි. උපාධිධාරීන් 3,045ක් එනම් 9.9% විද්‍යා විෂය ධාරාවෙන් වන අතර 1,808ක් එනම් 5.8% ක් ඉංජිනේරු විෂය ධාරාවෙන් ද වේ. 1,314 ක් එනම් 4.2% පරිගණක විද්‍යාව හා තොරතුරු තාක්ෂණ අංශවලින් ද, 1,260ක් වෛද්‍ය විද්‍යා අංශයෙන් ද, උපාධි සම්පූර්ණ කර ඇති අතර එය සමස්ත නිමැවුමෙන් එනම් 4.1% වන අතර උපාධිධාරීන් 731 එනම් 2.3%ක් තාක්ෂණය විෂය ධාරාවෙන්ද වේ. 2023 වර්ෂයේ දි දන්ත වෛද්‍ය විෂය ධාරාව සඳහා අවසන් වසර විභාගයක් පවත්වා නොමැති

අතර 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ඉංජිනේරු විද්‍යා විෂය ධාරාවෙන් උපාධිධාරින් 205 ක වැඩිවීමක් සිදුවී ඇත. විෂය ධාරාව අනුව සමස්ත උපාධිධාරී නිමැවුම 4.2 වගුවෙන් දක්වා ඇත.

**වගුව 4.2 විෂය ධාරාව අනුව සමස්ත උපාධිධාරී නිමැවුම**

| විෂය ධාරාව | 2022 | 2023 |
|---|---|---|
| කලා | 11,140 | 13,232 |
| කළමනාකරණය හා වාණිජ | 7,232 | 7,286 |
| අධ්‍යාපන | 353 | 157 |
| විද්‍යාව | 3,314 | 3,045 |
| නීතිය | 379 | 309 |
| වෛද්‍ය | 1,278 | 1,260 |
| දන්ත වෛද්‍ය | 72 | - |
| පශු වෛද්‍ය | 64 | 80 |
| කෘෂිකර්මය | 1,209 | 687 |
| ඉංජිනේරු විද්‍යාව | 1,603 | 1,808 |
| වාස්තු විද්‍යාව හා ප්‍රමාණ සමීක්ෂණය | 334 | 348 |
| පරිගණක විද්‍යාව හා තොරතුරු තාක්ෂණය | 1,425 | 1,314 |
| සමසෞඛ්‍ය විද්‍යාව | 801 | 369 |
| දේශීය වෛද්‍ය | 291 | 77 |
| තාක්ෂණය | 1,421 | 731 |
| එකතුව | 30,916 | 30,703 |

(මූලාශ්‍රය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය)

## 4.2.2 පශ්චාත් උපාධිධාරී නිමැවුම

දැනට නිරතව සිටින රැකියාවේ උසස්වීම් අපේක්ෂාවෙන්, රැකියා වෙළඳපොළෙහි දැඩි තරඟකාරීත්වයට මුහුණ දීම, දැනුම දියුණු කර ගැනීමට ඇති කැමැත්ත වැනි විවිධ හේතු නිසා සිසුන් පශ්චාත් උපාධි අධ්‍යයනයන් කරා යොමු වීමේ ඉහළ ප්‍රවණතාවක් පවතී.

2023 වර්ෂය අවසානය වන විට සමස්ත පශ්චාත් උපාධි නිමැවුම 6,261කි. මෙයින් 6,204 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතනවලින් වන අතර පශ්චාත් උපාධිධාරීන් 04ක් භික්ෂු විශ්ව විද්‍යාලයෙන්ද 53ක් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් වේ. සමස්ත පශ්චාත් උපාධි නිමැවුම සැලකූ විට, එයට පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් 1,175 ක් හා ශාස්ත්‍රපති /විද්‍යාපති උපාධිධාරීන් 4,425ක් ඇතුළත් ය. එසේම වෛද්‍ය පශ්චාත් උපාධිධාරීන් හා ආචාර්ය උපාධිධාරීන් 661ක් ද සමස්ත පශ්චාත් උපාධි නිමැවුම තුළ ඇතුළත්ය. පශ්චාත් උපාධිධාරී නිමැවුම තුළ, පශ්චාත් උපාධිධාරීන් වැඩිම පිරිසක් කළමනාකරණ හා වාණිජ විෂය ධාරාවෙන් බිහි කර ඇති අතර එය සංඛ්‍යාත්මකව 1,741ක් එනම් 28% ක් විය. කලා විෂය ධාරාව දෙවනුවට ඊළඟට වැඩිම උපාධිධාරීන් පිරිසක් බිහි කර ඇති අතර එම සංඛ්‍යාව 1,625 ක් එනම් 26% ක් විය. පශ්චාත් උපාධිධාරී නිමැවුමේ සාරාංශය 4.3 වගුවෙන් දක්වා ඇත.

**වගුව - 4.3 පශ්චාත් උපාධිධාරී නිමැවුම**

| අධ්‍යයන විෂය ධාරාව | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | විද්‍යාපති ශාස්ත්‍රපති / දර්ශනපති | ආචාර්ය/ වෛද්‍ය පශ්චාත් උපාධි | එකතුව |
|---|---|---|---|---|
| කලා | 293 | 1,258 | 74 | **1,625** |
| අධ්‍යාපන | 45 | 200 | - | **245** |
| කළමනාකරණ හා **වාණිජ** | 148 | 1,571 | 22 | **1,741** |
| නීතිය | - | - | - | **-** |
| වෛද්‍ය | 292 | 128 | 498 | **918** |
| දන්ත වෛද්‍ය | - | 2 | - | **2** |
| කෘෂිකර්මය | 12 | 190 | 10 | **212** |
| ඉංජිනේරු විද්‍යාව | 175 | 262 | 11 | **448** |
| පශු වෛද්‍ය | - | 6 | 2 | **8** |
| වාස්තු විද්‍යාව හා ප්‍රමාණ සමීක්ෂණය | 24 | 64 | 2 | **90** |
| විද්‍යාව | 154 | 491 | 21 | **666** |
| තොරතුරු තාක්ෂණය | 32 | 253 | 5 | **290** |
| දේශීය වෛද්‍ය | - | - | 16 | **16** |
| පරිපූරක වෛද්‍ය විද්‍යාව | - | - | - | **-** |
| **එකතුව** | **1,175** | **4,425** | **661** | **6,261** |

(මූලාශ්‍රය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය)

4.1 රූපය 2022 හා 2023 වර්ෂවල පශ්චාත් උපාධිධාරී නිමැවුමෙහි විචලතාව පෙන්වයි.

**රූපය 4.1 පශ්චාත් උපාධිධාරී නිමැවුම**




(මූලාශ්‍රය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය)

### 4.2.3 ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නිමැවුම

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නිමැවුම 5,100 වූ අතර එය 2022 වර්ෂයේදී 6,582 ක් විය. පාඨමාලා අනුව 2023 වසරෙහි සාමාර්ථලාභීන් පිළිබඳ විස්තර 4.4 වගුව මගින් ඉදිරිපත් කර ඇත.

**වගුව 4.4 ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නිමැවුම**

| පාඨමාලාව | 2023 |
|---|---|
| HNDA | 1,510 |
| HNDIT | 696 |
| HNDE (Civil) | 225 |
| HNDE (Mech.) | 117 |
| HNDE (Ele & Electronics) | 177 |
| HND(English) | 1,129 |
| HNDM | 389 |
| HNDT(Agri) | 142 |
| HNDBF | 65 |
| HNDFT | 45 |
| HNDQS | 115 |
| HNDBSE | 16 |
| HNDBA | 109 |
| HNDTHM | 283 |
| HNDCSPT | 61 |
| HNDPM | 21 |
| එකතුව | 5,100 |

(මූලාශ්‍රය - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය)

## 4.3 උපාධිධාරීන්ගේ රැකියා නියුක්තභාවය

### 2023 වසරේ විශ්වවිද්‍යාල අනුව රැකියා නියුක්තභාවය

2012 වසරේ සිට අමාත්‍යාංශය විසින් හඳුන්වා දී වසර කිහිපයක් පුරා පවත්වාගෙන යනු ලැබූ උපාධිධාරීන්ගේ රැකියා නියුක්තභාවය පිළිබඳ සමීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යාම විශ්වවිද්‍යාල වෙත පවරා තිබිණි. ඒ අනුව, 2023 වසර සඳහා විශ්වවිද්‍යාල කිහිපයක් විසින් කරන ලද සමීක්ෂණයන්හි ප්‍රතිඵල අනුව 2023 වසරේ සමස්ත උපාධිධාරී රැකියා නියුක්තභාවය 69.1% කි. 2023 වර්ෂයේ දී මොරටුව විශ්වවිද්‍යාලයෙන් 85.5% ක රැකියා නියුක්තභාවයක් ද, විවෘත විශ්වවිද්‍යාලයෙන් 93.8% ක රැකියා නියුක්තභාවයක් ද, වයඹ විශ්වවිද්‍යාලයෙ 72.3% ක රැකියා නියුක්තභාවයක් ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් 71.4% ක රැකියා නියුක්තභාවයක් ද, අග්නිදිග විශ්වවිද්‍යාලයෙන් 67.5% ක රැකියා නියුක්තභාවයක් ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් 66.8% ක රැකියා නියුක්තභාවයක් ද , රුහුණ, යාපනය, නැගෙනහිර යන විශ්වවිද්‍යාල වලින් පිළිවෙලින් 58.1%, 53.5%, 52.8% ක රැකියා නියුක්තභාවයක් ද වාර්තා විය.

**රූපය 4.2 - විශ්වවිද්‍යාලය අනුව සමස්ත උපාධිධාරී රැකියා නියුක්තභාවය**




(මූලාශ්‍රය - කොළඹ විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය , යාපනය විශ්වවිද්‍යාලය, රුහුණු

විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, අග්නිදිග විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය)

## විෂය ධාරා අනුව රැකියා නියුක්තභාවය - 2023

**වගුව 4.5 - විෂය ධාරා අනුව සමස්ත උපාධිධාරී රැකියා නියුක්තභාවය**

| විෂය ධාරාව | ප්‍රතිශතය (%) |
|---|---|
| කලා | 32.6 |
| කළමනාකරණය | 76.9 |
| ව්‍යාපාර අධ්‍යයනය | 69.4 |
| අධ්‍යාපන | 32.0 |
| විද්‍යාව | 73.1 |
| ව්‍යවහාරික විද්‍යාව | 60.2 |
| නීතිය | 52.0 |
| වෛද්‍ය | 76.2 |
| *දන්ත වෛද්‍ය | - |
| ධීවර හා සාගර විද්‍යාව | 42.9 |
| *පශු වෛද්‍ය | - |
| පශු සම්පත්, ධීවර හා පෝෂණය | 85.0 |
| කෘෂිකර්මය | 65.2 |
| ඉංජිනේරු විද්‍යාව | 80.6 |
| වාස්තු විද්‍යාව | 78.0 |
| පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය | 90.0 |
| සමසෞඛ්‍ය විද්‍යාව | 34.2 |
| දේශීය වෛද්‍ය | 37.5 |
| හෙද | 81.0 |
| තොරතුරු තාක්ෂණය | 90.0 |
| ජෛව පද්ධති තාක්ෂණය | 42.0 |
| තාක්ෂණය | 59.7 |
| තාක්ෂණික අධ්‍යයනය | 85.1 |
| ප්‍රමාණ සමීක්ෂණය | 96.4 |
| *කෘෂි තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යාව | - |
| විලාසිතා නිර්මාණ සහ නිෂ්පාදන සංවර්ධනය | 87.5 |
| නිර්මාණකරණය | 93.6 |
| ව්‍යාපාර විද්‍යාව | 96.7 |
| ඉංජිනේරු තාක්ෂණය | 65.0 |
| පහසුකම් කළමනාකරණය | 91.1 |
| තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය | 82.2 |
| ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය | 86.4 |
| නගර සහ ග්‍රාම සැලසුම්කරණය | 77.3 |
| ජන මාධ්‍ය හා රංග කලාව (ශ්‍රී පාලි මණ්ඩපය) | 35.5 |
| භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පය | 63.6 |
| ඉස්ලාමීය අධ්‍යයනය සහ අරාබි භාෂාව | 65.1 |
| සාමාන්‍යය | 69.2 |

(මූලාශ්‍රය - කොළඹ විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය , යාපනය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, අග්නිදිග විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය)

*** - සමීක්ෂණයේ තොරතුරු වාර්තා වී නැත**

කොළඹ විශ්වවිද්‍යාලය මත පදනම්ව වෛද්‍ය උපාධිධාරී රැකියා නියුක්තභාවය 76.2% කි. උපාධි ලබාගත් සිසුන්ගේ රැකියා නියුක්තභාවය අනුව අධ්‍යාපන විෂය ධාරාවේ උපාධිධාරීන් අවම අගය වූ 32% වාර්තා කර ඇත. කලා විෂය ධාරාවේ රැකියා නියුක්තභාවය 32.6% වාර්තා වී ඇත.මෙම ගණනය කිරීම සඳහා පදනම් වූ විශ්වවිද්‍යාලයන් වනුයේ කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය , යාපනය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, අග්නිදිග විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය වේ.

**රූපය 4.3 විෂය ධාරා අනුව සමස්ත උපාධිධාරී රැකියා නියුක්තභාවය**




(මූලාශ්‍රය - කොළඹ විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය , යාපනය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, අග්නිදිග විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය)

### ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාඨමාලා අනුව ඩිප්ලෝමාධාරීන්ගේ රැකියා නියුක්තභාවය

රූපය 4.4- ඩිප්ලෝමාධාරීන්ගේ රැකියා නියුක්තභාවය




(මූලාශ්‍රය - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය)

2023 වර්ෂයේදී උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාවේ (ගොඩනැගිලි සේවා) (HNDBSE) රැකියා නියුක්තභාවය 85% කි. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික) (HNDE-MECHANICAL) හා උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි සහ ඉලෙක්ට්‍රොනික) (HNDE-ELECTRICAL & ELECTRONIC) යන පාඨමාලාවල රැකියා නියුක්තභාවය 80% ට අධිකය.මෙම පාඨමාලාවන් අතුරින් අවම රැකියා නියුක්තභාවයක් වූ 8% ක අගය ඇති උසස් ජාතික පාරිභෝගික විද්‍යාව සහ නිෂ්පාදන තාක්ෂණ ඩිප්ලෝමාව (HNDCSPT) 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පැවැත්වූ අතර 2020 වර්ෂයෙන් පසු ප්‍රතිපත්තිමය හේතුවක් මත පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම සිදු නොකරන ලදී. 2023 වසරේදී, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සියළුම පාඨමාලාවල රැකියා නියුක්ති ප්‍රතිශතය 61%ක් වේ.

## 4.4 අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ පද්ධති සවිමත් කිරීම

### 4.4.1 තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ (QAC) කාර්යභාරය සහ කටයුතු

- විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.
- නිසි ක්‍රියාවලියක් තුළින් නව විෂය ඉම් ලකුණු ප්‍රකාශ සංවර්ධනය කිරීම සහ පවතින විෂය ඉම් ලකුණු යාවත්කාලීන කිරීම.
- ආයතනික සමාලෝචන පැවැත්වීම (**IRs**)
- ප්‍රථම උපාධි වැඩසටහන් සමාලෝචන පැවැත්වීම (**PRs**)
- පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචන පැවැත්වීම.
- බාහිර උපාධි වැඩසටහන් සමාලෝචන පැවැත්වීම.
- දුරස්ථ ඉගෙනුම් වැඩසටහන් සමාලෝචන පැවැත්වීම.
- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයට (**SLQF 2015**) අනුකූලව සුදුසුකම් නිර්ණය කිරීම සඳහා විශ්වවිද්‍යාල වෙත සහාය වීම සහ 2023 දී ශ්‍රී ලංකා රජය විසින් අනුමත කර ඇති දකුණු ආසියානු යෝග්‍යතා නිර්දේශන රාමුව (**SQRF**) හා අනුකූලව සුදුසුකම් නිර්ණය කිරීමේ අඛණ්ඩ උත්සාහයන් සඳහා දායක වීම.
- නව පීඨ, ආයතන, මණ්ඩප, අධ්‍යයන අංශ සහ උපාධි ස්ථාපනය කිරීමේ නව යෝජනා ඇගයීම.
- උපාධි සඳහා සාමූහික (**Blanket**) අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් ඇගයීම.
- ජාත්‍යන්තර උසස් අධ්‍යාපන තත්ත්ව ආරක්ෂණ නියෝජිතායතන සමඟ සහයෝගීතාව ඇති කිරීම සහ පවත්වාගෙන යාම.
- තත්ත්ව ආරක්ෂණය (**QA**) පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ වෙබ් අඩවිය නඩත්තු කිරීම.
- ජාතික, ආංශික සහ ජාත්‍යන්තර සංසදවලදී තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය සහ එහි කාර්යය වැඩසටහන නියෝජනය කිරීම.

- උසස් අධ්‍යාපන ආයතන විසින් ප්‍රදානය කරන ලද සුදුසුකම්වල අදාළත්වය සහ වලංගුභාවය පිළිබඳ ජාතික සහ විදේශීය විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම. (වි.වි.කො.යටතේ නොවන)
- අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය මගින් නියාමනය කරනු ලබන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ප්‍රතීතනය සහ තත්ත්ව සහතිකකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරයා දායක වේ.
- තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ප්‍රතීතනය සහ තත්ත්ව සහතිකය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකි.
- තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරයා විසින් අනෙකුත් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන විසින් ඉල්ලා සිටින පරිදි තත්ත්ව සහතිකකරණ කරුණු පිළිබඳ උපදෙස් සපයනු ලබයි.

### 4.4.2 විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ පද්ධති සවිමත් කිරීම.

#### • ආයතනික සමාලෝචනය (IR)

ආයතනික සමාලෝචනය දෙවන වටය සඳහා සැලසුම් කළ කාලසටහනට 2021 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සමාලෝචන ඇතුළත් විය. කෙසේ වෙතත්, ක්‍රියාවලියේ නොවැළැක්විය හැකි ප්‍රමාදයන් සහ ආයතනික සමාලෝචන සංශෝධිත අත්පොත අවශ්‍යවීම හේතුවෙන් මෙම සමාලෝචන 2023 දක්වා කල් දමන ලදී. සමාලෝචන තුනම අවසන් කර අවසන් වාර්තා 2023 සැප්තැම්බර් අවසානය වන විට තත්ත්ව ආරක්ෂණ කවුන්සිල වෙබ් අඩවියට උඩුගත කරන ලදී. මෙය තත්ත්ව ආරක්ෂණය සඳහා වන AHEAD මෙහෙයුමේ ඉලක්කය 100% කින් සාක්ෂාත් කර ගැනීමකි. සංශෝධිත තත්ත්ව ආරක්ෂණ අත්පොත 2023 දී ප්‍රකාශයට පත් කරන ලදී.

#### • වැඩසටහන් සමාලෝචනය (PR)

2020 වැඩසටහන් සමාලෝචනවල කොටසක් ලෙස, විද්‍යා, ඉංජිනේරු, වාස්තු විද්‍යා සහ භූ විද්‍යා පීඨවල සමාලෝචන 59ක් සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන්, 2020 සමාලෝචන, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව 2021 දක්වා කල් දමන ලදී. නැවතත්, ඉදිරිපත් කරන ලද විෂය ඇගයීම් සමාලෝචන (SERs) සමඟ ඇති ගැටලු කිහිපයක් හේතුවෙන්, සමාලෝචනවල සංයුතිය වෙනස් කරන ලද අතර, සමාලෝචන ගණන 74 දක්වා වැඩි කරන ලදී. සමාලෝචන අදියර දෙකකින් සිදු කිරීමට නියමිත විය. අදියර 1 සඳහා 37 සහ අදියර 2 සඳහා 37.

ඉහත සමාලෝචනවලට අමතරව, බාහිර උපාධි පාඨමාලා සමාලෝචන (EDP) 20ක් සැලසුම් කර ඇත. මෙයින් 17ක් සම්පූර්ණ කර ඇත. අත්පොතෙන් වෙනස් වන බාහිර වැඩසටහන් සමාලෝචනය සඳහා වන අත්පොත මෙම සමාලෝචන සඳහා භාවිත කරන ලදී. තවද, විශ්වවිද්‍යාල පද්ධතියේ විධායක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැඩවර්ජනය හේතුවෙන් 2024 මැයි, ජුනි සහ ජූලි මාසවල පැවැත්වීමට නියමිතව තිබූ සමාලෝචන කල් දමන ලදී.

### ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF)

විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන සුදුසුකම් සිතියම්ගත කිරීම සඳහා, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය මඟින් ශ්‍රී ලංකා යෝග්‍යතා රාමුව සහතික කිරීමේ මණ්ඩලයක් පිහිටුවන ලදී. මෙම කාර්යය සඳහා AHEAD ව්‍යාපෘතිය මඟින් මූල්‍ය ආධාර ලබා දෙන ලදී . SLQF සහතික කිරීමේ අත්පොතෙහි අවසාන අනුවාදය තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය වෙත 2023 දෙසැම්බර් මස මුල දී ඉදිරිපත් කරන ලද අතර එය 2024 දී ප්‍රකාශයට පත් කර බෙදා හරිනු ලැබේ.

තවද, ශ්‍රී ලංකා යෝග්‍යතා රාමුව 2015 ලේඛනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිය යුතුව පවතී.

තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ධාරිතා ගොඩනැගීම පිළිබඳ වාර්තාවක් 2022.03.24 දින පැවති කොමිෂන් සභාවේ 1075 වැනි රැස්වීමට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය ඵලදායීව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා නව සේවක සංඛ්‍යා තනතුරු නවයක් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, සේවක සංඛ්‍යා තනතුරු ඇති කිරීම සීමා කිරීම හේතුවෙන් නව සේවක තනතුරු ඇති කිරීම සඳහා වූ ඉල්ලීම් ක්‍රියාත්මක නොවිය. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ධාරිතා ගොඩනැගීම සඳහා

වන යෝජනාව නැවතත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අවශ්‍ය නව සේවක සංඛ්‍යා තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය මේ වන විට කටයුතු කරමින් සිටී.

### 4.4.3 උපාධි පාඨමාලා, උපාධි ප්‍රදාන තත්ත්වය ලබා ගත් ආයතන සහ 2023/2024 වර්ෂවලදී රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල නව අයදුම්පත්

**4.6 වගුව උපාධි පාඨමාලා සංඛ්‍යාව (2024.12.31දිනට)**

| | (ප්‍රථම උපාධිය) | (පශ්චාත් උපාධි ඩිප්ලෝමා) | (විද්‍යාපති / ශාස්ත්‍රපති) | (දර්ශනශූරි) | (දර්ශනපති) | සම්පූර්ණ එකතුව |
|---|---|---|---|---|---|---|
| 2023.09.30 දක්වා | 189 | 15 | 22 | 12 | 12 | 250 |
| 2023.10.01 සිට 2024.12.31 දක්වා | 24 | - | 3 | - | - | 27 |
| එකතුව | 213 | 15 | 25 | 12 | 12 | 277 |

( මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය- උසස් අධ්‍යාපන-රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය )

2024.12.31 දක්වා කාල සීමාව සඳහා උපාධි පාඨමාලා 277ක් සඳහා උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබා දී ඇති අතර, 2023.10.01 සිට 2024.12.31 දක්වා පාඨමාලා 27ක් සඳහා උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබා දී ඇත.

**උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබා දී ඇති ආයතන සහ නව අයදුම්පත්**

2024.12.31 වන විට ආයතන 28කට උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලැබී තිබේ.

2023.09.30 දිනට ආයතන 25ක් තිබූ අතර 2024.12.31 වන විට එය 28 ක් දක්වා ඉහල ගොස් ඇත.

1. ද ගේට්වේ කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්,

යන ආයතන දෙක නව උපාධි ප්‍රදානය කිරීමේ ආයතන ලෙස පිළිගෙන ඇත.

### 4.4.4 ලැප්ටොප් පරිගණක ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාල සිසුන්ට පොලී රහිත ණය ලබාදීම.

2016 අයවැය යෝජනාවලට අනුව, ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොලී රහිත ණය ලබාදීමේ ව්‍යාපෘතියට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව සිදු කිරීම.

2023.01.01 සිට 2024.12.31 දක්වා ලබාගත් ණය සඳහා බැංකු වෙත ගෙවන ලද පොලී මුදල, පිළිබඳ විස්තර අංක 4.7 වගුවේ දක්වා ඇත.

**4.7 වගුව ලබාගත් ණය සඳහා බැංකු වෙත ගෙවන ලද පොලී මුදල**

| මාසය | ලංකා බැංකුව (රු.මි) | මහජන බැංකුව (රු.මි) |
|---|---|---|
| **2023** | | |
| ජනවාරි | 0.67 | 0.11 |
| පෙබරවාරි | 0.52 | 0.1 |
| මාර්තු | 0.52 | 0.09 |
| අප්‍රේල් | 0.42 | 0.05 |
| මැයි | 0.4 | 0.04 |
| ජූනි | 0.37 | 0.04 |
| ජූලි | 0.33 | 0.04 |
| අගෝස්තු | 0.28 | 0.04 |
| සැප්තැම්බර් | 0.23 | 0.03 |
| ඔක්තෝබර් | 0.2 | 0.03 |
| නොවැම්බර් | 0.17 | 0.03 |
| දෙසැම්බර් | 0.16 | 0.03 |
| 2023.01.01 සිට 2023.12.31 දින දක්වා එකතුව | 4.27 | 0.63 |
| **2024** | | |
| ජනවාරි | 0.14 | 0.02 |
| පෙබරවාරි | 0.12 | 0.02 |
| මාර්තු | 0.12 | 0.02 |
| අප්‍රේල් | 0.11 | 0.02 |
| මැයි | 0.10 | 0.01 |
| ජූනි | 0.09 | 0.01 |
| ජූලි | 0.08 | 0.01 |
| අගෝස්තු | 0.08 | 0.008 |
| සැප්තැම්බර් | 0.07 | 0.006 |
| ඔක්තෝබර් | 0.07 | 0.005 |
| නොවැම්බර් | 0.07 | 0.005 |
| දෙසැම්බර් | 0.07 | 0.004 |
| 2024.01.01 සිට 2024.12.31 දින දක්වා එකතුව | 1.05 | 0.138 |

( මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය- උසස් අධ්‍යාපන-තොරතුරු තාක්ෂණ අංශය )

## 4.5. වැඩමුළු සහ සම්මන්ත්‍රණ

**1. "රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ ගුණාත්මක භාවය සහ තිරසාරභාවය ඉහළ නැංවීම" පිළිබඳ වැඩමුළුව**

උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන් මැතිතුමාගේ ගේ සංකල්පයක් අනුව "රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ ගුණාත්මකභාවය සහ තිරසාරභාවය ඉහළ නැංවීම" පිළිබඳ වැඩමුළුව 2023 දෙසැම්බර් 29වන දින කොළඹ 01 ගලදාරි හෝටලයේ දී පවත්වන ලද අතර, මෙම අවස්ථාවට අරමුදල් සපයන ලද්දේ AHEAD මෙහෙයුම විසිනි.

තවද, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල (NSHEIs) පරිණාමය වන පරිස්ථිතිය පිළිබඳ කථිකාවතක් සඳහා මෙම වැඩමුළුව සඳහා ප්‍රමුඛ පුද්ගලයින්, අධ්‍යාපනඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පාර්ශවකරුවන් කැඳවන ලදී. අංශයේ ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව සහ තිරසාරත්වය වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලද අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ තිරසාරභාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා සංවාදය සහ අදහස් පෝෂණය කිරීම, මෙම අංශයේ සංකීර්ණතා පිළිබඳ සාකච්ඡා කිරීම මෙහි දී අරමුණු කර ඇත.

2. **Erasmus+ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන (Erasmus+ CBHE Info Day Session – 2024)**

යුරෝපා සංගමය සහ ලොව පුරා තුන්වන රටවල් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීමට දිගු කාලීනව කටයුතු කිරීම සඳහා කටයුතු කරන ERASMAS+ යනු අධ්‍යාපනය, පුහුණුව, යෞවනය සහ ක්‍රීඩා සඳහා උපකාර කිරීම සඳහා වන යුරෝපා සංගමය විසින් මෙහෙයවනු ලබන වැඩසටහනකි. එම වැඩසටහනට සම්බන්ධවීම මඟින් ලාංකික විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන වලට තම සිසුන් හා අධ්‍යයන කාර්ය මණ්ඩල හුවමාරු කිරීම්, ධාරිතා සංවර්ධනය කිරීම්,ඒකාබද්ධ උපාධි අධ්‍යයන වැඩසටහන් වැනි ජාත්‍යන්තරීකරණය ඉහල නංවන වැඩසටහන් සඳහා ප්‍රදානයන් ලබා ගත හැකි වේ. ඒ අනුව ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල සහ / උසස් අධ්‍යාපන ආයතන අතර මෙම වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය දැනුවත් කිරීම සඳහා 170 දෙනෙකුට අධික විද්වතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් 2024.07.03 දින පවත්වන ලදි.

3. **අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ සහ විශ්වවිද්‍යාල පද්ධතියේ මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, කලා සහ ලලිත කලා පීඨවල පීඨාධිපතිවරුන්ගේ සහයෝගීතාවයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලලිත කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා (FAHSS) විෂයමාලා සංශෝධනය.**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ සහයෝගීතාවයෙන් ලලිත කලා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා විෂයමාලා සංශෝධන පිළිබඳ වැඩමුළුව එම පීඨවල අධ්‍යයන අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් 2023 දෙසැම්බර් 19 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලේ දී පවත්වන ලදී.

මෙම වැඩමුළුව ප්‍රධාන වශයෙන් පහත සඳහන් සමූහවලට (Clusters) බෙදා, මෙහෙයුම් සැලැස්මට අනුව ඉහත සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡා පවත්වන ලද අතර ප්‍රධාන සමූහ තුන යටතේ උප සමූහ කමිටු සමඟින් පසු විපරම් කටයුතු කරගෙන යනු ලැබේ.

- මානව ශාස්ත්‍ර සමූහ
- සමාජ විද්‍යා සමූහ
- ලලිත කලා සමූහ

ඉහත වැඩමුළුවේදී සාකච්ඡා කළ මෙහෙයුම් සැලැස්මට අනුව උපාධි පාඨමාලා සඳහා තොරතුරු තාක්ෂණ, සීමාවාසික, විවේචනාත්මක චින්තනය සහ ඉංග්‍රීසි යන විෂයමාලා ඇතුළත් කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලවලට පවරා ගන්නා ලෙස දැනුම් දෙන ලදී.

**4. 5වන ජාත්‍යන්තර පරිසංවාදය 2023- උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)**

උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) විසින් 2023 සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පිළිබඳ පස්වන ජාත්‍යන්තර පරිසංවාදය (ISSSH) 2023 නොවැම්බර් 29 වන දින කොළඹ 07, ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණයේ තේමාව වූයේ "' දිවංගත මහාචාර්ය සේනක ඩයස් බණ්ඩාරනායක මහතාගේ විද්වත් දායකත්වය නැවත වරක් මෙනෙහි කිරීම" ය.

ඇම්ස්ටර්ඩෑම් ඓතිහාසික කෞතුකාගාරයේ හිටපු ජ්‍යොෂ්ඨ භාරකරු මහාචාර්ය ලෝඩෙවික් ජේ. වැගේනාර් 5වැනි (IRSSSH) 2023 හි ප්‍රධාන කථික ලෙස සහභාගි විය.

ඒ අනුව පහත උප තේමා යටතේ මෙම සමුළුවේ කතිකාවත පවත්වන ලදී -

1. ස්පර්ශනීය කළ හැකි සහ අස්පර්ශනීය සංස්කෘතික උරුමය: ඉල්ලා සිටින අනන්‍යතාවයේ ප්‍රත්‍යාවර්තනයක්.

2. ආගම සහ සමාජය: විද්‍යාවෙන් ඔබ්බට ගිය දර්ශනයක්, මිථ්‍යාවක් සහ යථාර්ථයක්.

3. නිදහස, අයිතිවාසිකම් සහ සිවිල් වගකීම්වලට එදිරිව නීති සම්පාදනය සහ සමාජ සාධාරණත්වය.

4. සංහිඳියාව, දේශපාලනය සහ සමාජය.

5. පරිසරය සහ පරිසර විද්‍යාව: සෞඛ්‍ය සම්පන්න ජීවනෝපායක් සම්ප්‍රේෂණය කිරීම.

6. තිරසාර සංවර්ධනය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ කාර්යභාරය.

7.සංචාරක ක්ෂේත්‍රය: කර්මාන්තයක් හෝ කලාවක්.

8. ඉගැන්වීමේ සහ ඉගෙනීමේදී ඩිජිටල් මෙවලම්වල කාර්යභාරය: භාෂා ඉගෙනීම සඳහා බොහෝ දුරස් වේ.

9. සත්‍ය විද්‍යාව සහ තාක්ෂණය.

10. AI (කෘතිම බුද්ධිය) සහ ඩිජිටල් ප්‍රතිසාධනය.

5. **6 වන ජාත්‍යන්තර පරිසංවාදය (IRSSH) 2024- NCAS- ප්‍රගතිය**

NCAS විසින් වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය: 6 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය (IRSSH) 2024 ඔක්තෝබර් 24 සිට 25 දක්වා 'ජාතික සංවර්ධනය සඳහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පර්යේෂණ දියුණු කිරීම' යන තේමාව යටතේ පවත්වා ඇත. වසර 2024 යනු,

1) තිරසාර ජාතික සංවර්ධනයට තාක්ෂණික නවෝත්පාදනයන් සහ ආර්ථික වර්ධනය මත පමණක් විශ්වාසය තැබිය නොහැකි බවත්, ජාතික හා ජාත්‍යන්තර සබඳතාවලට ගරු කරමින් ගෝලීය පරිමාණයෙන් එහි ප්‍රතික්ෂේප කළ නොහැකි වැදගත්කම බවත් පිළිගැනීම,

2) ඩිජිටල් තාක්ෂණයන් සහ ක්‍රමවේදයන් ගවේෂණය කිරීම සලකා බැලීම මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාවන්හි පර්යේෂණ භාවිතයන් ප්‍රතිනිර්මාණය කරමින්, විශේෂයෙන්ම විශාල දත්ත වේදිකා සහ පරිගණක ආකෘති නිර්මාණය විශාල පර්යේෂණ ප්‍රමාණයක් ශීඝ්‍රයෙන් හෙළිදරව් කරමින්, සත්‍ය පර්යේෂණ සහ දත්ත විශ්ලේෂණයට බලපෑම් කරයි, සමහර විට ඒවායේ අදාළත්වයට සැලකිය යුතු ලෙස බලපායි. එවැනි, ප්‍රධාන අරමුණු යටතේ, පර්යේෂණ පරිසංවාදය පහත තේමාවන් ආවරණය කරන ලදී;

- සමාජ-ආර්ථික අර්බුද මත තාක්ෂණයේ බලපෑම.
- කාර්මිකකරණය, ගෝලීය උණුසුම සහ දේශගුණික විපර්යාස.
- තාක්‍ෂණ යුගයේ ප්‍රජාතන්ත්‍රවාදය සහ පුරවැසිභාවය.
- දේශපාලන ආර්ථිකය සහ තිරසාර පරිවර්තනීය ප්‍රවේශයන්.
- අධ්‍යාපනය පරිවර්තනය කිරීම: ඩිජිටල් යුගයේ ප්‍රතිසංස්කරණ සැරිසැරීම.
- ඔරොත්තු දීමේ හැකියාව යළි ගොඩනැගීම: පශ්චාත් සුනාමි සමාජ, සංස්කෘතීන් සහ උරුමයන් කෙරෙහි තාක්ෂණයේ බලපෑම ගවේෂණය කිරීම.
- තාක්ෂණය හරහා ගවේෂණය කරන ලද සමාජ ජාල සහ මානව අන්තර්ක්‍රියා.
- ඩිජිටල් මානව ශාස්ත්‍ර සහ ප්‍රාසාංගික සහ දෘශ්‍ය කලාව උපයෝගී කර ගැනීම පිළිබඳ පරිගණක ප්‍රවේශයන්.
- හරස් සංස්කෘතික සන්නිවේදනය සඳහා යාන්ත්‍රික ඉගෙනීම සහ යාන්ත්‍රික පරිවර්තනය.
- කර්මාන්තය, සමාජය, ශ්‍රම වෙළඳපොළ සහ මානව යහපැවැත්ම මත තාක්ෂණයේ බලපෑම.
- ස්පර්ශ සහ අස්පර්ශ සංස්කෘතික උරුමයන් ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී තාක්ෂණයේ කාර්යභාරය.
- නවෝත්පාදන ගවේෂණය: ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සහ වාග් විද්‍යාව පිළිබඳ තාක්ෂණය ඒකාබද්ධ කිරීම.

## 4.6 අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා උසස් අධ්‍යාපන අවස්ථා

උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය වැඩිවීම කෙරෙහි ආචාර්යවරුන්ගේ ගුණාත්මකභාවය වැඩිවීම ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇතැයි යන පූර්ව

නිගමනයට අනුව යමින් ආචාර්යවරුන් සඳහා පශ්චාත් උපාධි අවස්ථා වැඩිකිරීමට රජය ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත. උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය වැඩි කිරීමට ප්‍රධාන ක්‍රම 2 ක් යටතේ අනුග්‍රහය ලැබේ.

1.මහා භාණ්ඩාගාරයෙන් ලද රාජ්‍ය ආයෝජන යටතේ,

- උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

2.අවබෝධතා ගිවිසුම් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අත්සන් කරනු ලබන ද්විපාර්ශවික ගිවිසුම් යටතේ විදේශ රට වලින් පිරිනමන ලද ශිෂ්‍යත්ව මඟින්,

එක් එක් ආයතන විසින් මෙහෙයවනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ 2023/2024 වසර තුළ ශිෂ්‍යත්ව ලබා දී ඇති ප්‍රමාණය 4.8 වගුව මගින් දැක්වේ.

**4.8 වගුව 2023 වසර තුළ ශිෂ්‍යත්ව ලබා දී ඇති ප්‍රමාණය**

| ආයතනය | ආචාර්ය සහ පශ්චාත්උපාධි |
|---|---|
| • උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය(NCAS) | 22 |
| • විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 6 |
| • අධ්‍යාපන අමාත්‍යාංශය- උසස් අධ්‍යාපන | 184 |
| එකතුව | 212 |

(මූලාශ්‍රය - උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය- උසස් අධ්‍යාපන )

### 4.6.1 උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) මඟින් ප්‍රතිපාදන පිරිනැමීම.

උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ මෙහෙවර වන්නේ මානව වර්ගයාගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා නව්‍ය සහ නවෝත්පාදන අදහස් සමඟින් සමාජයට ප්‍රතිලාභ ලබා දීම සම්බන්ධයෙන් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනයන්ට සහාය වීම සහ වැඩිදියුණු කිරීමයි. එය දේශීය හා ගෝලීය ආර්ථිකයන්, ප්‍රතිපත්ති සංවර්ධනය සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මූලික අවශ්‍යතා සමඟින් ජීවිතයට පහසුව සඳහා ආවරණය කරයි. එම සාකල්‍ය දැක්ම සමඟින්, කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, අධ්‍යාපන, නීතිය සහ කළමනාකරණ යන පීඨවලට විශේෂයෙන් අනුයුක්තව සිටින ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල විද්වතුන්ට ප්‍රධාන පරිමාණයෙන් විශ්වවිද්‍යාලවලට සහ රටට ප්‍රයෝජනවත් වන පරිදි ඔවුන්ගේ පර්යේෂණ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම පිණිස ඔවුන්ගේ ආචාර්ය උපාධි අධ්‍යයන, දේශීය හෝ විදේශීය ආචාර්ය උපාධිය සඳහා යොමු වීමට මග සලසන දර්ශනපති උපාධි හැදෑරීමට උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සහාය දක්වයි. වාර්ෂිකව රජයේ ප්‍රතිපාදනවලින් සහ ඉන් පිටත අරමුදල් වෙන් කරනු ලබන NCAS අර්ධ අරමුදල් යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් ප්‍රදානලාභීන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් ද්වි-වාර්ෂිකව රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2023 වර්ෂය තුළ ප්‍රදාන ශිෂ්‍යත්ව 22 ක් පිරිනමන ලද අතර, NCAS විසින් 2024 ජූලි දක්වා 07 වන වරට ප්‍රදාන ශිෂ්‍යත්ව පිරිනමන ලද්දේ පළමු වටයේ අයදුම්පත් හරහා ලැබුණු අයදුම්පත් හොඳින් සමාලෝචනය කිරීමෙන් පසුව රාජ්‍ය විශ්වවිද්‍යාලවල විද්වතුන් වෙත ය. 2වන වටය සඳහා අයදුම්පත් 2024 අගෝස්තු 30 දක්වා කැඳවන ලද අතර (2024 ජූලි මැද දක්වා අනධ්‍යයන සහ විධායක කාර්ය මණ්ඩලයේ වෘත්තීය ක්‍රියාමාර්ගය හේතුවෙන් එය ප්‍රමාද විය) දැනට සමාලෝචනය කරමින් පවතී. ඇස්තමේන්තුගත/ වෙන්කර ඇති මුළු ප්‍රදාන මුදල රු.මිලියන 11.32 වන අතර, එය අරමුදල් ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් ලබා ගත හැකි වූ අතර එය මේ වසරේ සුදුසුකම් ලත් අපේක්ෂකයින් වෙත වියදම් කරනු ලැබේ.

තවද, දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හැදෑරීමට පෙර අරමුදල් ප්‍රදානය කර ඇති NCAS විද්වතුන්ගේ පළමු, දෙවන සහ තුන්වන වසරවල අධ්‍යයන කටයුතු සඳහා දැනට පවතින ආචාර්ය උපාධි ප්‍රදාන සඳහා සහාය වීම පිණිස NCAS මගින් සඳහන් කරන ලද කාලසීමාව තුළ රුපියල් මිලියන 28, රුපියල් මිලියන 486, රුපියල් මිලියන 113.58 වැය කරන ලදී. NCAS නියමාවලියෙහි 02/2005 විධානය අනුව මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, කළමනාකරණ, නීතිය, අධ්‍යාපන යන ක්ෂේත්‍රවල විද්වතුන් සඳහා ප්‍රදාන පිරිනමන ලදී. උපාධි සම්පූර්ණ කළ ප්‍රදානලාභීන් 392දෙනාට අමතරව පහත සඳහන් ප්‍රදානලාභීන් 2023 වර්ෂයේ දී තම අධ්‍යයන කටයුතු අවසන් කර,

ඔවුන්ගේ අදාළ විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතනයේ සිය රාජකාරි නැවත ආරම්භ කර ඇත.

උපාධි සම්පූර්ණ නොකළ ප්‍රදානලාභීන්ගෙන් 2024.08.30 සිට රුපියල් මිලියන 1.55ක් සම්පූර්ණයෙන් අයකර ගැනීමට NCAS සමත් වූ අතර, අදාළ විද්‍යාර්ථීන් තනතුරු අතහැර දමා ගොස්/ ඉල්ලා අස් වී ඇති බැවින් තවත් විශ්වවිද්‍යාල කිහිපයකින් ගෙවිය යුතු හිඟ මුදල් තිබේ. සාරාංශයක් ලෙස, 2024 වසරේ පළමු වටයේ අයදුම්පත් යටතේ පිරිනමන ලද ප්‍රදාන හත (07) සමඟ NCAS දැනට ප්‍රදානලාභීන් 475 දෙනෙකුට සහාය දක්වයි.

4.5 රූපය මගින් 2012 වර්ෂයේ සිට ප්‍රතිපාදන ලැබූ සංඛ්‍යාවත් 4.6 දරන ලද වියදමත් පෙන්නුම් කෙරේ.

**රූපය 4.5 NCAS ප්‍රතිපාදන ලාභීන් සංඛ්‍යාව**




(මූලාශ්‍රය - උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)

**රූපය 4.6 දරන ලද වියදම**




(මූලාශ්‍රය - උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)

**ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි(QUT) - උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) ආචාර්ය උපාධි වැඩසටහන.**

උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) සහ ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි (QUT) අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම යටතේ NCAS-QUT හරහා විද්වතුන්ට ප්‍රදාන ලබා දීමට සහාය විය. ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි (QUT) සහ NCAS සමගාමීව අයදුම්පත් සමාලෝචනය කිරීමෙන් සුදුසුකම් ලත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. එකී ගිවිසුමේ කොන්දේසි වලට අනුව, තෝරාගත් විද්වතුන් ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි (QUT) වෙත නම් කරන ලද ආචාර්ය උපාධි පාඨමාලා සඳහා බඳවා ගනු ලැබේ. ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි විසින් අපේක්ෂකයාගේ වාර්ෂික පාඨමාලා ගාස්තුව වසර 03 සඳහා අය නොකරන අතර NCAS විසින් වසරකට ඕස්ට්‍රේලියානු ඩොලර් 18,610 ක ජීවන දීමනාවක් ලබා දෙනු ඇති අතර විදේශීය සෞඛ්‍ය ආවරණය සඳහා ඕස්ට්‍රේලියානු ඩොලර් 2,451 එක් වරක් ගෙවීමක් ලෙස පිරිනමනු ලැබේ. මෙම අවබෝධතා ගිවිසුම යටතේ NCAS උපරිම ශිෂ්‍යත්ව හයක් (06) සඳහා කටයුතු කරනු ලැබීය. මුල් ගිවිසුම 2018 සැප්තැම්බර් සිට බලපැවැත්වෙන තවත් වසර පහක් (05) සඳහා දීර්ඝ කරන ලද අතර, 2023 සැප්තැම්බර් වන විට අවසන් විය.

ශිෂ්‍යත්වය ආරම්භයේ සිටම එක් වටයකට ශිෂ්‍යත්ව පහක් **(05)** ප්‍රදානය කරන ලද අතර **2022** දී අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය වන විට මුළු අයදුම්පත් එකොළහක් **(11)** ලැබී ඇත. කෙසේ වෙතත්, **2022.04.26** දිනැති **03/2022** ජාතික අයවැය චක්‍රලේඛයට අනුව, රාජ්‍ය වියදම් දැඩි ලෙස සීමා කර දේශීය අරමුදල් යොදා ගනිමින් පවත්වනු ලබන විදේශ අධ්‍යයන චාරිකා සහ පුහුණුවීම් අත්හිටුවා ඇති අතර, **QUT** යටතේ සුදුසුකම් ලත් ප්‍රදානලාභීන්ට ජීවන දීමනාව මූල්‍යමය ලෙස ලබා දීම **NCAS** සීමා කර ඇත. කරුණු සලකා බලා , සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට ඔවුන් **QUT** හි අධ්‍යයන කටයුතු කරගෙන යන කාල සීමාව තුළ පූර්ණ ශිෂ්‍යත්ව ලබන්නන් ලෙස ජීවන දීමනාව සෘජුවම ලබා දීම සඳහා ඔවුන් විසින් සම්මුඛ පරීක්ෂණ සහ සමාලෝචනය කිරීම සඳහා වන අයදුම්පත් එකොළහ **QUT** විසින් සලකා බලන

ලදී. **QUT** පූර්ණ ශිෂ්‍යත්වය-**2022** සඳහා සලකා බැලීමට අයදුම්කරුවන් දෙදෙනෙකු **(02)** සුදුසුකම් ලබා ඇති බව **NCAS** වෙත දැනුම් දෙන ලදී.

2023 දී ඕස්ට්‍රේලියානු ඩොලරය (AUD) සහ ශ්‍රී ලංකා රුපියල (LKR) අතර අනපේක්ෂිත විනිමය අනුපාතය මෙන්ම දැඩි ආර්ථික අවපාතය හේතුවෙන් උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය ඔවුන්ගේ ශිෂ්‍යත්ව වැඩසටහනේ වෙනසක් ඉල්ලා සිටීමට තීරණය කළේය. . ඔවුන්ට අවශ්‍ය වූයේ සම්පූර්ණ බඳවා ගැනීමේ සිට “split-site” උපාධි වැඩසටහනකට මාරු වීමටය. ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) පර්යේෂණ මගින් උසස් උපාධිය (HDR) ශිෂ්‍යත්වය සඳහා එහි නේවාසික ගාස්තු වසරකට ඕස්ට්‍රේලියන් ඩොලර් 18,610 සිට ඕස්ට්‍රේලියානු ඩොලර් 32,192 දක්වා වැඩි කර ඇති නිසා මෙම ඉල්ලීම සිදු කරන ලදී. මෙම ඉල්ලීම පිළිබඳ අවසන් තීරණය තවමත් සමාලෝචන මට්ටමේ පවතී.

### 4.6.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ප්‍රතිපාදන පිරිනැමීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ හැකියාව ශක්තිමත් කිරීම මගින් ආචාර්ය මණ්ඩලයේ ස්ථිර සාමාජිකයන්ට සිය වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා මූල්‍යමය වශයෙන් සහයෝගය දැක්වීමයි.

ප්‍රදාන ලබා දෙනු ලබන්නේ දේශීය/විදේශීය ආචාර්ය උපාධි සහ ආචාර්ය උපාධිය දක්වා වන දර්ශනපති උපාධි හා ඊට සමාන අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය මඟින් PhD/ ආචාර්ය උපාධි අධ්‍යයන සඳහා උපරිම වශයෙන් වසර 03 ක් සඳහා වන ප්‍රදාන සහ MPhil/ ශාස්ත්‍රපති උපාධි සඳහා උපරිම වශයෙන් වසර 02 ක් සඳහා වන ප්‍රදාන පමණක් සපයයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයේ සමස්ත ප්‍රදාන සීමාව, ආයතනික සහ ජීවන වියදම් යන දෙකම ඇතුළුව එක් අපේක්ෂකයෙකුට වසරකට රුපියල් මිලියන 2 කි. විදේශයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන සිදු කරන අපේක්ෂකයෙකුට ජීවන වියදම් සඳහා ලැබෙන ප්‍රදානයේ උපරිම සීමාව වසරකට රුපියල් මිලියන 1.5 ක් වේ. ජීවන වියදම් යටතේ, තනි අපේක්ෂකයෙකුට අදාළ වන සීමාව ඉහත දක්වා ඇති උපරිම සීමාව තුළ රට අනුව වෙනස් වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ 2023 දී ශිෂ්‍යත්ව හයක් සහ 2024 වර්ෂයේදී ශිෂ්‍යත්ව දෙකක් ප්‍රදානය කළ අතර , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනට ප්‍රදාන ලබා දෙන ප්‍රදානලාභීන් සඳහා ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු කරගෙන යාමට රුපියල් මිලියන 5.5 ක් නිකුත් කර ඇත.

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ශ්‍රී ලංකාව ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව (GU)පූර්ණ / ඒකාබද්ධ ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන.

ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය (GU) සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විද්වත් අන්තර්ක්‍රියා, සංස්කෘතික හුවමාරුව, සහභාගී පර්යේෂණ සහ වෙනත් ආකාරයේ ශාස්ත්‍රීය සහයෝගීතාවයන්ගෙන් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමකට එළැඹෙන ලදී.

ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම යටතේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසර 03 ක් දක්වා වූ කාලසීමාවක් සඳහා සම්පූර්ණ පන්ති ගාස්තුව ආවරණය කරනු ලබන අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඕස්ට්‍රේලියාව සඳහා අනුමත කරන ලද සීමාවන් තුළ අපේක්ෂකයින්ට වසර 3 ක කාලයක් සඳහා ජීවන වියදම් දීමනාවක් සහ විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණය (OSHC) ලබා දෙනු ඇත. ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසරකට ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව 12ක් දක්වා ලබාදෙනු ඇත.

ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය යටතේ සියලුම පාර්ශවයන්ගේ අවසාන අනුමැතියට යටත්ව කොළඹ විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල ප්‍රමුඛ කොට සහ අනෙකුත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලින් ඕනෑම එකකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහාය දක්වන අපේක්ෂකයින් සඳහා ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් අධීක්ෂණ විධිවිධාන ද දිරිමත් කරනු ලැබේ:

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ - ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ (GU) පූර්ණ/ ඒකාබද්ධ ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන - 2023 සඳහා අයදුම්පත් කැඳවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනට පවතින තත්ත්වයට අනුකූල වන සංශෝධිත නියමයන් සමඟ අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

### ඉන්ටනැෂනල් යුනිවර්සිටි ඔෆ් ජපැන් (IUJ) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ඉන්ටනැෂනල් යුනිවර්සිටි ඔෆ් ජපැන් (IUJ) සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයට ඉන්ටනැෂනල් යුනිවර්සිටි ඔෆ් ජපැන් විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීමට සම අනුග්‍රහය සහිත ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ඉන්ටනැෂනල් යුනිවර්සිටි ඔෆ් ජපැන් (IUJ) අතර ඇති කර ගත් එකඟතා ලිපියට අනුව, ඉන්ටනැෂනල් යුනිවර්සිටි ඔෆ් ජපැන් (IUJ) පන්ති ගාස්තුවෙන් (Tuition fee) 50% අරමුදල් සපයනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පන්ති ගාස්තුවෙන් ඉතිරි 50% (ඉන්ටනැෂනල් යුනිවර්සිටි ඔෆ් ජපැන් (IUJ) විසින් දැනුම් දෙන පරිදි) සහ ජපාන යෙන් 90,000 ක මාසික ජීවන වියදම් දීමනාවක් සඳහා අරමුදල් සපයනු ඇත. අධ්‍යයන නිවාඩු මත විදේශගත වන අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගුවන් ගමන් සඳහා ගෙවනු ලබන ප්‍රදාන ද හිමිවනු ඇත.

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි(QUT) ඒකාබද්ධ/ භින්නආචාර්ය උපාධි වැඩසටහන

ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි විසින් ආචාර්ය උපාධි අපේක්ෂකයන් (වසර තුනක් දක්වා ) සඳහා සම්පූර්ණ උපකාරක ගාස්තු අනුග්‍රහයක් (ආසන්න වශයෙන් ඕස්ට්‍රේලියානු ඩොලර් 100,000 අගයක්) ලබා දෙනු ඇත.

වසරක් සඳහා ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සිදු කරන අතරතුර වියදම් පියවා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි විශ්වවිද්‍යාලයේ සුදුසුකම් අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලාංකික විද්වතුන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය සහාය ලබා දෙනු ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව අවශ්‍ය පරිදි ජීවන වියදම් දීමනාවක්, විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණයක් (OSHC) සහ ඒ ආශ්‍රිත ආනුෂංගික වියදම් මෙම ආධාරයට ඇතුළත් වේ. උපරිම දීමනා සීමාව වසර 03ක් සඳහා එක් අපේක්ෂකයෙකුට රුපියල් මිලියන 3.5 කි.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල විවිධ විෂයයන් සඳහා අපේක්ෂකයින් 10 - 12 ක් ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි (QUT) විශ්වවිද්‍යාලයේ මණ්ඩපයන් හි අවම වශයෙන් මාස 12 ක ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සිදු කරන අතර ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි (QUT) මඟින් ආචාර්ය උපාධි අධීක්ෂණ සමූහ ආකෘතියකට (cohort model) සහාය දක්වනු ලබයි.

i. ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය

ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගිතා ආචාර්ය උපාධි වැඩසටහන්වලට කොළඹ විශ්වවිද්‍යාලය (CMB), පේරාදෙණිය විශ්වවිද්‍යාලය (PDN) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (SJP) සමඟ එක්ව ආරම්භ කරන ලද ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය ඇතුළත් වේ.

ඒකාබද්ධ ආචාර්ය උපාධි සිසුන්, ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජිහි ආචාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු, කොළඹ, පේරාදෙණිය හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවල එක් ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් සහ හැකි නම් අදාළ අපේක්ෂකයාගේ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් විසින් සම - අධීක්ෂණය සිදු කරනු ලැබේ.

ii. භින්න**(Split)/** බාහිර ආචාර්ය උපාධි ආකෘතිය

භින්න ආචාර්ය උපාධි සිසුන්ට, ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි විශ්වවිද්‍යාලයේ

අධ්‍යයන අධීක්ෂකවරුන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් ඕනෑම විශ්වවිද්‍යාලයක දේශීය අධීක්ෂකවරයෙකු ද සිටී.

2023 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ක්වීන්ස්ලන්ඩ් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි විශ්වවිද්‍යාලය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම තවත් වසර 5 ක කාලයක් සඳහා අලුත් කරන ලදී.

### ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ඕස්ට්‍රේලියාවේ ඊඩිත් කොවන් විශ්වවිද්‍යාලයේ (ECU) ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය.

2023 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ඕස්ට්‍රේලියාවේ ඊඩිත් කොවන් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබුවේ එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ය.

ඊඩිත් කොවන් විශ්වවිද්‍යාලය (EDU) යනු ඕස්ට්‍රේලියාවේ පිහිටි පොදු විශ්වවිද්‍යාලයක් වන අතර එය රටවල් 100 ක ජාත්‍යන්තර සිසුන් ඇතුළුව අධ්‍යාපනඥයින් සහ 30,000 කට අධික උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි සිසුන් සඳහා කදිම ඉගෙනුම් පරිසරයක් සපයයි. ඊඩිත් කොවන් විශ්වවිද්‍යාලයේ විද්‍යාල අටක් මඟින් කලා සහ මානව ශාස්ත්‍ර , ව්‍යාපාර සහ නීතිය, අධ්‍යාපනය, ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය සහ සෞඛ්‍ය විද්‍යාව, හෙද සහ ශවකර්මය(Midwifery), විද්‍යාව සහ බටහිර ඕස්ට්‍රේලියානු ප්‍රසාංගික කලා ඇකඩෙමිය හරහා විවිධ පරාසයක පාඨමාලා ඉදිරිපත් කරයි.

ඊඩිත් කොවන් විශ්වවිද්‍යාලයේ පාඨමාලා කර්මාන්තය ආශ්‍රිත දැනුම සංයෝජනය කර සංවර්ධනය කර ඇති අතර ඉගැන්වීමේ කාර්ය මණ්ඩලයට පුළුල් කර්මාන්ත අත්දැකීම් සහ ජාල සබඳතා ඇති අතර එබැවින් ඊඩිත් කොවන් විශ්වවිද්‍යාලයේ සිසුන්ට ඔවුන්ගේ අධ්‍යාපනයේ කොටසක් ලෙස වැඩ ඒකාබද්ධ ඉගෙනුම් අවස්ථා, ක්ෂේත්‍ර වැඩ, ප්‍රායෝගික සහ ජාලකරණ අවස්ථා ලබා ගත හැකිය.

සහයෝගිතාව යටතේ අදාල වන ක්ෂේත්‍ර සහ ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- තෝරාගත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සමඟ (ඒකාබද්ධ / සහයෝගී ) ආචාර්ය උපාධි පිරිනැමීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශිත සහ ඊඩිත් විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද පර්යේෂණ වැඩසටහන් මඟින් ඊඩිත් කෝවන් විශ්වවිද්‍යාලයේ උසස් උපාධිය සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින් තෝරා ගැනීම.
- ඉහල දක්ෂතා ඇති ශ්‍රී ලාංකික සිසුන් සඳහා අවම වශයෙන් එක් පූර්ණ අරමුදල් සහිත ඊඩිත් කොවන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි ශිෂ්‍යත්වයක් ස්ථාපිත කිරීමට ඇති අවස්ථා සොයා බැලීම.
- බාහිර ප්‍රදාන ලබා දෙන ආයතනයකින් මූල්‍යකරණයකට යටත්ව අධ්‍යයන කාර්ය මණ්ඩලය හුවමාරු කර ගැනීම, ඒකාබද්ධ පර්යේෂණ ක්‍රියාකාරකම් සහ ප්‍රකාශන, සම්මන්ත්‍රණ සහ අධ්‍යයන රැස්වීම්වලට සහභාගි වීම සඳහා ඇති හැකියාව සොයා බැලීම.
- එක් එක් ආයතනයේ පූර්ව අනුමැතිය ඇතිව විශේෂ කෙටිකාලීන අධ්‍යයන වැඩසටහන් / පරිපාලන සහ කළමනාකරණ වැඩසටහන් සඳහා ඇති හැකියාව සොයා බැලීම.
- එක් එක් ආයතනයේ පූර්ව අනුමැතිය ඇතිව ආචාර්ය උපාධි සිසුන් සඳහා අරමුදල් සහිත කෙටි හා මධ්‍ය කාලීන පර්යේෂණ චාරිකා සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පශ්චාත් ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව සඳහා ඇති හැකියාව සොයා බැලීම.

### ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (RMIT University) අතර පර්යේෂණ පුහුණු සහයෝගිතාව (ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන) - 2023

ශ්‍රේණිගත කිරීම් වල ලෝකයේ 140 වැනි ස්ථානය හිමි (QS ලෝක ශ්‍රේණිගත කිරීම 2023) ඕස්ට්‍රේලියානු උසස් අධ්‍යාපන ආයතනයක් වන රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (RMIT University) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ හවුල් වී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල කනිෂ්ඨ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් ඒකාබද්ධ ආචාර්ය උපාධි

වැඩසටහනක් හරහා පුහුණු කිරීමට කටයුතු කර ඇත.

රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (RMIT University) 2018 හි ආරම්භ කරන ලද අතර දැනට අධ්‍යාපන කටයුතු කරන අපේක්ෂකයින් 32 ක් සහ උපාධි සම්පූර්ණ කිරීම් 4 ක් සමඟ ඉතා සාර්ථක ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් පිරිනමා ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යයන ආයතන හතරක් සමඟ ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් පිරිනමා ඇත.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය (PDN)
- මොරටුව විශ්වවිද්‍යාලය (MRT)
- රුහුණු විශ්වවිද්‍යාලය (RUH)
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (SJP)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ආචාර්ය උපාධි සුදුසුකම් සහිත ආචාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම මඟින් ශාස්ත්‍රාලිකයන්ගේ පර්යේෂණ ධාරිතාව ඉහළ නැංවීමට අපේක්ෂා කරයි. අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හවුල්කාරිත්වය තුළින් රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ආයතනයේ ගෝලීය ව්‍යාප්තිය වැඩිදියුණු කරන අතර ශ්‍රී ලංකාවේ ආයතනවල පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කරනු ඇත. ඒ අනුව, ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ආයතනය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2023 පෙබරවාරි 16 වැනි දින අවබෝධතා ගිවිසුමකට එළඹුණි

**4.9 වගුව- ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ආයතනය විසින් ප්‍රදානය කිරීමට නියමිත ශිෂ්‍යත්වය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්වය**

| **ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ආයතනය විසින් ප්‍රදානය කිරීමට නියමිත ශිෂ්‍යත්වය** | **ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්වය** |
|---|---|
| • RMIT ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව 10 ක් දක්වා පිරිනැමේ.<br>• උපරිම වසර 3.5 දක්වා RMIT පන්ති ගාස්තු ශිෂ්‍යත්වය- ආසන්න වටිනාකම AU $ 80,000<br>• මෙල්බර්න්හි සිටින මාස 12 ක් දක්වා RMIT දීමනාව ආසන්න වටිනාකම AU $ 35,000 | අවබෝධතා ගිවිසුමට අනුව ,<br>• ඕස්ට්‍රේලියාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සීමාවන් තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අපේක්ෂකයින්ට ජීවන වියදම් දීමනාවක් සහ ප්‍රදානලාභීන්ට ඔවුන් මෙල්බර්න්හි සිටින විට RMIT විසින් ගෙවීම් ශිෂ්‍යත්වයක් ලබා නොදෙන්නේ නම් ඔවුන් ඕස්ට්‍රේලියාවේ RMIT හි අධ්‍යයන කටයුතු කරගෙන යන කාල සීමාව තුළ උපරිම වසරක (01) කාලයක් දක්වා විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණය සඳහා ගෙවීම් කරනු ලැබේ.<br>**සටහන:**<br>කෙසේ වෙතත්, RMIT විසින් මෙල්බර්න්හි සිටින මාස 12 ක් දක්වා ජීවන දීමනාවක් ලබා දෙන බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත මූල්‍ය බැඳීමක් නොමැත. |

(මූලාශ්‍රය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)

### 4.6.3 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන පිරිනැමීම.

විදේශීය රටවල උසස් අධ්‍යාපනය සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දෙමින් වාර්ෂිකව ඍජු සහ වක්‍රව විදේශීය ප්‍රථම හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන අතර එමගින්,

- විදේශීය උසස් අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා වැඩිකිරීම.
- ගෝලීය සම්බන්ධතා සහ අධ්‍යාපනික හුවමාරු අවස්ථා වැඩිදියුණු කිරීම.
- අධ්‍යාපනික සංචරණය තුළින් ජාතික ආර්ථිකයට දායක වීම අරමුණ වේ. 2023 වසර තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව 79ක් ලබා දී ඇති අතර 2024 වසර තුළ ඉන්දියාව සඳහා 67 දෙනෙකු හටද, චීනය සඳහා 24 දෙනෙකු හටද, හන්ගේරියාව සඳහා 12 දෙනෙකු හටද, එක්සත් රාජධානිය සඳහා 02

දෙනෙකු උදෙසාද පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ලබා දී ඇත.

**අවබෝධතා ගිවිසුම් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අත්සන් කරන ද්විපාර්ශවික ගිවිසුම් යටතේ විදේශ රට වලින් පිරිනමන ලද ශිෂ්‍යත්ව.**

**2024 - 2026 කාලය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වියට්නාම් සමාජවාදී ජනරජය අතර අධ්‍යාපනික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමකට එළැඹීම.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වියට්නාම් සමාජවාදී ජනරජය විසින් වරින් වර දෙරට අතර අධ්‍යාපනික සහයෝගීතාව සඳහා ගිවිසුම්වලට එළැඹෙන ලද අතර 2017 – 2020 දක්වා අවසන් වරට අත්සන් කරන ලද අධ්‍යාපනික සහයෝගීතාව පිළිබඳ ගිවිසුම සංශෝධන සහිතව නැවතත් 2024 සිට 2026 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා අත්සන් කිරීමට අපේක්ෂා කරන අතර ඒ අනුව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2024 ජුනි 24 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත . එසේම යෝජිත අවබෝධතා ගිවිසුමේ ඍජු ප්‍රතිලාභයන් ලෙස, එක් එක් පාර්ශවය විසින් තම පාර්ශවයේ විශේෂ දක්ෂතා ඇති සිසුන් අනෙක් පාර්ශවයේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා හුවමාරු කිරීමත්,දෙපාර්ශවය විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ක්ෂේත්‍රවල ප්‍රථම උපාධිය හෝ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ශිෂ්‍යත්ව 05 (පහක්) වාර්ෂිකව හුවමාරු කර ගැනීමත්, වසර දෙකකට වරක්, දෙරට අතර අත්දැකීම් හුවමාරු කර ගැනීම සහ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා උපරිම දින 7 ක කාලයක් සඳහා නියෝජිතයින් හතරක් හෝ පහක් දක්වා සමන්විත ජ්‍යෙෂ්ඨ අධ්‍යාපන නියෝජිත කණ්ඩායම් හුවමාරු කර ගැනීමත්, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රජය විසින් යෝජනා කරනු ලබන ක්ෂේත්‍රවල ඒකාබද්ධ පර්යේෂණ සිදුකිරීමේ ඉඩප්‍රස්ථා සැපයීමත්, වියට්නාමයේ අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශය, වියට්නාම් රජය විසින් යෝජනා කරනු ලබන ක්ෂේත්‍රවල ඒකාබද්ධ පර්යේෂණ සිදුකිරීමේ ඉඩප්‍රස්ථා සැපයීමත්, දෙපාර්ශවය විසින්ම විශ්වවිද්‍යාල / පර්යේෂණ මධ්‍යස්ථාන සහ අදාළ ආයතන අතර සිසුන් සහ විද්වතුන් (කථිකාචාර්යවරුන්, පර්යේෂකයින්, තාක්ෂණික විශේෂඥයින් සහ තාක්ෂණවේදීන්) හුවමාරු කර ගැනීම දිරිමත් කිරීමත් සිදු කරනු ලබයි.

එසේම, මෙම ගිවිසුම මගින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ නවෝත්පාදන සම්බන්ධ තොරතුරු සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම, ඒකාබද්ධ පර්යේෂණ පැවැත්වීම, දෙපාර්ශවයේම විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන අතර ද්විපාර්ශ්වික සහයෝගීතා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම, දෙපාර්ශවය විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ක්ෂේත්‍රවල ප්‍රථම උපාධි හෝ පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ශිෂ්‍යත්ව 05 ක් වාර්ෂිකව හුවමාරු කර ගැනීම, දෙරටේ විශ්වවිද්‍යාල/පර්යේෂණ මධ්‍යස්ථාන හා අදාළ ආයතන අතර සිසුන් හා විද්වතුන් හුවමාරු කිරීම දිරිමත් කිරීමත් මෙමගින් අපේක්ෂා කරනු ලබයි.

**I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ නේපාල රජය අතර උසස් අධ්‍යාපනික ක්ෂේත්‍රයේ සහයෝගීතාවන් සඳහා ගිවිසුමකට එළැඹීම.**

මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නංවාලනු පිණිස උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාවන් අත්‍යාවශ්‍ය සාධකයකි. එම අන්‍යෝන්‍ය සහයෝගීතාවයන් තුළින් මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යයන කාර්යය මණ්ඩලවලත්, පර්යේෂකයින්ගේ සහ සිසුන්ගේ දැනුම සහ අත්දැකීම් පුළුල් කර ගැනීමටත් මහඟු අවස්ථාවක් සැලසේ. ඒ සඳහා ශ්‍රී ලංකාව සමග සහයෝගීතාවයන් සඳහා එළැඹීමේ දීර්ඝකාලීන ඉතිහාසයක් ඇති නේපාල රජය සමග සංස්කෘතික, අධ්‍යාපනික හා විද්‍යාත්මක ක්ෂේත්‍රයන්ට අදාළව ගිවිසුමකට අත්සන් කිරීමට අපේක්ෂා කරන අතර, ඒ අනුව, පහත සඳහන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2023 නොවැම්බර් 27 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

එසේම යෝජිත අවබෝධතා ගිවිසුමේ ඍජු ප්‍රතිලාභයන් ලෙස ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි ප්‍රගමනය සඳහා දෙරටේ ස්ථාපිතව ඇති අධ්‍යාපනික හා වෘත්තීයමය ආයතන අතර සහයෝගීතාවයන් ඉහළ නංවා ගැනීම හා දෙරට අතර සිදු කෙරෙන පුහුණු වැඩසටහන් මෙන්ම අධ්‍යයන චාරිකාවන් සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, අධ්‍යාපනඥයින්,

පර්යේෂකයින් හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ජ්‍යෙෂ්ඨ පරිපාලකයින් සහභාගී වීම ප්‍රවර්ධනය කිරීමටත් අවස්ථාව සැලසේ. එසේම, දෙරටෙහි උසස් අධ්‍යාපන ක්‍රමයට අදාළ විෂයමාලා, විද්‍යාත්මක හා අධ්‍යාපනික ක්‍රමවේද හුවමාරු කර ගැනීමටත් දෙපාර්ශවය විසින් පවත්වනු ලබන උසස් අධ්‍යාපන සම්මේලන, සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමටත් අවස්ථාව හිමිවේ.

**II. ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල අතර අධ්‍යාපනික සහයෝගීතාවය අරමුණු කර ගනිමින් අවබෝධතා ගිවිසුම්/ වලට එළැඹීම.**

මේ යටතේ, පසුගිය කාලය තුල පහත සඳහන් ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

- උසස් අධ්‍යාපන සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලය හා චීනයේ යුනාන් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම.
- උසස් අධ්‍යාපන සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හා චීනයේ ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය (Shanghai Open University) අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ චීන භාෂා මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය සහ සීමාසහිත බැන්ක් ඔෆ් චයිනා (Bank of China Ltd) අතර ත්‍රෛයි පාර්ශවීය ගිවිසුමකට අත්සන් තැබීම.
- ආරක්ෂිත රුධිර පරිත්‍යාග සහ සැපයුම පිළිබඳව පාරවිලයන වෛද්‍ය වෘත්තිකයන් සඳහා ඉහළ බලපෑමක් සහිත තිරසාර අධ්‍යාපනික වැඩසටහන් සංවර්ධනය කිරීම (ERASMUS-EDU-2022-CBHE)" සඳහා වන ව්‍යාපෘතියට ස්පාඤ්ඤයේ බාර්සිලෝනා විශ්වවිද්‍යාලය (Universitat AutÖnoma de Barcelona), සහ ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, සහ රජරට විශ්වවිද්‍යාලය අතර සාමූහික ගිවිසුමකට (Consortium Agreement) අත්සන් තැබීම.
- ආපදා සඳහා ඔරොත්තු දීමට හා ස්වාභාවික සම්පත්හි සමෝධානිත කළමනාකරණය සම්බන්ධයෙන් බහුවිධ පර්යේෂණවලට එළැඹීම දිරිගැන්වීමට අදාළව ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලය සහ එක්සත් රාජධානියේ සැල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය (University of Salford ) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.
- ගෝලීය සෞඛ්‍ය ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීම අරමුණු කරගනිමින් කලාපීය සහයෝගීතා මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලය සහ සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය (National University of Singapore ) හා සිංගප්පූරු සෞඛ්‍ය සේවා පුද්ගලික සමාගම අතර ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළැඹීම.
- ගෝලීය වශයෙන් කාන්තාවන්ට ආර්තවහරණයෙන් ඇති වන මානසික සෞඛ්‍ය බලපෑම් පිළිබඳව මාරි ව්‍යාපෘතියට (MARIE project) අදාළව එක්සත් රාජධානියේ සහ උතුරු අයර්ලන්තයේ දකුණු සෞඛ්‍ය NHS භාරය (Southern Health NHS Trust) සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ රුහුණ විශ්වවිද්‍යාලය අතර ගිවිසුමක් (Non- Disclosure Agreement) ඇතුලත් අවබෝධතා ගිවිසුමකට එළැඹීම.
- චීනයේ සිසුන්ට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් අනුමත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා එහි නිසි බලයලත් නියෝජිතයා ලෙස Tomorrow Technology Education Service Center (TTESC) නම් කිරීම සහ බලගැන්වීමට අදාලව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හා Tomorrow Technology Education Service Center (TTESC) අතර ඇති කර ගනු ලබන ගිවිසුම හා අවබෝධතා ගිවිසුම.
- දෙපාර්ශවය අතර සහයෝගීතාවයන් වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා චෙක් ජනරජයේ තෝමස් බාටා විශ්වවිද්‍යාලය (Tomas Bata University) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.
- ධාරිතා ගොඩනැගීම, පර්යේෂණ සහයෝගීතා, නවෝත්පාදන සහ ජලජීවී වගා ජෛව පද්ධති තාක්ෂණය භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලය සහ ඉතාලියේ නේපල්ස් ෆෙඩ්රිකෝ II විශ්වවිද්‍යාලය (University of Naples Federico II) අතර ගිවිසුමකට එළැඹීම. ධාරිතා සංවර්ධනය කිරීම, පර්යේෂණ සහයෝගීතා ගොඩනගා ගැනීම හා සුහුරු කෘෂිකර්මාන්තයට අදාළ නවෝත්පාදන සහ

අනුස්‍රෝත යෙදවුම් සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය (Michigan State University) අතර හවුල් ගිවිසුමකට එළැඹීම.

### 4.6.4 උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)

රටෙහි ආර්ථික සංවර්ධනයට උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛතා විෂයයන් වලට බඳවා ගැනීම් වැඩි කිරීම, උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, පර්යේෂණ, සංවර්ධනය, නවෝත්පාදන සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය 2018 ජූනි මස 01 වන දින ආරම්භ කරන ලදී.

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මගින් 2023.12.31 වන විට ආචාර්ය උපාධි ප්‍රදාන 198 ක ප්‍රමාණයක් ලබාදී ඇති අතර 36 දෙනෙකු ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලද අතර 129 දෙනෙකු දැනට අධ්‍යයන කටයුතු වල නියලී සිටී. ශාස්ත්‍රපති උපාධි ප්‍රදාන 12 ක ප්‍රමාණයක් SLIATE ශාස්ත්‍රාලිකයන් හට ලබාදී ඇති අතර 04 දෙනෙකු පශ්චාත් උපාධිය දැනට සම්පූර්ණ කරන ලදී.

### 4.6.5 විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ප්‍රතිපාදන පිරිනැමීම (STHRDP)

2018 දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය ගුණාත්මක හා උසස් තාක්ෂණ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය මගින් ආචාර්යවරුන්ට පශ්චාත් උපාධි හා ආචාර්ය උපාධි සඳහා එක් අයෙකුට ඇමෙරිකානු ඩොලර් 80,000.00 මූල්‍ය අනුග්‍රහයක් දක්වයි.

## 4.7 විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්

ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ ස්ථානය තක්සේරු කිරීම සඳහා 'Webometrics'ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය භාවිතා කරයි. ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාලයන්හි ශ්‍රේණිගත කිරීම් සලකා බැලීමේදී, එක් එක් ආයතනයේ ශ්‍රේණිගත කිරීම්වල උච්ඡාවචනයන් දැකිය හැකිය. 2016 වර්ෂය හා සසඳන විට, ලෝක ශ්‍රේණිගත කිරීම්වලට අනුව ඉහළම විශ්වවිද්‍යාල 2024 වර්ෂය තුළ සිය ශ්‍රේණිගත කිරීම් තවදුරටත් ඉහළ නංවා ගෙන ඇති බව අපට පෙනේ.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 19 අතර ( ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය ඇතුළුව) කොළඹ විශ්වවිද්‍යාලය (1,591), පේරාදෙණිය විශ්වවිද්‍යාලය (2,016) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (2,190) පිළිවෙලින් පළමු, දෙවන හා තෙවන ස්ථාන ලබාගෙන ඇත. 2023 දෙසැම්බර් හා සසඳන විට ආයතන පහක් ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවා තිබේ. එනම් කැළණිය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලයන් වේ.'Webometrics' ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය යටතේ ලොව පුරා ආයතන 31,657 ක් ශ්‍රේණිගත කර ඇත. ඉන් ආයතන 16,594 ක් ආසියානු කලාපයේ වේ. 5,936 ක් දකුණු ආසියානු කලාපයේ වේ. එයින් ලෝක ශ්‍රේණිගත කිරීමේ පළමු 5,000 තුල ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 10ක් ශ්‍රේණිගතව ඇත. වව්නියා විශ්වවිද්‍යාලයද 2024 දෙසැම්බර් ලෝක ශ්‍රේණිගත කිරීමට එකතු කර ඇත. සංසන්දනාත්මක තොරතුරු 4.10හි දක්වා ඇත.

වගුව **4.10** - සංසන්දනාත්මක තොරතුරු

| විශ්වවිද්‍යාලය | දකුණු ආසියානු ශ්‍රේණිගත අගය 2023 දෙසැම්බර් | දකුණු ආසියානු ශ්‍රේණිගත අගය 2024 දෙසැම්බර් | ආසියානු ශ්‍රේණිගත අගය 2023 දෙසැම්බර් | ආසියානු ශ්‍රේණිගත අගය 2024 දෙසැම්බර් | ලෝක ශ්‍රේණිගත අගය 2023 දෙසැම්බර් | ලෝක ශ්‍රේණිගත අගය 2024 දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|
| කොළඹ | 46 | 52 | 473 | 413 | 1,487 | 1,591 |
| පේරාදෙණිය | 83 | 93 | 666 | 562 | 1,978 | 2,016 |
| ශ්‍රී ජයවර්ධනපුර | 92 | 114 | 693 | 624 | 2,043 | 2,190 |
| රුහුණ | 153 | 165 | 883 | 781 | 2,534 | 2,664 |
| මොරටුව | 158 | 199 | 893 | 862 | 2,553 | 2,899 |
| කැලණිය | 201 | 208 | 1,069 | 884 | 3,001 | 2,963 |
| රජරට | 198 | 265 | 1,057 | 1,031 | 2,973 | 3,380 |
| යාපනය | 281 | 277 | 1,360 | 1,070 | 3,666 | 3,496 |
| සබරගමුව | 352 | 374 | 1,639 | 1,338 | 4,249 | 4,188 |
| වයඹ | 376 | 443 | 1,721 | 1,521 | 4,442 | 4,686 |
| නැගෙනහිර | 444 | 523 | 2,040 | 1,774 | 5,206 | 5,416 |
| විවෘත | 478 | 564 | 2,214 | 1,946 | 5,617 | 5,896 |
| අග්නිදිග | 642 | 734 | 2,906 | 2,618 | 7,761 | 7,931 |
| ඌව වෙල්ලස්ස | 625 | 747 | 2,858 | 2,658 | 7,604 | 8,055 |
| සෞන්දර්ය කලා | 1,890 | 1,891 | 7,087 | 6,634 | 16,475 | 16,752 |
| වව්නියා | - | 1,992 | - | 6,926 | - | 17,300 |
| බෞද්ධ හා පාලි | 2,496 | 2,298 | 8,738 | 7,750 | 19,515 | 18,924 |
| භික්ෂු | 3,454 | 3,059 | 10,738 | 9,307 | 23,186 | 21,970 |

(මූලාශ්‍රය - අන්තර්ජාලය -වෙබෝමෙට්‍රික්ස් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය)

# 05

# කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව

## 5.1 හැඳින්වීම

උසස් අධ්‍යාපන පද්ධතිය මගින් බිහි කරනු ලබන උපාධිධාරීන්, ඩිප්ලෝමාධාරීන් ගේ, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව වර්ධනය කිරීමේ ලා පද්ධතිය තුල සේවය කරන අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව නැංවීම මෙන් ම අමාත්‍යාංශයේ සියළුම ස්ථර වල සේවකයන්ගේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම, උසස් අධ්‍යාපනයේ නිමැවුම අපේක්ෂිත මට්ටමින් පවත්වා ගෙන යාමට හේතු වේ.

එබැවින් අමාත්‍යාංශය මට්ටමින් කාර්ය මණ්ඩල පුරප්පාඩු නිසි කලට පිරවීම මෙන් ම දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දීම, විවිධ තාක්ෂණික සහයන් ලබා දීම තුළින් හා විවිධ සේවා සැපයීමෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

## 5.2 උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය

අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ඒ යටතේ ඇති විශ්වවිද්‍යාල 17, උසස් අධ්‍යාපන ආයතන 18, අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සහ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයත් (SLIATE) ඇතුළත් ව සකස් වී ඇති උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය මෙම අංශයේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමෙහි ලා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. 2023 සහ 2024 වර්ෂවල අධ්‍යයන සහ අනධ්‍යයන සේවක සංඛ්‍යාව 5.1 වගුවෙන් දැක්වේ.

### 5.2.1 උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය

2024 වර්ෂයේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ථිර හා තාවකාලික පදනම මත කටයුතු කරන සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 10,277 කි. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 265 කි.

රාජ්‍ය විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනවල සිටින අධ්‍යයන සේවක සංඛ්‍යාව ඇමුණුම C හි දැක්වේ.

**5.1 වගුව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වත්මන් කාර්ය මණ්ඩලය**

| ආයතනය | අධ්‍යයන (ස්ථිර හා තාවකාලික) | | අනධ්‍යයන (ස්ථිර හා තාවකාලික) | |
|---|---|---|---|---|
| | 2023 | 2024 | 2023 | 2024 |
| විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන | 10,328 | 9,891 | 12,754 | 11,747 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 10 | 4 | 217 | 216 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 110 | 117 | 207 | 203 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 277 | 265 | 556 | 563 |
| අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය) | – | – | 210 | 197 |
| එකතුව | **10,725** | **10,277** | **13,944** | **12,926** |

මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

**5.1 රූපය වි.වි.ප්‍ර.කො.ස යටතේ ඇති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සේවක මණ්ඩල සංයුතිය - 2024**




දත්ත මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) සේවය කරන සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 265 කි. ඒ අතර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු 89ක්ද, කථිකාචාර්යවරු 28ක්ද, සහකාර කථිකාචාර්යවරු 85ක්ද, අනෙකුත් අධ්‍යයන සහයකවරුන් 63 ක්ද සේවය කරති. වැඩිම අධ්‍යයන සේවක සංඛ්‍යාවක් (43) ගාල්ල උසස් තාක්ෂණ ආයතනයේ සේවය කරන අතර අඩුම සංඛ්‍යාවක් (02) සේවය කරන්නේ නාවලපිටිය, මන්නාරම, වවුනියා, උසස් තාක්ෂණ ආයතනවල ය.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇමුණුම C1 හි දැක්වේ.

### 5.2.2 අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය, ඇබෑර්තු සහ පත්වීම්

2024 වර්ෂයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල ඇබෑර්තු සංඛ්‍යාව 2,179කි. 2023 වර්ෂය අවසාන වන විට අධ්‍යයන කාර්ය මණ්ඩල තත්‍ය ස්ථිර සේවක සංඛ්‍යාව 7400 වූ අතර 2024 වන විට එම සංඛ්‍යාව 7,333 කි. සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය තුල 48% පමණ වූ ඇබෑර්තු සංඛ්‍යාවෙන් අඩක් පමණ තාවකාලික පදනම මත බඳවා ගෙන ඇති අධ්‍යයන කාර්ය මණ්ඩලයක් මඟින් ආවරණය කර ඇත. අධ්‍යයන සේවක සංඛ්‍යාව හා ඇබෑර්තු පිළිබඳ විස්තර 5.2 වගුවෙන් දැක්වේ.

**5.2 වගුව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ථිර අධ්‍යයන සේවක සංඛ්‍යාව**

| ආයතනය | අනුමත කාර්ය මණ්ඩලය | ඇබෑර්තු | දැනට සිටින කාර්යය මණ්ඩලය |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන | 9,332 | 2,048 | 6,946 |
| වි.වි.ප්‍ර.කො.ස | 4 | 0 | 4 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 80 | 23 | 57 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 66 | 5 | 61 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 368 | 103 | 265 |
| එකතුව | **9,850** | **2,179** | **7,333** |

මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

### 5.2.3 උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 12,926 වේ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය 563 කි. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයේ) සේවය කරන සමස්ත අනධ්‍යයන සේවක සංඛ්‍යාව 400 වේ.

රාජ්‍ය විශ්වවිද්‍යාල සහ වි.වි.ප්‍ර.කො.ස යටතේ ඇති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි සිටින අනධ්‍යයන සේවක මණ්ඩලය පිළිබඳ විස්තර ඇමුණුම C2 හි දැක්වේ.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අනධ්‍යයන සේවක කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඇමුණුම C3හි දැක්වේ.

### 5.2.4 අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය, ඇබෑර්තු සහ පත්වීම්

2024 වර්ෂයේ සමස්ත අනුමත අනධ්‍යයන සේවක සංඛ්‍යාව 17,988 කි. 2023 වසර අවසාන වන විට අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ තත්‍ය සේවක සංඛ්‍යාව 13,944 ක් විය.

අනධ්‍යයන සේවක සංඛ්‍යාව හා ඇබෑර්තු පිළිබඳ විස්තර 5.3 වගුවෙන් දැක්වේ.

**5.3 වගුව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ථිර අනධ්‍යයන සේවක සංඛ්‍යාව හා ඇබෑර්තු**

| ආයතනය | අනුමත කාර්ය මණ්ඩලය | ඇබෑර්තු | දැනට සිටින කාර්යය මණ්ඩලය |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන | 16,351 | 4,476 | 11,875 |
| වි.වි.ප්‍ර.කො.ස | 325 | 108 | 217 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, | 142 | 34 | 108 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 111 | 16 | 95 |
| උසස් අධ්‍යාපන අංශය | 301 | 104 | 197 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 758 | 195 | 563 |
| එකතුව | **17,988** | **4,933** | **13,055** |

මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

### 5.2.5 අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයේ) සේවක මණ්ඩලය

උසස් අධ්‍යාපන අංශයේ ස්ථිර කාර්ය මණ්ඩලයෙන් සංවර්ධන නිලධාරීන් 40ක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ඒ යටතේ ඇති විශ්ව විද්‍යාල 08 ක 2023.12.31 දිනට සේවය සඳහා යොදවා තිබුණි. මෙම සේවක මණ්ඩලයේ 40 දෙනාගෙන් 36ක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාලවල හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවය කරන අතර අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සහ පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනයේ 04 දෙනෙකු ද වේ. එම සංඛ්‍යාව 2024.12.31 දින වන විට 31 දක්වා අඩුවී ඇත. එම සංවර්ධන නිලධාරීන්ට වෙනත් රැකියා ලැබීම හේතුවෙන් මෙම අමාත්‍යාංශයෙන් ඉවත්ව ඇත. එම විස්තරය පහත දක්වා ඇත.

**5.4 වගුව උසස් අධ්‍යාපන අංශයේ ස්ථිර කාර්ය මණ්ඩලයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ 2024.12.31 දිනට සේවයේ යොදවා තිබූ සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව**

| විශ්ව විද්‍යාලය / ආයතනයේ නම | 2023.12.31 දිනට | 2024.12.31 දිනට |
|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 6 | 4 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 4 | 4 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 4 | 4 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 1 | 1 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 12 | 9 |
| වයඹ විශ්වවිද්‍යාලය | 4 | 4 |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 4 | 1 |
| රජරට විශ්වවිද්‍යාලය | 1 | 1 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 3 | 3 |
| පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය | 1 | 0 |
| එකතුව | **40** | **31** |

මූලාශ්‍රය: පාලන අංශය (අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | උසස් අධ්‍යාපන අංශය)

2023 වසරේ දී උසස් අධ්‍යාපන අංශයේ සේවක මණ්ඩලය 210 කි. සමස්ත සේවක සංඛ්‍යාවෙන් 21ක් විධායක නිලධාරීන් ද 03 ක් තෘතියික මට්ටමේ නිලධාරීන් ද 147 ක් ද්විතීයික මට්ටමේ නිලධාරීන් ද 39 ක් ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්ද වශයෙන් සේවය කරයි. 2023 වසරේ පුරප්පාඩු 66 ක් පැවති අතර 2024 දෙසැම්බර් මස අවසන් වන විට පුරප්පාඩු 104ක් ඇත. සේවක සංඛ්‍යාවේ සංයුතිය 5.2 රූපය මගින් දැක්වේ.

**5.2 රූපය උසස් අධ්‍යාපන අංශයේ කාර්යය මණ්ඩල සංයුතිය - 2024**




මූලාශ්‍රය: පාලන අංශය (අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | උසස් අධ්‍යාපන අංශය)

## 5.3 අනධ්‍යයන කාර්ය මණ්ඩල ධාරිතාව ඉහළ නංවාලීම

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යයන සහ අනධ්‍යයන සේවකයන්ගේ ධාරිතා වර්ධනය සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනවල දේශීය මෙන් ම විදේශීය පුහුණු අවස්ථා ලබා දීමට අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් කටයුතු කර ඇත.

### 5.3.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ ( උසස් අධ්‍යාපන අංශය) විසින් සිදු කරන ලද කාර්ය මණ්ඩල සංවර්ධන කාර්යයන්

අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා දේශීය පුහුණු අවස්ථා සඳහා අමාත්‍යාංශ නිලධාරීන් බොහෝ දෙනෙක් සහභාගිකරවා ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත්කර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව (සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන්) 96 දෙනෙක්ද තවද විදේශීය පුහුණු වැඩසටහන් තුනක් සඳහා 03 දෙනෙක් ද යනාදී වශයෙන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවා ඇත.

මීට අමතරව විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යයන සහ අනධ්‍යයන සේවකයන්ගේ ධාරිතා වර්ධනය සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනවල දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථා ලබා දීමට අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කටයුතු කර ඇත.

## 5.4 අධ්‍යයන සහ අනධ්‍යයන සේවකයන්ගේ ධාරිතා වර්ධනය

**5.5 වගුව රජයේ සහ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනවලින් ලබාදුන් දේශීය හා විදේශීය පුහුණු අවස්ථා**

| අනු අංකය | විශ්වවිද්‍යාලය | 2023 | | 2024 (ජනවාරි - ඔක්තෝබර්) | |
|---|---|---|---|---|---|
| | | ශිෂ්‍යත්ව ගණන | මුදල (රු. මි) | ශිෂ්‍යත්ව ගණන | මුදල (රු. මි) |
| 1 | UGC-RMIT Scholarship Scheme | 6 | No financial obligation to UGC | | |
| 2 | UGC-Grant Scheme | | | 2 | 3,600,000.00 |

මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

### 5.5 තොරතුරු හා සන්නිවේදනා තාක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය විසින් 2023.11.01 සිට 2024.12.31 දක්වා ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්.

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන විශ්ව විද්‍යාල 17 කින් අනුබද්ධ ආයතන 18කින් සියලු ම අධ්‍යයන, අනධ්‍යයන කාර්යමණ්ඩල වල විදේශීය නිවාඩු අනුමත කිරීම මාර්ගගත විදේශ නිවාඩු අනුමත කිරීම (online foreign leave approval) මෙම පද්ධතිය මගින් සිදු කරයි.

- විදේශ ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවීමට මාර්ග ගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට අවශ්‍ය පද්ධතියක් (online management system for scholarships) සකසා ඇති අතර ශිෂ්‍යත්ව අයදුම්කරුවන් හට මේ සඳහා අවස්ථාව ඇත. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ සිදු කිරීම Zoom තාක්ෂණය යොදා ගනී.

- රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල අංශයේ Online Interest Free Student Loan Management System පද්ධතිය නඩත්තු කිරීම සහ නව අවශ්‍යතාවයන් ඇතුළත් කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලබයි. තවද, Ms Teams තාක්ෂණය යොදා ගනිමින් අමාත්‍යාංශ ශිෂ්‍ය ණය අංශයේ සිසුන් 4,500කට අධික පිරිසක් සම්මුඛ පරීක්ෂණ සඳහා සම්බන්ධ කිරීම සිදුකරයි.

- තවද, 2016 අයවැය යෝජනාවලට අනුව, ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොළී රහිත ණය ලබාදීමේ ව්‍යාපෘතියට අදාළ කටයුතු ක්‍රමවත්ව සිදු කරනු ලබයි.

- අමාත්‍යාංශයේ සේවකයන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට (HR management system) අවශ්‍ය මෘදුකාංගය නිර්මාණය කර යාවත්කාලීන කරමින් පවතින අතර අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කර ගෙන යැමට මෙන් ම, පරිගණක උපාංග ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගනු ලබයි.

    - 2020 අයවැය යෝජනාවට අනුව විශ්වවිද්‍යාල වල Wi-fi පහසුකම තවදුරටත් පුළුල් කිරීම සඳහා තුන්වන අදියර යටතේ තෝරා ගනු ලැබූ ඌව වෙල්ලස්ස, සබරගමුව, පුරාවිද්‍යා පශ්චාත් සහ ආයතන වල සාමාන්‍යයක් ලෙස 100% ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත.

**5.6 වගුව අමාත්‍යාංශයේ වෙබ් අඩවියට තොරතුරු ඇතුලත් කිරීම් හා යාවත්කාලින කිරීම්**

| අංකය | අංශය | තොරතුරු | ප්‍රමාණය (සිංහල) | ප්‍රමාණය (ඉංග්‍රීසි) | ප්‍රමාණය (දමිළ) |
|---|---|---|---|---|---|
| 1 | සංවර්ධන අංශය | දේශීය හා විදේශීය සිසුන් සඳහා ශිෂ්‍යත්ව ,රාජ්‍ය සේවකයන් සඳහා විදේශීය ශිෂ්‍යත්ව දැන්වීම. | 65 | 65 | 65 |
| 2 | අතිරේක (ලේකම්) සංවර්ධන | වෙබ් අඩවියේ මුහුණත් වෙනස් කිරීම් අලුත් අංග ඇතුලත් කිරීම හා වෙනත් වෙබ් අඩවි වලට සම්බන්ධ කිරීම. | 20 | 20 | 20 |
| 3 | ගරු රාජ්‍ය අමාත්‍යතුමා | අමාත්‍යාංශ රැස්වීම්, මහජන හමුවීම්, සම්බන්ධ ජයාරූප හා ලිපි. | 58 | 58 | 58 |
| 4 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය. | ලැප්ටොප් පරිගණක පිළිබඳ මිළ ගණන් ලැයිස්තු, ශිෂ්‍ය ණය ව්‍යාපෘතිය. | 15 | 15 | 15 |
| 5 | ප්‍රසම්පාදන | ටෙන්ඩර් දැන්වීම් පලකිරීම. | 35 | 35 | 35 |
| 6 | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද උපාධි පාඨමාලා ලැයිස්තු. | 65 | 65 | 65 |
| 7 | පාලන | පුරප්පාඩු පලකිරීම | 12 | 12 | 12 |
| 8 | ශිෂ්‍ය ණය අංශය | ශිෂ්‍යාණය ව්‍යාපෘතිය | 33 | 33 | 33 |
| 9 | STHRD ව්‍යාපෘතිය | ටෙන්ඩර් දැන්වීම්, පුරප්පාඩු පලකිරීම | 10 | 10 | 10 |

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

- **උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය නවීකරණය කර සකස් කිරීම.**

තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) දායකත්වය සහිතව, උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය සකස් කර අවසන් කර ඇත.

**5.7 වගුව අමාත්‍යාංශයේ එක් එක් අංශයන් වෙත සේවා සැපයීම් (2023.11.01 සිට 2024.12.31 දක්වා)**

| අංක | සේවා සැපයුම් විස්තරය | වාර්තා කරන ලද හා නිරාකරණය කරන ලද ප්‍රශ්න සංඛ්‍යාව (2023.11.01 සිට 2024.11.30 දක්වා ) |
|---|---|---|
| 1 | අන්තර්ජාලයට පිවිසීමේදී ඇති ගැටළු | 90 |
| 2 | E-Mail පිළිබද ගැටළු | 35 |
| 3 | මෘදුකාංග යාවත්කාලීන කිරීම් | 108 |
| 4 | නව මෘදුකාංග ස්ථාපනය කිරීම් | 65 |
| 5 | සුළු දෘඩාංග ගැටළු | 285 |
| 6 | පරිගණක මුද්‍රණ ගැටළු | 345 |
| 7 | පරිගණක මුද්‍රණ යන්ත්‍ර වල ඇති වන දෝශ | 300 |
| 8 | WI-FI පිළිබද ඇතිවන ගැටළු | 295 |
| 9 | ජාලකරණ ගැටළු | 208 |
| 10 | වෛරස් මගින් ඇති වන ගැටළු | 25 |
| 11 | Share Folder වල ඇති වන ගැටළු | 95 |
| 12 | N පරිගණක වලින් ඇති වන ගැටළු | 08 |
| 13 | වාහන බලපත්‍ර පද්ධතිය සම්බන්ධ ගැටළු | 65 |

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

**5.8 වගුව මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කරනු ලැබූ පරිගණක/ලැප්ටොප් සංඛ්‍යාව (2023.11.01 සිට 2024.12.31 දක්වා)**

| අංක | අංශය | පරිගණක සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සංවර්ධන අංශය | 08 |
| 2 | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය | - |
| 3 | තොරතුරු තාක්ෂණ අංශය | 5 |
| 4 | අභ්‍යන්තර විගණනය අංශය | 3 |
| 5 | ගිණුම් අංශය | 10 |
| 6 | රජයේ විගණනය අංශය | 3 |
| 7 | ප්‍රසම්පාදන අංශය | 5 |
| 8 | පාලන අංශය | 10 |

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

**5.9 වගුව වාහන බලපත්‍ර නිකුතුව (2023.11.01 සිට 2024.12.31 දක්වා)**

| 2023.11.01 සිට 2024.12.31 දක්වා | | |
|---|---|---|
| 01 | නොවැම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව | 136 |
| 02 | දෙසැම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව | 45 |
| 03 | ජනවාරි මස වාහන බලපත්‍ර නිකුතුව | 24 |
| 04 | පෙබරවාරි මස වාහන බලපත්‍ර නිකුතුව | 107 |
| 05 | මාර්තු මස වාහන බලපත්‍ර නිකුතුව | 61 |
| 06 | අප්‍රේල් මස වාහන බලපත්‍ර නිකුතුව | 72 |
| 07 | මැයි මස වාහන බලපත්‍ර නිකුතුව | 69 |
| 08 | ජුනි මස වාහන බලපත්‍ර නිකුතුව | 08 |
| 09 | ජුලි මස වාහන බලපත්‍ර නිකුතුව | 36 |
| 10 | අගෝස්තු මස වාහන බලපත්‍ර නිකුතුව | 57 |
| 11 | සැප්තැම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව | 10 |
| 12 | ඔක්තෝම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව | 134 |
| 13 | නොවැම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව | 45 |
| | **මුළු ගණන** | **824** |

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

## 5.6 උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධන අංශයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා ගෙන ඇති පියවර සහ යෝජනා.

විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විදේශ නිවාඩු අනුමත කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් 2019 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරන ලදී. එහි කලින් කලට සිදු කළ යුතු වෙනස්කම් හඳුනා ගනිමින් එම මාර්ගගත පද්ධතිය යාවත්කාලීන කර ඒ තුලින් වඩා ගුණාත්මක සේවයක් ලබාදීමට උත්සාහ කර ඇත. අයඳුම්කරුවෙකුට විදේශ සංචාරය ආරම්භ කිරීමට දින 07කට ප්‍රථම මාර්ගගත පද්ධතියට තොරතුරු

ඇතුළත් කර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට මෙම මාර්ගගත පද්ධතිය තුළින් අවකාශය සැලසේ. ඒ අනුව 2024 වර්ෂයේ දී විශ්ව විද්‍යාල නිලධාරීන් 3,563 දෙනකුගේ රාජකාරි හා පෞද්ගලික නිවාඩු පිළිබඳ ව කටයුතු කර ඇත. මීට අමතරව ශ්‍රී ලංකා හෙද විශ්ව විද්‍යාල පිහිටුවීම හා විශ්ව විද්‍යාල වල ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලියට අදාළ කාර්යභාරය සිදු කරන ලදි.

**කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා යෝජනා**

1.දැනට භාවිතා කරන පරිගණක පද්ධතිය වෙනුවට කාර්යක්ෂම නව පරිගණක පද්ධතියක් හඳුන්වා දීම.

2. නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ඒ සඳහා අවස්ථාව සලසා දීම.

## 5.7 උසස් අධ්‍යාපන අංශයේ විදේශ අධ්‍යාපන අංශයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා ගෙන ඇති පියවර

විදේශීය රාජ්‍යයන් විසින් මෙන්ම අධ්‍යාපනික ආයතන මගින් ශ්‍රී ලංකාව වෙත ලබාදෙන ශිෂ්‍යත්ව අවස්ථාවන් පිළිබඳ තොරතුරු භාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ පුවත්පත් මඟින් හා අපගේ වෙබ් අඩවිය (www.mohe.gov.lk) මගින් ප්‍රචාරය කරනු ලබන අතර මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම සිදුකර විධිමත් හා විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් යටතේ සිසුන් තෝරා ගැනීම සිදුකරයි.

### 5.7.1 උසස් අධ්‍යාපන අංශයේ විදේශ අධ්‍යාපන අංශයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා කරනු ලබන යෝජනා

- මානව සම්පත් සහ යටිතල පහසුකම් වර්ධනය කරදීම.
- පුහුණු අවශ්‍යතා හඳුනාගනිමින් ඒ සඳහා අවස්ථාව සලසා දීම.

## 5.8 අධ්‍යාපන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිගේ තත්වාගණනය කළ මතය.

ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාර ව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු . 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාදනය මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 5.8.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

මෙම මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

# 06

# යටිතල පහසුකම් සංවර්ධනය

## 6.1 හැඳින්වීම

සියලු ම විශ්වවිද්‍යාල සිසුන් තාක්ෂණය ද ඇතුලත්ව නව ලොව නව දැනුම සමඟ සම්බන්ධ කිරීමටත්, 21 වැනි සියවසේ ඉදිරි දශකය තුළ දේශීය හා ගෝලීය වශයෙන් ආර්ථිකය විසින් ඉල්ලා සිටින මානව ප්‍රාග්ධනය ඒ හරහා ගොඩනැගීමටත් රටක උසස් අධ්‍යාපන පද්ධතිය විසින් මහඟු කාර්යභාරයක් ඉටු කරයි. රටක් නොව ලොවක් දිනන්නට අභියෝග සමඟ ඉදිරියට යාමේ දී ප්‍රාථමික, ද්විතීයික, හා තෘතියික උසස් අධ්‍යාපන පද්ධතීන් සංවර්ධනය වෙනුවෙන් අනාගත සැලසුම් ගොඩනගන්නට සියලු පාර්ශවයන්ගි සාමූහික සහාය අතිශයින් ම වැදගත් වෙයි. මේ යටතේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම, විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම, උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවිම තුළින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩිකිරීම, පර්යේෂණ හා නවෝත්පාදන වැඩි කිරීම යනාදී අංශ සඳහා දායකවීම දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයේ) කාර්ය භාරය විහිදී යයි. මීට සමගාමීව සිසුන්ගේ අධ්‍යයන කටයුතු වලට ඉඩ සැලසෙන පරිදි හා ඔවුන් හදාරන පාඨමාලාවන්ට උචිත වන පරිදි විශ්වවිද්‍යාල වල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම කල යුතුව ඇත.

## 6.2 යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන

වාර්ෂිකව රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට වෙන්වන මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් වැඩි ප්‍රතිශතයක් වෙන් වන්නේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහාය. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන්වන ප්‍රතිපාදන තුල මූලික වශයෙන් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම, නඩත්තු කිරීම් හා නව ඉදිකිරීම් ව්‍යාපෘති යන වියදම් සඳහා වෙන්වන ප්‍රතිපාදන ඇතුළත් වෙයි. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම යටතේ විශ්වවිද්‍යාල පද්ධතියට අවශ්‍ය වන කාර්යාලයීය උපකරණ, පුස්තකාල පොත්, තොරතුරු තාක්ෂණ මෙවලම්, ක්‍රීඩා උපකරණ හා විද්‍යාගාර උපකරණ වැනි උපකරණ මිලදී ගැනීම් අඩංගු වේ. නඩත්තු කිරීමේ කටයුතු සඳහා වෙන්වන ප්‍රතිපාදන දැනට පවත්නා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් සඳහා මෙන්ම යන්ත්‍රෝපකරණවල නඩත්තු කටයුතු සඳහාද යොදවා ගනු ලැබේ. 2024 වර්ෂයේදී රාජ්‍ය උසස් අධ්‍යාපන පද්ධතිය සඳහා වෙන්වූ සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 88%ක් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කර ඇත. 2023 වර්ෂයේ එය 79%ක් වූ අතර, 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්වීම 09%ක ප්‍රතිශතාත්මක වැඩි වීමක් දැකිය හැක. 2024 වර්ෂයේ සිව්වන කාර්තුව අවසන් වනවිට යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන්වූ ප්‍රතිපාදනයේ මූල්‍ය ප්‍රගතිය 86%කි. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන්කළ ආකාරය හා එහි ප්‍රගතිය 6.1 රූපය මඟින් දක්වා ඇත.




6.1 රූපය: යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන හා වියදම - 2024

(මූලාශ්‍ර: විශ්වවිද්‍යාල වාර්තා 2024.12.31 දිනට)

## 6.3 ඉදිකිරීම් ව්‍යාපෘති

2024 වර්ෂයේ විශ්වවිද්‍යාල පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් 75%ක් හෙවත් රුපියල් මිලියන 22,214ක් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් කර ඇත. එම ඉදිකිරීම් ව්‍යාපෘති සංඛ්‍යාව 73ක් වන අතර එම සංයුතිය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 35ක් ද, මෙම වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති 08ක් ද, අවසන් බිල්පත් ගෙවීමට ඇති ඉදිකිරීම් ව්‍යාපෘති 30ක් ද ඇතුළත් වේ. එම ව්‍යාපෘතීන්හි ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 92,205ක් වේ. 2023 වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 17,240ක් වෙන්වූ අතර, ඒ යටතට ව්‍යාපෘති 86ක් අන්තර්ගත විය.

ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේ දී රජයේ ප්‍රධාන අරමුණක් වන විද්‍යා, වෛද්‍ය, තාක්ෂණ, ඉංජිනේරු යන අංශ සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීමට සමගාමීව ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දී ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ආයෝජනය කර ඇත.

2024 වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 8,366 ක් දේශීය අරමුදල් මඟින් ද, ඉතිරි ප්‍රතිපාදනය වූ රුපියල් මිලියන 13,848ක මුදල විදේශීය ණය හා ආධාර මඟින් ද මූල්‍යනය කර ඇත.

විදේශීය ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ලෙස, වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතිය, විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය හා සබරගමුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ මඩකලපුව ස්වාමි විපුලානන්ද ආයතනයේ ශ්‍රවණාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යනාදී ව්‍යාපෘති සඳහා වෙන්වන ප්‍රතිපාදන අන්තර්ගත වී ඇත.

රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොළහක ගොඩනැගිල්ලක් ඉදිකිරීම, රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයක් ස්ථාපිත කිරීම යන ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් අයවැය යෝජනා ඉදිකිරීම් ව්‍යාපෘති තුළ අන්තර්ගත වේ. නව අයවැය යෝජනාවක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 500ක මුදලක් 2024 වර්ෂයේදී වෙන් කරන ලදී.

2024 වර්ෂයේ සිව්වන කාර්තුව අවසන් වන විට සමස්ථ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදනයන්හි මූල්‍ය ප්‍රගතිය 87%කි. 2024 වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි සංයුතිය 6.1 වගුව මඟින් ද ව්‍යාපෘති සඳහා වෙන්වන ප්‍රතිපාදන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වැය ශීර්ෂය යටතේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන වැය ශීර්ෂය යටතේ 6.2 වගුව හා 6.3 වගුව මඟින් දක්වා ඇත.

**6.1 වගුව : ඉදිකිරීම් ව්‍යාපෘති සංයුතිය - 2024**

| | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | කොන්ත්‍රාත් මුදල (රු.මි.) | සමුච්චිත වියදම (රු.මි.) | ප්‍රතිපාදන (2024) (රු.මි.) | වියදම (2024.12.31) (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| අවසන් බිල්පත් පියවීමට ඇති ව්‍යාපෘති | 30 | 18,798.93 | 21,704.23 | 17,100.95 | 1,764.61 | 1,763.45 |
| 2024 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති | 08 | 2,902.27 | 2,357.25 | 2,361.95 | 352.04 | 318.42 |
| 2024 වර්ෂයේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති | 34 | 69,489.91 | 54,542.01 | 50,050.74 | 19,896.85 | 16,962.99 |
| 2024 වර්ෂයේ ක්‍රියාත්මක වන නව ව්‍යාපෘති | 01 | 1,014.00 | - | 200.00 | 200.00 | 200.00 |
| **එකතුව** | **73** | **92,205.11** | **78,603.49** | **69,713.64** | **22,213.50** | **19,244.86** |

(මූලාශ්‍ර - විශ්වවිද්‍යාල වාර්තා 2024.12.31 දිනට)

**6.2 වගුව : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වැය ශීර්ෂය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබීම් හා වියදම්හි තොරතුරු - 2023 සහ 2024**

| විශ්වවිද්‍යාලය/ ආයතනය | 2023.09.30 | | | | 2024.12.31 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යා. සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | % | ව්‍යා. සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | % |
| පේරාදෙණිය | 13 | 258 | 230 | 89 | 07 | 180 | 180 | 100 |
| කොළඹ | 04 | 255 | 168 | 66 | 03 | 57 | 57 | 100 |
| ජයවර්ධනපුර | 02 | 400 | 400 | 100 | 03 | 697 | 697 | 100 |
| කැළණිය | 01 | 113 | 100 | 89 | 01 | 200 | 178 | 89 |
| මොරටුව | 07 | 231 | 81 | 35 | 07 | 320 | 270 | 84 |
| රුහුණ | 01 | 100 | 90 | 90 | 01 | 60 | 60 | 100 |
| යාපනය | 02 | 152 | 150 | 99 | 01 | 160 | 160 | 100 |
| නැගෙනහිර | 01 | 36 | - | - | 01 | 70 | 70 | 100 |
| රජරට | 03 | 185 | 170 | 92 | 05 | 295 | 185 | 63 |
| සබරගමුව | 05 | 190 | 93 | 49 | 03 | 285 | 285 | 100 |
| අග්නිදිග | 02 | 107 | 86 | 80 | 02 | 126 | 99 | 79 |
| වයඹ | 11 | 93 | 61 | 66 | 04 | 122 | 103 | 84 |
| සෞන්දර්ය | 02 | 120 | 120 | 100 | 02 | 120 | 117 | 98 |
| ඌව වෙල්ලස්ස | 04 | 122 | 91 | 75 | 03 | 216 | 193 | 89 |
| විවෘත වි.වි. | - | - | - | - | 01 | 36 | 36 | 100 |
| වව්නියා වි.වි. | 01 | 130 | 76 | 59 | 01 | 120 | 113 | 94 |
| ත්‍රිකුණාමලය මණ්ඩපය | 03 | 112 | 48 | 43 | 03 | 240 | 232 | 97 |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය | 01 | 100 | 87 | 87 | 01 | 22 | 22 | 100 |
| අයවැය යෝජනා ව්‍යාපෘති(තාක්ෂණ පීඨ ඉදිකිරීම ඇතුළුව) | 09 | 975 | 636 | 15 | 10 | 565 | 565 | 100 |
| නව අයවැය යෝජනා (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය) | 01 | 200 | - | - | - | - | - | |
| එකතුව | 73 | 3,879 | 2,687 | 69 | 59 | 3,891 | 3,622 | 93 |

(මූලාශ්‍ර - ඉදිකිරීම් ව්‍යාපෘති විශ්වවිද්‍යාල වාර්තා 2023.09.30 දිනට හා 2024.12.31 දිනට)

**6.3 වගුව: උසස් අධ්‍යාපන වැය ශීර්ෂය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන - 2024**

| විශ්වවිද්‍යාලය/ ආයතනය | ව්‍යා. සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | % |
|---|---|---|---|---|
| භික්ෂු | 01 | 150 | 21 | 14 |
| බෞද්ධ හා පාලි | 01 | 47 | 35 | 75 |
| විදේශීය ණය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති | 06 | 15,490 | 12,962 | 84 |
| අයවැය යෝජනා ව්‍යාපෘති | 06 | 2,636 | 2,620 | 99 |
| *ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන* | ***14*** | ***18,323*** | ***15,638*** | ***85*** |
| කොළඹ විශ්වවිද්‍යාලයේ පූර්ව සායනික ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා ගත් දේශීය ණය අරමුදලේ ණය පොලිය ගෙවීම | | 1,850 | 1,463 | 79 |
| මුළු එකතුව | **14** | **20,173** | **17,101** | **85** |

(මූලාශ්‍ර - විශ්වවිද්‍යාල වාර්තා 2024.12.31 දිනට)

### 6.3.1 - 2024 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති

පෙර වර්ෂයන්හි සිට ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ඉදිකිරීම් ව්‍යාපෘති 08ක ඉදිකිරීම් කටයුතු 2024 වර්ෂයේ සිව්වන කාර්තුව වනවිට අවසන් කිරීමට හැකි වී ඇත. රටෙහි පවතින මූල්‍ය අර්බුදකාරී තත්ත්වය වැනි අනපේක්ෂිත තත්ත්වයන්ට පසුගිය කාලය තුළදී රටට මුහුණ දීමට සිදුවීම හේතුවෙන් සැලසුම් කළ ආකාරයට ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වීම නිසා 2024 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති කිහිපයක ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකි විය.

රටට මුහුණ දීමට සිදුවී ඇති අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට මුහුණ දීමට සිදුවී ඇති ගැටළු නිරාකරණය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශවකරුවන් කැඳවා ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. ඒ අනුව බොහෝ ගැටලු සඳහා විසඳුම් ලබා දීමට විවිධ පාර්ශවකරුවන් හා එකඟතාවයන් ඇති කරගන්නා ලද අතර ඉදිරි ක්‍රියාකාරකම් සිදු කිරීම මඟින් සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගැනීමටද හැකියාව ලැබිණි.

මෙම වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති ලේඛනය ඇමුණුම D මඟින් දක්වා ඇත.

- **උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)**

ලෝක බැංකු ණය යටතේ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතියේ මුළු ණය වටිනාකම ඇ.ඩො. මිලියන 100ක් වූ අතර 2019 වර්ෂයේදී ආරම්භ වී 2023.12.31 දින අවසන් වූ අතර එහි වගකීම් කාලය 2024.06.30 දින දක්වා පැවතුණි. 2024 වර්ෂය සඳහා ද මෙම ව්‍යාපෘතියේ අවසන් බිල්පත් ගෙවීම සඳහා රුපියල් මිලියන 762.58ක් වෙන් වූ අතර මෙම ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 762.38ක් 2024.12.31 වන විට වියදම් කර ඇත. ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ පළමුවන ප්‍රතිඵල පාදක සංරචකය යටතේ විශ්වවිද්‍යාල සඳහා වාර්ෂිකව විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත අංශවලට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය ඉහළ නැංවීම වෙනුවෙන් සිවිල් වැඩ සඳහා රුපියල් මිලියන 3,840.41ක මුදලක් සහ අමතරව රුපියල් මිලියන 1,912.53ක මුදලක් වෙන් කර ඇත. ඒ යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලදී.

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ ඉදිකිරීම් ව්‍යාපෘතින්හි ඡායාරූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත.



6.2 රූපය: නැනෝ විද්‍යා තාක්ෂණ දෙපාර්තමේන්තුව, තාක්ෂණ පීඨය, වයඹ විශ්වවිද්‍යාලය



6.3 රූපය: ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය, ATI මධ්‍යස්ථානය, මන්නාරම

## 6.3.2 - ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති

2024 වර්ෂයට පෙර ආරම්භ කර ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති ගණන 34කි. ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 69,490ක් වන මෙම ව්‍යාපෘති සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 19,897ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2024 වර්ෂයේ සිව්වන කාර්තුව වන විට මෙම ප්‍රතිපාදනයේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 16,963කි.

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,000ට වැඩි ව්‍යාපෘති කිහිපයක තොරතුරු පහත දක්වා ඇත.

ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති ලේඛනය ඇමුණුම D1 මගින් දක්වා ඇත.

- **නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - නැගෙනහිර විශ්වවිද්‍යාලය**

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 5,480ක් වන අතර ඉදිකිරීම් කටයුතු සඳහා පමණක් රුපියල් මිලියන 2,507ක් වෙන් කර ඇත. මෙම ව්‍යාපෘතිය අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදලින් ලැබෙන ණය මුදලක් යටතේ ක්‍රියාත්මක වේ.

ව්‍යාපෘතිය නිම කළ පසු වෛද්‍ය උපාධිය සඳහා 100ක් ද, හෙද උපාධිය සඳහා 70ක් ද, ඖෂධවේදී උපාධිය සඳහා 20ක් ද, මහජන සෞඛ්‍ය පිළිබඳ උපාධිය සඳහා 20ක් ද වශයෙන් වාර්ෂිකව මෙම පීඨයට විද්‍යාර්ථීන් ඇතුළත් කර ගැනීමට හැකි වනු ඇත. මෙම පීඨය යටතේ පහත සඳහන් අධ්‍යයන දෙපාර්තමේන්තු 03 පිහිටු වීමට සැලසුම් කර ඇත.

I. ප්‍රාථමික සෞඛ්‍ය සේවා අධ්‍යයන අංශය සහ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය
II. සායනික විද්‍යා අධ්‍යයන අංශය සහ අතිරේක වෛද්‍ය අධ්‍යයන අංශය
III. මානව ජීව විද්‍යා අධ්‍යයන අංශය සහ ව්‍යාධි විද්‍යා අධ්‍යයන අංශය

- **විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය**

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර ලබන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන (STHRD) ව්‍යාපෘතිය මඟින් දේශීය හා ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපළට අදාළ කුසලතා සහ ව්‍යවසායකත්ව ජවයෙන් සන්නද්ධ තාක්ෂණ-දිශානුගත උපාධිධාරීන් බිහි කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ පීඨ සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට සහය දක්වයි.

මෙම ව්‍යාපෘතිය මගින් නව්‍ය තාක්ෂණය සහ කර්මාන්ත සඳහා අදාළ අධ්‍යාපනය සහ පර්යේෂණ පහසුකම් සැපයීම, ගුණාත්මක විෂයමාලා සැලසුම් කිරීම සහ කර්මාන්ත ඉල්ලුම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උපකාර කිරීම සහ තරඟකාරී කර්මාන්ත සහ විදේශීය විශ්වවිද්‍යාල සහයෝගීතා යෝජනා ක්‍රමය සහ ධාරිතා සංවර්ධන කාර්යයන් සඳහා අවස්ථා

ලබා දෙනු ඇත. යෝජිත නව උසස් අධ්‍යාපන ව්‍යාපෘතියක් සකස් කිරීමේදී රජයට සහාය වීම සඳහා වන සංරචකයක් ද ව්‍යාපෘතිය තුළ අන්තර්ගතය.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 26,400 කි. (ඇමරිකානු ඩොලර් මිලියන 165) එයින් රුපියල් මිලියන 23,200ක්, ආසියානු සංවර්ධන බැංකුවේ ණය යටතේ සහ ඉතිරි මුදල දේශීය අරමුදල් යටතේ මූල්‍යායනය කිරීමට සැලසුම් කර ඇත. 2018 දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම නව පීඨ ඉදිකිරීමෙන් පසු 2023 වර්ෂයේ සිට එක් අධ්‍යයන වර්ෂයක් සඳහා ශිෂ්‍යයින් 1,460ක් ඇතුළත් කරගැනීමට හැකිවනු ඇත. මෙම ව්‍යාපෘති අරමුදලින් වැඩි ප්‍රතිශතයක් වෙන් වන්නේ ඉදිකිරීම් කටයුතු සඳහාය. එම ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය 6.4 වගුව මඟින් දක්වා ඇත.

විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි ඡායාරූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත.



6.4 රූපය: පරිගණක තාක්ෂණ පීඨයේ ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම, කැලණිය විශ්වවිද්‍යාලය





6.5 රූපය: තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම, සබරගමුව විශ්වවිද්‍යාලය

**6.4 වගුව: විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පීඨ ඉදිකිරීම.**

| පීඨ ගොඩනැගිල්ල | ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | කොන්ත්‍රාත් ප්‍රදානය (රු.මි.) | *සමුච්චිත වියදම (රු.මි.) (2024.12.31) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| තාක්ෂණ පීඨය, කැලණිය වි. | 4,079.60 | 4,651.13 | 4,440.39 | **100** |
| තාක්ෂණ පීඨය, සබරගමුව වි. | 1,941.50 | 2,547.14 | 2,499.16 | **100** |
| ඉංජිනේරු පීඨය, ශ්‍රී ජයවර්ධනපුර වි. | 4,189.20 | 4,808.26 | 4,621.49 | **81** |
| තාක්ෂණ පීඨය, රජරට වි. | 2,933.70 | 5,502.73 | 5,286.78 | **100** |
| තාක්ෂණ පීඨය, මොරටුව වි. | 844.00 | 597.30 | 344.97 | **70** |
| එකතුව | **13,988.00** | **18,106.56** | **17,192.79** | |

* මිල විචලනයන් සමඟ

(මූලාශ්‍ර - විශ්වවිද්‍යාල වාර්තා 2024.12.31)

- **වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය (WUTDP)**

මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන්නේ සෞදි අරාබි රාජධානියේ සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල (SFD) වන අතර මුළු ණය මුදල සෞදි අරාබි රියාල් මිලියන 105 ක් වන අතර එය සිවිල් වැඩ සහ උපකරණ, උපදේශන සේවා සහ වෙන් නොකළ යන කාණ්ඩ යටතේ පිළිවෙළින් සෞදි අරාබි රියාල් මිලියන 85ක්, 12ක් සහ 08ක් ලෙස බෙදා හැර ඇත.

ප්‍රවර්තන මුදල් වර්ෂය සඳහා රුපියල් මිලියන 2,470.72ක මුදලක් වෙන් කර ඇති අතර 2024.12.31 දින වනවිට වියදම රුපියල් මිලියන 1,791.16ක් වන අතර සමුච්චිත වියදම රුපියල් මිලියන 5,560.48ක් වේ.

ව්‍යාපෘතියේ සිවිල් වැඩ පහත සඳහන් ප්‍රධාන සංරචක දෙකකින් සමන්විත වේ.

පහත සඳහන් අධ්‍යයන පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් යෝජනා කර ඇති අතර සංවර්ධනය සඳහා සෞදි අරමුදලෙන් ලැබෙන ණය මුදලෙන් කුලියාපිටිය පරිශ්‍රයේ සහ මාකඳුර පරිශ්‍රයේ ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

01. කුලියාපිටිය පරිශ්‍රයේ යෝජිත ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම.
(ස්ථාන 05, ගොඩනැගිලි 07 + මාර්ග සංවර්ධනය)

- නගර සංවර්ධන පහසුකම් මධ්‍යස්ථානය (මහල් 02)
- ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය (මහල් 04)
- පුස්තකාල ගොඩනැගිල්ල (මහල් 04)
- අධ්‍යයන කාර්ය මණ්ඩල නිල නිවාස (මහල් 04)
- දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඇතුළුව විධායක කාර්ය මණ්ඩල නිල නිවාස (මහල් 04)
- අනධ්‍යයන කාර්ය මණ්ඩල නිල නිවාස (මහල් 04)
- සංචාරක බංගලාව (මහල් 02)
- පොදු චතුරශ්‍රය සංවර්ධනය (ප්‍රධාන පිවිසුම, ද්විතීයික පිවිසුම, බස් නැවතුම් අංක 3, මාර්ග දෙපස වැඩ)

02. මාකඳුර පරිශ්‍රයේ යෝජිත ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම. (ගොඩනැගිලි 06 + පිවිසුම් දොරටුව)

- නගර සංවර්ධන පහසුකම් මධ්‍යස්ථානය (මහල් 02)
- බහු කාර්ය මධ්‍යස්ථානය (මහල් 05)
- අධ්‍යයන කාර්ය මණ්ඩල නිල නිවාස (මහල් 05)

- විධායක කාර්ය මණ්ඩල නිල නිවාස (මහල් 02)
- අනධ්‍යයන කාර්ය මණ්ඩල නිල නිවාස (මහල් 03)
- දිවා සුරැකුම් මධ්‍යස්ථානය (මහල් 02)
- ඇතුල්වීමේ දොරටුව

වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි ඡායාරූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත.



6.6 රූපය: පුස්තකාල ගොඩනැගිල්ල, වයඹ විශ්වවිද්‍යාලය - කුලියාපිටිය පරිශ්‍රය



6.7 රූපය: බහු කාර්ය මධ්‍යස්ථානය, වයඹ විශ්වවිද්‍යාලය - මාකඳුර පරිශ්‍රය

- **රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

2017 වර්ෂයේ අයවැය යෝජනාවක් මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 1,179කි. වර්ග මීටර් 8,199 ක වපසරියකින් යුක්ත වූ ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 264.5ක් වෙන් කර ඇති අතර 2024.12.31 වන විට සමුච්චිත වියදම රුපියල් මිලියන 1,255.86කි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වල පැවති අඩු ප්‍රගතිය නිසා 2019.12.23 දින පළමු කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර 2020.07.09 දින ව්‍යාපෘතියේ නව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමත් සමඟ 2024.12.31 වන විට සමුච්චිත භෞතික ප්‍රගතිය 58.5%කි. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ඇතුළත් කර ගන්නා වෛද්‍ය සිසුන් සංඛ්‍යාව 160 සිට වසරකට සිසුන් 10 බැගින් වසර 4ක් තුලදී සිසුන් 40කින් වැඩි කර වර්ෂයකට ඇතුලත් කර ගන්නා සිසුන් ගණන 200ක් කිරීමට යෝජිතය.

රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඡායාරූප සටහනක් පහත දක්වා ඇත.



6.8 රූපය: වෛද්‍ය පීඨය සඳහා තට්ටු දොලහක ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, රුහුණ විශ්වවිද්‍යාලය

- **රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහාචාර්ය ඒකකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

2018 වර්ෂයේ අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 1,300ක් වන අතර ගොඩනැගිලිවල මුළු වපසරිය වර්ග අඩි 110,655.6කි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම මඟින් වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ලබා ගැනීමේ පහසුකම් වැඩිවීම, අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම්, විද්‍යාගාර සහ භෞතික සම්පත් වර්ධනය කිරීමට අපේක්ෂිතය. 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 361.8ක් ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කර ඇත.

රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහාචාර්ය ඒකකයක් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඡායාරූප සටහනක් පහත දක්වා ඇත.



6.9 රූපය: වෛද්‍ය පීඨය සඳහා මහාචාර්ය ඒකකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, රුහුණ විශ්වවිද්‍යාලය

### 6.3.3. අවසන් බිල්පත් ගෙවීමට ඇති ඉදිකිරීම් ව්‍යාපෘති

2024 වර්ෂයේ අවසන් බිල්පත් ගෙවීමට ඇති ව්‍යාපෘති ලේඛනය ඇමුණුම D2 මඟින් දක්වා ඇත.

## 6.4 ප්‍රසම්පාදන කටයුතු

මෙම වර්ෂය තුළ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වෙනුවෙන් උසස් අධ්‍යාපන අංශය විසින් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ රුපියල් මිලියන 844ක වටිනාකමින් යුත් මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා ඇත.

මීට අමතරව තවදුරටත් මෙම වසර තුල විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වෙනුවෙන් උසස් අධ්‍යාපන අංශය විසින් ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර නොමැත.

# 07

# පර්යේෂණ, නවෝත්පාදන, වාණිජ්‍යකරණය සහ ජාතික සංවර්ධන ක්‍රියාකාරකම්

## 7.1 හැඳින්වීම

තාක්ෂණික නවොත්පාදනයන් තුලින් රටක සංවර්ධනය දිනෙන් දින ඉදිරියට ගෙන යන අතර එම රට තුළ ජනනය වන නවෝත්පාදන සහ පර්යේෂණ මඟින් එළිදක්වනු ලබන ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව සුදුසු පරිදි පර්යේෂණ කටයුතුවල නියැලීම විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට පැවරී ඇති ප්‍රමුඛතම වගකීමකි. වර්තමානයේ, විශ්වවිද්‍යාල පද්ධතියේ සියලුම විද්වතුන් පාහේ ප්‍රධාන වශයෙන් මූලික පර්යේෂණ පමණක් නොව ව්‍යවහාරික පර්යේෂණවල ද නිරත වෙති. මෙම පර්යේෂණ ප්‍රයත්නයන් නව්‍ය නිෂ්පාදන සංවර්ධනයට, ඇතැම් භාණ්ඩ වාණිජ්‍යකරණයට, ජාතික සංවර්ධන ක්‍රියාකාරකම්වලට දායක වීමට සහ විවිධ සමාජ ගැටලුවලට විසඳුම් ලබා දීමට හේතු වී ඇත. මීට අමතරව, එවැනි පර්යේෂණ විශ්වවිද්‍යාල සහ විද්වතුන්ගේ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට ද හේතු වී ඇති අතර එමඟින් ඔවුන්ගේ කීර්තිනාමය ද ඔප්නැංවී ඇත.

## 7.2 පර්යේෂණ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

2024 වර්ෂයේදී පර්යේෂණ කටයුතු සඳහා ප්‍රාග්ධන වියදම්වලින් රුපියල් මිලියන 892.5ක ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙම මුදලින් රුපියල් මිලියන 676.34ක් දැනටමත් භාවිත කර ඇත. එම මුදලින් රුපියල් මිලියන 309 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වෙන් කර ඇති අතර රුපියල් මිලියන 583.5ක් අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වේ. මෙම ප්‍රතිපාදනය තුළ විදේශ ණය හා ප්‍රදාන මෙන්ම ශ්‍රී ලංකා රජයේ අරමුදල් ද අන්තර්ගතය. ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීම සහ වියදම් කිරීම පිළිබඳ විස්තර 7.1 වගුවෙන් දක්වා ඇත.

7.1 වගුව 2024.12.31 දිනට ප්‍රාග්ධන ප්‍රතිපාදන සහ වියදම

| ආයතනය | | වෙන් කිරීම (රු.මි.) | වියදම (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| වි.වි.ප්‍ර. කො | | 309 | 164 | 53 |
| අමාත්‍යාංශය | භික්ෂු | 4.0 | 3.8 | 95 |
| | විදේශ ව්‍යාපෘති | 579.5 | 508.4 | 87 |
| **එකතුව** | | **892.5** | **676.34** | **75.7** |

(මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකාභික්ෂු විශ්ව විද්‍යාලය, විදේශ ව්‍යාපෘති)

පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ කටයුතු සිදු කිරීම පිණිස පර්යේෂණ දීමනා ලෙස රුපියල් මිලියන 3,267.10 ක් වෙන් කර ඇත. මෙයින් රුපියල් මිලියන 2644.60ක් භාවිතා කර ඇති අතර මෙම උපයෝගිතා ප්‍රතිශතය 81%කි. පර්යේෂණ දීමනා සහ පුනරාවර්තන ප්‍රතිපාදන භාවිත කිරීම 7.2 වගුවේ දක්වා ඇත.

7.2 වගුව 2024.12.31 දිනට පුනරාවර්තන වියදම

| ආයතනය | | වෙන් කිරීම* (රු.මි.) | වියදම (රු.මි.) | ප්‍රගතිය % |
|---|---|---|---|---|
| වි.වි.ප්‍ර.කො | | 3,126 | 2,518 | 80.5 |
| අමාත්‍යාංශය | භික්ෂු වි.වි | 21.3 | 9.1 | 42.7 |
| | බෞද්ධ හා පාලි | 21.5 | 21.4 | 99.5 |
| | ශ්‍රී.ල.උ.තා.ආ | 98.3 | 96.1 | 97.7 |
| **එකතුව** | | **3267.10** | **2644.60** | **81** |

(මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය)

## 7.3 විදේශ අරමුදල් යටතේ පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය

විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 579.5ක විදේශ අරමුදල් වෙන් කර ඇති අතර ඒ පිළිබඳ විස්තර 7.3 වගුවේ දක්වා ඇත.

7.3 වගුව 2024.12.31 දිනට විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවල පිරිවැය පිළිබඳ ප්‍රගතිය.

| ව්‍යාපෘතිය | රු.මිලියන | | |
|---|---|---|---|
| | වෙන් කිරීම | වියදම | ප්‍රගතිය % |
| උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය - AHEAD | 14.50 | 14.46 | 99.7 |
| විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | 445 | 439 | 98.6 |
| විශ්ව විද්‍යාලයේ පර්යේෂණ කටයුතු සඳහා විදේශ ආධාර | 120 | 55 | 45.8 |
| එකතුව | 579.5 | 508.46 | 87.74 |

(මූලාශ්‍රය:අමාත්‍යාංශයේ ගිණුම් වාර්තාව)

### 7.3.1. ලෝක බැංකුව මඟින් මූල්‍යයනය කරන උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) යටතේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ හා සංවර්ධන, නවෝත්පාදන හා වාණිජ්‍යකරණ (RDIC) සවිමත් කිරීම– ප්‍රතිඵල ක්ෂේත්‍ර 3

මෙම ප්‍රතිඵල ක්ෂේත්‍රයේ පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාල තුළ පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජ්‍යකරණ (RDIC) සංස්කෘතියක් සංවර්ධනය කිරීමයි. පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජ්‍යකරණ (RDIC) ක්‍රියාකාරකම් රටේ උසස් අධ්‍යාපනය දියුණු කිරීමේ ද අතිශය වැදගත් ඉදිරි පියවරකි.
AHEAD මෙහෙයුම යටතේ සංවර්ධන-නැඹුරු පර්යේෂණ (DOR), පර්යේෂණ සහ නවෝත්පාදන වාණිජ්‍යකරණය (RIC) සහ නවෝත්පාදන වාණිජ්‍යකරණය වැඩිදියුණු කිරීමේ (ICE) ව්‍යාපෘති ප්‍රදානය කරන ලදී.

ICE 9, RIC 13 සහ DOR ව්‍යාපෘති 18 ලෙස පළමු වටය යටතේ විශ්වවිද්‍යාල සඳහා RDIC ව්‍යාපෘති 40ක් තරඟකාරී ලෙස ප්‍රදානය කරන ලදී. 2වන වටයේ දී විශ්වවිද්‍යාල සඳහා RDIC ව්‍යාපෘති 49 ක් ප්‍රදානය කරන ලදී, එනම් RIC 15 සහ DOR ව්‍යාපෘති 34 කි.

ඉහත සඳහන් කළ පරිදි, තරඟකාරී අරමුදල් යෝජනා ක්‍රම හතක් සහ අරමුදල් වට 2ක් යටතේ 2018 සිට 2023 දක්වා විශ්වවිද්‍යාල පර්යේෂණ ව්‍යාපෘති 89ක් සඳහා අරමුදල් සපයන ලදී. AHEAD හි තුන්වන ප්‍රතිඵල ක්ෂේත්‍රය සඳහා වන මුළු මූල්‍ය ප්‍රතිපාදන මෙහෙයුමේ මුළු පිරිවැයෙන් 16% කි. මෙම පර්යේෂණ ව්‍යාපෘති ප්‍රදානය කිරීමේදී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රථම වරට මාර්ගගත යෝජනා ඉදිරිපත් කිරීම් සහ ඇගයීම් ක්‍රම භාවිතා කරන ලදී.

**විශ්වවිද්‍යාලවල පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජ්‍යකරණය (RDIC) ශක්තිමත් කිරීම**

විශ්වවිද්‍යාල සඳහා ප්‍රදානය කරන ලද 1 වටයේ සහ 2 වටයේ ව්‍යාපෘතිවල සාරාංශය: මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 79 කි. මෙය 7.1 රූපයෙන් දැක්වේ.

7.1 රූපය: විශ්වවිද්‍යාලවල පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජ්‍යකරණය (RDIC) ශක්තිමත් කිරීම




| | Colombo | Peradeniya | Sri Jayawardenepura | Kelaniya | Moratuwa | Ruhuna | Open | Jaffna | Eastern | South Eastern | Rajarata | Sabaragamuwa | Uva Wellassa | Visual and Performing Arts | Wayamba |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ICE | 3 | 3 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| RIC STEM | 1 | 2 | 2 | 2 | 6 | 2 | 0 | 1 | 0 | 1 | 2 | 2 | 0 | 0 | 0 |
| RIC HEMS | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| RIC STEM-HEMS | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 0 | 0 |
| DOR STEM | 3 | 5 | 1 | 1 | 5 | 3 | 2 | 2 | 2 | 0 | 3 | 1 | 2 | 0 | 4 |
| DOR HEMS | 2 | 1 | 1 | 2 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 3 | 1 | 1 | 1 |
| DOR STEM-HEMS | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 |
| Total | 10 | 11 | 6 | 5 | 12 | 6 | 3 | 4 | 3 | 2 | 7 | 9 | 3 | 2 | 6 |

වගුව 7.4: විවිධ විශ්වවිද්‍යාල විසින් දිනා ගත් ICE/RIC/DR ව්‍යාපෘතිවල විස්තර

| විශ්වවිද්‍යාලය | ICE සහ RIC ව්‍යාපෘති සංඛ්‍යාව | DOR ව්‍යාපෘති සංඛ්‍යාව | සමස්ත වියදම (රු.මිලියන) | ගිවිස ගත් දර්ශකවලින් 80%ක් ලබාගෙන ඇති මුළු ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කොළඹ | 4 | 6 | 309.56 | 10 |
| නැගෙනහිර | 1 | 2 | 60.32 | 1 |
| මොරටුව | 7 | 5 | 402.83 | 10 |
| විවෘත | 1 | 2 | 124.84 | 2 |
| පේරාදෙණිය | 5 | 6 | 396.55 | 10 |
| රුහුණ | 3 | 3 | 215.96 | 6 |
| රජරට | 2 | 5 | 246.55 | 7 |
| අග්නිදිග | 1 | 1 | 46.88 | 2 |
| සබරගමුව | 5 | 4 | 307.00 | 7 |
| යාපනය | 1 | 3 | 124.09 | 4 |
| කැලණිය | 2 | 3 | 136.56 | 4 |
| ජයවර්ධනපුර | 4 | 2 | 194.19 | 6 |
| සෞන්දර්යය කලා | 0 | 2 | 49.64 | 1 |
| ඌව වෙල්ලස්ස | 0 | 3 | 89.17 | 3 |
| වයඹ | 1 | 5 | 206.03 | 6 |
| **එකතුව** | **37** | **52** | **2910.17** | **79** |

මූලාශ්‍රය : උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)

සියලුම ව්‍යාපෘති 79 හි නිමැවුම් සහ ප්‍රතිඵල මුදල් අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල, වාණිජ හවුල්කරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් වෙත 2023 දෙසැම්බර් 15වන දින පෙන්වා දෙන ලද අතර, එහිදී සහභාගී වූ 300කට අධික පිරිසක් RDIC දායකත්වය දැක බලා ගන්නට විය. මෙම පුවත් සඳහා පහත සබැඳියෙන් ප්‍රවේශ විය හැක.

https://youtu.be/zsClBe4Pmss?si=TKUVE65VSeHNXwU5

විශ්වවිද්‍යාල මගින් නවෝත්පාදන වාණිජ්‍යකරණය වැඩිදියුණු කිරීමේ (ICE), පර්යේෂණ සහ නවෝත්පාදන වාණිජ්‍යකරණය (RIC), සංවර්ධන-නැඹුරු පර්යේෂණ (DOR) ව්‍යාපෘති ජයග්‍රහණ පිළිබඳ සාරාංශය.

වගුව 7.5 විශ්වවිද්‍යාල ICE/RIC/DOR වෙතින් ලත් ජයග්‍රහණ පිළිබඳ සාරාංශය

| ප්‍රධාන කාර්යසාධක දර්ශක | එකතුව |
|---|---|
| ප්‍රකාශිත කාර්ය පත්‍රිකා සංඛ්‍යාව | 56 |
| පිළිගනු ලැබූ සන්නිවේදනයන් (සාරාංශ (සංඛ්‍යාව | 854 |
| ජාතික සම්මන්ත්‍රණ /පරිසංවාද සඳහා ඉදිරිපත් කරන ලද පත්‍රිකා සංඛ්‍යාව | 114 |
| ජාත්‍යන්තර සම්මන්ත්‍රණ / පරිසංවාද සඳහා ඉදිරිපත් කරන ලද පත්‍රිකා සංඛ්‍යාව | 279 |
| සම-සමාලෝචනය කරන ලද ජාතික සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව | 119 |
| සම-සමාලෝචනය කරන ලද ජාත්‍යන්තරව සුවිගත කරන ලද සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව | 310 |
| කීර්තිමත් ජාතික ප්‍රකාශකයින් විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත් හෝ ශාස්ත්‍රීය නිබන්ධයන් ලෙස පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව | 26 |
| කීර්තිමත් ජාත්‍යන්තර ප්‍රකාශකයින් විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත් හෝ ශාස්ත්‍රීය නිබන්ධයන් ලෙස පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව | 17 |
| පිළිගත් ජාතික පේටන්ට් බලපත්‍ර ගණන) ඉදිරිපත් කර ඇත( | 112 |
| ජාත්‍යන්තර පිළිගත් සංඛ්‍යාව) ඉදිරිපත් කර ඇත( | 11 |
| පිළිගත් කාර්මික සැලසුම් ගණන) ඉදිරිපත් කර ඇත( | 37 |
| පිළිගත් ජාතික ප්‍රකාශන හිමිකම් අයදුම්පත් සංඛ්‍යාව )ඉදිරිපත් කර ඇත) (උදා .මෘදුකාංග( | 46 |
| පිළිගත් ජාත්‍යන්තර ප්‍රකාශන හිමිකම් අයදුම්පත් සංඛ්‍යාව) ඉදිරිපත් කර ඇත) (උදා .මෘදුකාංග( | 19 |
| පිළිගත් ජාතික වෙළඳ ලකුණු සංඛ්‍යාව) ඉදිරිපත් කර ඇත( | 30 |
| පිළිගත් ජාත්‍යන්තර වෙළඳ ලකුණු සංඛ්‍යාව) ඉදිරිපත් කර ඇත( | 9 |
| පේටන්ට් සහයෝගිතා ගිවිසුම) PCT) සංඛ්‍යාව පිළිගත්තා | 17 |
| අත්සන් කරන ලද බලපත්‍ර ගිවිසුම් සංඛ්‍යාව | 62 |
| අත්සන් කළ බුද්ධිමය දේපළ පැවරුම් සංඛ්‍යාව | 7 |
| වෙළඳපොලේ ඇති නිෂ්පාදන සංඛ්‍යාව) වෙළඳපොළට පැමිණීමට හැකියාව ඇති ඒවා ඇතුළුව( | 109 |
| පර්යේෂණ වාණිජකරණය සඳහා කර්මාන්ත-විශ්වවිද්‍යාල සම්බන්ධතා (MOU හෝ ගිවිසුම්) ගණන | 125 |

(මූලාශ්‍රය : උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD))

තනි ව්‍යාපෘතිවල සාරාංශය සහ අත්පත් කරගත් දර්ශක පිළිබඳ විස්තර ප්‍රකාශයට පත් කරන ලදී::
*AHEAD, (2023). "Accelerating Invention and valorization of research in universities. AHEAD Operation, Ministry of Education. ISBN 978-955-28-0090-0*"

**රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජ්‍යකරණය (RDIC) සවිමත් කිරීම.**

වගුව .76 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 6ක් දිනා ගත් RIC/DOR ව්‍යාපෘති

| | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන | RIC ව්‍යාපෘති සංඛ්‍යාව | DOR ව්‍යාපෘති සංඛ්‍යාව | සමස්ත වියදම (රු.මිලියන) | ගිවිස ගත් දර්ශකවලින් 80%ක් ලබාගෙන ඇති මුළු ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | සිනෙක් | 0 | 2 | 19.69 | 2 |
| 2 | හොරයිසන් | 0 | 1 | 9.97 | 1 |
| 3 | KIU | 0 | 1 | 9.52 | 1 |
| 4 | Saegis | 0 | 1 | 7.83 | 1 |
| 5 | සණස | 0 | 1 | 9.30 | 1 |
| 6 | ශ්‍රී.ල.තොරතුරු තාක්ෂණ ආයතනය | 1 | 5 | 61.47 | 6 |
| | **එකතුව** | **1** | **11** | **117.78** | **12** |

මූලාශ්‍රය : උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)

## රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල RIC/DOR

වගුව 7.7 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන RIC/DOR වෙතින් ලත් ජයග්‍රහණ පිළිබඳ සාරාංශය

| ප්‍රධාන කාර්යසාධක දර්ශක | එකතුව |
|---|---|
| ප්‍රකාශිත කාර්ය පත්‍රිකා සංඛ්‍යාව | 12 |
| පිළිගනු ලැබූ සන්නිවේදනයන් (සාරාංශ (සංඛ්‍යාව | 102 |
| ජාතික සම්මන්ත්‍රණ /පරිසංවාද සඳහා ඉදිරිපත් කරන ලද පත්‍රිකා සංඛ්‍යාව | 10 |
| ජාත්‍යන්තර සම්මන්ත්‍රණ / පරිසංවාද සඳහා ඉදිරිපත් කරන ලද පත්‍රිකා සංඛ්‍යාව | 48 |
| සම-සමාලෝචනය කරන ලද ජාතික සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව | 14 |
| සම-සමාලෝචනය කරන ලද ජාත්‍යන්තරව සුවිගත කරන ලද සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව | 57 |
| කීර්තිමත් ජාතික ප්‍රකාශකයින් විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත් හෝ ශාස්ත්‍රීය නිබන්ධයන් ලෙස පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව | 3 |
| කීර්තිමත් ජාත්‍යන්තර ප්‍රකාශකයින් විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත් හෝ ශාස්ත්‍රීය නිබන්ධයන් ලෙස පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව | 2 |

| | |
|---|---|
| පිළිගත් ජාතික පේටන්ට් බලපත්‍ර ගණන) ඉදිරිපත් කර ඇත( | 3 |
| ජාත්‍යන්තරව පිළිගත් සංඛ්‍යාව) ඉදිරිපත් කර ඇත( | 1 |
| පිළිගත් කාර්මික සැලසුම් ගණන) ඉදිරිපත් කර ඇත( | 3 |
| පිළිගත් ජාතික ප්‍රකාශන හිමිකම් අයදුම්පත් සංඛ්‍යාව )ඉදිරිපත් කර ඇත) (උදා .මෘදුකාංග( | 1 |
| පිළිගත් ජාත්‍යන්තර ප්‍රකාශන හිමිකම් අයදුම්පත් සංඛ්‍යාව) ඉදිරිපත් කර ඇත) (උදා .මෘදුකාංග( | 3 |
| පිළිගත් ජාතික වෙළඳ ලකුණු සංඛ්‍යාව) ඉදිරිපත් කර ඇත( | 4 |
| පිළිගත් ජාත්‍යන්තර වෙළඳ ලකුණු සංඛ්‍යාව) ඉදිරිපත් කර ඇත( | 7 |
| පේටන්ට් සහයෝගිතා ගිවිසුම) PCT) සංඛ්‍යාව | 0 |
| අත්සන් කරන ලද බලපත්‍ර ගිවිසුම් සංඛ්‍යාව | 1 |
| අත්සන් කළ බුද්ධිමය දේපළ පැවරුම් සංඛ්‍යාව | 0 |
| වෙළඳපොලේ ඇති නිෂ්පාදන සංඛ්‍යාව) වෙළඳපොළට පැමිණීමට හැකියාව ඇති ඒවා ඇතුළුව( | 3 |
| පර්යේෂණ වාණිජකරණය සඳහා කර්මාන්ත-විශ්වවිද්‍යාල සම්බන්ධතා (MOU හෝ ගිවිසුම්) ගණන | 3 |

මූලාශ්‍රය : **උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)**

තනි ව්‍යාපෘතිවල සාරාංශය සහ අත්පත් කරගත් දර්ශක පිළිබඳ විස්තර ප්‍රකාශයට පත් කරන ලදී::
“AHEAD, (2023) Improving Research and Innovation at Non-State HEIs: A pilot study with 6 Non-State HEIs. AHEAD operation, Ministry of Education. ISBN 978-955-28-0089-4”

**පර්යේෂණ හරහා පශ්චාත් උපාධි පුහුණුව ලබාදීම.**

**AHEAD** ප්‍රතිඵල ***3*** ව්‍යාපෘති යටතේ පශ්චාත් උපාධි ලියාපදිංචි කිරීම හෝ සම්පූර්ණ කිරීම කාර්යසාධන දර්ශකයක් නොවීය. මෙය හිතාමතාම සිදු කරන ලද්දේ, පශ්චාත් උපාධි වැඩසටහනක් සම්පූර්ණ කිරීම කාර්යසාධනය මත පදනම් වූ අරමුදල් සමඟ සම්බන්ධ කිරීම, කාර්යයන් සතුටුදායක නොවුනත් උපාධිය ලබා දෙන ලෙස පරීක්ෂකයින්ට බලපෑම් කළ හැකි බැවිනි.කෙසේ වෙතත්, **AHEAD** විසින් ආයෝජනයේ වටිනාකම පෙන්වීම සඳහා පහත තොරතුරු එකතු කරන ලදී.

වගුව **7.8** ආයෝජනයේ වටිනාකම

| | **ආචාර්ය උපාධිය සඳහා ලියාපදිංචි වීම** | **දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වීම** | **විද්‍යාපති උපාධිය සඳහා ලියාපදිංචි වීම** |
|---|---|---|---|
| විශ්වවිද්‍යාලයීය ICE/RIC/DOR | 39 | 103 | 15 |
| රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි RIC/DOR | 0 | 6 | 0 |

(මූලාශ්‍රය : උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD))

DOR ව්‍යාපෘති යටතේ, පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වන උපාධිධාරීන් දිරිමත් කරන ලදී. ICE/RIC ව්‍යාපෘති වාණිජ්‍යකරණයට සම්බන්ධ බැවින්, නිබන්ධනයක් ප්‍රකාශයට පත් කිරීම බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පෙර මහජනයාට රහස්‍ය තොරතුරු සැපයීමට හේතු විය හැකි බැවින් පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වීම අනිවාර්ය නොවේ. පශ්චාත් උපාධි වැඩසටහනක් සම්පූර්ණ කිරීම AHEAD ප්‍රතිඵල ක්ෂේත්‍ර 3 හි පහළ ප්‍රතිලාභයකි.

### ප්‍රතිඵල ක්ෂේත්‍ර 3 සඳහා වැඩසටහන් සංවර්ධන අරමුණ (වියපැහැදම් සම්බන්ධිත දර්ශකය 6 -DLI 6)

**වියපැහැදම් සම්බන්ධිත දර්ශකය** (DLI 6) හා සමාන වැඩසටහන් සංවර්ධන අරමුණ (PDO 5) DOR, RIC, සහ ICE ව්‍යාපෘතිවල සාර්ථකත්වයට සම්බන්ධ වේ. තුන්වන පාර්ශ්ව සත්‍යාපන කණ්ඩායමක් විසින් සත්‍යාපනය කරන ලද පහත දැක්වෙන පරිදි සියලුම බෙදා හැරීම් සම්බන්ධිත ප්‍රතිඵල සාක්ෂාත් කර ඇත.

2022/23 සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන ප්‍රගමනය සඳහා වූ සංගමය විසින් පවත්වන ලද **වියපැහැදම්** සම්බන්ධිත දර්ශක හය (DLI 6) සත්‍යාපනය සඳහා පහත තොරතුරු දැක්විය හැක.

තවද ව්‍යාපෘති 101 ක් අතරින්,

- දර්ශක ඉලක්කයෙන් 80%කට වඩා වැඩි ICE/RIC DOR ව්‍යාපෘති: 91
- ව්‍යාපෘති 59ක් පොරොන්දු වූ ප්‍රතිඵල දර්ශකවලින් 100%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගෙන ඇත.
- ව්‍යාපෘති 32ක් පොරොන්දු වූ ප්‍රතිඵල දර්ශකවලින් 80-99%ක් ලබාගෙන ඇත.
- ව්‍යාපෘති 08ක් පොරොන්දු වූ ප්‍රතිඵල දර්ශකවලින් 50-79%ක් ලබාගෙන ඇත.
- ව්‍යාපෘති 01ක් පොරොන්දු වූ ප්‍රතිඵල දර්ශකවලින් 0%කට වඩා අඩු ප්‍රමාණයක් ලබාගෙන ඇත.
- එකක් සත්‍යාපනය කළ නොහැකි විය.

මෙම පර්යේෂණ ව්‍යාපෘති හරහා නිර්මාණය කරන ලද නව දැනුම් සම්භාරය ව්‍යාපෘති කාලය තුළ ප්‍රකාශයට පත් කරන ලද සම්පූර්ණ පත්‍රිකා 429 ක් සහ සම්මන්ත්‍රණ පත්‍රිකා 1,247 ක් තුළ ලේඛනගත කර ඇත. කීර්තිමත් ජාතික ප්‍රකාශකයින් සහ ජාත්‍යන්තර ප්‍රකාශකයින් විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත් හෝ ශාස්ත්‍රීය නිබන්ධයන් ලෙස පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව පිළිවෙලින් 26 සහ 17 කි.

### විශ්වවිද්‍යාල පර්යේෂණවල ප්‍රතිලාභ කර්මාන්තයට සහ සමාජයට ද ලබා දීම.

විශ්ව විද්‍යාල 15 තුළම විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටි ක්‍රමානුකූලව ස්ථාපිත කිරීම AHEAD මෙහෙයුම මගින් සිදු කරන ලද්දේ විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටි ලකුණු පත්‍රයක් හරහා ඒවායේ සංවර්ධනය ප්‍රවේශමෙන් අධ්‍යයනය කිරීමෙනි. විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටි විශ්වවිද්‍යාලය තුළ නිර්මාණය කරන ලද බුද්ධිමය දේපළ (IP) කළමනාකරණය කරන අතරතුර පර්යේෂණ ප්‍රතිඵල වාණිජමය වශයෙන් අත්පත් කර ගැනීමට සහාය වනු ඇත. මෙම විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටි AHEAD-අරමුදල් සහිත පර්යේෂණ මෙන්ම AHEAD-අරමුදල් නොවන පර්යේෂණ වලින් පැන නගින පර්යේෂණ වාණිජකරණයට සහාය වනු ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.

පහත දක්වා ඇති පරිදි ක්‍රියාවන් අදියර 4 කට බෙදා ඇති ලකුණු පත්‍රයක් අනුව සංවර්ධනය සිදු විය.

- 1 අදියර: මූලික විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටි පිහිටුවීම
- 2 අදියර: අභ්‍යන්තරය හඳුනා ගැනීම පර්යේෂණ සහ සංවර්ධන ශක්තිය සහ විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටි සන්නද්ධ කිරීම.
- 3 අදියර :බාහිර පාර්ශ්ව සමඟ විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටි ක්‍රියාත්මක කිරීම
- 4 අදියර: විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) කුටිවල ප්‍රතිඵලය

**විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා සංවර්ධනය (UBL)**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මගින් විශ්වවිද්‍යාල තුළ නිර්මාණය කරන ලද තාක්ෂණය සහ දැනුම සමාජයේ යහපත උදෙසා ලබා දීමට විවිධ උත්සාහයන් ගෙන ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල බුද්ධිමය දේපළ කළමනාකරණය කිරීමට සහ විද්වතුන්ට ඔවුන්ගේ පර්යේෂණ මහජන ප්‍රයෝජනය සඳහා භාවිත කිරීමට අවශ්‍ය සහාය ලබා දීමට කේන්ද්‍රස්ථාන නොතිබුණි.

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ සෑම විශ්වවිද්‍යාලයකම විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක (UBL) කුටියක් පිහිටුවීම විශ්වවිද්‍යාල-කර්මාන්ත අන්තර්ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කරන අතර නව්‍යකරණය උත්තේජනය කරන ප්‍රමාණය හඳුනා ගැනීමයි. විශ්ව විද්‍යාල විසින් දියුණු කරන ලද දැනුම සහ තාක්ෂණය සමාජයට/කර්මාන්තයට පැවරීමට මෙම ව්‍යාපාර සබඳතා (UBL) කුටි උපකාර වනු ඇත. උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) මෙහෙයුම මගින් සංවර්ධනය කරන ලද ලකුණු පත්‍රය මත පදනම්ව සංවර්ධන අදියර 4 ක් අනුගමනය කරන ලදී.

**<u>විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා(UBL) සහ Hel-SL කුටි වලින් ලද ජයග්‍රහණ .</u>**

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) මෙහෙයුම, (2023) විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා (UBL) හරහා විශ්වවිද්‍යාල පර්යේෂණවල සාර්ථක වාණිජ්‍යකරණ උත්සාහයන් හඳුනා ගැනීම."AHEAD operation, Ministry of Education ISBN 978-955-28-0087-0"

- ❖ පුද්ගලික අංශය සමඟ ඇතිකරගත් පර්යේෂණ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් ගණන: 113
- ❖ පුද්ගලික අංශය සමඟ ඇති බලපත්‍ර ගිවිසුම් ගණන: 84
- ❖ වෙළඳපොලේ ඇති නිෂ්පාදන ගණන: 48
- ❖ ජාතික බුද්ධිමය දේපල සංවිධානයේ (NIPO) හි ගොනු කර ඇති දේශීය පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව: 228
- ❖ වෙනත් බුද්ධිමය දේපළ වර්ග ගණන: 124
- ❖ පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) ගොනු කිරීමේ සංඛ්‍යාව: 22

**පර්යේෂණ සහ නවෝත්පාදන ජාත්‍යන්තර තලයට රැගෙන යාම.**

AHEAD ප්‍රතිඵල ක්ෂේත්‍ර 3 යටතේ ශ්‍රී ලංකාවේ නව නිපැයුම් ජාත්‍යන්තර තලයට ගෙනයාම සඳහා ක්‍රියාකාරකම් කිහිපයක් ආරම්භ කර ඇත.

1. පර්යේෂණ පුනරාවර්තනය වීම වැළැක්වීම සඳහා ලෝකයේ දැනට පවතින අදාළ දැනුම සෙවීම.
2. නව නිපැයුම් ඇගයීම් වාර්තා උත්පාදනය කිරීම සහ ලෝක බුද්ධිමය දේපල සංවිධානය (WIPO) යටතේ පේටන්ට් සංස්ථා ගිවිසුම (PCT) අයදුම්පත් ගොනු කිරීම: බුද්ධිමය දේපළ උපදේශනය F.J. & G. de Saram සහ Clarivate Analytics India Private Limited වෙත පිරිනමනු ලැබීය.
3. ක්‍රියා කිරීමට නිදහස ලබා දීම (FTO) සෙවුම් වාර්තා: Clarivate Analytics India Private Limited වෙත උපදේශනය පිරිනමන ලදී.

4.විදේශ බලපත්‍ර හවුල්කරුවන් සොයා ගැනීම: නව නිපැයුම් තත්ව වාර්තාව (ISR) හෝ නව නිපැයුම් ඇගයීම මත පදනම්ව මෙම උපදේශනය සඳහා විශ්වවිද්‍යාල අටකින් නව නිපැයුම් අටක් තෝරා ගන්නා ලදී. විදේශීය බලපත්‍රලාභීන් සොයා බැලීම අරමුණයි.

ISR හෝ නව නිපැයුම් ඇගයීම් වාර්තාව මත පදනම්ව මෙම උපදේශනය සඳහා විශ්වවිද්‍යාල අටකින් නව නිපැයුම් අටක් තෝරා ගන්නා ලදී.

5.විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (**UBL) සඳහා ජාත්‍යන්තර නිරාවරණය:** ලෝක බුද්ධිමය දේපල සංවිධානය සහ එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව, වාණිජ නීති සංවර්ධන වැඩසටහන **(CLDP)** සමඟ **AHEAD** අරමුදල් භාවිතයට නොගෙන පුහුණු කිරීම.

වගුව 7.9 නවෝත්පාදන සහ ඉදිරිපත් කරනු ලබන විශ්වවිද්‍යාල

| තාක්ෂණය | විශ්වවිද්‍යාල |
|---|---|
| ආමන්ත්‍රණය කළ හැකි දත්ත සන්නිවේදනය | කැලණිය විශ්වවිද්‍යාලය |
| නැවත සකස් කළ හැකි සංකෝචන ස්නායුක ජාල ප්‍රොසෙසරය | රුහුණු විශ්වවිද්‍යාලය |
| බුද්ධිය සහිත කැමරාව | මොරටුව විශ්වවිද්‍යාලය |
| ස්වයංක්‍රීය අකුණු ආරක්ෂණය සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය | කොළඹ විශ්වවිද්‍යාලය |
| විඛාදනයට ප්‍රතිරෝධය සඳහා සිමෙන්ති මිශ්‍රණය | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව |
| අතේ ගෙන යා හැකි ස්වයංක්‍රීය විමෝචන මොනිටරය | යාපනය විශ්වවිද්‍යාලය |
| ඉඩම් ලක්ෂණ පද්ධතිය සඳහා ෆයිබර් ඔප්ටික් සංවේදක | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය |
| බහාලුම් කළමනාකරණ පද්ධතිය | CINEC කැම්පස් |

(මූලාශ්‍රය : උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) )

7.2 රූපය: ආමන්ත්‍රණය කළ හැකි දත්ත සන්නිවේදනය -කැලණිය විශ්වවිද්‍යාලය






මෙම පද්ධතිය ඉහළ අභිරුචිකරණයකින් යුක්ත වන අතර විශේෂිත යෙදුමකට සීමා නොවේ. එපමණක් නොව, මෙම පද්ධතිය IoT- ( Internet of Things) පද්ධතිවල පවතින ගැටලු, එනම් අන්තර්ජාලය හෝ ක්ලවුඩ් සර්වර් අසමත් වීමකදී සන්නිවේදනය නතර කිරීම වැනි ගැටලු ජය ගනී.

7.3 රූපය: නැවත වින්‍යාස කළ හැකි සංවලිත ස්නායුක ජාල පොසෙසරය (Reconfigurable convolution neural network processor) - රුහුණ විශ්වවිද්‍යාලය



පසුගිය දශක කිහිපය තුළ විද්‍යාඥයන් විසින් ජීව විද්‍යාත්මක මොළය අභිරූපණය කරන කෘතිම ස්නායු ජාල (ANNs) සංවර්ධනය කිරීමේ ක්‍රමයක් සොයා ගනු ලැබූහ. සංවලිත ස්නායුක ජාල (Convolutional Neural Networks (CNNs)) මෙම කෘතිම ස්නායු ජාලවල වර්ගීකරණය සහ යාන්ත්‍රික දර්ශන කාර්යයන් සඳහා නිතිපතා භාවිතා වේ.

7.4 රූපය: බුද්ධියක් සහිත (Intelligent) කැමරාව - මොරටුව විශ්වවිද්‍යාලය

පසුගිය දශක දෙක තුළ, නිරීක්ෂණ කැමරා (CCTV) මූලික වශයෙන් අධි ආරක්ෂිත කලාපවල භාවිතා කරන උපාංගවල සිට විවිධ අධීක්ෂණ අරමුණු සඳහා විවිධ පරිශීලකයින් විසින් භාවිතා කරන වෙළඳ භාණ්ඩයක් දක්වා පරිණාමය වී ඇත: විශාල සිල්ලර වෙළඳසැල්, මාර්ග, සුහුරු නගර සහ නිවාස ආදිය වේ. කෙසේ වෙතත්, ක්‍රියාකරුවන් නොමැතිව, වීඩියෝ විශ්ලේෂණ සැකසුම්කරණය නොමැති විට CCTV වල ඵලදායීතාවය සීමිතය.




**පද්ධතියේ ක්‍රමාණුරූප සටහන**

### 7.3.2. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුව -ණය) – STHRDP

STHRD ව්‍යාපෘතියේ නිමැවුම් 03 ක්‍රියාත්මක කරනු ලබන්නේ කර්මාන්ත සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා වන අතර, මෙම කාර්යය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 6 ක ඇස්තමේන්තුගත අයවැයක් වෙන් කර ඇත. මෙම නිමැවුම යටතේ, සහභාගී වන පීඨවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIUs); කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨය, සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය, රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සහ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය යන පීඨයන්හි පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා සහාය වීම සඳහා කර්මාන්ත හවුල්කරුවන් සහ විශ්වවිද්‍යාල සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගෙන ඇත.

විශ්වවිද්‍යාල-විශ්වවිද්‍යාල හවුල්කාරිත්වයන් සහ විශ්වවිද්‍යාල-කර්මාන්ත සහයෝගීතාවයන් යන දෙකම ව්‍යාපෘතියේ පර්යේෂණ සංරචකයට අත්‍යවශ්‍ය වේ. විශ්ව විද්‍යාල, ඔවුන්ගේ හවුල්කරුවන් සමඟ සහයෝගයෙන්, පහත සඳහන් දෑ කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා හවුල්කාරිත්වයක් ඇති කර ගෙන ඇත:

(1) කර්මාන්ත අභියෝගවලට මුහුණ දීම හෝ නව්‍ය නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීම.

(2) සිසුන්ගේ රැකියා නියුක්තිය වැඩි දියුණු කිරීම සහ පවතින සේවකයින් සඳහා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය ආශ්‍රිත ක්ෂේත්‍රවල කර්මාන්ත ඉල්ලුම සපුරාලීම.

3) ශාස්ත්‍රාල හා කර්මාන්ත අතර සහයෝගීතාවයේ නව ආකෘති ප්‍රවර්ධනය කිරීම.

ඊට අමතරව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක පහත පරිදි සුප්‍රකට විදේශීය විශ්වවිද්‍යාල සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගෙන ඇත:

අ. පීඨ සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්.
ආ. උසස් අධ්‍යාපනයේ නව්‍ය ඉගැන්වීම් සහ ඉගෙනුම් පිළිවෙත්.
ඇ. විශේෂයෙන් කර්මාන්තයට අදාළ ක්ෂේත්‍රවල

ඒකාබද්ධ පර්යේෂණ ක්‍රියාකාරකම්. අමාත්‍යාංශය මගින් පිහිටුවන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ඇගයීමට ලක් කරන ලද තරඟකාරී ලෙස තෝරාගත් යෝජනා සඳහා සහාය වීම සඳහා මෙම ව්‍යාපෘතිය ප්‍රදාන සපයනු ලබයි. මෙම ප්‍රදානවල ප්‍රගතිය එම කමිටුව විසින්ම අර්ධ වාර්ෂිකව තක්සේරු කරනු ලැබේ. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර 7.10 වගුවේ දක්වා ඇත.

## 7.4 2023 වර්ෂයේ ලබාගත් පේටන්ට් බලපත්‍ර

ජාතික මට්ටමින් අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් 2023 දී පේටන්ට් බලපත්‍ර 30 ක් ගොනු කර ඇත. කැළණිය විශ්වවිද්‍යාලය බලපත්‍ර 7ක් ද, ශ්‍රී ජයවරධනපුර විශ්වවිද්‍යාලය බලපත්‍ර 6 ක් ද. මොරටුව විශ්වවිද්‍යාලය සහ රජරට විශ්වවිද්‍යාලය බලපත්‍ර 03ක්ද ගොනු කර ඇත.

රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ජාතික මට්ටමේ පේටන්ට් බලපත්‍ර 10ක් සඳහා ජාතික මට්ටමේ අනුමැතිය සහ ජාත්‍යන්තර මට්ටමේ අනුමැතීන් 04ක් ලැබී ඇත. සවිස්තර වාර්තාව **ඇමුණුම E** හි දක්වා ඇත.

වගුව 7.10 ප්‍රදානය කිරීමේ පර්යේෂණ යෝජනාවේ ප්‍රගතිය - 2024.12.31 වන විට (විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය)

**රු.මිලියන**

| තරඟකාරී ප්‍රදාන යෝජනා ක්‍රමය-ලබා දෙන ලද ප්‍රදාන | කර්මාන්ත හවුල්කාරිත්වය | මුදල | විශ්වවිද්‍යාල හවුල්කාරිත්වය-අන්තර් විශ්වවිද්‍යාල -අන්තර් පීඨ | මුදල | ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හවුල්කාරිත්වය | මුදල | ප්‍රදානය කළ මුළු මුදල | සමුච්චිත මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|
| කැලණිය විශ්වවිද්‍යාලය – **1-3 වටය** | 2 | 42.22 | 4 | 332.71 | 0 | - | 374.93 | 64.95 |
| සබරගමුව විශ්වවිද්‍යාලය **2-3** වටය | - | - | 4 | 75.84 | 2 | 389.87 | 465.71 | 239.99 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය **1-3** වටය | 5 | 47.31 | 8 | 428.23 | 1 | 169.90 | 645.44 | 121.09 |
| රජරට විශ්වවිද්‍යාලය **1-3** වටය | 2 | 245.41 | 3 | 206.39 | 2 | 385.89 | 837.69 | 107.19 |
| **එකතුව** | **9** | **334.94** | **19** | **1,043.17** | **5** | **945.66** | **2,323.77** | **533.22** |

## 7.5 අයවැය යෝජනා මත ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘති

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ නවීනතම පර්යේෂණ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම සඳහා 2024 වර්ෂයේ අයවැය යෝජනාවක් වශයෙන් අමාත්‍යාංශයේ අරමුදල් යටතේ රුපියල් මිලියන 40ක ප්‍රතිපාදන ලබා දී ඇත.

### 7.5.1 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ නවීනතම පර්යේෂණ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම.

මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 850 ක් වෙන් කර ඇති අතර 2024 වර්ෂයේ අයවැය යෝජනාවක් වශයෙන් අමාත්‍යාංශයේ අරමුදල් යටතේ රුපියල් මිලියන 40ක ප්‍රතිපාදන ලබා දී ඇත.
මෙම වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේ කටයුතු සියල්ල මේ වන විට අවසන් කර ඇත.

**ව්‍යාපෘතියේ ප්‍රගතිය**

- සෞඛ්‍ය අමාත්‍යාංශයට PCR පරීක්ෂණ සිදුකිරීමට අපහසු වූ විට ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මෙම උපකරණ භාවිත කරමින් 2020 සහ 2021 කාලපරිච්ඡේදය තුළ PCR සහ ප්‍රතිදේහ පරීක්ෂණ සිදු කරමින් වසංගතයට කඩිනම් ප්‍රතිචාරයක් දක්වන ලදී. පළමු ශ්‍රී ලාංකික රෝගියා හඳුනා ගන්නා ලද්දේ ද විද්‍යාගාරයකිනි. මීට අමතරව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ PCR රසායනාගාර කිහිපයක් ස්ථාපිත කිරීමට සහාය හා පුහුණුව ලබා දෙන ලදී.
- අසාත්මිකතා පරීක්ෂණ සේවා ආරම්භ කර උපදේශන 5000කට වඩා සිදු කර ඇත. (සේවාවන් ද ඇතුළත් ව)
- In Vitro Diagnostics: උසස් රසායනාගාර පදනම් වූ අසාත්මිකතා පරීක්ෂණ සිදු කිරීම.
- Skin Prick Tests: On-site ඉක්මන් අසාත්මිකතා රෝග විනිශ්චය සිදු කිරීම.

**අපට වැලඳිය හැකි විවිධ අසාත්මිකතා වර්ග හඳුනා ගැනීම.**

මෙම ප්‍රදානය හරහා මිලදී ගත් උපකරණ භාවිතා කරමින් අසාත්මිකතා රෝග නිර්ණය කිරීමේ පහසුකම සමස්ත රටටම ලබා දීම සහ දරුණු අසාත්මිකතා ඇති රෝගීන් තුළ අසාත්මිකතා ඇතිවීමට හේතුව හඳුනා ගැනීම. (දකුණු ආසියාවේ ඇති එකම ස්ථාපනය මෙය වේ.

1. ඇනෆිලැක්සිස්: දරුණු අසාත්මිකතා ප්‍රතික්‍රියා හඳුනා ගැනීම.
2. ආහාර අසාත්මිකතා: පොදු සහ දුර්ලභ ආහාර අසාත්මිකතා සඳහා පරීක්ෂා කිරීම.
3. ශ්වසන අසාත්මිකතා: පරාග, දූවිලි සහ අනෙකුත් ආශ්වාස අසාත්මිකතාවන් හඳුනා ගැනීම.
4. වෘත්තීය අසාත්මිකතා: රැකියා ආශ්‍රිත අසාත්මිකතාවන් හඳුනා ගැනීම.
5. ඖෂධ අසාත්මිකතා: ඖෂධ සඳහා අහිතකර ප්‍රතික්‍රියා සඳහා පරීක්ෂා කිරීම.

මෙම ව්‍යාපෘතිය හරහා සපයාගත් උපකරණ භාවිතා කරමින් ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ වෛරස් වල සම්පූර්ණ ප්‍රවේණික අනුක්‍රම නිර්ණය සිදු කර ඇත.

මෙම ව්‍යාපෘතියෙන් ලද උපකරණ ශ්‍රී ලංකාවේ පර්යේෂණ කටයුතු සිදු කිරීම මගින් පහත සඳහන් විදේශ පර්යේෂණ ප්‍රදානයන් දිනා ගැනීමට උපකාරී විය.

- ඇ.ඩො. මිලියන 0.23ක් වටිනා Asian and American Center for Arbovirus Research and Enhanced Surveillance (A2CARES) NIIAD ප්‍රදානය ලබා ගන්නා ලදී.
- නැගී එන සහ නැවත මතුවන වෛරස් ආසාදන සඳහා ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාර විමර්ශනය කිරීම සඳහා එන්නත් සංවර්ධන ප්‍රයත්නවල කොටසක් ලෙස එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීතා ව්‍යාපෘතියක් සඳහා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයෙන් රුපියල් මිලියන 10 ක ප්‍රදානය කිරීම.
- ලෝක සෞඛ්‍ය සංවිධානය වෙතින් ජාන අනුක්‍රමණය පිළිබඳ පර්යේෂණ සඳහා ප්‍රදානය - ඇ.ඩො. 300,000 (රුපියල් මිලියන 60).
- දකුණු කොරියාවේ SKK විශ්වවිද්‍යාලයේ LUPIC ව්‍යාපෘතිය මගින් USD 333,333 (වසරකට) ලබා දී ඇත.
- **Well Come Trust Grant** වෙත අවසන් වටය සඳහා කෙටි ලැයිස්තුගත කර අයදුම්පත ඉදිරිපත් කිරීම.
- ලන්ඩනයේ ඉම්පීරියල් විද්‍යාලය සමඟ උපදේශන ගිවිසුම- 44166.67 GBP.

# 08

# ඉදිරි ක්‍රියාමාර්ග 2025

නව රජයේ ප්‍රතිපත්ති රාමුව මගින් අවධාරණය කරනු ලබනුයේ සමාජ පරිවර්තනය යනු එක් ක්ෂේත්‍රයක හෝ දෙකක පරිවර්තනයෙන් ඔබ්බට ගිය පුනරුදයකි. කෙසේ වෙතත්, අධ්‍යාපනය රජයේ මූලික වගකීමකි. හඳුනාගෙන ඇති ප්‍රධාන මූලධර්ම වන්නේ නිදහස් අධ්‍යාපනය සහ සම ප්‍රවේශය, මානව සංවර්ධනයට හා සේවා නියුක්තියට අදාළත්වය, සියල්ලන්ටම පිළිගත හැකි බව, සමාජයට වගකියන පුරවැසියන්, තිරසාරභාවය සහ නවෝත්පාදනය මෙන්ම යාවජීව අධ්‍යාපනයයි.

ඉහත මූලධර්මවලට අනුකූලව, ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය උසස් න්‍යායික සහ පර්යේෂණාත්මක අධ්‍යාපනයක් සපයන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීමට අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබා දෙන සමාන්තර විශ්වවිද්‍යාල පද්ධතියක් ස්ථාපිත කිරීමට ද කටයුතු කරනු ඇත.

## 8.1 උසස් අධ්‍යාපන ප්‍රවේශයේ සාධාරණත්වය සහ අන්තර්ගතබව සහතික කිරීම

විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන උසස් අධ්‍යාපනය සඳහා ඉල්ලුම මත පදනම් වූ ප්‍රවේශයන් මත පදනම්ව සිසුන් බඳවා ගැනීම ඉහළ නැංවීමට පියවර ගත යුතුය. රාජ්‍ය විශ්වවිද්‍යාල අදාළ විෂය පථයන් යටතේ මෙහෙයවීමේ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු වේ.

### 8.1.1 ප්‍රවේශ ප්‍රතිපත්තිය පරිණාමනය

වත්මන් විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය සඳහා නව්‍ය වැඩි දියුණු වූ ප්‍රවේශ ක්‍රමවේදයන් හඳුන්වාදීම පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

දැනට ක්‍රියාත්මක විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලිය අ.පො.ස. (උ/පෙළ) විභාගයේ සිට විශ්වවිද්‍යාලයට බඳවා ගැනීමේ මට්ටම දක්වා සමාලෝචනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පියවර ගත යුතුව ඇත. ඒ මත පදනම්ව, විභාග දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ආදී සියලුම සම්බන්ධිත ආයතන අතර ගතවන කාලය අවම කිරීමට සහ පරතරයන් අවම කිරීමට ඒකාබද්ධ ප්‍රවේශයක් හඳුන්වා දිය යුතු වේ. තොරතුරු කළමනාකරණය පවත්වා ගැනීම සඳහා නිසි ඩිජිටල් වේදිකාවක් හඳුන්වා දිය හැකිය.

තවද, ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාලවල උපාධි හැදෑරීම සඳහා උසස් පෙළ සමතුන්ට වසරකට ශිෂ්‍යත්ව 200 ක් පිරිනැමීමට රජය විසින් අපේක්ෂා කරනු ලබයි.

### 8.1.2 යටිතල පහසුකම්

පසුගිය දශකය තුළ, උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඉහළ නැංවීම පිණිස අමාත්‍යාංශය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. උසස් අධ්‍යාපනය සඳහා කරන ආයෝජනයන් තුළින් වඩා හොඳ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මෙම වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ගයන් වඩාත් අර්ථවත් ආකාරයෙන් සිදු කෙරෙනු ඇත.

### 8.1.3 දුරස්ථ අධ්‍යාපනය

තෘතීයික අධ්‍යාපනයේ ඉතා වැදගත් සංරචක ලෙස විවෘත හා දුරස්ථ අධ්‍යාපනයේ වැදගත්කම හඳුනා ගනිමින්, විවිධ හේතු මත තෘතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට නොහැකිවූවන්ට අවස්ථා ලබා දීම විවෘත විශ්වවිද්‍යාල ව්‍යාප්ති සංරචකවල අරමුණයි. මෙයට විවිධ වෘත්තීන්හි නියැලී සිටින, තම තෘතීයික අධ්‍යාපන අවශ්‍යතා සපුරා ගැනීමට අපේක්ෂා කරනු ලබන පුද්ගලයින් ඇතුළත් වේ. රැකියා තත්ත්වය හෝ භූගෝලීය සාධක මත පදනම්ව බාධාවකින් තොරව උසස් අධ්‍යාපනයට ප්‍රවේශය සහතික කිරීම සඳහා විවෘත හා දුරස්ථ අධ්‍යාපනය පුළුල් කරනු

ලැබේ. ඒ අනුව , ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පහසුකම් පුළුල් කිරීමට රජය විසින් අපේක්ෂා කරනු ලබයි.

## 8.2 උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම.

දැක්ම මත පදනම් වූ ආර්ථික දර්ශනයේ ඉදිරි දර්ශන අනුව, දැනුම් ආර්ථික ප්‍රවේශය මත පදනම් වූ චින්තනය වැදගත් වේ. මෙහිදී දැනුම් ආර්ථිකයේ ප්‍රධාන අංගයක් ලෙස උපාධිධාරීන් පරිණාමනය කිරීම මග හැරිය නොහැකි ක්‍රියාවලියකි.

පර්යේෂණ හා සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල දායකත්වය ආර්ථිකයේ ගාමක බලවේගය විය යුතුය. උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා බලපවත්නා ප්‍රධාන පරිණාමයන් ලෙස විශ්වවිද්‍යාල නවීකරණය හා ගුණාත්මකභාවය ඉහල නැංවීම, අධ්‍යයන පාඨමාලාවල අන්තර්ගතය වැඩිදියුණු කිරීම මෙන්ම විද්‍යාර්ථීන්ගේ සහ සිසුන්ගේ චර්යාත්මක වෙනස්වීම්ද බලපානු ලැබේ.

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව, සිසුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා තෘතියික අධ්‍යාපන ආයතනවල අන්තර්ජාල පහසුකම් සම්පාදනය වැනි අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම, දේශන ශාලා, විද්‍යාගාර, පුස්තකාල, නේවාසිකාගාර සහ ආපනශාලා සඳහා නිසි ප්‍රමිතීන්ට අනුකූලව පහසුකම් සැලසීම පිළිබඳව සාකච්ඡා කිරීම ප්‍රධාන අරමුණු වේ. තවද, ජීවන වියදමට අනුකූලව මහපොළ සහ අනෙකුත් ශිෂ්‍යාධාර ඉහළ නැංවීම සඳහා අමතර අරමුදල් වෙන් කළ යුතු වේ.

## 8.3 ද්විතීයික හා තෘතියික අධ්‍යාපනය විශ්වීයකරණය.

උසස් අධ්‍යාපනයේ වර්ධනය සඳහා ද්විතීයික අධ්‍යාපනය ඵලදායී විය යුතුය. ද්විතීයික මට්ටමේ අධ්‍යාපන ආයතන අතර ඇති ප්‍රබල වෙනස්කම් තෘතියික අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට අහිතකර ලෙස බලපානු ඇත. තෘතියික හෝ උසස් අධ්‍යාපන ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්තිය උසස් අධ්‍යාපනය කෙරෙහි පමණක් අවධානය යොමු නොකළ යුතු අතර ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ කාර්යක්ෂමතාව සහ ගුණාත්මකබව වැඩිදියුණු කිරීමේ වැදගත්කම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

එම ප්‍රතිපත්තියට අනුකූලව, සිසුන්ට පශ්චාත් උපාධි අවස්ථා සුරක්ෂිත කර ගැනීමට ඉඩ සලසන සබඳතා වර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා කුසලතා ඇතුළු මූලික සුදුසුකම් ඔප් නැංවීම පිණිස රජය විසින් සෑම තෘතීයික අධ්‍යාපන ආයතනයකම විශේෂ ඒකක ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනු ලබයි.

## 8.4 උසස් අධ්‍යාපනය නිසි ලෙස විවිධාංගීකරණය කිරීම.

සමාජයේ අවශ්‍යතා වඩාත් හොඳින් සපුරාලීමේ හා සේවා නියුක්තිය සහතික කිරීමේ අරමුණින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම අවශ්‍ය වේ. "දැනුමැති සමාජයක්" බිහි කිරීම උසස් අධ්‍යාපනයේ අභියෝග සහ ඉදිරි අවස්ථාවන් සලකා බැලීමේ දී සමාජයේ වඩාත් උචිත අනාගත සන්දර්භ අතරින් එකකි.

## 8.5 උසස් අධ්‍යාපන විෂය පථය සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන යාන්ත්‍රණය හඳුන්වාදීම.

වත්මන් ගෝලීය උසස් අධ්‍යාපන අවස්ථා සහ ප්‍රවණතා මනාව විමර්ශනය කිරීමෙන් අනතුරුව, රාජ්‍ය විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන යන දෙකෙහිම තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති නියෝග සකස් කිරීම ඉතා වැදගත් බව පැහැදිලි වේ. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙස, උසස් අධ්‍යාපනයේ සමස්ත විෂය පථයම ආවරණය වන පරිදි පුළුල් තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන යාන්ත්‍රණයක් හඳුන්වා දීම නිර්දේශ කෙරේ.

රාජ්‍ය විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන දෙකෙහිම ප්‍රමිතීන් ඇගයීම සඳහා මෙම යාන්ත්‍රණය ජාතික වශයෙන් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතු අතර, එමගින් ක්ෂේත්‍රය පුරා සංගතභාවය සහ විශිෂ්ටත්වය සහතික කෙරේ.
තවද, උසස් අධ්‍යාපනය පිළිබඳ පනත් කෙටුම්පතක් දැනටමත් කෙටුම්පත් කර ඇති අතර උක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවසානාත්මක ලේඛනය සකස් කර ඵලදායී අයුරින් ක්‍රියාවට නැංවිය හැකිය.

### 8.6 ටෝකියෝ සම්මුතිය සහ උසස් අධ්‍යාපනයට අදාළ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ ගෝලීය සම්මුතිය සහ ජාතික තොරතුරු මධ්‍යස්ථානයක් (NIC) ස්ථාපිත කිරීම.

ටෝකියෝ සම්මුතිය සහ උසස් අධ්‍යාපනයට අදාළ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ ගෝලීය සම්මුතිය සහ ජාතික තොරතුරු මධ්‍යස්ථානයක් (NIC) පිහිටුවීම සමඟින් ශ්‍රී ලංකාවට උසස් අධ්‍යාපනයේ සුදුසුකම් පිළිගැනීම වැඩිදියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවට සැලකිය යුතු ප්‍රතිලාභයක් ලැබෙනු ඇත.

- **ටෝකියෝ සහ ගෝලීය සම්මුතීන් අපරානුමත කිරීම**:
  විදේශීය සුදුසුකම් පිළිගැනීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබේ. මෙමගින් ශ්‍රී ලාංකීය ආචාර්ය-ශිෂ්‍ය ප්‍රජාවට සහ රැකියා සොයන්නන්ට ජාත්‍යන්තරව සහ කලාපීය වශයෙන් බාධාවකින් තොරව සංචලනය වීමට පහසුකම් සැලසේ.
- **ජාතික තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත** උසස් අධ්‍යාපන සුදුසුකම්, පිළිගැනීමේ ක්‍රියා පටිපාටි සහ ආයතනවල තත්ත්වය පිළිබඳ විනිවිද පෙනෙන සහ බලයලත් තොරතුරු සැපයීම සඳහා වගකිව යුතු මධ්‍යම ආයතනයක් ලෙස ජාතික තොරතුරු මධ්‍යස්ථානය කටයුතු කරනු ඇත. මෙමගින් ශ්‍රී ලාංකීය සුදුසුකම් ගෝලීය වශයෙන් වඩාත් පිළිගැනීමකට සහ සංසන්දනයකට ලක් වන අතරම සුදුසුකම් පිළිගැනීමේ ක්‍රියාවලියේ අනුකූලතාව සහ විශ්වසනීයත්වය සහතික කරනු ඇත.

සාමූහිකව, මෙම ප්‍රයත්නයන් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්‍රමයේ ගෝලීය ඒකාබද්ධතාවය, අධ්‍යයන හුවමාරුව, ශිෂ්‍ය සංචලනය සහ සුදුසුකම් අන්‍යෝන්‍ය වශයෙන් පිළි ගැනීම දිරිමත් කරමින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකබව සහ ජාත්‍යන්තර කීර්තිය ඉහළ නැංවීමට ඉවහල් වනු ඇත.

### 8.7 උසස් අධ්‍යාපනයේ ඩිජිටල්කරණය සහ ඩිජිටල් සාක්ෂරතාවය දියුණු කිරීම.

උසස් අධ්‍යාපන ක්‍රමය ඩිජිටල්කරණය කිරීම ප්‍රවේශ්‍යතාව, කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. සියලුම උසස් අධ්‍යාපන ආයතන පුරා ශක්තිමත් ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS), විශ්වවිද්‍යාල තොරතුරු කළමනාකරණ පද්ධතියක් (UIMS), ඩිජිටල් පුස්තකාල සහ අථත්‍ය විද්‍යාගාර ස්ථාපිත කිරීම මෙම උත්සාහයන්ට ඇතුළත් විය යුතුවේ. සිසුන්, පීඨය සහ පරිපාලන කාර්ය මණ්ඩලය අතර ඩිජිටල් සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු අතර, එමඟින් ඔවුන් ඩිජිටල් මෙවලම් ඵලදායී ලෙස භාවිතා කිරීමට සහ ඒකාබද්ධ කිරීමට සන්නද්ධ වීම සහතික කෙරේ. තවද, ඩිජිටල් යුගයේ ඉගෙන ගන්නන්ගේ විකාශනය වන අවශ්‍යතා සපුරාලීම සඳහා මාර්ගගත සහ දෙමුහුන් අධ්‍යාපන ආකෘති සඳහා ජාතික රාමුවක් සංවර්ධනය කළ යුතුය.

#### 8.7.1 නිසි ලෙස යාවත්කාලීන කරන ලද විශ්වසනීය සහ නිරවද්‍ය කුසලතා දත්ත සහ ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් (LMIS) ස්ථාපිත කිරීම

ශ්‍රම වෙළඳපොළ නිපුණතා අවශ්‍යතාවන් (ඉල්ලුම් පාර්ශ්වය) සහ සමස්ත උසස් අධ්‍යාපන පද්ධතියෙන් බිහි වූ උපාධිධාරීන් (සැපයුම් පාර්ශ්වය) අතර පරතරය පියවා ගැනීම සඳහා තීරණ ගැනීම සඳහා (ගුණාත්මයට එදිරිව ප්‍රමාණය) නිසි ලෙස යාවත්කාලීන කරන ලද විශ්වසනීය සහ නිරවද්‍ය කුසලතා දත්ත සහ ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් (LMIS) ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. මෙම පද්ධතිය කර්මාන්ත හා විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ කිරීම තුළින් ඉහත සඳහන් කළ ජාතික තොරතුරු මධ්‍යස්ථානය සමඟ ද අනුබද්ධ කළ හැක.

### 8.8 උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික-රාජ්‍ය හවුල්කාරිත්ව ආකෘති හඳුන්වාදීම

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සහ පුළුල් කිරීම සඳහා ඵලදායී ප්‍රවේශයක් විය හැකිය.

උසස් අධ්‍යාපනය සඳහා මූලික සුදුසුකම් සපුරාලන සිසුන්ට පහසුකම් සැලසීමට රාජ්‍ය අධ්‍යාපන පද්ධතියට ඇති සීමිත ධාරිතාව හේතුකොට ගෙන, පෞද්ගලික විශ්වවිද්‍යාල සහ අනෙකුත් පෞද්ගලික තෘතියික අධ්‍යාපන සැපයුම්කරුවන් ඇතුළු පෞද්ගලික අධ්‍යාපන ආයතන සඳහා සැලකිය යුතු ඉල්ලුමක් පවතී.

වර්තමානයේ, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය උසස් අධ්‍යාපන අංශය විසින් ස්ථාපිත කරන ලද නියාමන යාන්ත්‍රණයක් යටතේ ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, විදේශීය විශ්වවිද්‍යාල සමඟ අනුබද්ධිත ආයතන විශාල සංඛ්‍යාවක් මෙම රාමුවෙන් පිටත ක්‍රි නියාමනයකින් තොරව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ආයතන බොහෝ විට පාඨමාලාවන්හි ගුණාත්මකභාවය සහ ශාස්ත්‍ර ව්‍යුහයන් සම්බන්ධයෙන් අධීක්ෂණයක් නොමැතිව ක්‍රියාත්මක වෙමින් පවතී.

රජට විසින් නියාමනය කරන ආයතන මෙන් නොව, මෙම නියාමනයකින් තොර ආයතන ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන්නේ ලාභ ඉපැයීමේ පදනමක් මත වන අතර, ප්‍රමිතිගත ශාස්ත්‍ර ව්‍යුහයක් ක්‍රියාත්මක නොවේ. මෙසේ නියාමනයක් නොමැතිව ක්‍රියාත්මක වීම, මෙම අංශයේ සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් සහ දැරිය හැකි මිලක් සහතික කිරීම සඳහා අභියෝග මතු කරයි. එබැවින්, අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ සිසුන්ගේ අභිප්‍රායන් ආරක්ෂා කිරීම සඳහා විදේශීය විශ්වවිද්‍යාල සමඟ අනුබද්ධිත ආයතන ඇතුළත් සියලුම පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අධීක්ෂණය කිරීම සඳහා පුළුල් නියාමන යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

## 8.9 පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

සංකල්පිත කර්මාන්ත ගවේෂණය කිරීම සහ රටේ ව්‍යවසායකත්ව වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම මගින් පර්යේෂණ සහ සංවර්ධන ප්‍රයත්නයන් වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම සන්දර්භය තුළ, තෝරාගත් උපාධි අපේක්ෂකයින්ගේ රැකියා නිපුණතා ශ්‍රම වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි වැඩිදියුණු කිරීම සඳහා අති නවීන විද්‍යාව, (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිත (STEM) අධ්‍යාපනය, කාර්මික හා තාක්ෂණික පාඨමාලා සහ පීඨ පිහිටුවීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව, රජය සෑම විශ්වවිද්‍යාලයක් තුළම ව්‍යවසායකත්ව ප්‍රයත්නයන් සඳහා පහසුකම් සපයන අතර, අත්‍යවශ්‍ය නිපුණතා සපිරි මානව සම්පත් වලින් සමන්විත වෙනම පරිපාලන ඒකකයක් හරහා ඒවා ප්‍රවර්ධනය කළ හැකිය.

එක් එක් ඒකකය සඳහා විභව්‍ය ව්‍යවසායකත්ව වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් පහත පරිදි හඳුනාගත හැකිය.

අ) උපදේශන සේවා

ආ) පුහුණු සේවා

ඇ) පර්යේෂණ සහ සංවර්ධන සේවා (නියැදි විශ්ලේෂණය, ආදිය)

ඈ) තාක්ෂණික පරිණාමන සේවාව (ස්වයංක්‍රීයකරණය/ කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) සංවර්ධනය, ඩිජිටල් අලෙවිකරණය ආදිය)

## 8.10 ගෝලීය විශ්වවිද්‍යාලයන් ලෙස විශිෂ්ටත්වයට පත්වීම සඳහා උපායමාර්ගික ජාත්‍යන්තරකරණය.

ගෝලීය පිළිගැනීමක් ලබා ගැනීමට සහ ලෝකයේ ඉහළම ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයන් බවට පත්වීමට නම්, උපායමාර්ගික ජාත්‍යන්තරකරණ ප්‍රයත්නයන් සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. ගෝලීය වශයෙන් කීර්තිමත් ආයතන සමඟ හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම, විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීම ප්‍රවර්ධනය කරමින් දේශසීමාවලින් ඔබ්බට අධ්‍යාපනය සඳහා අවස්ථා ඇති කිරීම සහ ද්විත්ව හෝ ඒකාබද්ධ උපාධි පාඨමාලා සඳහා අවස්ථා මෙයට ඇතුළත් වේ. විශ්වවිද්‍යාල තුළ ඒ සඳහා වෙන් වූ ජාත්‍යන්තර සබඳතා කාර්යාලයක් (IRO) ස්ථාපිත කිරීම ගෝලීය සහයෝගීතාව වැඩි දියුණු කිරීම, පීඨ සහ ශිෂ්‍ය හුවමාරු ප්‍රවර්ධනය කිරීම සහ ජාත්‍යන්තර අරමුදල් ආකර්ෂණය කර ගැනීම සඳහා උපකාරී වේ. ගෝලීය ශ්‍රේණිගත කිරීම් සහ ප්‍රතීතන ක්‍රියාවලීන්හි සහභාගීත්වය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශයේ කැපී පෙනීම සහ කීර්ති නාමය තවදුරටත් ඉහළ නංවනු ඇත.

**අවසන් වශයෙන්,** උසස් අධ්‍යාපනයේ සිදුවන උත්ශ්‍රේණිගත කිරීම් රටේ ආර්ථික වර්ධනය, ජනගහනයේ යහපැවැත්ම, රැකියා උත්පාදනය සහ ජාතික සංවර්ධනය සඳහා ක්‍රම සහ විධි සොයා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

# 2024 වර්ෂයේ ප්‍රගතිය හා 2025 වර්ෂයේ ඉදිරි ගමන් මග

# 2024 வருடத்திற்கான முன்னேற்றம் மற்றும் 2025 வருடத்திற்கான எதிர்கால பயணப் பாதை

# The Progress of 2024 and the Way Forward 2025

**වෙළුම III - වෘත්තීය අධ්‍යාපන**

இதழ் III - தொழில் கல்வி

Volume III - Vocational Education

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ප්‍රගතිය 2024 හා ඉදිරි ගමන් මග 2025

## වෙළුම III

වෘත්තීය අධ්‍යාපන අංශය

**දැක්ම**

නිපුණත්වයෙන් සපිරි ශ්‍රම බලකායක්

**මෙහෙවර**

දැනුමෙන්, වෘත්තීය නිපුණතාවයෙන් හා කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහි කිරීම සඳහා පසුබිම සැකසීම

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | හැඳින්වීම | 01 |
| 02. | සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය, සිසුන් බඳවාගැනීම, මූල්‍ය ප්‍රගතිය සහ 2025 වර්ෂය සඳහා ඉලක්ක | 03 |
| 03. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) | 13 |
| 04. | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) | 16 |
| 05. | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTASL) | 21 |
| 06. | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) | 28 |
| 07. | ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය (CGTTI) | 32 |
| 08. | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය (UNIVOTEC) හා ඒ යටතේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල විද්‍යායතන | 35 |
| 09. | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (OCUSL) | 43 |
| 10. | ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය (NIBM) | 47 |
| 11. | ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM හරිත සරසවිය) | 50 |
| 12. | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | 51 |

# 01. හැඳින්වීම

ජාතික සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා නිපුණතාවයෙන් සපිරි ශ්‍රම බලකායක් බිහි කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය හා ඒ යටතේ ක්‍රියාත්මක ආයතන සතුව පවත්නා භෞතික යටිතල පහසුකම් හා මානව සම්පත් උපරිම ඵලදායිතාවයකින් හසුරුවමින්, පාඨමාලා නිසි ඇගයීමකට ලක් කර, රැකියා වෙළෙඳපොළ අවශ්‍යතාවයට වඩාත්ම යෝග්‍ය ගුණාත්මක නිපුණ ශිල්පීන් නිර්මාණය සඳහා 2024 සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පැවැති ආර්ථික අභියෝග හමුවේ වුව ද අපේක්ෂිත කාර්යසාධනය ලඟා කර ගැනීමට හැකිවිය.

පසුගිය වසරවල මුහුණ දුන් Covid වසංගතය මෙන්ම ආර්ථික අර්බුදය කර්මාන්ත ක්ෂේත්‍රයට සෘණාත්මක බලපෑම් ඇති කළ අතර පුහුණු ශ්‍රමිකයන් සඳහා වුවද දේශීය රැකියා වෙළෙඳපොළේ පැවති ඉඩ ප්‍රස්තා පටු විය. එමෙන්ම පැවති විදේශ විනිමය හිඟතාවය වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ දිශානතිය විදේශීය රැකියා වෙළෙඳපොළ වෙත යොමු කිරීමට හේතුවක් විය.

එසේම ජාතික ආර්ථිකය තුළ විදේශ රැකියා නියුක්තිය, විදේශ විනිමය උත්පාදනයේ දී අවධානය යොමු වූ ප්‍රධාන අංශයකි. වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීමේදී ද එම ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් යොමු වූ අතර ඒ සඳහා අවශ්‍ය ශ්‍රම බලකාය ගොඩනගන වෘත්තීය අධ්‍යාපනය දෙස රජයේ අවධානය ද ඉහළ ගියේය. 2024 වසර අවසන් වන විට රැකියා සඳහා විදේශ ගත වූ 313,160ක පිරිස අතරින් වෘත්තිකයන් හා නිපුණ ශිල්පී කොටස 37%ක් විය. ඉතිරි 63%ක පිරිස අතරින් ද 163,898ක් නුපුහුණු හෝ අවම නිපුණතාවක් සහිත අය වේ. මේ තත්ත්වය තුළ ද වාර්ෂික විදේශ විනිමය ඉපයීම ඇ.ඩො.මි. 5,961.6ක් වූ අතර එම පිරිස වෘත්තීය නිපුණතාව සහිත අය බවට හැරවීම මඟින් වැඩි වැටුප් තලවල රැකියා සඳහා යොමු වීම මත වැඩි විදේශ විනිමයක් උපයා ගැනීමේ හැකියාව හිමි වේ.

ඒ අනුව ගෝලීය රැකියා වෙළෙඳපොළ ඉලක්ක කරගත් පුහුණු ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍ය, පෞද්ගලික සියලු අංශ සමඟ සහයෝගීතාවයන් හා අවබෝධතා ගිවිසුම් මඟින් වෘත්තීය අධ්‍යාපන පද්ධතිය තුළ, විවිධ විශේෂ පුහුණු වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට වෘත්තීය පුහුණු ආයතන සමත් විය. ICT, Construction, Aluminum Fabrication, Welding, Health, Food & Beverage ආදී ක්ෂේත්‍රවල පාඨමාලා ගණනාවක් ඒ යටතේ ආරම්භ විය.

වෘත්තීය අධ්‍යාපනයේ අවසාන හා එකම අරමුණ සතුටුදායක වැටුපක් සහිත රැකියාවක් ලබාගැනීම පමණක් නොවේ. ව්‍යවසායකයෙකු වශයෙන් ගොඩනැගී ජාතික ආර්ථිකයේ කොටස්කරුවෙකු වෙමින් නිපුණ ශ්‍රමිකයන්ට රැකියා අවස්ථා සලසන අතර ස්වකීය ආර්ථිකයද තහවුරු කරගන්නා පුරවැසියෙකු බිහිකිරීම ද මූලික අරමුණකි. ඒ සඳහා නිපුණ ශ්‍රමිකයන් දිරිගන්වමින් මූලික ප්‍රාග්ධන පහසුකම් සලසාගැනීම සඳහා SEPI ණය යෝජනා ක්‍රමය යටතේ 2024 වර්ෂයේ දී ප්‍රතිලාභීන් 82 දෙදෙනෙකු සඳහා රු. මි. 69.42ක ණය මුදල් ලබා දී ඇත.

තවද වෘත්තීය අධ්‍යාපනයේ නියැලෙන ශිෂ්‍යයන් අතරින් ආර්ථික දුෂ්කරතා සහිත සිසුන්ට සහනයක් ලෙස පිරිනමන "නිපුණතා සිසු දිරිය" ශිෂ්‍යාධාර වැඩසටහන සාගර විශ්වවිද්‍යාලය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හා විශ්වවිද්‍යාල විද්‍යායතන ද ආවරණය වන පරිදි සියළු වෘත්තීය අධ්‍යාපන ආයතන වෙත පුළුල් කරන ලද අතර, සමාලෝචිත වසර තුළ දරන ලද වියදම රු.මි. 533.33කි. එසේ ම වෘත්තීය නිපුණ ශිල්පීන්ගේ ආරක්ෂාව පිළිබඳ අවධානය හා අවබෝධය ඉහළ නැංවීමටත් වෘත්තීය ගරුත්වය පිළිබඳ ආකල්ප ප්‍රවර්ධනයක් සඳහා සිසුන් 13,700කට ආරක්ෂිත ඇඳුම් කට්ටල පිරිනැමීම වෙනුවෙන් සිදුකළ ආයෝජනය රු.මි.71කි.

2024 දෙසැම්බර් 31 දිනට රට තුළ වෘත්තීය අධ්‍යාපනයේ නියැළි සමස්ත පිරිස 225,165 කි. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශයට අයත් වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුව ලද 105,258ක් ද ඊට ඇතුළත් ය. එම ආයතන විසින් පුහුණු පාඨමාලා පවත්වාගෙන යන විෂය මාලා සංඛ්‍යාව 468කි. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සමාලෝචිත වසර තුළ නිකුත් කළ NVQ සහතික සංඛ්‍යාව 115,849කි.

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්'' රටේ සෑම පවුල් ඒකකයකටම ලබාදීමේ ඉලක්කය සාධනය සඳහා අඩු ආදායම්ලාභී පවුල් කෙරෙහි විශේෂ අවධානය යොමු කර නුපුහුණු තරුණ ප්‍රජාව වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට යොමු කිරීමටත්, ඒ ඔස්සේ ඉහළ වැටුප් සහිත රැකියා නියුක්තිකයෙකු සෑම පවුලක් තුළින්ම බිහිකිරීම 2025 වර්ෂයේ ඉලක්කය වේ. ඒ සඳහා මෙම අංශය යටතේ ක්‍රියාත්මක ආයතන සතු භෞතික යටිතල පහසුකම් හා මානව සම්පත් උපරිම ඵලදායීතාවයකින් හසුරුවමින්, පාඨමාලා නිසි ඇගයීමකට ලක් කර, රැකියා වෙළෙඳපොළ අවශ්‍යතාවයට වඩාත්ම යෝග්‍ය ගුණාත්මක නිපුණ ශිල්පීන් නිර්මාණය සඳහා වන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමේ කටයුතු සැලසුම් කරමින් පවතී.

## 1.1. වෘත්තීය අධ්‍යාපන අංශයේ කාර්යභාරය

- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- අධ්‍යාපන සුදුසකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම
- දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම
- පාසැල් අධ්‍යාපනය හැර යෑමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරිමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම
- යෝග්‍ය වෘත්තීය පුහුණු ආයතන තාක්ෂණවේදී උපාධි පිරිනමන ආයතන බවට පත් වීම
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම
- වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂයමාලා සංශෝධනයක් සිදු කිරීම
- ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මඟින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම

## 1.2. වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - TVEC
- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව - DTET
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - VTASL
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය - NAITA
- ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - CGTTI
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - UNIVOTEC හා ඒ යටතේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල විද්‍යායතන
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - OCUSL
- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය - NIBM
- සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල - SDFL

# 02. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය, සිසුන් බඳවාගැනීම, මූල්‍ය ප්‍රගතිය සහ 2025 වර්ෂය සඳහා ඉලක්ක

## 2.1 සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

පෙර වර්ෂවල ඉදිරිපත් වූ අයවැය යෝජනාවලට යටත්ව විවිධ නිපුණතා සහිත තරුණ ශ්‍රමිකයන් සඳහා පවතින විශාල ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍යතාවයන් හා ඌණතාවයන් සපුරාලීම සඳහා පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### 2.1.1. වෘත්තීය පුහුණු ආයතනවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

ශ්‍රම වෙළඳපොළේ ඉහළ ඉල්ලුමක් පවතින පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම ඉහළ නැංවීමට වෘත්තීය පුහුණු ආයතනවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අමාත්‍යාංශය තීරණය කරන ලදී. ඒ අනුව 2021 වසරේදී පන්ති කාමර, වැඩහල්, විද්‍යාගාර, ආපනශාලා, විවේක කාමර, ඇඳුම් මාරු කරන කාමර, සනීපාරක්ෂක ඒකක සහ ශිෂ්‍ය / ගුරු නිල නිවාස වැඩි දියුණු කිරීම ආරම්භ කෙරිණි. 2024 වසරේ දී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ සාගර විශ්වවිද්‍යාලය මඟින් ක්‍රියාත්මක වන අඛණ්ඩ ව්‍යාපෘති 07ක් සඳහා රු. මි.50.0ක ප්‍රතිපාදන වෙන්කරන ලදී. 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මි. 19.03ක් වන අතර සමස්ත භෞතික ප්‍රගතිය 90%ක් පමණ වේ.

### 2.1.2. "ටෙක් උදාන" වැඩසටහන

වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීම පිණිස ආරම්භ කරන ලද "ටෙක් උදාන" වැඩසටහන යටතේ ඒකීය ගෘහ නිර්මාණ ශිල්පීය ආකෘතියක් අනුව කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, 2021 වසරේ සිට මහනුවර, කුරුණෑගල, මරදාන තාක්ෂණ විද්‍යාලයන් සහ හෝමාගම, දඹුල්ල, මාතර කාර්මික විද්‍යාලයන්හි නවීකරණ කටයුතු සිදු කෙරෙමින් පවතී. මාතර කාර්මික විද්‍යාලයේ සහ මරදාන තාක්ෂණ විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ ක්‍රියාත්මක වන අතර, මේ සඳහා 2024 වසරේ රු. මි 225ක් වෙන් කර ඇත. මෙහි මූල්‍ය ප්‍රගතිය රු. මි.159.0කි.

### 2.1.3. නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මඟින් 2014 වසරේ සිට 2018 වසර දක්වා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 4ක සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 7ක බිම් මහල් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලදී. මෙම ගොඩනැඟිලි වෙත සෘජු අව් රශ්මිය සහ වර්ෂාවෙන් සිදුවන හානිය වලක්වා ගැනීමටත්, බිම් මහලේ පුහුණු කටයුතුවල නියැලී සිටින සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් මෙම ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වේ. 2023 වසරේ සිට 2025 කාලය අතර අදියර කිහිපයක් යටතේ මෙම ගොඩනැගිලිවල ඉදිකිරීම් නිම කිරීමට සැලසුම් කළද, ජාතික මෙහෙයුම් මැදිරියෙහි (NOR) තීරණය පරිදි, මෙම ගොඩනැගිලි 11 සඳහා ආරක්ෂිත වහල (Retention Roofs) පමණක් නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. ඒ අනුව, 2024 වසරේ වෘත්තීය පුහුණු අධිකාරියේ ගොඩනැගිලි 4ක් ද, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ ගොඩනැගිලි 2ක් සඳහාද රු.මි.145.0ක මුදලක් වෙන් කරන ලදී. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට භෞතික ප්‍රගතිය පිළිවෙළින් 90%ක් හා 65%ක් වන අතර මූල්‍ය ප්‍රගතිය රු.මි. 89.69ක් වේ.

### 2.1.4. ශ්‍රී ලංකාවේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රය (TVET) ට අදාළ පර්යේෂණයක් සිදු කිරීම

නිපුණ ශ්‍රම බලකායක් සඳහා ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම සහ ක්ෂේත්‍රයේ තත්‍ය නිමැවුම අතර පවතින හිඩැස හේතුවෙන් ශ්‍රී ලංකාවේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රය (TVET) විශාල ගැටළුවකට මුහුණු පා ඇත. එම නිසා දිවයිනේම පුහුණු ජාලය ඉලක්ක කර පුළුල් පර්යේෂණයක් සිදු කිරීමට යෝජනා විය. ඒ අනුව, පවත්වනු ලබන පාඨමාලා, පාඨමාලාවල අන්තර්ගතය ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම කෙරෙහි අදාළත්වය, පුහුණු

යාන්ත්‍රණය, පාඨමාලා හැර යාම් ප්‍රමාණය, පුහුණුව බෙදා හැරීම, වෘත්තීය පුහුණුව සඳහා දිවයින පුරා ප්‍රවේශ හැකියාව, පුහුණුව බෙදා හැරීමේ ගුණාත්මකභාවය, කළමනාකරණ ක්‍රමවේදයන් සහ සහතික ලාභීන්ගේ රැකියා නියුක්තභාවය මෙම පර්යේෂණය මගින් විශ්ලේෂණය කරනු ඇත. ඒ අනුව, "වෙළඳපොළ ඉල්ලුම සහ ශ්‍රී ලංකාවේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ (TVET) තත්‍ය නිමැවුම අතර පවතින හිඩැස හඳුනාගැනීම" යන තේමාව යටතේ පර්යේෂණයක් බාහිර උපදේශකවරයකු / උපදේශක කණ්ඩායම / ආයතනයක් මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. දැනට උපදේශක ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

### 2.1.5. වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ ජයග්‍රහණයන්

- ජාතික වෘත්තීය සුදුසුකම 4 මට්ටම දක්වා වන වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන අඩු ආදායම්ලාභී සිසුන් සඳහා ලබාදෙනු ලැබූ නිපුණතා සිසු දිරිය ශිෂ්‍යාධාර වැඩසටහන වඩාත් පුළුල් කරමින් 2024.04.04 දිනැතිව අංක 01/2024 නව චක්‍රලේඛය නිකුත් කරන ලදී. මෙම චක්‍රලේඛය මගින් ජාතික වෘත්තීය සුදුසුකම 7 මට්ටම දක්වා පාඨමාලාවලට ඇතුළත් වන සිසුන් සඳහා ශිෂ්‍යාධාර ලබා ගැනීමට හැකි වනු ඇත. ඒ අනුව "නිපුණතා සිසු දිරිය" ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ 2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මස 31 දක්වා කාල සීමාව තුළ රු.මි. 533.33ක ශිෂ්‍යාධාර ලබා දී ඇත.
- වැඩහල්වල වෘත්තීය පුහුණුව ලබන සිසුන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල (Overall Kit) ලබා දීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හා ඊට අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි පුහුණුව ලබන සිසුන් සඳහා ලබා දීමට අවශ්‍ය ආරක්ෂිත ඇඳුම් කට්ටල 13,700ක් අදාළ පුහුණු ආයතන සඳහා ලබා දී ඇත.
- 2024 ලෝක තරුණ නිපුණතා දිනයට සමගාමීව නිපුණතා හා නවෝත්පාදන තරඟාවලියක් සහ ප්‍රදර්ශනයක් 2024.07.14 සහ 2024.07.15 යන දෙදින රත්මලාන ජර්මානු කාර්මික අභ්‍යාස පුහුණු ආයතනයේදී පැවැත්වීමට කටයුතු කරන ලදී. එහිදී "හොඳම ව්‍යවසායකයා", "හොඳම ව්‍යාපාර සැලැස්ම" සහ "නව නිපැයුම් තරඟාවලිය" යන තරඟ කාණ්ඩ යටතේ ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සඳහා මුදල් ත්‍යාග හා සම්මාන පිරිනමන ලදී.
- ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමය යටතේ 2024 වර්ෂයට අදාළව ප්‍රතිලාභීන් 82 දෙදෙනෙකු සඳහා රු. මි. 69.42ක ණය මුදල් නිකුත් කිරීම සිදු කර ඇත.
- පාසැල් අධ්‍යාපනය අවසන් කරන තරුණ ප්‍රජාව වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු කර, ඔවුන් නඟා සිටුවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය දෙරණ මාධ්‍ය ජාලය සමඟ එක්ව ආරම්භ කරන ලද නිපුණතා බලකාය ශිෂ්‍ය මාර්ගෝපදේශන වැඩසටහන මගින් මේ වනවිට දිස්ත්‍රික්ක 14ක් ඉලක්ක කරගනිමින් එහි අදියර 14ක් සාර්ථකව පවත්වන ලදී. ඒ අනුව සිසුන් 25,485 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සම්බන්ධ වී ඇති අතර, වෘත්තීය යතුර පරීක්ෂණය සඳහා සිසුන් 12,485දෙනෙකු සහභාගීව වෘත්තීය මාර්ගෝපදේශනය ලබා ගැනීමටත්, ඊට අමතරව වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා සිසුන් යොමු කිරීමටත්, පෙර දැනුම ඇගයීමේ ක්‍රමය (RPL) යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ලබා ගැනීම ප්‍රාදේශීය මට්ටමින් ප්‍රචලිත කිරීමට හා ඒ සඳහා පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමටත් කටයුතු සිදු කර ඇත. RPL යටතේ NVQ සහතිකපත් 872ක් නිකුත් කර ඇත.
- ජර්මානු ෆෙඩරල් ජනරජය සහ ස්විස් සංවර්ධන සහයෝගීතාවයේ (Swiss Development Cooperation) අනුග්‍රාහකත්වය ද ඇතිව GIZ – Vocational Training in Sri Lanka ව්‍යාපෘතියේ දෙවන අදියර (VTSL Phase II) සඳහා 2023 – 2026 වර්ෂ සඳහා යුරෝ මිලියන 8.24ක ප්‍රදානයක් ලබාදී ඇති අතර එම ව්‍යාපෘති යටතේ පහත සඳහන් කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.
  - වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ කළමනාකරණ තලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන පැවැත්වීම (Leadership Program)
  - හරිත සංකල්පය හඳුන්වාදීම සඳහා සංවාද මණ්ඩපය පැවැත්වීම

- කළමනාකරණ මෙවලම් (Management Tools) හඳුන්වාදීම සඳහා වැඩමුළුව පැවැත්වීම
- ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය සඳහා English Lab ආරම්භ කර පුහුණු වැඩමුළුවක් පැවැත්වීම
- සමාජයේ ආන්තික තත්වයට (marginalized people) පත් පුද්ගලයින් 556 දෙනෙකු සඳහා වැඩසටහන් පැවැත්වීම
- සමාජයේ ආන්තික තත්වයට පත් කණ්ඩායම් සඳහා රැකියා ඉලක්ක කරගත් වැඩසටහන් 11ක් පැවැත්වීම
- පරිසර තිරසාරත්වය සඳහා වූ වෘත්තීය පුහුණු වැඩසටහන් 08ක් ක්‍රියාත්මක කිරීම

- ඕස්ට්‍රේලියානු රජයේ ආධාර වැඩසටහන යටතේ ලද ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 12ක මූල්‍ය ප්‍රදානයක් මත ආරම්භ කළ අන්තර්ගෘහිත ආර්ථික වර්ධනයක් සඳහා නිපුණතා ව්‍යාපෘතියේ (S4IG) දෙවන අදියර යටතේ VTA, NAITA සහ TVEC ආයතන සමඟ එක්ව මුළු දිවයින පුරා සංචාරක ක්ෂේත්‍රයේ අගයදාමයන් ප්‍රවර්ධනය හා විශේෂ අවශ්‍යතා සහිත ආන්තික ප්‍රජාව ප්‍රමුඛ කර ගනිමින් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

  - තෝරාගත් දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් නිපුණතා සැලසුම් (District Skill Plans) වැඩමුළු 2ක් පැවැත්වීම
  - ඩවුන් සින්ඩ්‍රෝම් සංකූලතාවයෙන් පෙළෙන පුද්ගලයින් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් ඔවුන් ආර්ථික වශයෙන් සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීම
  - ආගන්තුක සත්කාර පුහුණුකරුවන් 15 දෙනෙකු සඳහා ToT වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - සාධාරණ ගැලපීම් (Reasonable Adjustment) අයදුම් කිරීම සඳහා ICT වෘත්තීය පුහුණුකරුවන් 20 දෙනෙකුට ToT ලබා දීම
  - ත්‍රිකුණාමලය, මඩකලපුව සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක සඳහා Multitasker up Skilling program ක්‍රියාත්මක කිරීම
  - අයදුම්කරුවන් 300ක් සඳහා මාර්ගගත ක්‍රමයට මූලික ආගන්තුක සත්කාර සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම
  - Surf Level 2 සඳහා සුදුසුකම් ලැබූ Surf උපදේශකවරුන් 9 දෙනෙකු ව්‍යාපාර වැඩි දියුණු කිරීමේ වැඩසටහන සාර්ථකව නිම කිරීම
  - පොළොන්නරුව, අනුරාධපුරය සහ මාතලේ දිස්ත්‍රික්ක 03හි තෝරාගත් ආගන්තුක (Guest Houses) නිවාසවල ඉවුම් පිහුම් අංශයේ දැනටමත් සේවය කරන කාර්ය මණ්ඩලයේ නිපුණතාව වැඩි දියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 5ක් නිම කිරීම

- ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම මත පදනම්වූ කාර්මික, වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය (Human Resource Development Korea - HRDK) මඟින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනය වැඩි දියුණු කිරීම හා එහි ධාරිතා සංවර්ධනය කිරීම සඳහා කොරියානු වොන් බිලියන 2.15ක ආධාරයක් ලබා දුන් අතර, එම ව්‍යාපෘතියට අදාළ ගිවිසුම 2023.05.12 දින අත්සන් කරන ලදී. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ (TVET) විශේෂඥයින් හා උපදේශකවරුන් හට ධාරිතා සංවර්ධනය කිරීමේ පුහුණුවීම් ලබාදීම හා උපකරණ ලබාදීමට අදාළ කටයුතු සිදු කරන ලදී. මේ වනවිට ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ නියාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු සිදු කර නිල වශයෙන් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත භාර දී ඇත.

- ශ්‍රී ලංකා කොරියානු ජාතික වෘත්තීය පුහුණු ආයතනය (K-TEC)හි දැනට පවතින පහසුකම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම සලකා බැලීමෙන් පසු කොරියානු ආනයන හා අපනයන බැංකුව (EXIM Bank) විසින් ඇමරිකානු ඩොලර් මිලියන 1.5ක ප්‍රදානයක් සමඟින් ඔරුගොඩවත්ත K-TEC ආයතනය සඳහා පසු නිම කිරීමේ සහාය ලබා දීමේ ව්‍යාපෘතියට (Post Completion Support to Sri Lanka Korean National Training Institute (K-TEC) අදාළ අවබෝධතා ගිවිසුම (MoU) අත්සන් කරන ලදී. ඒ අනුව CNC, පෑස්සුම්, විදුලි, ඉලෙක්ට්‍රොනික්, මෝටර් රථ සහ රොබෝ තාක්ෂණය සඳහා අවබෝධතා ගිවිසුමෙහි සඳහන් උපකරණ මිලදී ගැනීම සඳහා සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වී ඇති අතර

අදාළ කොන්ත්‍රාත්කරුවන් සඳහා අත්තිකාරම් ලෙස මුළු කොන්ත්‍රාත් වටිනාකමින් ඇමරිකානු ඩොලර් 429.79ක් ලබා දී ඇත.

- KOICA විසින් ආරම්භ කරන ලද "TVET Career Platform" ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව පුරා සිටින ඉහළ මට්ටමේ වෘත්තීය කුසලතා ඇති අභ්‍යාසලාභීන් සඳහා උසස් තත්ත්වයේ වෘත්තීය මාර්ගෝපදේශනයක් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සැපයීම අරමුණු කරයි. 2024 පෙබරවාරි මාසයේදී ප්‍රධාන සැලැස්ම ලබා දෙමින් "Career Platform" සංවර්ධනය, server room ප්‍රතිසංස්කරණය කිරීම සහ යටිතල පහසුකම් උපකරණ ප්‍රසම්පාදනය සඳහා පදනම පිහිටුවිය. TVEC server room සහ අදාළ උපකරණ භාරදීම 2025 ජනවාරි මස අවසන් වනවිට සිදු කිරීම සඳහා සැලසුම් කර ඇති අතර, "Career Platform" පද්ධතිය පෙබරවාරි මස දියත් කිරීමට නියමිතය. මීට අමතරව, වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන්ට පහසුකම් සැලසීම සඳහා ලැප්ටොප් පරිගණක TVEC සහ TVET ආයතන 70ක් වෙත භාර දෙනු ලැබේ. "Career Platform"හි ප්‍රාථමික පරිශීලකයන් වන වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් 200කට ජූලි සිට අගෝස්තු දක්වා දින තුනක ස්ථානීය පුහුණු සැසියක් පවත්වන ලදී. මීට අමතරව, "Career Platform" සංවර්ධන වැඩමුළුවක් (පෙබරවාරි), අන්තර්ගත සංවර්ධන ආරම්භයක වැඩමුළුවක් (මැයි) සහ ව්‍යාපෘතියේ ප්‍රතිපත්ති වැඩමුළු දෙකක් (ජූලි) පවත්වන ලදී.

- 2017 ජූනි 02 සිට 2024 මැයි 31 වන විට YouLead වැඩසටහන අවසන් වී ඇති අතර එම කාලසීමාව තුළ, මෙම වැඩසටහන මඟින් නව හෝ වඩා හොඳ රැකියා 70,000ක්, පුද්ගලයන් 135,000කට වෘත්තීය මාර්ගෝපදේශන සහ විෂයමාලා 85ක් වැඩිදියුණු කර ඇත. YouLead විසින් වෘත්තීය මාර්ගෝපදේශන වෘත්තිකයන් 3,500කට අධික සංඛ්‍යාවක් හා පුහුණුකරුවන් 300කට අධික සංඛ්‍යාවක් පුහුණු කර ඇත. ව්‍යාපාර 21,000 කට වැඩි ප්‍රමාණයකට මෙම ව්‍යාපෘතිය යටතේ සහය ලබාදී ඇත. එමෙන්ම පුද්ගලයන් 24,000කට වැඩි පිරිසක් ව්‍යවසායකත්ව කුසලතා පුහුණු කරන ලද අතර ව්‍යාපාර සඳහා ප්‍රදාන 80ක් ප්‍රදානය කරන ලදී.

- කොරියන් ආධාර යටතේ පහසුකම් සහිත විශ්වවිද්‍යාල පරිශ්‍රයක් ඉදිකිරීමට අදාළ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ "අධ්‍යයන හා පර්යේෂණ ධාරිතාව වර්ධනය සඳහා සහනදායී ණය පහසුකම් ලබා ගැනීමේ ව්‍යාපෘතිය - කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල (EDCF)" සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023.01.16 දින ලැබී ඇත. දැනට ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින බැවින් එම කටයුතු අවසන් වූ වහාම මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

- නිපුණතා, කුසලතා සහ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ පවතින අවස්ථාවන් පිළිබඳව පෙන්වාදීම අරමුණු කර ගනිමින් නිපුණතා ආංශික සංවර්ධන අංශය සහ කර්මාන්ත ආංශික නිපුණතා සභා විසින් 2024 වර්ෂයේදී දෙවන වරට Skills Expo ප්‍රදර්ශනය සාර්ථක ලෙස පවත්වන ලදී. මෙය ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයක් සහ ප්‍රදර්ශනයක් වූ අතර එය නිපුණතා, කුසලතා සහ රැකියා අවස්ථා සම්බන්ධ ජාතික හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් එකම වේදිකාවකට රැගෙන ඒමට සමත් විය. රාජ්‍ය නිලධාරීන්, කර්මාන්ත ක්ෂේත්‍රයේ නියෝජිතයන්, පාසැල් සිසුන්, ජාත්‍යන්තර සංවිධාන සහ මහජනතාවගේ සහභාගීත්වයෙන් යුතුව මෙම ප්‍රදර්ශනය පවත්වන ලදී.

- දිවයින පුරා පාසැල් 300ක් තෝරා ගනිමින් අ.පො.ස. (උ.පෙළ) අවසන් කළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම සඳහා "Skills Vista" වැඩසටහන මාස 03ක කාලයක් පැවැත්විණි. එම වැඩසටහන සම්පූර්ණ කළ සිසුන් 7,500 දෙනෙකු සඳහා සහතිකපත් බෙදා හරිමින් "Skills Vista" වැඩසටහන සාර්ථක ලෙස සිදු කරන ලදී.

- 2024 වර්ෂයට අදාළව ජනවාරි මස සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා නිපුණතා සංවර්ධන නිලධාරීන්ගේ දායකත්වයෙන් පවත්වන ලද වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

| අනු අංකය | වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | අ.පො.ස. (සා.පෙළ) සිසුන් සඳහා | 1,905 | 40,892 |
| 02. | අ.පො.ස. (උ.පෙළ) සිසුන් සඳහා | 3,907 | 50,379 |
| 03. | දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා | 2,438 | 51,618 |
| 04. | රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමට අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව (විදුහල්පතිවරුන්, ගුරුවරුන්,සමෘද්ධි නිලධාරීන් වැනි) | 2,504 | 32,453 |
| 05. | පාසල් හැර ගිය තරුණ තරුණියන් සඳහා | 2,017 | 43,221 |
| 06. | RPL සඳහා යොමු කිරීම (දැනුවත් කිරීම) | - | 8,059 |
| 07. | අනෙකුත් ආයතන මඟින් පවත්වන ලැබූ දැනුවත් කිරීම (නිපුණතා සංවර්ධන නිලධාරීන් සඳහා) | 4 | 180 |
| 08. | දුරකථන මාර්ගයෙන් සේවාවන් ලබා ගැනීම | - | 530 |
| 09. | කාර්යාලයට පැමිණ සේවාවන් ලබා ගැනීම | - | 344 |
| | **එකතුව** | **12,775** | **227,676** |

- වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළ දිවයින පුරා සේවාලාභීන්ට අවශ්‍ය සියළුම වෘත්තීය මග පෙන්වීම සිදු කර ඇත. (පොදු දුරකථනය සහ ක්ෂණික දුරකථන අංකය මඟින්) සමස්ත සේවාලාභීන් 910 දෙනෙකු මෙම සේවාව ලබා ගෙන ඇත.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්ට අමතරව ජාතික වෘත්තීය මාර්ගෝපදේශ සහ උපදේශන මධ්‍යස්ථාන වෙත පැමිණෙන පාසල් සිසුන්, ගුරුවරුන්, දෙමාපියන්, තරුණ තරුණියන්, විශ්වවිද්‍යාල සිසුන්, රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශය, විශ්‍රාමිකයින් සහ පූජ්‍ය පක්ෂයේ සේවාලාභීන් සඳහා පුද්ගලික වෘත්තීය මාර්ගෝපදේශන සැසි පැවැත්වීම මඟින් අවශ්‍ය නිවැරදි මග පෙන්වීම සිදු කර ඇත.
- වෘත්තීය මාර්ගෝපදේශ සහ උපදේශන සේවාවන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීමේ අරමුණින් 1966 ක්ෂණික දුරකථන සේවාව හඳුන්වා දී ඇත.

## 2.2 සිසුන් බඳවාගැනීම

| | ඉලක්කය | බඳවාගැනීම | % |
|---|---|---|---|
| 2020 | 157,069 | 77,422 | 49 |
| 2021 | 159,059 | 91,995 | 58 |
| 2022 | 124,637 | 108,219 | 87 |
| 2023 | 122,254 | 120,255 | 98 |
| 2024 | 130,318 | 105,258 | 81 |




ආයතන අනුව සිසුන් බඳවාගැනීම

| ආයතනය | 2024 වර්ෂයේ ඉලක්කය | 2024.12.31 දිනට බඳවාගැනීම | % |
|---|---|---|---|
| **DTET** | 30,000 | 24,706 | 82 |
| **VTA** | 41,180 | 31,213 | 76 |
| **NAITA** | 30,165 | 23,845 | 79 |
| **CGTTI** | 6,778 | 8,910 | 131 |
| **UNIVOTEC + UCs** | 2,975 | 2,467 | 83 |
| **OCUSL** | 3,020 | 2,483 | 82 |
| **NIBM** | 11,750 | 10,291 | 88 |
| **NSBM** | 4,450 | 1,343 (2024.03.31 දිනට) | 30 |
| එකතුව | **130,318** | **105,258** | **81** |

**සමාලෝචිත වර්ෂයේ සිසුන් බඳවාගැනීම ඉලක්කගත මට්ටමින් අඩුවීමට හේතු**

* වෘත්තීය පුහුණු ආයතනවල උපදේශක පුරප්පාඩු නිසා පාඨමාලා විශාල සංඛ්‍යාවක් ආරම්භ කිරීමට නොහැකි වීම
* බාහිර දේශකවරුන් මගින් පවත්වාගෙන යන වැඩි ශිෂ්‍ය සහභාගීත්වයක් සහිත එහෙත් රැකියා අවස්ථා අවම පාඨමාලා අත්හිටුවීම
  උදා : DTET මගින් ක්‍රියාත්මක වැඩි ශිෂ්‍ය ඉල්ලුමක් සහිත කෙටි කාලීන භාෂා පාඨමාලා සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ NVQ 4 මට්ටමේ පාඨමාලාවන් සීමා කිරීම
* පාඨමාලා ගාස්තු ගෙවීමේ දී මතුවන මූල්‍ය අපහසුතා
* දැනට සේවයේ නියුතු පළපුරුදු උපදේශකවරුන් විවිධ හේතූන් මත සේවයෙන් ඉවත්ව යාම



## 2.3. මූල්‍ය ප්‍රගතිය *

### 2.3.1. මූල්‍ය වෙන් කිරීම් හා වියදම්

(රු.මි.)

| වර්ෂය | පුනරාවර්තන | | ප්‍රාග්ධන | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කළ මුදල | වියදම | වෙන් කළ මුදල | වියදම | වෙන් කළ මුදල | වියදම |
| 2022 | 5,978 | 5,426 | 2,624 | 1,709 | 8,602 | 7,135 |
| 2023 | 6,740 | 5,540 | 3,708 | 2,509 | 10,448 | 8,049 |
| 2024 | 7,072 | 6,172 | 4,103 | 2,143 | 11,175 | 8,315 |

### 2.3.2. ප්‍රාග්ධන වෙන් කිරීම් හා වියදම්

(රු.මි.)

| | 2022 | | | 2023 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කළ මුදල | වියදම | % | වෙන් කළ මුදල | වියදම | % | වෙන් කළ මුදල | වියදම | % |
| ජාතික අය වැය වැඩසටහන | 7,860 | 6,450 | 82% | 9,145 | 6,864 | 75% | 8,636 | 7,296 | 84% |
| අයවැය යෝජනා වැඩසටහන | 38 | 4 | 10% | - | - | - | - | - | - |
| විදේශීය ණය / ආධාර වැඩසටහන | 704 | 681 | 97% | 1,304 | 1,186 | 91% | 2,539 | 1,018 | 40% |
| **එකතුව** | **8,602** | **7,135** | **83%** | **10,448** | **8,049** | **77%** | **11,175** | **8,315** | **74%** |

## 2.3.3. ආයතනය අනුව ප්‍රතිපාදන වෙන් කිරීම - වෘත්තීය අධ්‍යාපන අංශය

| | ආයතනය | පුනරාවර්තන | | | ප්‍රාග්ධන | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2024 (රු.මි.) | | | 2024 (රු.මි.) | | |
| | | වෙන් කළ මුදල | වියදම | % | වෙන් කළ මුදල | වියදම | % |
| 01. | නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන අංශය | 808 | 756 | 93% | 20 | 10 | 49% |
| 02. | Nipunatha Sisu Diriya Welfare Programmes | 700 | 533 | 76% | - | - | 0% |
| 03. | DTET | 2,691.35 | 2,603.03 | 97% | 190 | 126.27 | 66% |
| 04. | TVEC | 233 | 210 | 90% | 21 | 14 | 68% |
| 05. | VTA | 1,939 | 1,620 | 84% | 120 | 117 | 97% |
| 06. | NAITA | 1,390 | 1,320 | 95% | 100 | 25 | 25% |
| 07. | CGTTI | 457 | 426 | 93% | 160 | 143 | 89% |
| 08. | UNIVOTEC | 993 | 798 | 80% | 286 | 172 | 60% |
| 09. | OCUSL | 551 | 509 | 92% | 80 | 74 | 92% |
| | සංවර්ධන ක්‍රියාකාරකම් | | | | | | |
| 10. | යොවුන් දිරිය වැඩසටහන (Improvement of Vocational Training Activities) | - | - | - | 100 | 97 | 97% |
| 11. | ජර්මානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වෘත්තීය පුහුණු වැඩසටහන (Vocational Training in Sri Lanka - GIZ) | - | - | - | 622 | 616 | 99% |
| 12. | ස්වයං රැකියා මූල්‍ය උත්පාදන ණය යෝජනා ක්‍රමය (Self Employment Promotion Initiative (SEPI) Programme) | - | - | - | 70 | 69 | 99% |
| 13. | You Lead (USAID) වැඩසටහන | - | - | - | 215 | 214 | 99% |
| 14. | Skills for Inclusive Economic Growth (S4IG) | - | - | - | 146 | 145 | 99% |
| 15. | තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල 7ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන (Modernization of 7 Colleges of Technology / Technical Colleges) | - | - | - | 225 | 159 | 71% |
| 16. | කාර්මික විද්‍යාල / තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (KOICA) - (Capacity Building Project for Construction Courses in Technical Colleges & Colleges of Technology of Sri Lanka) | - | - | - | 47 | 44 | 94% |
| 17. | වෘත්තීය හා තාක්ෂණික පුහුණු සංවර්ධනය (Development of Vocational & Technological Training) | - | - | - | 200 | 102 | 51% |
| 18. | Strengthening Vocational Training Center in Niyagama (GOSL/Korea) | - | - | - | 569 | 107 | 19% |
| 19. | TVET Career Platform Project (GOSL / KOICA) | - | - | - | 648 | 31 | 5% |
| 20. | Establishment of Colombo VT Center & Gampaha Tec College | - | - | - | 475 | 2 | 0% |
| | **එකතුව** | **9,763.35** | **8,775.03** | **89.88%** | **4,293** | **2,269.27** | **52.86%** |

* වෘත්තීය අධ්‍යාපන අංශයේ 2024.12.31 දිනට අදාළ ප්‍රගතිය 2025.01.10 දිනැතිව නිකුත් කර ඇති පළමු භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව සකසා ඇත. (අවසන් මුද්‍රිත සටහන් අනුව වෙනස් වීමට ඉඩ ඇත.)

## 2.4. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- විදේශ රැකියා ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් පවතින රැකියා අවස්ථා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා හඳුනා ගැනීමට හා ඒ සඳහා සුදුසු නිපුණ ශ්‍රමිකයන් බිහි කිරීම සඳහා පුහුණු ආයතනවල වැඩසටහන් සැලසුම් කිරීමට මඟ පෙන්වීම
- උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව යටතේ විශ්වවිද්‍යාල වරම් අහිමි සිසුන් සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම මඟින් තවත් සිසුන් 1,900 දෙනෙකු සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම
- GIZ – VTSL- Phase II ව්‍යාපෘතිය මඟින් ජර්මානු සහයෝගීතාව යටතේ ස්ථාපිත කරන ලද වෘත්තීය පුහුණු ආයතන (CGTTI, SLGTI) සහ වෙනත් රාජ්‍ය ආයතනවල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය සඳහා තාක්ෂණික සහය මෙන්ම කළමනාකරණ හා තීරක මට්ටමේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. තවද, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ සමාජීය ආන්තික තත්වයට පත් පුද්ගලයින් සඳහා රැකියා මූලික වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. එසේම, පරිසර තිරසාරත්වය ඉලක්ක කරගත් වෘත්තීය අධ්‍යාපනික පුහුණු වැඩසටහන් (VET Programs) ලෙස ආහාර පෝෂණය, පුනර්ජනනීය බලශක්ති, අපද්‍රව්‍ය කළමනාකරණ යනාදී අංශ යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා විෂය මාලා සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම
- වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල 38,000ක් ලබා දීම
- නිපුණතා සිසු දිරිය ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ NVQ 7 මට්ටම දක්වා වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුව ලබන සිසුන් 27,000කට ආසන්න පිරිසකට මාසිකව රු.4,000ක ශිෂ්‍යාධාරයක් ලබා දීම සඳහා රු. මි.750ක ප්‍රතිපාදන වෘත්තීය පුහුණු ආයතන වෙත ලබා දීම
- ස්වයං රැකියා උත්පාදන උපණය යෝජනා ක්‍රමය (SEPI) යටතේ රු.මි. 420ක ණය මුදල් නිකුත් කිරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5,6 සහ 7 හදාරනු ලබන වෘත්තීය පුහුණුලාභීන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය අරමුණු කරගත් TVET Career Platform Project in Sri Lanka ව්‍යාපෘතියේ (ඇ.ඩො.මි. 6ක) ඉදිරි කටයුතු කිරීම
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව පිහිටුවීමට යෝජිත ජාතික ධීවර හා සමුද්‍රීය පුහුණු ආයතනය (NIFMAT) පිහිටුවීමට අදාළ කටයුතු සිදු කිරීම
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා යෝජිත කොරියානු ණය ආධාර යටතේ පහසුකම් සහිත විශ්වවිද්‍යාල පරිශ්‍රයක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී මේ වනවිට ඉදිරි කටයුතු සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඒ අනුව ණය පහසුකම් ලබා ගැනීමේ කටයුතු සිදු කිරීමෙන් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- 2025 ජූලි 15 දිනට යෙදී ඇති ලෝක තරුණ නිපුණතා දිනයට සමගාමීව දීපව්‍යාප්ත නිපුණතා තරඟාවලියක් පැවැත්වීම
- දිස්ත්‍රික් මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- Skills Expo - 2025 ප්‍රදර්ශනය පැවැත්වීම
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම
- 2024 අ.පො.ස.(උ.පෙළ) අවසන් කරන සිසුන් සඳහා "Skills Vista" වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන පැවැත්වීම
- ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ක්ෂේත්‍ර නිලධාරීන්ට අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබා දීම

# 03. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)

## 3.1. හැඳින්වීම

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ විධිවිධාන යටතේ, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ නියාමන ආයතනය ලෙස 1991 දී ස්ථාපනය කරන ලදී. 1999 අංක 50 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් TVET ක්ෂේත්‍රය ආශ්‍රිත පර්යේෂණ පැවැත්වීම, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය දියුණු කිරීම, ප්‍රදාන ලබාදීම සහ TVET ක්ෂේත්‍රයේ පරීක්ෂණ ඇතුළු තත්ත්ව සහතික සඳහා පද්ධති ස්ථාපිත කිරීම පිණිස වැඩි බලතල සහිතව සංශෝධනය කරන ලදී. ආයතනයේ මූලික වගකීම් වන්නේ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, තත්ත්ව ආරක්ෂණය සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය රට තුළ සම්බන්ධීකරණය කිරීම සහ සංවර්ධනය කිරීමයි. ශ්‍රී ලංකාව තුළ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපනය සපයන ආයතනයන්හි අධ්‍යයන හා පුහුණු ප්‍රමිතීන් පවත්වා ගැනීමද, TVEC හි කාර්යභාරයකි.

**දැක්ම**

රැකියා වෙළෙඳපොළට ගැලපෙන හා ගුණාත්මක තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය අපේක්ෂා කරන සියළු දෙනාට වෘත්තීය පුහුණුව ලබාදීම

**මෙහෙවර**

සමාජ-ආර්ථික ඉලක්ක සහ අභියෝගාත්මක ගෝලීය වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා කාර්යක්ෂම, ඵලදායී සහ ගුණාත්මක සහතික කළ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන පද්ධතියක් ස්ථාපිත කර පවත්වා ගෙන යාම

## 3.2. කාර්යයන්

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සඳහා වන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ දියුණුව සඳහා සැලසුම් සකස් කිරීම
- ආයතන ලියාපදිංචි කිරීම සහ පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම තුළින් NVQ සහතික ප්‍රදානය කිරීමට තත්ත්ව ආරක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- TVET ආයතන මඟින් ප්‍රමිති ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම සහ සහතික කිරීම
- සහතික කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
- TVET ක්ෂේත්‍රය සඳහා ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම

## 3.3. 2024 වර්ෂයේ ජයග්‍රහණ

| අංක | ක්‍රියාකාරකම් | ඉලක්ක | ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | TVET ක්ෂේත්‍රය සඳහා ජාතික සංවර්ධන සැලසුම් සකස් කිරීම | ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබාගැනීම | ජාතික සංවර්ධන සැලසුම් ගැසට් නිවේදනය සකස්කර අමාත්‍යාංශය හරහා ජනාධිපති කාර්යාලයට ඉදිරිපත් කර ඇත. කෙටුම්පත් වාර්තාව එළිදක්වා ඇත. |
| 02. | බස්නාහිර පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම (VET Plan) | සමාලෝචිත වර්ෂය දෙසැම්බර් මස වනවිට අවසන් කිරීම | අවසාන වාර්තාව එළිදක්වා ඇත. (100% ) |
| 03. | 2023 වර්ෂය වෙනුවෙන් ශ්‍රම වෙළඳපොළ ආශ්‍රිත (LMI Bulletin) වාර්ෂික ප්‍රකාශනය එළිදැක්වීම | සැප්තැම්බර් මස වනවිට 100% අවසන් කිරීම | එළිදක්වා ඇත. (100% ) |
| 04. | වෘත්තීය පුහුණුව ආශ්‍රිත පර්යේෂණ පැවැත්වීම | දෙසැම්බර් මස වනවිට අවසන් කිරීම | 2023 වර්ෂයේ ඇරඹි පර්යේෂණ වලින් පර්යේෂණ 05ක් සඳහා අනුමැතිය ලබා පර්යේෂණ වාර්ථා 04ක් අවසන් කර ඇත. 2024 වර්ෂය සඳහා පර්යේෂණ 03ක් සඳහා අනුමැතිය ලැබී ඇත. |
| 05. | ජාතික නිපුණතා සම්මත (NCS) සහ ඒ ආශ්‍රිත විෂයමාලා සංවර්ධනය කිරීම හා අනුමත කිරීම | ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා | ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා 26ක් අලුතින් සංවර්ධනය කර ඇත. |

| අංක | ක්‍රියාකාරකම් | ඉලක්ක | ප්‍රගතිය |
|---|---|---|---|
| | | 50ක් අලුතින් සංවර්ධනය කිරීම. ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා 30 ක් යාවත්කාලීන කිරීම | ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා 22ක් යාවත්කාලීන කර ඇත. |
| 06. | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික නිකුත් කිරීම | 100,000 | 115,849 |
| 07. | NVQ ඇගයීම්වල සංඝතභාවය ආරක්ෂා කිරීම සඳහා අහඹු ලෙස තෝරාගත් ඇගයීම් අධීක්ෂණය කිරීම | 200 | 405 |
| 08. | පුහුණු ආයතන ලියාපදිංචි කිරීම | නව පුහුණු ආයතන ලියාපදිංචි කිරීම් - 350<br><br>ලියාපදිංචිය යාවත්කාලීන කිරීම් - 500 | අලුතින් ලියාපදිංචිය සඳහා පුහුණු ආයතන 519ක ඇගයීම් සිදු කර ඇති අතර 280ක් ලියාපදිංචි කර ඇත. ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා පුහුණු ආයතන 688ක ඇගයීම් සිදු කර ඇත. මෙයින් පුහුණු ආයතන 601ක ලියාපදිංචිය යාවත්කාලීන කර ඇත. |
| 09. | පාඨමාලා ප්‍රතීතනය කිරීම | නව පාඨමාලා ප්‍රතීතනය කිරීම් - 300<br><br>යාවත්කාලීන කිරීම් - 800 | 2024 වර්ෂය තුළ නව පාඨමාලා 777ක් ප්‍රතීතනය සඳහා ඇගයීම් සිදුකර ඇති අතර පාඨමාලා 728කට ප්‍රතීතනය ලබා දී ඇත. පාඨමාලා 729ක් සඳහා ප්‍රතීතනය යවත්කාලීන කිරීම සඳහා ඇගයීම් සිදු කර ඇත. එයින් පාඨමාලා 741ක් (පසුගිය වර්ෂය අවසානයේ ඇගයීම් කරන ලද පාඨමාලා ද ඇතුළත් වී ඇත) සඳහා ප්‍රතීතනය ලබා දී ඇත. |
| 10. | ජාතික වෘත්තීය සුදුසුකම් 04 වන මට්ටමේ දැනුම තක්සේරු කිරීම (Knowledge Assessment) සඳහා විභාග පැවැත්වීම | පාඨමාලා 15ක් සඳහා විභාග 02ක් පැවැත්වීම | NVQ 04 සිසුන්හට වෘත්තීන් 19ක් සඳහා දැනුම ඇගයීමේ පරීක්ෂණ (Knowledge Assessment) 01ක් පවත්වා ඇත. ඊට අමතරව මාර්ගගත (online) ක්‍රමය මඟින් සිසුන් 1500කට ආසන්න ප්‍රමාණයක් සඳහා දැනුම ඇගයීමේ පරීක්ෂණ (Knowledge Assessment) පවත්වා ඇත. |
| 11. | ජාතික වෘත්තීය සුදුසුකම ලබාගත් සහතික ලාභීන් සඳහා නිපුණතා බලපත්‍ර (Skills Passport) නිකුත් කිරීම | 500 | නිපුණතා බලපත්‍ර 839 ක් නිකුත් කර ඇත. |

### 3.3.1. අනෙකුත් ජයග්‍රහණ

- කර්මාන්ත ආංශික නිපුණතා සභා (Industry Sector Skills Council) සමඟ ඒකාබද්ධව Skill Expo ප්‍රදර්ශනය පැවැත්වීම.
- දැනට ක්‍රියාත්මක වන නිපුණතා සභා 07ට අමතරව, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සඳහා කර්මාන්ත නිපුණතා සභාව ආරම්භ කිරීමට අවශ්‍ය මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම.
- පෙර දැනුම ඇගයීමේ (RPL) ක්‍රමය හරහා NVQ සහතික ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් සඳහා මාර්ගගත (online) ක්‍රමය මඟින් දැනුම ඇගයීමේ පරීක්ෂණ (Knowledge Assessment) පැවැත්වීම.
- දිවයින පුරා ලියාපදිංචි පුහුණු ආයතන සඳහා පද්ධති පුහුණු (System training) වැඩසටහන් අරම්භ කළ අතර රත්නපුරය, නුවරඑළිය, හම්බන්තොට, මොණරාගල, යාපනය සහ බදුල්ල දිස්ත්‍රික්කවල වැඩසටහන් අවසන් කර ඇත.

### 3.4. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- ජාතික සංවර්ධන සැලසුම් සඳහා ගැසට් නිවේදනය නිකුත් කිරීමෙන් පසු අදාළ සියලු කටයුතු ආරම්භ කර අවශ්‍ය අවස්ථාවල දී TVEC හරහා සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම
- වෘත්තීය පුහුණුව ආශ්‍රිත පර්යේෂණ 10ක් පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම
- 2024 වර්ෂය වෙනුවෙන් ශ්‍රම ඉල්ලුම සහ සැපයුම වෙනුවෙන් සකස් කරනු ලබන ශ්‍රම වෙළඳපොළ ආශ්‍රිත වාර්ෂික ප්‍රකාශනය (LMI Bulletin) සකස් කිරීම
- ශ්‍රම වෙළඳපොළේ ඉල්ලුමක් පවතින වෘත්තීන් සඳහා ජාතික නිපුණතා සම්මත (NCS) සහ විෂයමාලා (Curriculum) 50ක් අලුතින් සංවර්ධනය කිරීම සහ දැනට පවතින ජාතික නිපුණතා සම්මත (NCS) සහ විෂයමාලා 30ක් ශ්‍රම වෙළඳපොළට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම
- විෂයමාලා 10ක් ඩිජිටල්කරණය (Digitalization) කිරීම
- නව පුහුණු ආයතන 450ක් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අවසන් වන පුහුණු ආයතන 600ක් ලියාපදිංචිය අලුත් කිරීම
- නව පාඨමාලා 700ක් ප්‍රතීතනය කිරීම සහ ප්‍රතීතනය අවසන් වූ පාඨමාලා 700ක් ප්‍රතීතනය අලුත් කිරීම
- පුහුණුව සැපයීමේ ගුණාත්මකභාවය පරික්ෂා කිරීම සඳහා අහඹු ලෙස තෝරාගත් පුහුණු ආයතන 160ක් අධික්ෂණය කිරීම
- NVQ ඇගයීම්වල සංසතභාවය ආරක්ෂා කිරීම සඳහා අහඹු ලෙස තෝරාගත් ඇගයීම් 300ක් අධීක්ෂණය කිරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 110,000ක් නිකුත් කිරීම
- වෘත්තීය පුහුණු ක්‍රමවේදයේ තොරතුරුවල තත්ත්වය සහ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම
- කාර්මික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු මඟ (TVET Guide) පළාත් 09 සඳහා පිළියෙළ කිරීම
- දැනුම ඇගයීමේ පරීක්ෂණ (Knowledge Assessment) මාර්ගගත ක්‍රමය හරහා දිවයින පුරා ක්‍රියාත්මක කිරීම
- වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු නියාමනය කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සහ වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් පුහුණු කිරීම
- NVQ නොවන පාඨමාලා NVQ මට්ටම් දක්වා සමාන කිරීම
- වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ හරිතකරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
- කර්මාන්ත, වෘත්තීය ආයතන සහා විදේශීය ආයතන සමඟ සම්බන්ධීකරණය අඛණ්ඩව පවත්වාගෙන යාම.

# 04. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET)

## 4.1. හැඳින්වීම

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා පිහිටුවා ඇති තාක්ෂණ විද්‍යාල 09ක් හා කාර්මික විද්‍යාල 30ක් මඟින් NVQ සහ සහතික පත්‍ර පාඨමාලා සියයකට වැඩි ප්‍රමාණයක් විවිධ කර්මාන්ත අංශ 18ක් යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. වාර්ෂිකව සිසුන් 25,000කට වඩා වැඩි ප්‍රමාණයක් විවිධ කාර්මික හා වෘත්තීය පාඨමාලා සඳහා බඳවාගනු ලැබේ. දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ වෙත තරුණ ප්‍රජාව යොමු කිරීමේ අරමුණින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3, 4 මට්ටමේ සහතික හා 5, 6 ඩිප්ලෝමා සහතික පිරිනමනු ලබන අතර වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා උපාධිය දක්වා ගමන් කිරීමටද අවස්ථාව සලසා ඇත. එසේම පෙර ඉගෙනුම් ඇගයීම් ක්‍රමවේදය යටතේ විවිධ ක්ෂේත්‍රවල ශ්‍රමිකයන් හට වෘත්තීය සුදුසුකම සඳහා RPL සහතික ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත. දේශීය හා විදේශීය රැකියා ඉල්ලුම සහිත පාඨමාලා සඳහා තරුණ තරුණියන්හට පුහුණු අවස්ථා ලබාදීම හරහා නිපුණතා ගොඩනැගීම තුළින් මානව සම්පත සංවර්ධනය කර ජාතික හා ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳපොළට ගැලපෙන පරිදි නිපුණ ශ්‍රමිකයන් බිහි කිරිම සඳහා මෙම දෙපාර්තමේන්තුව ඉහළ දායකත්වයක් ලබා දේ.

**දැක්ම**

ජාත්‍යන්තරව උසස් පිළිගැනීමකින් යුත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමේ ප්‍රමුඛයා වීම

**මෙහෙවර**

අපගේ සේවාලාභීන්ට උසස් තත්වයෙන් යුත් දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබා දෙන ආයතනය ලෙස කටයුතු කිරීම

## 4.2. කාර්යයන්

- කාර්මික අධ්‍යාපනය හා ඒ හා සම්බන්ධ පුහුණු වැඩසටහන් හඳුනා ගැනීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මඟ පෙන්වීම, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය
- කාර්මික අධ්‍යාපනය සහ පුහුණු කිරීම වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය
- කාර්මික අධ්‍යාපනය හා පුහුණු ක්‍රමය තුළ අනුමත ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුවට අනුව පාඨමාලා ක්‍රියාත්මක කිරීම
- වෘත්තීය මාර්ගෝපදේශනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ ඒකාබද්ධ ක්‍රියාකාරී වැඩසටහන් සැකසීම, සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම
- කාර්මික හා තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු සිදු කිරීම හා නව නිපැයුම් සඳහා අවකාශ සලසා දීම

## 4.3. 2024 වර්ෂයේ ජයග්‍රහණ

- 2024 වර්ෂයේදී කර්මාන්ත අංශයේ ක්ෂේත්‍ර 18ක් යටතේ පුහුණු පාඨමාලා 129ක් පවත්වා සිසුන් 25,129ක් බඳවාගන්නා ලදී.
- 2024 වර්ෂයේදී රැකියා වෙළඳපොළ ඉලක්ක කරගත් පාඨමාලා ලෙස වෙල්ඩින් ක්ෂේත්‍රයේ සිසුන් 992ක්, පේස්ට්‍රි බේකරි කුකරි සහ ක්ෂණික සේවා අවන්හල් සහායක පාඨමාලාවලට අදාළව සිසුන් 1,203ක්, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා සිසුන් 1,773ක්, ඇළුමිනියම් ක්ෂේත්‍රයේ සිසුන් 716ක්, ඉලෙක්ට්‍රිකල් ක්ෂේත්‍රයේ සිසුන් 2497ක්, ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රයේ සිසුන් 1,154ක්, මැෂිනින් පාඨමාලාව සඳහා සිසුන් 485ක්, මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ සිසුන් 5,141ක්, සත්කාරක සේවා පාඨමාලාව සඳහා සිසුන් 151ක් හා කාර්මික ජලනල පාඨමාලාව සහ ජලනල පාඨමාලා සඳහා සිසුන් 674ක්

වශයෙන් පුහුණුව සඳහා බඳවා ගෙන ඇත. මෙහිදී විශේෂයෙන් මින් පෙර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු නොවූ හෝටල් ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා විශාල ශිෂ්‍ය ඉල්ලුමක් පැවතීමෙන් එම පාඨමාලා සඳහා යොමු වීම තුළින් එම ක්ෂේත්‍රයෙන් විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් පුහුණු කිරීමට හැකියාව ලැබී ඇත.

- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ සිසුන් 718ක් සඳහා කාර්මික හා තාක්ෂණ විද්‍යාල මඟින් පුහුණු පහසුකම් සපයා ඇත.
- තාක්ෂණ විද්‍යාල හා කාර්මික විද්‍යාල මඟින් වෙල්ඩින්, ජලනල තාක්ෂණය, ඇලුමිනියම් පිළිසකරකරණය, මෝටර්රථ තාක්ෂණය, විදුලි, වඩු කාර්මික, පෙදරේරු කාර්මික, තොරතුරු තාක්ෂණය, කළමණාකරණ, වෛද්‍ය හා සෞඛ්‍ය විද්‍යාව සහ ශීතකරණ හා වායුසමීකරණ යන ක්ෂේත්‍ර 13ක් සඳහා පෙර ඉගෙනුම් ඇගයීම (RPL) සහතික පත්‍ර 1,215ක් නිකුත් කර ඇත. මීට අමතරව ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය මඟින් සිදු කරනු ලබන පෙර ඉගෙනුම් ඇගයීම (RPL) සඳහා අවශ්‍ය වැඩහල් පහසුකම් තාක්ෂණ හා කාර්මික විද්‍යාල මඟින් සපයා ඇත.
- තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39 හරහා NVQ 3,4 මට්ටමේ සහතික පත්‍ර 13,428ක්, NVQ 5,6 මට්ටමේ සහතික පත්‍ර 2,854ක්, දෙපාර්තමේන්තු සහතික පත්‍ර 7,426ක් ද ලෙස මුළු සහතික පත්‍ර 23,700ක් නිකුත් කර ඇත.
- Gamma Pizza Kraft Lanka (Pvt) Ltd ආයතනයේ සමාජ සත්කාරක ව්‍යාපෘතියක් ලෙස එම ආයතනය, සේවා ලංකා පදනම හා දෙපාර්තමේන්තුව අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමට අනුව අනුරාධපුරය, මහනුවර හා කුරුණෑගල යන තාක්ෂණ විද්‍යාලවල හා කුලියාපිටිය, නුවරඑළිය, මාතර හා කළුතර යන කාර්මික විද්‍යාලවල ක්ෂණික සේවා අවන්හල් (QSR) NVQ 4 පාඨමාලාව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර, පුහුණු ඒකක ස්ථාපනය කර පුහුණු පාඨමාලාව ආරම්භ කර ඇත. මේ සඳහා Pizza ආයතනය මඟින් එක් පුහුණු ඒකකයක් සඳහා රු.මි.7ක් පමණ ආයෝජනය කර ඇත. මේ යටතේ සිසුන් 283ක් පමණ පුහුණුව සඳහා බඳවාගෙන ඇති අතර මින් පළමු කණ්ඩායම ලෙස සිසුන් 53 දෙනෙකු ක්ෂණික සේවා අවන්හල් ජාලයේ රැකියාගත වී ඇත.
- Alumax පෞද්ගලික ආයතනය හා දෙපාර්තමේන්තුව සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව ගාල්ල, මහනුවර යන තාක්ෂණ විද්‍යාල සහ මාතලේ, නුවරඑළිය, බණ්ඩාරවෙළ, රත්මලාන, කළුතර, බලපිටිය යන කාර්මික විද්‍යාල සඳහා ඇළුමිනියම් පිළිසකරකරණ පාඨමාලාව සඳහා පුහුණු අමුද්‍රව්‍ය නොමිලේ ලබා දී ඇති අතර සිසුන් 716ක් පුහුණුව ලබමින් සිටී.
- ටෙක් උදාන වැඩසටහන යටතේ තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල පුහුණු ධාරිතාව වැඩිකිරීම හා ආකර්ශණීය පුහුණු මධ්‍යස්ථාන ලෙස නවීකරණය කිරීම ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශ්‍රම දායකත්වය යටතේ සිදුකරනු ලබන අතර මරදාන තාක්ෂණ විද්‍යාලයේ පස් මහල් කුලසිංහ ගොඩනැගිල්ලේ සමස්ත නවීකරණ කටයුතු වලින් 30%ක් පමණ අවසන් කර ඇති අතර මාතර කාර්මික විද්‍යාලයේ නවීකරණ කටයුතු අවසන් අදියරේ ක්‍රියාත්මක වේ. මෙම නවීකරණ කටයුතු සඳහා රු.මි. 25ක ප්‍රතිපාදන 2024 වර්ෂය සඳහා ලබා දී ඇත.
- කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (KOICA) සහ දෙපාර්තමේන්තුව අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලාවල ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ වැඩහල් නවීකරණය වෙනුවෙන් (KOICA) විසින් වෙන්කළ අරමුදලින් ඉතිරි වූ අරමුදල් මරදාන තාක්ෂණ විද්‍යාලයේ කුලසිංහ ගොඩනැගිල්ලේ සනීපාරක්ෂක පහසුකම් නවීකරණය හා ඉතිරි වැඩ නිම කිරීමට හා අනෙකුත් ප්‍රතිලාභී විද්‍යාලවල ජලනල පාඨමාලාවේ පන්තිකාමර ඉදිකිරීම වෙනුවෙන් ලබා දුන් අතර රත්නපුර, මාතර, රත්මලාන යන තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල ජලනල පාඨමාලාවේ පන්තිකාමර නවීකරණය හා කුලසිංහ ගොඩනැගිල්ලේ හතරවන මහලේ නවීකරණ කටයුතු සියල්ල අවසන් කර ඇත. මේ සඳහා රු.මි. 39.93ක මුදලක් වැය කර ඇත.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කළ කාර්මික ජලනල තාක්ෂණ වැඩහල, (Industrial Plumbing) පරිගණක ආශ්‍රිත සැලසුම්කරණ තාක්ෂණ විද්‍යාගාරය (Drafting Technology) හා සැලසුම් ශිල්පී විද්‍යාගාරය සඳහා (Draughtmanship) රු.මි. 300ක් පමණ වටිනා නවීන වැඩහල් උපකරණ, පරිගණක හා මෘදුකාංග, පුහුණු උපකරණ හා ලී බඩු උපකරණ සියල්ල කොරියානු රජය මඟින් ප්‍රදානය කළ අතර සියලු උපකරණ සවිකර පූර්ණ පහසුකම් සහිත වැඩහල් හා විද්‍යාගාර සිසුන්ගේ පුහුණු කටයුතු සඳහා යොදා ගැනීම ආරම්භ කර ඇත. මේ වනවිට ප්‍රතිලාභී විද්‍යාලවල නව පාඨමාලා ආරම්භ කර සිසුන් 137ක් සැලසුම් ශිල්පී පාඨමාලාවලද, 87 දෙනෙකු කාර්මික ජලනල තාක්ෂණ පාඨමාලාවේ ද පුහුණුව ලබමින් සිටී.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ජලනල තාක්ෂණ උපදේශකවරුන් හා ශිල්ප ප්‍රදර්ශකවරුන් 20ක් හා පරිගණක ආශ්‍රිත සැලසුම් ශිල්පී උපදේශකවරුන් 20ක් සඳහා කොරියානු ජාතික මහාචාර්යවරුන් විසින් දින 35ක නේවාසික පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන මරදාන තාක්ෂණ විද්‍යාලයේ වැඩිදියුණු කළ වැඩහල් හා විද්‍යාගාර භාවිතයෙන් පවත්වන ලදී. කොරියානු ජාතික මහාචාර්යවරුන් විසින් සකස් කරනු ලැබූ ඉගෙනුම් අත්පොත් මුද්‍රණය කර ගුරු හා ශිෂ්‍ය භාවිතය සඳහා ලබා දී ඇත. මෙම මහාචාර්යවරුන් විසින් උපදේශකවරුන් සඳහා පසු ඇගයීම් පවත්වන ලදී.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ වෘත්තීය පුහුණුව නිමකළ පසු රැකියාගත පුහුණුව හා රැකියා පරිසරයට අනුගත වීම හා කර්මාන්ත ආචාරධර්ම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් අත් පොතක් සකස්කිරීමේ කටයුතු කර්මාන්ත ක්ෂේත්‍රයේ සම්පත් දායකයින් හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා සිදු කරන ලදී. මෙම මාර්ගෝපදේශය ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය හරහා ප්‍රකාශ (e-book) කිරීමට බලාපොරොත්තු වේ.
- Art of Living පදනම හා දෙපාර්තමේන්තුව සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව මරදාන, රත්නපුර, යාපනය යන තාක්ෂණ විද්‍යාලවල හා මඩකලපුව කාර්මික විද්‍යාලයේ විදුලි පාඨමාලාවලට අදාළ වැඩහල් නවීකරණය කර පුහුණු උපකරණ සපයා ඇත. රු.මි.13ක් පමණ වටිනා උපකරණ හා පුහුණු අමුද්‍රව්‍ය නොමිලේ ලබා දෙන ලදී.
- මරදාන, මහනුවර, කෑගල්ල, බණ්ඩාරවෙල හා සමන්තුරේ යන තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල කොරියානු ආධාර යටතේ වැඩිදියුණු කළ මෝටර් කාර්මික වැඩහල්වල පශ්චාත් කළමනාකරණ වෙනුවෙන් ඇමරිකානු ඩොලර් 75,500ක ප්‍රදානයන් හරහා එම වැඩහල්වල උපකරණ අළුත් වැඩියාවන් හා නව උපකරණ මිලදී ගැනීම තුළින් වැඩහල් යාවත්කාලීන කරන ලදී.
- ජර්මානු ආධාර යටතේ ක්‍රියාත්මක වන GIZ VTSL ව්‍යාපෘතිය හරහා කළමනාකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 5ක් පවත්වා ඇති අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් 10 දෙනෙකු සහභාගී වී ඇත. ජර්මානු Chamber of Construction (HWK) ආධාර යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උපදේශකවරුන් සඳහා ජලනල තාක්ෂණය හා ඉදිකිරීම් අංශ සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් දෙකක් පවත්වා ඇති අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් උපදේශකවරුන් 5 දෙනෙකු සහභාගී වී ඇත.
- KOICA හා JICA ස්වේච්ඡා නිලධාරීන් හරහා ඉගැන්වීම් කටයුතු සඳහා සහාය ලබා දීම සඳහා මරදාන, ගාල්ල, රත්නපුර, මාතර යන විද්‍යාල සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය හා කොරියන් භාෂාව ඉගැන්වීම සඳහා ස්වේච්ඡා නිලධාරීන් සිව් දෙනෙකු අනුයුක්තව සේවය ලබා දේ.
- අයවැය ප්‍රතිපාදන යටතේ මරදාන, අනුරාධපුර, අම්පාර තාක්ෂණ විද්‍යාලවල සූර්ය පැනල පද්ධති සවිකිරීම අවසන් කර ඇති අතර මේ සඳහා රු.මි.30.5ක් වැයකර ඇත. මෙමඟින් මාසික විදුලි පිරිවැය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.
- තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා රු.මි.32.8ක් වැය කර ඇති අතර කාර්මික විද්‍යාලවල හඳුනාගත් ප්‍රමුඛතාගත ව්‍යාපෘති 14ක් හා තාක්ෂණ විද්‍යාලවල ව්‍යාපෘති 8ක නවීකරණ කටයුතු අවසන් කර ඇති අතර අනෙකුත් ව්‍යාපෘති සඳහා අවශ්‍ය ගොඩනැගිලි අමුද්‍රව්‍ය මිලදී ගෙන ඇත.
- වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳව තරුණ පරපුර දැනුවත් කිරීමේ අරමුණින් දෙරණ මාධ්‍ය ජාලය සමඟ එක්ව පවත්වනු ලබන *"Derana Skill Force"* ජාතික වැඩසටහන මරදාන, ගම්පහ, ඇඹිලිපිටිය, ගාල්ල, කුරුණෑගල, නුවරඑළිය, කළුතර, මොණරාගල, කෑගල්ල, රත්මලාන, මාතර, අනුරාධපුරය සහ පොළොන්නරුව යන තාක්ෂණ හා කාර්මික විද්‍යාල 13ක පවත්වා සිසුන් 18,000ට ආසන්න ප්‍රමාණයක් ලියාපදිංචි කර ඇත.

- "2024 ලෝක තරුණ නිපුණතා දිනයට" සමගාමීව රත්මලාන ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පැවති නිපුණතා තරගාවලියට සහභාගී වූ තරඟකරුවන් අතරින් කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව වෙනුවෙන් හොඳම නව නිපැයුමට හිමි රන් සම්මානය ආණමඩුව කාර්මික විද්‍යාලයත්, හොඳම ව්‍යවසායකයන්ට හිමි පළමු හා දෙවන ස්ථාන රත්මලාන කාර්මික විද්‍යාලයත්,හොඳම ව්‍යාපෘති සැලැස්ම සඳහා සම්මානය රත්නපුර තාක්ෂණ විද්‍යාලය විසින් දිනා ගන්නා ලදී.

## 4.4. සිසුන් බඳවාගැනීම

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍ර | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවාගැනීම් 2024.12.31 |
| 01. | කෘෂිකාර්මික, වැවිලි සහ පශු සම්පත් | 1,610 | 1,942 | 2,300 | 1,773 |
| 02. | මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව | 4,460 | 4,676 | 3,710 | 5,141 |
| 03. | ගොඩනැගිලි ඉදි කිරීම | 6,080 | 4,599 | 4,665 | 3,792 |
| 04. | විදුලි, ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ | 2,270 | 2,440 | 3,540 | 2,503 |
| 05. | මූල්‍ය, බැංකුකරණය සහ කළමනාකරණය | 1,490 | 1,312 | 2,340 | 1,082 |
| 06. | ආහාර තාක්ෂණය | 370 | 211 | 235 | 154 |
| 07. | මැණික් සහ ස්වර්ණාභරණ | 60 | 52 | 120 | 49 |
| 08. | හෝටල් සහ සංචාරක | 60 | 554 | 570 | 1,203 |
| 09. | තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය තාක්ෂණය | 3,480 | 3,329 | 4,700 | 3,650 |
| 10. | භාෂා | 1,110 | 1,524 | 1,500 | 1,314 |
| 11. | සම් භාණ්ඩ සහ පාවහන් | 120 | 51 | 60 | 42 |
| 12. | මෙකාට්‍රොනික් තාක්ෂණය | 260 | 237 | 260 | 217 |
| 13. | වෛද්‍ය සහ සෞඛ්‍ය විද්‍යාව | | | 240 | 151 |
| 14. | ලෝහ සහ සැහැල්ලු ඉංජිනේරු විද්‍යාව | 1,025 | 1,434 | 1,300 | 1,742 |
| 15. | කාර්යාල කළමනාකරණය | 885 | 707 | 840 | 587 |
| 16. | ශීතකරණ සහ වායු සමීකරණය | 630 | 709 | 650 | 873 |
| 17. | රෙදිපිළි සහ ඇඟලුම් | 330 | 328 | 180 | 342 |
| 18. | දැව කර්මාන්තය | 120 | 131 | 250 | 91 |
| 19. | කර්මාන්ත අවශ්‍යතා මත හඳුනාගත් වෙනත් පාඨමාලා | - | - | 2,540 | 423 |
| **එකතුව** | | **24,360** | **24,236** | **30,000** | **25,129** |

## 4.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39 සඳහා ක්ෂේත්‍ර 18ක් යටතේ පාඨමාලා 119ක් සඳහා සිසුන් 27,000 ක් බඳවා ගැනීමට ඉලක්ක කර ඇත. මේ යටතේ NVQ 3 / 4 පාඨමාලා 81 ද, NVQ 5 / 6 පාඨමාලා 36 ද, ඉතිරි පාඨමාලා සහතිකපත් පාඨමාලා ලෙස ආරම්භ කිරීමට සැලසුම් කර ඇත
- විවිධ අධ්‍යාපන මට්ටම්වල සිටින පුද්ගලයන් හට වෘත්තීය අධ්‍යාපන අවස්ථා විවර කරමින් එක් එක් ප්‍රදේශ වල වැඩි ඉල්ලුමක් පවතින හා වර්තමාන රැකියා වෙළඳපොළට සරිලන කර්මාන්ත ක්ෂේත්‍රයේ පාඨමාලා පුළුල් කරමින් මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තුව, ගොඩනැගිලි ඉදිකිරීම්, විදුලි, ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ, ඇඟළුම් ක්ෂේත්‍රය, තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය තාක්ෂණය හා දැව කර්මාන්තය ආදී ක්ෂේත්‍රවලට අදාළ පාඨමාලා 18ක් සහ ආහාර තාක්ෂණය, හෝටල් සහ සංචාරක, වෛද්‍ය සහ සෞඛ්‍ය විද්‍යාව හා කාර්යාල කළමනාකරණය ආදී ක්ෂේත්‍රවලට අදාළව පාඨමාලා 14 ක්ද නව පාඨමාලා ලෙස ආරම්භ කිරීමට සැලසුම් කර ඇත
- උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව හදාරන පාසැල් සිසුන් 1,000ක් ආවරණය වන පරිදි තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල වැඩහල් සහ විද්‍යාගාර තුළ ප්‍රායෝගික පුහුණු අවස්ථා ලබා දීමට සැලසුම් කර ඇත
- සිසුන් හා ගුරුවරුන් සඳහා ගුණාත්මක යටිතල පහසුකම් සැපයීමේ අරමුණින් තෝරාගත් තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල ශිෂ්‍ය හා ගුරු නේවාසිකාගාර, ශිෂ්‍ය සනීපාරක්ෂක පහසුකම්, පන්තිකාමර ගොඩනැගිලි, වැඩහල් ගොඩනැගිලි, පරිපාලන ගොඩනැගිලිවල අත්‍යාවශ්‍ය නවීකරණ සහ වැඩිදියුණු කිරීම් 2025 අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ යටතේ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, යාපනය, මහනුවර, කුරුණෑගල හා රත්නපුර යන තාක්ෂණ විද්‍යාල හා තෝරාගත් කාර්මික විද්‍යාල 17ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ඉලක්ක කර ඇත
- තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල විදුලි පරිභෝජන පිරිවැය අවම කිරීමේ අරමුණින් හා සම්පත් උපරිමව භාවිතා කරමින් රජයේ ප්‍රතිපාදන වැය නොකර පෞද්ගලික අංශය හා ඒකාබද්ධව වහල මත සූර්යපැනල සවි කිරීමට සැලසුම් කර ඇත. එමගින් මෙගාවොට් 10-15 අතර විදුලි ප්‍රමාණයක් ජනනය කිරීමට අපේක්ෂා කෙරේ.

- නිපුණතා සිසු සවිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ තෝරාගත් වෘත්තීය පාඨමාලාවල පුහුණුව ලබන අඩු ආදායම්ලාභී සිසුන් සඳහා මසකට රු.4,000/= බැගින් සිසුන් 12,500ක් සඳහා රු.මි. 312ක ශිෂ්‍යත්ව පිරිනැමීමට සැලසුම් කර ඇත
- 2025 වර්ෂය තුළ පුහුණුව සම්පූර්ණ කරන සිසුන් සඳහා NVQ 5,6 සහ NVQ 3,4 සහතික පත්‍ර 15,000ක් දෙපාර්තමේන්තු සහතික පත්‍ර 10,000ක් සහ RPL සහතික පත්‍ර 2,500 ඇතුළුව මුළු සහතික පත්‍ර 27,500ක් නිකුත් කිරීමට සැලසුම් කර ඇත
- විදුලි, පෙදරේරු, ජලනල කාර්මික, වායු සමීකරණ, ලී වැඩ, මිනුම් සහායක ආදී ක්ෂේත්‍රවල ශ්‍රමිකයන්හට RPL සහතික නිකුත් කිරීම සඳහා මහජන උපයෝගීතා කොමිසම, මහාරාජා සමූහ ව්‍යාපාරය සහ ඕසෝන් ඒකකය (පරිසර අමාත්‍යාංශය) යන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට සැලසුම් කර ඇත. එසේම, නාවික හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ (Maritime and Logistic) පාඨමාලා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් Southern Maritime Training Institute (SMTI) ආයතනය සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව මරදාන තාක්ෂණ විද්‍යාලයේ සිසුන්ට නව පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දීමට සැලසුම් කර ඇත
- කොරියානු ආධාර යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා මරදාන, රත්නපුර හා මාතර, රත්මලාන යන ප්‍රතිලාභී විද්‍යාලවල වැඩිදියුණු කළ විද්‍යාගාර හා වැඩහල් යොදාගෙන Drafting Technology හා Industrial Plumbing පාඨමාලා පුළුල් කර පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා සඳහා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවාගැනීමට සැලසුම් කර ඇත
- ජර්මානු ආධාර යටතේ ක්‍රියාත්මක GIZ ව්‍යාපෘතිය හරහා සුනිත්‍ය බලශක්ති තාක්ෂණය Renewable Energy NVQ 5 පාඨමාලාව හා Solar Photovoltaic Technician, NVQ 4 පාඨමාලාව සඳහා විදුලි ක්ෂේත්‍රයේ ගුරුවරුන් පුහුණු කර මඩකලපුව, කළුතර, ගම්පහ, අනුරාධපුර යන කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල නව පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර මහනුවර හා මරදාන තාක්ෂණ විද්‍යාලයන්හි හෝටල් හා සංචාරක ක්ෂේත්‍රයේ නව පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර ඇත
- හෝටල් හා සත්කාරක සේවා ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා පුළුල් කිරීමේ අරමුණින් Pizza Hut සමාජ සත්කාරක වැඩසටහන හරහා ලැබෙන අරමුදල් උපයෝගී කරගෙන ක්ෂණික සේවා අවන්හල් (Quick Service Restaurant), NVQ 4 පාඨමාලාව නව විද්‍යාල 4ක (මඩකලපුව, බදුල්ල, දඹුල්ල, රත්නපුර) ආරම්භ කිරීමට සැලසුම් කර ඇත
- පේස්ට්‍රි, බේකරි හා කුකරි හා හෝටල් ක්ෂේත්‍රයේ වෙනත් පාඨමාලා පුළුල් කිරීම හා නව පාඨමාලා ආරම්භ කිරීම සඳහා (KOICA) ආධාර ලබාගැනීම සඳහා සකස් කළ ව්‍යාපෘති වාර්තාව සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා කොයිකා ආයතනයට ඉදිරිපත් කර ඇත. මේ යටතේ විද්‍යාල 12ක යටිතල පහසුකම් සංවර්ධනය කර පාඨමාලා ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

# 05. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTASL)

## 5.1. හැඳින්වීම

1995 අංක 12 දරණ වෘත්තීය පුහුණු අධිකාරී පනතින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ප්‍රමුඛතම ආයතනය වේ. ඉකුත් වසර 28ක කාලය තුළ විවිධ මට්ටමින් පාසල් අධ්‍යාපනය නිම කළ රැකියා විරහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව හා නිපුණතාවය ලබා දී දැනුම, හැකියාව ඇති වෘත්තිකයින් බවට පත් කර ඔවුන්ගේ සෘජු දායකත්වය ජාතික ආර්ථිකයට ලබා දීමෙන් රටේ සංවර්ධන ක්‍රියාදාමයට විශාල දායකත්වයක් ලබා දීමට හැකි වී තිබේ. ජාතික වෘත්තීය පුහුණු ආයතන 08ක්, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22ක් හා ප්‍රාදේශීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 164ක් වශයෙන් පුහුණු මධ්‍යස්ථාන 194ක පුහුණු මධ්‍යස්ථාන ජාලයක් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වේ. පාඨමාලා කාලය මාස 03 සිට අවුරුදු 2 දක්වා වන කාල පරාසයකට අයත් වන පුහුණු ක්ෂේත්‍ර 18ක් යටතේ පාඨමාලා ක්‍රියාත්මක කරමින් වසරකට 42,000ට ආසන්න තරුණ තරුණියන් සංඛ්‍යාවක් පුහුණුව සඳහා බඳවා ගනු ලැබේ.

**දැක්ම**
ගෝලීය රැකියා නිපුණත්වය ලබා දීම තුළින් උසස් ජීවන තත්ත්වයක් ඇති කිරීම

**මෙහෙවර**
ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ක්‍රියාශීලි හා නිර්මාණශීලි වෘත්තීය අධ්‍යාපනය, පුහුණුව සහ සේවා සපයන්නා බවට පත්වීම

## 5.2. කාර්යයන්

- වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා රැකියාගත වීම සඳහා අවශ්‍ය දක්ෂතා ලබා ගත හැකි වන පරිදි සුදුසුකම් ඇති තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව සෘජුව හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ නියෝජ්‍යායතනයක් මඟින් ලබා දීම
- ජාතික වෘත්තීය පරීක්ෂණ හා විභාග පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව ලබා ඇති ආධුනිකයින්ට සහතික සහ වෙනත් ප්‍රදාන නිකුත් කිරීම
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශන ලබා දීම
- රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ නියෝජ්‍යායතන විසින් පවත්වා ගෙන යනු ලබන සියලුම ආකාරයේ වෘත්තීය පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම, පහසු කිරීම සහ ඒවාට සහය වීම
- වෘත්තිය පුහුණුව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම හා වෘත්තීය පුහුණුව සංවර්ධනය කිරීම
- වෘත්තීය පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති තැනැත්තන්ට හැකි අවස්ථාවලදී රැකියා ස්ථානගත සේවා ලබා දීම
- අන්තර්ජාතික වෘත්තීය පුහුණු සංවිධාන හා ආයතන සමඟ සම්බන්ධව බැඳීම් ඇති කර ගැනීම
- රාජ්‍ය හා පෞද්ගලික අංශ විසින් වෘත්තීය පුහුණුව සඳහා අවශ්‍ය පුහුණුකරුවන් පුහුණු කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පහසු කිරීම

## 5.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- පුහුණු කාර්යයට දායක වන අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් හා පළපුරුදු අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් 1/3ක පමණ ප්‍රමාණයක් සේවයෙන් ඉවත්ව ගොස් ඇති පසුබිමක තරුණ තරුණියන් වැඩි ප්‍රමාණයක් විදෙස් රැකියා සඳහා යොමු වීමේ අභිලාෂයෙන් රැකියාභිමුඛ පාඨමාලාවන් හැදෑරීමට දැක් වූ ඉල්ලුම සපුරාලීමට ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ඒ සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සලසා ගනිමින් උපරිම සේවා දායකත්වයක් සපයා ඇත. ඒ අනුව,

- දිවයින පුරා විහිදුන පුහුණු මධ්‍යස්ථාන ජාලය තුළින් වසරකට ආධුනික බඳවා ගැනීම් අදියර 4 කින් පවතින අතර පූර්ණකාලීනව හා අර්ධකාලීනව පිළිවෙළින් පුහුණුව සඳහා තරුණ තරුණියන් 24,780ක්
- හා 6433ක් වශයෙන් 31,213ක් බඳවා ගැනීමට සමත් වීම. එය ඉලක්කගත සංඛ්‍යාවෙන් 75%ක් පමණ වේ.
- විවිධ ක්ෂේත්‍රයන් යටතේ පුහුණුව සඳහා බඳවාගත් ආධුනිකයින් ඇගයීම සඳහා යොමු කිරීමෙන් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත් 28,258ක් හා ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ) සහතිකපත් 3,571ක් ලබා දීමට කටයුතු කිරීම. එය සමස්ත රාජ්‍ය වෘත්තීය පුහුණු ආයතනයන් හා සැසඳීමේදී 44%ක ප්‍රතිශතයකි.
- 2024 වර්ෂයේ ඉලක්කගත කළ රු.මි. 300ක් වූ ආදායම් ඉපයීම අභිබවා රු.මිලි. 578ක් දක්වා ආදායමක් ඉපයීමට සමත් වීම.
- රාජ්‍ය වියදම් සමාලෝචනය මඟින් ලබා දී ඇති නිරීක්ෂණයන්ට අනුගත වෙමින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විවිධ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ආයතන සමඟ සහයෝගීතා ගිවිසුම් සමඟ යොමු වීමට කටයුතු කළ අතර එමගින් වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා විවිධ සංවර්ධනයන් සිදු කිරීමට කටයුතු කර ඇත.

| ගිවිසුම්ගත ආයතනය | පරමාර්ථය / කාර්යභාරය |
|---|---|
| කර්මාන්ත අමාත්‍යාංශය - විදාතා ඒකකය | ජලනල විදුලි හා රූපලාවන්‍ය ක්ෂේත්‍ර වල නිපුණ ශ්‍රමිකයින් බිහි කිරීම සඳහා වැඩසටහන් 19ක් මඟින් පුහුණුවන්නන් 357 ක් පුහුණු කිරීම |
| Insight Interior EDMUN (IIEM) | Interior Designing ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අදියර ලෙස 15 දෙනෙකු පුහුණු කිරීම |
| ANI ARTS Academics Lanka | සමාජ සත්කාරක වැඩසටහනක් ලෙස තලල්ල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය තුළ අඩු ආදායම් ලාභී පුහුණුවන්නන් 365 කගේ කුසලතා සංවර්ධනය සඳහා කටයුතු කිරීම |
| S Net Chamber (Pvt) Ltd | අහංගම Seascape හෝටල්සංකීර්ණය ප්‍රතිසංස්කරණය, වැඩි දියුණු කිරීම කළමනාකරණය කිරීම |
| National Youth Corps | ජාතික යොවුන් සේනාංක (NYC) සිසුන් පාඨමාලා සඳහා බඳවා ගැනීම |
| South Asia Gateway Terminals (Pvt) Ltd | වරාය බහාලුම් පර්යන්ත මෙහෙයුම් නැව් වල නඩත්තු කාර්මික ශිල්පීය කුසලතා සංවර්ධනය කිරීම සඳහා පුහුණුවන්නන් 17 දෙනෙකු පුහුණු කිරීම |
| Oracle Academy | ලොව පිළිගත් Oracle Academy විෂයමාලාව ICT Level 5 Level 4 සහ Software Developer පාඨමාලා සඳහා ඇතුළත් කිරීම හා Oracle සහතිකපත්‍රය ලබා දීම |
| NEXTGEN | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විදේශ රැකියා සඳහා නිපුණතාවය ලබා දීම සඳහා අත්තිඩිය වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ ඉදි කිරීම් සහ ආරක්ෂක පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කිරීම. |
| Scope Global (Pvt) Ltd | විශේෂ අවශ්‍යතා ඇති ශිෂ්‍යයන්ගේ කුසලතා සංවර්ධනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වෙනිවැල් කොළ මධ්‍යස්ථානය හරහා පාසල් පද්ධතිය තුළ අන්තර්ගත අධ්‍යාපනය තවදුරටත් ශක්තිමත් කිරීම |
| Euro Cosmetics | රූපලාවන්‍ය පාඨමාලාවන් සඳහා අවශ්‍ය උසස් තත්ත්වයේ පුහුණු ද්‍රව්‍ය අඛණ්ඩව සැපයීම |
| St. Anthonys Industries group | ජලනල විදුලි හා වඩු කාර්මික ක්ෂේත්‍රවල නිපුණ ශිල්පීන් 1,000 දෙනෙකු බිහි කිරීම |
| Idea Industries | ඇලුමිනියම් පිරිසැකසුම් හා අත්කම් ක්ෂේත්‍රයන්හි නියැලෙන ආධුනිකයින්ගේ ශිල්පීය කුසලතා වැඩිදියුණු කිරීම |
| පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පාසල් හැර ගිය ළමුන් සඳහා ICT පාඨමාලාආරම්භ කිරීම |
| MOSVOLD Martinos | පාඨමාලා හදාරන ආධුනිකයින්ගෙන් මූල්‍ය අපහසුතා ඇති සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම |

- වෘත්තීය පුහුණුවේ තවත් දිශානතියකට පා තබමින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වන Autism Spectrum දරුවන් සඳහා ICT Technician පාඨමාලාව ද, Down Syndrome දරුවන් සඳහා Food and Beverage Associate පාඨමාලාවද, නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ ආරම්භ කර ඇත. Food and Beverage Associate පාඨමාලාවේ දරුවන් මේ වනවිට Mount Lavinia හෝටලයේ වැඩිදුර පුහුණුව ලබමින් සිටී. තවද කථන ආබාධ සහිත දරුවන් සඳහා Graphic Designer පාඨමාලාවද පසුගිය වසර 10 කට වැඩි වකවානුවක සිට සාර්ථකව පවත්වනු ලැබේ.
- කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 12ක STEAM CLUB පිහිටුවා 2024.04.02 නියමු ව්‍යාපෘතියක් ලෙස එකම දිනයක අනුග්‍රාහක ආයතන 12ක් සම්බන්ධ කර ගනිමින් තෝරා ගත් පාසල් 12 තුළ නිපුණතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- කාන්තා කාර්යාංශය සමඟ සම්බන්ධව කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සිටින වයස අවු. 25 ට අඩු, අඩු ආදායම්ලාභී තරුණියන් තෝරා ගනිමින් 130 දෙනෙකු දැනුවත් කර ඔවුන්ට වෘත්තීය විභවයන් හඳුන්වා දෙමින් කෙටිකාලීන පාඨමාලා (NVQ 3 මට්ටම) ආරම්භ කිරීමෙන් පසු සූපවේදී, බේකරි, රූපලාවන්‍ය, වැඩිහිටි සුරකුම් සහ ඇඳුම් මැසීමේ පාඨමාලා අවසන් කරන ලද තරුණියන් හට සහතිකපත් ලබා දී ඇත.
- දිස්ත්‍රික් මට්ටමින් EDEX Expo – 2024, Career Fair, Skill Force හා ජයගමු ශ්‍රී ලංකා, X – BAN 2024 යනාදී ප්‍රදර්ශන සඳහා සම්බන්ධ වෙමින් ප්‍රවර්ධන කටයුතු සිදු කර ඇත.
- අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය උදෙසා විවිධ කර්මාන්තගත ආයතන අනුග්‍රහය යටතේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 877ක් හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 636ක් සඳහා දේශීය පුහුණුව සඳහා යොමු කර ඇත. තවද විදේශගත පුහුණුව සඳහා කාර්යමණ්ඩලයේ 12 දෙනෙකු හට අවස්ථාව ලබා දී ඇත.
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට දිවයින පුරා පිහිටි මධ්‍යස්ථාන මඟින් පුහුණුව ලබා දීමේ අරමුණින් ළමා මානසික සෞඛ්‍ය පිළිබඳ මහාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වයද රැගෙන Food and Beverage Associate and ICT Technician උපදේශකවරුන් 37ක් සඳහා කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවත්වා ඇත.
- දකුණු කොරියානු රජයේ ආනයන අපනයන බැංකුව (EXIM BANK) හා මානව සම්පත් සංවර්ධන වැඩසටහන (HRD Korea) ආධාර යටතේ පිළිවෙළින් ඩොලර් මිලි.1.5 ක හා 1.61 නවීන පුහුණු උපකරණ හා ආශ්‍රිත පහසුකම් ඔරුගොඩවත්ත හා නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනය වෙත ලගාවීම හා නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ විදේශ රැකියාවන්හි නියුතුව සිට ලංකාවට පැමිණි අය ඉලක්ක කර ගනිමින් කෙටිකාලීන නියමු පාඨමාලා ලෙස CNC, Welding, Automobile හා Electrician පාඨමාලා අරඹන ලදී.
- Japan International Corporation System (JICS) ආධාර යටතේ යාපනය, කිලිනොච්චිය, මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්කයන්හි පුහුණු මධ්‍යස්ථාන 6ක ක්‍රියාත්මක ඇඟලුම් කර්මාන්ත පාඨමාලා සඳහා ජපාන යෙන් මිලියන 404ක් වටිනා උපකරණ ලබා දීමට අවශ්‍ය මූලික කටයුතු ආරඹා ඇත.
- GIZ ව්‍යාපෘති ආධාර යටතේ
    - මාතර-අකුරැස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වැඩිහිටි සත්කාරක (Elder Care) පාඨමාලාව ආරම්භ කිරීමට අදාළ උපකරණ හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මිලි. 10.5ක ආධාර ලබා දීම.
    - තෝරා ගත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 5කට හරිත සංකල්පය හඳුන්වා දීමට අදාළ පරිසර ඇගයීම් සඳහා වන මෙවලම් හඳුන්වා දීමට මූලික පියවර ගැනීම.
- Association of Public Finance Accountants of Sri Lanka (APFASL) විසින් පිරිනමන රාජ්‍ය අංශයේ හොඳම වාර්ෂික වාර්තාව සහ ගිණුම් සඳහා ලෝකඩ සම්මානය 2023 වර්ෂය වෙනුවෙන් හිමි කර ගන්නා ලදී.
- තරුණ තරුණියන්ගේ රැකියා විරහිතභාවය අවම කිරීමේ අරමුණින් ආයතන 157ක් හා සම්බන්ධ වෙමින් රැකියා වෙළෙඳපොළ 6ක් පවත්වා ඇත.

## 5.4. ආධුනික බඳවාගැනීම්

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍ර | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | බඳවාගැනීම් | ඉලක්කය | බඳවාගැනීම් |
| 01. | කෘෂිකර්මය හා පශු සම්පත් | 75 | 70 | 60 | 96 |
| 02. | මෝටර් වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 3,175 | 2,993 | 3,100 | 2,396 |
| 03. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 3,865 | 3,030 | 3,415 | 2,564 |
| 04. | විදුලි විද්‍යුත් හා විදුලි සංදේශ | 4,170 | 3,803 | 4,365 | 2,559 |
| 05. | ආහාර තාක්ෂණය | 1,130 | 1,804 | 1,240 | 1,582 |
| 06. | මැණික් හා ස්වර්ණාභරණ | 150 | 94 | 90 | 82 |
| 07. | සෞඛ්‍ය හා සමාජීය ක්‍රියාකාරකම් | 180 | 73 | 520 | 102 |
| 08. | හෝටල් හා සංචාරක | 2,965 | 4,066 | 4,015 | 3,644 |
| 09. | පරිගණක හා තොරතුරු තාක්ෂණය | 10,770 | 9,600 | 10,510 | 7,659 |
| 10. | සම් හා පාවහන් | 60 | 48 | 30 | 23 |
| 11. | ලෝහ හා ලුහු ඉංජිනේරු | 1,435 | 1,648 | 1,340 | 1,031 |
| 12. | කාර්යාල කළමනාකරණය | 155 | 146 | 155 | 121 |
| 13. | පෞරුෂ ප්‍රජා සංවර්ධනය | 5,545 | 6,645 | 6,695 | 5,523 |
| 14. | මුද්‍රණ හා ඇසුරුම් | 90 | 56 | 90 | 55 |
| 15. | ශීතකරණ හා වායු සමීකරණ | 710 | 624 | 670 | 512 |
| 16. | රෙදිපිළි සහ ඇඟලුම් | 3,830 | 3,531 | 3,685 | 2,443 |
| 17. | දැව ආශ්‍රිත ක්ෂේත්‍ර | 1,290 | 846 | 1,140 | 781 |
| 18. | අනෙකුත් | 75 | 155 | 60 | 40 |
| **එකතුව** | | **39,670** | **39,232** | **41,180** | **31,213** |

## 5.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- තාක්ෂණික හා වෘත්තීය අංශයේ ඵලදායීත්වය හා කාර්යක්ෂමතාවය වර්ධනයට හා ගෝලීය ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතාවයන්ට උචිත පාඨමාලා හඳුන්වා දෙමින් ආධුනිකයින් 35,000ක් සඳහා පුහුණු අවස්ථා සැලසීම
- සංවර්ධන ප්‍රමුඛතා හා වෙළෙඳපොළ අවශ්‍යතා සමපාත වන විවිධ පාඨමාලා හා ආදායම් උත්පාදක මාර්ගයන් හඳුන්වා දෙමින් රු.මි.500ක ආදායම් උත්පාදක ඉලක්කයක් ළඟා කර ගැනීම
- පුහුණු මධ්‍යස්ථානයන්හි ධාරිතාවය වර්ධනය හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා රු.මි. 375 ක් ඇස්තමේන්තුගත කිරීම
- වෘත්තීය පුහුණුව සඳහා ඇස්තමේන්තුගත සෑම ආධුනිකයෙකු සඳහා ඇගයීම් පැවතීම තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත් 25,000ක් ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ) සහතිකපත් 10,000ක් ලබා දීම
- වෘත්තීය දැනුමක් ඇති ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නොමැති පුද්ගලයින්ගේ පෙර දැනුම ඇගයීම තුළින් සහතිකපත් 6,000ක් ලබා දීම
- වෘත්තීය පුහුණුව හා කර්මාන්තගත අවශ්‍යතාවයන් සමපාතික කිරීම උදෙසා කර්මාන්තයන් හා සහයෝගීත්වය වර්ධනය කිරීමේ කර්මාන්ත සංසද 09 ක් පැවැත්වීම හා එමගින් රැකියා වෙළෙඳපොළ 20ක් දිවයින පුරා පැවැත්වීම
- විවිධ ක්ෂේත්‍රයන්හි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනයන් හා ගිවිසුම්ගතව වෘත්තීය පුහුණු ප්‍රවර්ධනය Skill gap filling programmes හඳුන්වාදීමට නිරන්තරව කටයුතු කිරීම

| ගිවිසුම්ගත ආයතනය | පරමාර්ථය / කාර්යභාරය |
|---|---|
| Certis Lanka Home Nursing and Swift Care (Pvt) Ltd | NVQ Level 3 යටතේ ගෘහස්ථ හෙද නිලධාරියෙකු ලෙස අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීම තුළින් 500 දෙනෙකු පුහුණු කිරීම |
| Certis Lanka security solutions | NVQ Level 3 යටතේ ආරක්ෂක නිලධාරියෙකුට අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීම තුළින් 1,000 දෙනෙකු පුහුණු කිරීම |
| Department of Probation and Child Care | කැප්පෙටිපොල විශාඛා පුහුණු මධ්‍යස්ථානය හා සහතිකලත් පුහුණු පාසල සඳහා දැව ශිල්පී, විදුලි, පේස්ට්‍රි සහ බේකරි, ටේලර්, කොණ්ඩා මෝස්තර, රූපලාවන්‍ය ශිල්පී යන පාඨමාලා පවත්වා කුසලතා සංවර්ධනය කිරීම |

- GIZ ව්‍යාපෘති ආධාර යටතේ පහත කාර්යයන් ආරම්භ කිරීමට සැලසුම් කිරීම.

| | |
|---|---|
| Solar PV System පාඨමාලාව | කලුතර - බුලත්සිංහල |
| Caregiverපාඨමාලාව | ගම්පහ - වේයන්ගොඩ<br>යාපනය - කයිතඩි |
| Graphic Designing | කොළඹ - නාරාහේන්පිට |



TVEC තත්ත්ව කළමණාකරණ පද්ධති ස්ථාපනය කිරීම




වෘත්තීය මාර්ගෝපදේශක වෘත්තීය සඳහා NVQ සහතික පත්‍ර ප්‍රදානය-TVEC






ටෙක් උදාන වැඩසටහන මඟින් මාතර කාර්මික විද්‍යාලයේ නාවික හමුදා ශ්‍රම දායකත්වය යටතේ නවීකරණය කරනු ලැබූ ගොඩනැගිලි හා ශිෂ්‍ය වැසිකිළි පද්ධතිය-DTET



කාර්මික විද්‍යාලවල නවීකරණය කරන ලද පරිගණක ආශ්‍රිත සැලසුම්කරණ විද්‍යාගාර හා පන්ති කාමර -DTET






2024 ලෝක තරුණ නිපුණතා දිනයට සමගාමීව පැවති තරගාවලියේදී
ජයග්‍රහණ ලබාගත් තරගකරුවන්




Skills Expo ප්‍රදර්ශන කුටිය-VTA



Oracle Academy විෂයමාලාව හඳුන්වාදීමේ
වැඩසටහන-VTA




ජාතික යොවුන් සේනාංකය (NYC) සමඟ ගිවිසුම්
අත්සන් කිරීම-VTA

# 06. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA)

## 6.1. හැඳින්වීම

මෙම ආයතනය 1971 අංක 49 දරණ පනතින් ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස ආරම්භ කරන ලදුව 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය) ලෙස එහි කාර්යභාරය හා වගකීම තවදුරටත් පුළුල් කරන ලදී. වයස අවුරුදු 16 - 35ත් අතර තරුණ තරුණියන්ට විශේෂයෙන්ම කර්මාන්ත පාදක වූ ආධුනිකත්ව පුහුණුව යටතේ රැකියා ඉලක්ක කොට වෘත්තීය නිපුණතාවය ලබාදීමත්, අනෙකුත් වෘත්තීය ආයතන ආධුනිකයන් සඳහා රැකියාස්ථ පුහුණුව ලබාදීමත්, විශ්වවිද්‍යාල සිසුන් සඳහා විශේෂ කර්මාන්ත පුහුණුව ලබා දීමත්, ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා සංවර්ධනය සහ වලංගුගත කිරීමත් අධිකාරියේ ප්‍රමුඛ කාර්යභාරය වේ. තවද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය පුහුණු ජාතික ආයතන 04ක් ඇතුළුව දිවයින පුරා පිහිටුවා ඇති ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන මඟින් ද්විත්ව පුහුණු ක්‍රමය යටතේ (මධ්‍යස්ථාන තුළ සහ කර්මාන්තගත පුහුණුව) වෘත්තීය පුහුණුව ලබාදීම ක්‍රියාත්මක කරයි.

**දැක්ම**

මානව සම්පත් සංවර්ධනය මඟින් ශ්‍රී ලංකාවේ සමෘද්ධිය සැලසීම සඳහා සාර්ථක දායකත්වයක් දෙමින් කාර්යක්ෂම පුහුණු කිරීමේ ආයතනය බවට පත්වීම

**මෙහෙවර**

කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපුණ මිනිස් බල අවශ්‍යතා සපුරාලනු පිණිස මනාසේ සකසන ලද උසස්ම වෘත්තීය මට්ටමේ නිපුණතා පුහුණු වැඩසටහන් තුළින් තරුණ තරුණියන් හට වෘත්තීය හා කාර්මික පුහුණුව ලබා දීම

## 6.2. කාර්යයන්

- වෘත්තීය පුහුණුකිරීම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා සැලැස්වීම
- වෘත්තීය පුහුණුවට අදාළව සම්මතයන් නිශ්චය කිරීම
- වෘත්තීය පුහුණුවට අදාළව විභාග පැවැත්වීම හා සහතිකපත්‍ර සහ වෙනත් ප්‍රදානයන් නිකුත් කිරීම
- ජාතික ශිල්පීය පරීක්ෂණ පැවැත්වීම
- වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් පැවැත්වීම
- විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම
- වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම
- වෘත්තීය පුහුණු කිරීම් සම්බන්ධයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට උපදෙස් දීම
- සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් පවත්වා ගැනීම සහ ආශ්‍රිත විෂයයන් හා පාඨමාලා සම්බන්ධයෙන් ඇති සහතික ඩිප්ලෝමා සහ උපාධි සම තත්වයෙහිලා සැලසීම හා බලාත්මක කිරීම

## 6.3. 2024 වර්ෂයේ ජයග්‍රහණ

- ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමඟ එක්ව සාත්තු සේවක අංශයේ කුසලතා පරීක්ෂා කිරීම සඳහා NVQ 3 සහ NVQ 4 මට්ටම් සඳහා ලිඛිත හා යෝග්‍යතා පරීක්ෂණ ඊශ්‍රායලයේ දී පවත්වන ලදී. මෙම වැඩසටහන ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ රටක පවත්වනු ලැබූ ප්‍රථම අවස්ථාව මෙය වූ අතර NAITA සහ TVEC ආයතන මඟින් පවත්වනු ලැබූ පළමු නියමු ව්‍යාපෘතිය වේ.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO), ශ්‍රී ලංකා කර්මාන්ත සහ වාණිජ මණ්ඩල සම්මේලනය (FCCISL) සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) සමග එක්ව විදේශගත වීමට අපේක්ෂිත අයදුම්කරුවන්ගේ හෝටල් ක්ෂේත්‍රය පිළිබඳව නිපුණතාවය ලබා දීමේ අරමුණින් පැවැත්වීමට නියමිත Basic Skills for Hospitality Sector පාඨමාලාව පිළිබඳ අවබෝධතා ගිවිසුම 2024.05.15 දින අත්සන් තබන ලදී.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය මඟින් RPL ක්‍රමවේදය යටතේ NVQ 4 වන මට්ටම ලබා ගත් කේක් හැඩගැන්වීමේ ශිල්පී වෘත්තීයේ නියුතු වෘත්තිකයින් 250කට අධික ප්‍රමාණයක් NVQ සහතිකලාභී නිපුණ ශිල්පීන් ලෙස අභිෂේක ගැන්වීමේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය අධිකාරියේ කැණිමඩල ශ්‍රවණාගාරයේදී උත්සවාකාරයෙන් පවත්වන ලදී.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය සහ හේලීස් වතු සමාගමට අයත් කැලණිවැලි වතු සමාගමෙහි හැටන් කලාපයෙහි පිහිටි වතු සඳහා "ක්ෂේත්‍ර නිළධාරී (තේ)" NVQ L 04 පාඨමාලාවට ආධුනිකයින් බඳවා ගැනීමේ ආරම්භක වැඩසටහනක් සාර්ථක අයුරින් පැවැත්විණ.
- දෙස් විදෙස් රැකියා අපේක්ෂිත වෘත්තිකයන් සඳහා RPL ක්‍රමවේදය යටතේ NVQ සහතික ලබා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන අනුරාධපුර සල්ගාදු ක්‍රීඩාංගනයේ දී දෙදිනක් පුරා ක්‍රියාත්මක කරන ලදී.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පුහුණුව ලබන ආධුනිකයින්ගේ ජාත්‍යන්තර භාෂා පුහුණුව සහ නිපුණතා අධ්‍යාපනය වැඩිදියුණු කර ගැනීමේ අරමුණින් විශේෂ සාකච්ඡාවක් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියත් බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයත් අතර පැවැත්විණි.
- අධිකාරිය වෙත ආධුනිකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය විධිමත් ක්‍රමවේදයකට අනුව සිදුකිරීමේ වැඩපිළිවෙළ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන් දැනුවත් කිරීම මඟින් පුහුණුව සඳහා ඉල්ලුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සිදු කිරීම හා එයට සමගාමීව අධිකාරිය යටතේ පුහුණු වන ආධුනිකයින්ගේ පෞරුෂත්ව සංවර්ධනය, නායකත්ව පුහුණුව සහ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය සංවර්ධනය කොට වඩාත් නිපුණත්වයකින් යුක්ත ශ්‍රම බලකායක් බිහිකිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා යුධ හමුදාවේ පූර්ණ දායකත්වයෙන් දින පහක පෞරුෂත්ව සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කර ආධුනිකයින් හදාරන වෘත්තීය පිළිබඳ මූලික පුහුණුවක් තුළින් ආධුනිකත්ව පුහුණුව සඳහා යොමු කිරීමේ වැඩසටහනේ සමාරම්භක වැඩසටහන ඔරුගොඩවත්ත පිහිටි මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දී සිදු කරන ලදී.
- අධිකාරියේ පාඨමාලා නිමකල සහතිකපත්ලාභී තරුණ ව්‍යවසායකයන් හට නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ තම ව්‍යාපාරය වැඩිදියුණු කිරීමට ලංකා බැංකුවේ පූර්ණ දායකත්වයෙන් සහනදායී පොළී අනුපාතයක් යටතේ ණය ලබා දීමේ වැඩසටහනෙහි සාමාරම්භක උත්සවය නයිටා කැණිමඩල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.
- **"ලෝක තරුණ නිපුණතා දිනය"** පාදක කරගනිමින් ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ වෘත්තීය පුහුණු රැකියා ප්‍රදර්ශනයක් 2024 ජූලි මස 14 හා 15 දෙදින පුරා ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පරිශ්‍රයේදී පැවැත්වූ අතර, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ වෙළෙඳ කුටියක් ද අප විසින් ස්ථාපිත කරන ලදී.
- "පාසල් අධ්‍යාපනය නිමා කළ තරුණ තරුණියන් කර්මාන්තගත වෘත්තීය පුහුණුවට බඳවා ගැනීම තුළින් දේශීය හා විදේශීය රැකියා සඳහා සූදානම් කිරීමේ වැඩසටහන" යටතේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අධ්‍යාපනය නිමා කළ තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කරන ලදී.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය මඟින් දිස්ත්‍රික් කළමනාකරුවන් උදෙසා කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහනක් ගොඩගම රිච් හෝටලයේදී පැවැත්විය. 2024 දී නව පුහුණු වැඩසටහන් සහ ළඟා කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක පිළිබඳව එහිදී සාකච්ඡා කළ අතර කළමනාකරණ කුසලතා සහ ඉලක්ක පිළිබඳව විශේෂ දේශනයක් පැවැත්විය.

- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව ගම්පහ, ඉඹුල්ගොඩ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සහ වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරීම පිළිබඳව අවබෝධතා ගිවිසුමක් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාවේදී අත්සන් තබන ලදී.
- NAITA සහ Jaykay marketing services (pvt) limited අතර පැවති අවබෝධතා ගිවිසුම දීර්ඝ කිරීම සිදු කෙරුණි. මේ යටතේ සුපිරි වෙළෙඳසල් සඳහා ගුණත්වයෙන් සහ දක්ෂතාවයෙන් හෙබි නිපුණ පුහුණුකරුවන් සුපිරි වෙළෙඳසල් සහායක සහ සේවා සහායක NVQ 4 මට්ටමෙන් වසරක කාල සීමාවකදී පුහුණු කිරීමේ වැඩසටහන අඛණ්ඩව පවත්වා ගෙන යෑම මෙහි මූලික අරමුණ වේ.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) ආදායමින් රු.මි. 400ක මුදලක් මුදල් අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කරන ලදී.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය, ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL) ලෝක කම්කරු සංවිධානය (ILO) සහ ජපන් රජය එක්ව ක්‍රියාත්මක කරන ලද මූලික ආගන්තුක සත්කාර සේවා බහුකාර්ය පාඨමාලාව සාර්ථකව අවසන් කරන ලද නුවරඑළිය දිස්ත්‍රික් පළමු සහ දෙවන කණ්ඩායමේ ආධුනික ආධුනිකාවන් සඳහා සහතික බෙදාදීම නුවරඑළිය අරලිය ග්‍රීන් හිල්ස් හෝටල් පරිශ්‍රයේදී පැවැත්විණ.

## 6.4. සිසුන් බඳවාගැනීම

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍ර | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | බඳවාගැනීම 2023.12.31 දක්වා | ඉලක්ක | බඳවාගැනීම 2024.12.31 දක්වා |
| 01. | කෘෂිකර්මය හා පශු සම්පත් | 566 | 981 | 769 | 435 |
| 02. | කලා සහ මාධ්‍ය (දෘශ්‍ය හා රංග කලා) | 46 | 20 | 53 | 44 |
| 03. | මෝටර් වාහන අලුත්වැඩියාව සහ නඩත්තුව | 4,201 | 5,585 | 5,917 | 5,184 |
| 04. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2,224 | 798 | 1,843 | 561 |
| 05. | විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ | 1,482 | 1,463 | 1,813 | 897 |
| 06. | මූල්‍ය සහ බැංකු කළමනාකරණය | 265 | 166 | 307 | 124 |
| 07. | ධීවර හා ජලජ සම්පත් | 25 | 53 | 57 | 10 |
| 08. | ආහාර තාක්ෂණය | 5 | 95 | 17 | 181 |
| 09. | මැණික් හා ස්වර්ණාභරණ | 60 | 79 | 78 | 92 |
| 10. | හෝටල් සහ සංචාරක | 1,865 | 3,113 | 2,409 | 2,770 |
| 11. | මානව සම්පත් කළමනාකරණය | 0 | 0 | 0 | 0 |
| 12. | තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය තාක්ෂණය | 3,155 | 1,820 | 3,470 | 1,581 |
| 13. | භාෂා | 780 | 695 | 2,190 | 445 |
| 14. | සම් සහ පාවහන් | 290 | 92 | 165 | 72 |
| 15. | සමුද්‍ර හා නාවික | 29 | 12 | 90 | 10 |
| 16. | වෛද්‍ය හා සෞඛ්‍ය විද්‍යාව | 1,866 | 2,760 | 1,842 | 1,830 |
| 17. | ලෝහ හා සැහැල්ලු ඉංජිනේරු | 1,331 | 1,159 | 1,358 | 633 |
| 18. | කාර්යාල කළමනාකරණය | 1,285 | 937 | 1,032 | 809 |
| 19. | වෙනත් | 4,205 | 4,491 | 2,683 | 4,145 |
| 20. | පුද්ගලික හා ප්‍රජා සංවර්ධනය | 99 | 2 | 150 | 142 |
| 21. | මුද්‍රණය සහ ඇසුරුම්කරණය | 359 | 479 | 535 | 343 |
| 22. | ශීතකරණය සහ වායු සමීකරණය | 568 | 451 | 380 | 459 |
| 23. | රබර් සහ ප්ලාස්ටික් | 37 | 14 | 112 | 12 |
| 24. | රෙදිපිළි හා ඇඟලුම් | 3,290 | 3,079 | 2,381 | 2,896 |
| 25. | දැව ආශ්‍රිත | 567 | 212 | 514 | 163 |
| 26. | යාන්ත්‍රික ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය | | | | 7 |
| | **මුළු එකතුව** | **28,600** | **28,556** | **30,165** | **23,845** |

* රැකියාස්ථ පුහුණුව යටතේ ආධුනිකයින් බඳවා ගැනීම් (2024.12.31 දින දක්වා) - 6,948

* විශේෂ කර්මාන්ත පුහුණුව යටතේ ආධුනිකයින් බඳවා ගැනීම් (2024.12.31 දින දක්වා) - 12,944

* පෙර ඉගෙනුම් පසු ඇගයීම් (RPL) ක්‍රමය යටතේ ඇගයීම් (2024.12.31 දින දක්වා) - 9,883

## 6.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- මධ්‍යස්ථාන පාදක පුහුණුව යටතේ ආධුනිකයින් 3,890 ක් බඳවා ගැනීම
- කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව යටතේ ආධුනිකයින් 22,125ක් බඳවා ගැනීම
- ජාතික ආයතන සඳහා ආධුනිකයින් 3,320ක් බඳවා ගැනීම
- රැකියාස්ථ පුහුණුව යටතේ ආධුනිකයින් 10,000**ක්** බඳවා ගැනීම
- විශේෂ කර්මාන්ත පුහුණුව යටතේ ආධුනිකයින් 14,000ක් බඳවා ගැනීම
- ජාතික වෘත්තීය සුදුසුකම, පෙර ඉගෙනුම් පසු ඇගයීම් (RPL) ක්‍රමය යටතේ ඇගයීම් 10,000ක් ක්‍රියාත්මක කිරීම
- ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමවේදය යටතේ ඇගයීම් 2,500ක් ක්‍රියාත්මක කිරීම
- 2024 වසරෙහි ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා සංවර්ධනය සඳහා Air Craft Maintenance Technician, Refinery Non-destructive Testing Technician, Project Management, Local Governors, Nail Technician, Public Sector Management, Business Administration and Public Administration, Sawing Machine Technology, Choreographer, Sport Masseur, ඇතුළු තෝරාගත් ක්ෂේත්‍ර කිහිපයක කටයුතු කිරීම සඳහා යෝජනා කරන ලදී
- ආයතනයේ ජාතික අධ්‍යාපන ආයතනයක් වන කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා, උපාධි පාඨමාලා ලෙස ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත

# 07. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය (CGTTI)

## 7.1. හැඳින්වීම

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය ශ්‍රී ලංකාවේ මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා ඊට අදාළ අනෙකුත් ක්ෂේත්‍රවල නිපුණ කාර්මික පිරිසක් බිහිකිරීමෙහි ලා මූලික වූ කාර්මික අධ්‍යාපන ආයතනයකි. මෙම ආයතනය ලංකා ගමනාගමන මණ්ඩලයේ වේරහැර මධ්‍යම වැඩපොළට අයත් භූමිභාගයේ 1959 වර්ෂයේදී පිහිටුවන ලදී. 1958 වර්ෂයේදී ජර්මන් රජය ශ්‍රී ලංකා රජය සමඟ ඇතිකරගත් ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් මෙම ආයතනය ආරම්භකර ඇති අතර මෙහි මූලික අරමුණු වූයේ ලංගම බස් රථ අලුත්වැඩියාවට අවශ්‍ය කාර්මිකයින් පුහුණු කිරීමය. 1974 වර්ෂයේදී මෙම ආයතනය මොරටුව අඟුලාන ප්‍රදේශයේ වත්මන් පරිශ්‍රය වෙත ගෙන එන ලදී. 1976 පෙබරවාරි 29 දක්වා මෙම ආයතනයේ පරිපාලන හා සංවිධාන කටයුතු ජර්මන් අධ්‍යක්ෂකවරයෙකු සහ එහි කාර්ය මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදී. පසුව මෙහි පරිපාලන කටයුතු ලාංකීය අධ්‍යක්ෂ-විදුහල්පතිවරයකු හා කාර්ය මණ්ඩලය යටතට පවරන ලදී. මෙම ආයතනය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

**දැක්ම**

දකුණු ආසියාවේ විශිෂ්ටතම මෝටර් කාර්මික පුහුණු ආයතනය බවට පත්වීම

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ මෝටර් කාර්මික ක්ෂේත්‍රය සඳහා වූ විශිෂ්ටතම පුහුණු මධ්‍යස්ථානයක් ලෙස අවශ්‍ය වන සම්මත පවත්වාගනිමින්, මෝටර් කාර්මික හා ඊට අදාළ වෘත්තීන් සඳහා ක්‍රමානුකූල ලෙස සංවර්ධනය වූ තාක්ෂණය තුළින් පුහුණුවන්නන් සඳහා ඉහල මට්ටමේ කාර්යසාධනයට ලගාවීමට අදාළව සැකසුණු නවීන පුහුණුව සැපයීම

## 7.2. අරමුණු හා කාර්යයන්

- මෝටර් රථ කර්මාන්තය සහ නියමිත පරිදි වූ වෙනත් තාක්ෂණික සහ වෘත්තීය කර්මාන්තවල වෘත්තීය පුහුණු පාඨමාලා සහ වැඩසටහන්, සෘජුව ආයතනය මඟින් හෝ වෙනත් රාජ්‍ය හෝ පෞද්ගලික ක්ෂේත්‍රයේ නියෝජ්‍යායතන මඟින් හෝ සකස් කර පවත්වා ගෙන යාම
- රජයේ සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් ආයතනයේ පුහුණුකරුවන්ගේ සහ උපදේශකයන්ගේ පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඊට පහසුකම් සැලසීම
- මෝටර් රථ කර්මාන්තයේ සහ වෙනත් නියමිත තාක්ෂණික කර්මාන්තවලට සම්බන්ධ ක්ෂේත්‍රවල වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ කරගෙන යාම
- ආයතනයේ වෘත්තීය පුහුණුව නිමකර ඇති තැනැත්තන්ට, වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශන සේවා සැපයීම
- පුහුණුව සම්පූර්ණ කර ඇති අභ්‍යාසලාභීන්ට ශ්‍රී ලංකාවේ සහ විදේශවල රැකියා අවස්ථා සැපයීම සඳහා අදාළ බලධරයන්ට සහාය වීම සහ ඒ පිළිබඳව දේශීය සහ විදේශීය සංවිධාන සමඟ ගිවිසුම්වලට එළඹීම
- ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල වෙනත් ආයතන සමඟ සබඳතා පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම සහ වෙනත් ආයතන සමඟ ගිවිසුම් වලට එළඹීමෙන් ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සඳහා හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආයතනයේ වාහන අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයේදී, වාහන සේවා කිරීමේ මධ්‍යස්ථානයේදී සහ වෙනත් වැඩපොළවලදී අභ්‍යාසලාභීන්ට ප්‍රායෝගික පුහුණු කිරීම් ලබාදීම අඛණ්ඩව සිදු කිරීම
- නියමිත ක්ෂේත්‍රවල තාක්ෂණ සහ වෘත්තීය පුහුණු කිරීම් පවත්වා ගෙන යාමේ සහ අධ්‍යාපනය ලබාදීමේ කාර්යයන් සඳහා කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම
- අදාළ කර්මාන්තවල සිදුවන තාක්ෂණ දියුණුව නියාමනය කිරීම සහ ඊට අනුකූලව ආයතනයේ පහසුකම් වැඩිදියුණු කිරීම, නවීකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම
- මෝටර් රථ සහ නියමිත තාක්ෂණික කර්මාන්තවල නියැලී සිටින ජාතික සහ ජාත්‍යන්තර සංවිධානවල සහාය ඇතිව සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළු පැවැත්වීම

- මෝටර් රථ සහ නියමිත තාක්ෂණික කර්මාන්ත පිළිබඳව සහ එම කර්මාන්තවල වෘත්තීය සහ තාක්ෂණික පුහුණු කිරීම් පිළිබඳව සඟරා සහ වාර ප්‍රකාශන පළ කිරීම
- ආයතනයේ පරමාර්ථ ඉටු කිරීමට යෝග්‍ය වන වෙනත් සියළු ක්‍රියාවන් කිරීම

## 7.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- ආයතනය තුළ පැවැත්වෙන පූර්ණකාලීන පාඨමාලා 10, NVQ 4 මට්ටමේ සිට NVQ 5 මට්ටම දක්වා වැඩිදියුණු කිරීම.
- තිරසාර බලශක්ති ක්ෂේත්‍රයේ අවස්ථා ආමන්ත්‍රණය කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ පාඨමාලාවක් ආරම්භ කිරීම.
- වාර්ෂිකව පූර්ණකාලීන පාඨමාලා සඳහා බඳවා ගනු ලබන ආධුනික ආධුනිකාවන් සංඛ්‍යාව 600 සිට 650 දක්වා වැඩි කිරීම.
- වාර්ෂිකව පූර්ණකාලීන පාඨමාලා සඳහා බඳවා ගනු ලබන ආධුනිකාවන් සංඛ්‍යාව දෙගුණ කිරීම.
- ආයතනීය ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය 2024 ජුනි මස 14 වන දින BMICH හිදී පැවැත්වූ අතර එහිදී සහතිකපත්‍ර 657 ක් ප්‍රදානය කරන ලදී.
- NVQ සහතික ප්‍රදානය නොකල අර්ධකාලීන පාඨමාලාවන් 07ක් සඳහා NVQ 3 සහතිකය පිරිනැමීම
- වැඩි වන ඉල්ලුම සැලකිල්ලට ගෙන රාත්‍රී අර්ධකාලීන පාඨමාලා ආරම්භ කිරීම.
- නව ඩිප්ලෝමා පාඨමාලාවන් 03ක් ආරම්භ කිරීම සහ ඉන් එක් ඩිප්ලෝමා පාඨමාලාවක් ආණමඩුව කලාප මධ්‍යස්ථානය තුළ ආරම්භ කිරීම.
- අර්ධකාලීන පාඨමාලා සඳහා ශිෂ්‍ය කළමණාකරන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- ආයතනයේ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම.
- පුහුණුව ලබන සිසුන් සඳහා ඩිජිටල් හැඳුනුම්පතක් ලබා දීම.
- පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ පාඨමාලාව කිලිනොච්චියේ SLGTI ආයතනය සහ මොරටුව CGTTI ආයතන අනුබද්ධ කර පවත්වාගෙන යාමට පියවර ගැනීම.
- ජර්මනියේ Metzingen සහයෝගීතාව පාසල සමඟ සහයෝගීතාව වර්ධනය කරගැනීමේ පියවරක් ලෙස එම පාසලේ ඉංජිනේරුවරු දෙදෙනෙක් විසින් පුහුණු සැසි පැවැත්වීම.
- පූර්ණකාලීන පාඨමාලාවට බඳවා ගැනීම් මාර්ගගත ක්‍රමයට පරිවර්තනය කිරීම.
- අත්තිඩියේ ඉදිකරන ලද සිසු නේවාසිකාගාරය සිසුන් වෙනුවෙන් විවෘත කිරීම.
- ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ ආයතනයේ පූර්ණකාලීන පාඨමාලාවට සිසුන් ඇතුළත් කර ගැනීමේ ලිඛිත පරීක්ෂණය 2024 සැප්තැම්බර් මස 24 වන දින පවත්වන ලද අතර ඒ සඳහා සිසුන් 4,520ක් පෙනී සිට ඇත.
- ආයතනයේ උපදේශකවරයෙකු වන එන්.ටී. බණ්ඩාර මහතා 2024.06.24 දින සිට 2024.06.26 දින දක්වා චීනයේ චොංගින් හි පැවති Second Belt and Road International Skills Competition ජාත්‍යන්තර කුසලතා තරඟයට සහභාගී වී 04 වන ස්ථානය දිනා ගන්නා ලදී.

## 7.4. සිසුන් බඳවාගැනීම

- මොරටුව CGTTI සහ කලාප මධ්‍යස්ථානයන්

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍රය | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවාගැනීම 2024.12.31 දක්වා |
| 01. | Automobile Repair & Maintenance | 2,645 | 3,462 | 2,635 | 3,896 |
| 02. | Building and Construction | 120 | 117 | 120 | 86 |
| 03. | Electrical, Electronics and Telecommunication | 330 | 396 | 330 | 457 |
| 04. | Mechatronics Technology | 315 | 341 | 315 | 361 |
| 05. | Metal and Light Engineering | 2,640 | 3,012 | 2,700 | 3,118 |
| 06. | Refrigeration and Air Conditioning | 220 | 356 | 220 | 438 |
| 07. | Other | 60 | 84 | 110 | 92 |
| එකතුව | | **6,330** | **7,768** | **6,430** | **8,448** |

- කිලිනොච්චිය SLGTI ආයතනය

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍රය | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවාගැනීම 2024.12.31 දක්වා |
| 01. | Automobile Mechanic Level-04 | 24 | 33 | 24 | 166 |
| 02. | Automotive Technology Level-05 | 24 | 34 | 24 | 41 |
| 03. | Construction Technology Level-05 | 24 | 34 | 24 | 13 |
| 04. | Electrician Level-04 | 24 | 17 | 24 | 18 |
| 05. | Mechatronics Technology Level-05 | 24 | 23 | 24 | 31 |
| 06. | Baker & Laboratory Assistant Level-04 | 24 | 10 | 24 | 15 |
| 07. | Food Technology Level-05 | 24 | 15 | 24 | 14 |
| 08. | ICT Level-05 | 24 | 37 | 24 | 60 |
| 09. | Computer Hardware and Network Technician & ICTT | 24 | 22 | 24 | 30 |
| 10. | Machinist Level-04 | 24 | 11 | 24 | 15 |
| 11. | Construction Site Supervisor Level-04 | - | - | 24 | 4 |
| එකතුව | | **240** | **236** | **264** | **407** |

## 7.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- NVQ සහතිකය මෙතෙක් ලබා නොදුන් අර්ධකාලීන පාඨමාලාවන් NVQ 4 මට්ටමට ප්‍රතීතනය කිරීමටත්, තවත් අර්ධකාලීන පාඨමාලා 02ක් NVQ 3 මට්ටමේ සිට NVQ 4 මට්ටම දක්වා උසස් කිරීමට සැලසුම් කර ඇත
- ආණමඩුව කලාපීය මධ්‍යස්ථානයට බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගැනීම
- පුනර්ජනනීය බලශක්ති පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගෙන ඇත
- අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැඩිදුර අධ්‍යාපනය ලබා දීමට පියවර ගැනීම
- දෙස් විදෙස් කර්මාන්තයට ගැලපෙන පරිදි පුහුණුවේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා කාර්ය මණ්ඩලය පුහුණුව සහ නවීන පුහුණු උපකරණ ලබාදීම
- ආයතනයේ හා කලාපීය මධ්‍යස්ථානවල යටිතල පහසුකම් ප්‍රධාන සැලැස්මකට අනුව වැඩිදියුණු කිරීම
- පාඨමාලා ගුණාත්වය ඉහළ නැංවීම අරමුණු කර රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන සමඟ හවුල්කාරීත්ව ගිවිසුම්වලට එළඹීම (Ansel Lanka (pvt) Ltd, SLSEA)

# 08. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය (UNIVOTEC) හා ඒ යටතේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල විද්‍යායතන

## 8.1. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

### 8.1.1. හැඳින්වීම

2008 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මඟින් කඳවල, රත්මලානේ පිහිටි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිහිටුවන ලදී. මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ NVQ 5,6 මට්ටම හෝ ඊට සමාන සුදුසුකම් ලැබූ සිසුන්ට උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමයි. ඒ හැරුණු විට උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව හදාරා ඇති සිසුන්ටද උසස් අධ්‍යාපන අවස්ථාව ලබා දෙයි.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පර්යේෂණ හා අනෙකුත් අධ්‍යාපන පාඨමාලා සඳහා විෂය මාලාවන් සකස් කිරීමේ දී කර්මාන්තයෙහි සිදුවන තාක්ෂණික උච්ඡාවචනයන්, පවතින ශ්‍රම වෙළෙඳපොළ හැසිරීම මෙන්ම නිරන්තරව යාවත්කාලීන වන ජාතික සහ ජාත්‍යන්තර කර්මාන්ත සම්බන්ධතා පිළිබඳව පර්යේෂණාත්මක සහ ඉදිරිගාමී දෘෂ්ටියක් සහිතව කටයුතු කරනු ලබයි.

**දැක්ම**

දකුණු ආසියානු කලාපයේ වඩාත්ම ඉල්ලුමක් ඇති වෘත්තීය හා තාක්ෂණික විශ්වවිද්‍යාලය වීම

**මෙහෙවර**

තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු සුදුසුකම් ඇති පුද්ගලයින්ට ගෝලීය වශයෙන් පිළිගත් උසස් අධ්‍යාපනය ලබා දීම සඳහා අති නවීන තාක්ෂණය, ඉගැන්වීම සහ ඉගෙනීම, පර්යේෂණ සහ නවෝත්පාදන, කර්මාන්ත සම්බන්ධතා සහ ජීවිත කාලය පුරාම අධ්‍යාපන අවස්ථා හරහා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් රටේ තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනය කරා ළඟාවීම

### 8.1.2. කාර්යයන්

- ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු කිරීම් පද්ධතිය තුළ සිය දක්ෂතාවයන් හා හැකියාවන් පදනම් කොට ගෙන විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගනු පිණිස ඔවුන්ගේ ප්‍රගතිශීලී සංවර්ධනයෙහි ලා සහාය වීම
- කාර්මික, තාක්ෂණික හා කාර්මික අධ්‍යාපන අංශයන්හි සේවයේ යෙදී සිටියදී පුහුණුව ලබන අයට අධ්‍යාපනවේදී පුහුණුව ලබා දීම
- තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව සඳහා පාඨමාලා සහ විෂය නිර්දේශ සංවර්ධනය කිරීමෙහි ලා සහය වීම
- ජාතික වෘත්තීය සුදුසුකම් ඇති අය සඳහා ඔවුන්ගේ නිපුණතාවය ඉහළ නංවා අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම සඳහා අධ්‍යයන පාඨමාලා ලබා දීම
- අඛණ්ඩ වෘත්තීයවේදී සංවර්ධනය පිළිබඳ ව්‍යාප්ති පාඨමාලා ඉදිරිපත් කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා පිළිගත හැකි සුදුසුකම් ඇති මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් සඳහා අධ්‍යාපන පාඨමාලා ලබාදීම
- ඉදිකිරීම්, නිෂ්පාදන හා සේවා අංශයන්හි ආයතන ද ඇතුළුව පොදු ජනතාව සඳහා ව්‍යාප්ති සේවා සැපයීම

### 8.1.3. 2024 වර්ෂයේ ජයග්‍රහණ

- **උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම**

| අනු අංකය | උපාධි පාඨමාලාව | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවාගැනීම 2024.12.31 දක්වා** |
| 01. | නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 90 | 80 | 100 | 77 |
| 02. | ගොඩනැගිලි සේවා තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 90 | 94 | 150 | 103 |
| 03. | මෙකාට්‍රොනික්ස් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 90 | 103 | 150 | 117 |
| 04. | ඉදිකිරීම් තාක්ෂණය සහ සම්පත් කළමණාකරණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 90 | 97 | 150 | 117 |
| 05. | ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 90 | 85 | 100 | 95 |
| 06. | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 90 | 97 | 120 | 106 |
| 07. | කර්මාන්ත කළමණාකරණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 90 | 77 | 100 | 76 |
| 08. | සිනමා සහ ටෙලිවිෂන් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 40 | 14 | 40 | 33 |
| 09. | මාධ්‍ය කලා නිෂ්පාදන පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 40 | 37 | 40 | 49 |
| 10. | හෝටල් කළමනාකරණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 40 | 29 | 40 | 28 |
| 11. | ජල තාක්ෂණය පිළිබඳ උපාධිය | 80 | 69 | 80 | 63 |
| 12. | බහු මාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ උපාධිය | 80 | 60 | 80 | 74 |
| 13. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ උපාධිය | 80 | 23 | 80 | 86 |
| 14. | අධ්‍යාපන තාක්ෂණය පිළිබඳ උපාධිය | 80 | 84 | - | - |
| 15. | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය | 80 | 98 | 100 | 81 |
| | **එකතුව** | **1,150** | **1,103** | **1,330** | **1,105** |

** 2023/24 කණ්ඩායම සඳහා සිසුන් බඳවා ගැනීම 2024 දී සිදු විය.

- **සහතිකපත් පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම**

| අනු අංකය | පුහුණු වැඩසටහන | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම 2024.12.31 දක්වා |
| 01. | තක්සේරුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 100 | 83 | 275 | 229 |
| 02. | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 100 | 75 | 125 | 148 |
| 03. | තක්සේරුකරුවන් නැවුම්කිරීමේ වැඩසටහන | - | - | 120 | 115 |

### 8.1.4. අනෙකුත් ජයග්‍රහණ

- 2024 ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේදී අධ්‍යයන කටයුතු සාර්ථකව නිම කළ සිසුන් 663 දෙනෙකුට උපාධිය ප්‍රදානය කරන ලදී.
- EPLUS විභාග සඳහා පුහුණුකරුවන්ගේ පළමු පුහුණු වැඩසටහන 2024 මාර්තු 23-24 දිනවල විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදී. මෙය වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ EPLUS ජාත්‍යන්තර විභාග අතර අත්සන් කරන ලද ගිවිසුම යටතේ සඳහන් එක් කාර්යයකි.
- කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වන ගිවිසුම 2024 ජූලි 19 වන දින අත්සන් කරන ලද අතර එමඟින් කර්මාන්ත අංශවල සහ පුළුල් ශ්‍රම වෙළෙඳපොළේ අවශ්‍යතා සඳහා උසස් තත්ත්වයේ පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම සහ බෙදා හැරීම සඳහා මධ්‍යගත වේදිකාවක් සපයයි. මෙම ව්‍යාපෘතිය යටතේ තෘතීයික අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පරීක්ෂකවරු සඳහා මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳව තෙදින පුහුණු වැඩසටහන් හතරක් 2024 වර්ෂය තුළදී පවත්වන ලදී.
- තරුණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ අරමුණින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් සංවිධානය කරන ලද "Brain into Business:Youth

Entrepreneurship Skill Development Programme" 2024 ජූලි 26 සිට 28 දක්වා විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි.

- කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ සහයෝගීතාවයෙන් ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES) උපාධි මට්ටමට උසස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.
- කෘෂිකර්ම හා ආහාර තාක්ෂණ දෙපාර්තමේන්තුව සහ ආහාර තාක්ෂණ සංගමය එක්ව සංවිධානය කරන ලද FoodEx'24 ප්‍රදර්ශණය සහ සම්මාන ප්‍රදානෝත්සවය 2024 ජුලි 11 සහ 12 යන දිනයන්හිදී විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී "නවෝත්පාදනය සහ තිරසාරභාවය තුළින් ආහාර කර්මාන්තයේ ප්‍රගතිය" යන තේමාව යටතේ පැවැත්විණි.
- ජාතික විෂයමාලා හයක් (NVQ 5 සහ 6, NCS) සකස් කර, සංශෝධනය කර ඇති අතර තෘතියීක හා වෘත්තීය වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරිමට අපේක්ෂිතය.
- තුන්වන ශිෂ්‍ය පර්යේෂණ සැසිය (SRS) 2024, "සමාජ ක්‍රමාංකනය සඳහා තාක්ෂණික සමාජ අනුකූලතාව" යන තේමාව යටතේ 2024 නොවැම්බර් 7 වන දින විශ්වවිද්‍යාල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.
- ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය (IRS 2024) "තිරසාර හරිත ආර්ථිකයක් සඳහා වෘත්තීය තාක්ෂණ අධ්‍යාපනය" යන තේමාව යටතේ 2024 දෙසැම්බර් 12 වැනි දින විශ්වවිද්‍යාල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

### 8.1.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

| | වැඩසටහන | බඳවාගැනීමේ ඉලක්කය |
|---|---|---|
| 01. | උපාධි වැඩසටහන් | |
| | • පවතින වැඩසටහන් | 1,330 |
| | • ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 5/6) දරණ අය සඳහා කාර්මික තාක්ෂණ පීඨය මඟින් රූපලාවන්‍ය ක්ෂේත්‍රයේ නව උපාධි වැඩසටහනක් හඳුන්වා දීම | 40 |
| 02. | පශ්චාත් උපාධි වැඩසටහන් | |
| | • අධ්‍යාපන පීඨය මඟින් අධ්‍යාපන කලමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 30 |
| | • ඉංජිනේරු තාක්ෂණ පීඨය විසින් හඳුන්වාදීමට නියමිත පාරිසරික විද්‍යාව සහ තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය | 30 |
| 03. | ඒකාබද්ධ උපාධි වැඩසටහන් | |
| | • කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ සහයෝගීතාවයෙන් ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES) උපාධි මට්ටමට උසස් කිරීම | 500 |
| 04. | ඩිප්ලෝමා සහ සහතික පාඨමාලා | |
| | • ඩිප්ලෝමා වැඩසටහන් | 100 |
| | • තක්සේරුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් | 560 |

## 8.2. විශ්වවිද්‍යාල විද්‍යායතන

### 8.2.1. හැඳින්වීම

2014 අංක 01 දරණ පාර්ලිමේන්තු පනත සහ විශ්වවිද්‍යාල විද්‍යායතන ආඥා පනත යටතේ පිහිටවනු ලැබූ විශ්වවිද්‍යාල විද්‍යායතන, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව පිහිටුවා ඇත. මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි ප්‍රමුඛ අරමුණ වනුයේ ප්‍රධාන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) අංශ 14ක් යටතේ NVQ 06 නිපුණතා මට්ටම සහිත සිසු සිසුවියන් බිහි කිරීමයි.

දැනට අනුරාධපුර, බටංගල, යාපනය, කුලියාපිටිය, මාතර හා රත්මලාන යන ස්ථානවල පිහිටුවා ඇති විශ්වවිද්‍යාල විද්‍යායතන 6ක් පවතී.

**දැක්ම**

වෘත්තීය විශිෂ්ටත්වය ළඟාකර ගැනීම සඳහා වන කාර්මික අවශ්‍යතා සපුරාලමින්, වෘත්තීය අධ්‍යාපනය ලබා දීමේ පුරෝගාමී විශ්වවිද්‍යාල විද්‍යායතන බවට පත් වීම

**මෙහෙවර**

ඒකාබද්ධ සහ නිපුණතා නැඹුරු වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීම, නව්‍ය පර්යේෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වීම සහ ඊට අදාළ කර්මාන්ත හා ප්‍රජාව සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීම

## 8.2.2. කාර්යයන්

- තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු පද්ධතිවල සිසුන්ගේ ප්‍රගතිශීලී සංවර්ධනයට සහාය වීම
- කර්මාන්තවල සහයෝගීතාවය ඇතිව සිසුන් සඳහා පරිපූර්ණ පුහුණුවක් ලබා දීම
- සිසුන්ගේ නිපුණතාවය ඉහළ නැංවීමට සහ අධ්‍යයන සුදුසුකම් සපුරා ගැනීම සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් NVQ සහිත අධ්‍යයන පාඨමාලා ලබා දීම
- ප්‍රජාව අතර කුසලතා සහ දැනුම බෙදා හැරීම සඳහා ඉල්ලුම මත ව්‍යාප්ති පාඨමාලා ලබා දීම

## 8.2.3. 2024 වර්ෂයේ ජයග්‍රහණ

- **උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම**

| අනු අංකය | අංශය | අනුරාධපුර 2022/2023 | | බටංගල 2022/2023 | | යාපනය 2022/2023 | | කුලියාපිටිය 2022/2023 | | මාතර 2022/2023 | | රත්මලාන 2022/2023 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම |
| 01. | ධීවර හා ජලජීවී වගාව | 30 | 36 | - | - | - | - | - | - | - | - | - | - |
| 02. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 60 | 58 | 60 | 69 | 60 | 60 | 160 | 144 | 60 | 60 | | |
| 03. | විදුලි, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ | 60 | 63 | - | - | - | - | - | - | - | - | 60 | 62 |
| 04. | හෝටල් සහ සංචාරක කළමනාකරණය | 60 | 56 | 60 | 68 | 30 | 28 | 40 | 41 | 60 | 61 | 30 | 25 |
| 05. | පුද්ගලික සහ ප්‍රජා සංවර්ධනය | - | - | - | - | 30 | 32 | - | - | - | - | - | - |
| 06. | කෘෂිකාර්මික වැවිලි සහ පශු සම්පත් | 30 | 32 | 30 | 23 | 30 | 24 | 40 | 36 | - | - | - | - |
| 07. | ආහාර තාක්ෂණය | - | - | - | - | 30 | 34 | - | - | 30 | 35 | 30 | 38 |
| 08. | Mechatronics තාක්ෂණය | - | - | - | - | 30 | 25 | - | - | - | - | - | - |
| 09. | ශීතකරණ සහ වායු සමීකරණ | - | - | - | - | - | - | 30 | 17 | 30 | 14 | - | - |
| 10. | මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව | - | - | - | - | - | - | 40 | 43 | 30 | 34 | - | - |
| 11. | කලා නිර්මාණ සහ මාධ්‍ය (දෘශ්‍ය සහ ප්‍රසංග) | - | - | - | - | - | - | - | - | - | - | 60 | 54 |
| 12. | තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය | - | - | - | - | 30 | 33 | - | - | - | - | - | - |
| 13. | රෙදිපිළි සහ ඇඟලුම් | - | - | - | - | - | - | - | - | - | - | 30 | 33 |
| 14. | වෙනත් | - | - | 30 | 36 | 30 | 28 | 30 | 28 | 60 | 56 | 90 | 102 |
| **එකතුව** | | **240** | **245** | **180** | **196** | **270** | **264** | **340** | **309** | **270** | **260** | **300** | **314** |

විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි 2024 ශිෂ්‍ය කණ්ඩායම සඳහා අපේක්ෂා කළ සහ සත්‍ය බඳවා ගැනීම පහත පරිදි වේ.

| අනු අංකය | අංශය | අනුරාධපුර | | බටංගල | | යාපනය | | කුලියාපිටිය | | මාතර | | රත්මලාන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2024 | | 2024 | | 2024 | | 2024 | | 2024 | | 2024 | |
| | | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම | ඉලක්කය | බඳවා ගැනීම |
| 01. | ධීවර හා ජලජීවී වගාව | 30 | 33 | - | - | - | - | - | - | - | - | - | - |
| 02. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 60 | 39 | 60 | 48 | 60 | 47 | 160 | 99 | 70 | 45 | - | - |
| 03. | විදුලි, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ | 60 | 56 | - | - | - | - | - | - | - | - | 60 | 60 |
| 04. | හෝටල් සහ සංචාරක කළමනාකරණය | 60 | 53 | 60 | 68 | 30 | 31 | 40 | 29 | 70 | 53 | 30 | 33 |
| 05. | පුද්ගලික සහ ප්‍රජා සංවර්ධනය | - | - | - | - | 30 | 28 | - | - | - | - | - | - |
| 06. | කෘෂිකාර්මික වැවිලි සහ පශු සම්පත් | 30 | 27 | 30 | 08 | 30 | 6 | 40 | 16 | - | - | - | - |
| 07. | ආහාර තාක්ෂණය | - | - | - | - | 30 | 29 | - | - | 35 | 36 | 30 | 37 |
| 08. | Mechatronics තාක්ෂණය | - | - | - | - | 30 | 30 | - | - | - | - | - | - |
| 09. | ශීතකරණ සහ වායු සමීකරණ | - | - | - | - | - | - | 30 | 20 | 35 | 20 | - | - |
| 10. | මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව | - | - | - | - | - | - | 40 | 45 | 35 | 35 | - | - |
| 11. | කලා නිර්මාණ සහ මාධ්‍ය (දෘශ්‍ය සහ ප්‍රසංගය) | - | - | - | - | - | - | - | - | - | - | 60 | 50 |
| 12. | තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය | - | - | - | - | 30 | 29 | - | - | - | - | - | - |
| 13. | රෙදිපිළි සහ ඇඟලුම් | - | - | - | - | - | - | - | - | - | - | 30 | 28 |
| 14. | වෙනත් | | | 30 | 30 | 30 | 11 | 30 | 20 | 70 | 48 | 90 | 100 |
| **එකතුව** | | **240** | **208** | **180** | **154** | **270** | **211** | **340** | **229** | **315** | **237** | **300** | **308** |

### 8.2.4. වෙනත් ජයග්‍රහණ

- උසස් ජාතික ඩිප්ලෝමා සහ ජාතික ඩිප්ලෝමා සඳහා සුදුසුකම් ලැබූ සිසුන් 951 දෙනෙකු සඳහා 2024 ඔක්තෝබර් 16 වන දින පැවති ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයෙහි දී ඩිප්ලෝමා ප්‍රදානය කර ඇත.
- World Skill Day Exhibition 2024, Culinary Art Food Expo 2024, TechXphere, Future Mind Exhibition සහ Pro Food Pro Pack Exhibition 2024 වැනි දේශීය සහ විදේශීය ප්‍රදර්ශන ගණනාවකට විශ්වවිද්‍යාල විද්‍යායතන සිසුන් සහභාගී වූ අතර ඒ හරහා ඔවුන් ක්ෂේත්‍රයට නිරාවරණය වීම මෙන්ම විශ්වවිද්‍යාල විද්‍යායතන පිළිබඳව ප්‍රජා දැනුවත්භාවය ද වර්ධනය විය.
- දැනුවත්භාවය වර්ධනය සහ ප්‍රජා මෙහෙවර උදෙසා ඒකාබද්ධ සමාජ වගකීම් වැඩසටහන් ප්‍රමාණයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. ඒ අතර,
  - යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය මඟින් ලේ දන්දීමේ ව්‍යාපාර, නොමිලේ වෛද්‍ය සායන, යාපනය බන්ධනාගාරය සඳහා පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහන, ඉංජිනේරු තාක්ෂණ ගුරුවරුන් සඳහා වැඩමුළු, ප්‍රාදේශීය ප්‍රජාව සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
  - අනුරාධපුර, බටංගල, මාතර, රත්මලාන, සහ කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතන මඟින් විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

### 8.2.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 07 (NVQ 07) නව උපාධි වැඩසටහන් සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවය සමඟ සුදුසු ස්වයං මූල්‍යායන වැඩසටහන් ගොඩනැගීම
- සෑම අධ්‍යයන වැඩසටහනකටම බඳවා ගැනීමට අනුමැතිය ඇති උපරිම සිසුන් සංඛ්‍යාව බඳවා ගැනීම සහ ශිෂ්‍ය හැරයාම අවම කිරීමට පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- ප්‍රදේශය තුළ විශ්වවිද්‍යාල විද්‍යායතන ප්‍රවර්ධනය උපරිම මට්ටමට ගෙන ඒම අරමුණු කරගනිමින් දැනුවත් කිරීම් සහ වෘත්තීය උපදේශන වැඩසටහන් පැවැත්වීම සඳහා පාසල් සහ ප්‍රජාව සමඟ ජාලයක් ගොඩනැඟීම සහ එය පුළුල් කරගැනීම
- කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ අපගේ ජාලය පුළුල් කරගැනීම හරහා සිසුන්ගේ වෘත්තීය පුහුණු අවස්ථා සහ රැකියා අවස්ථා වර්ධනය කරගැනීම.
- ආදි විද්‍යාර්ථයින් සමඟ සම්බන්ධතාවය ශක්තිමත් කරගැනීමට සහ පුළුල් කරගැනීමට, වැඩසටහන් වැඩිදියුණු කරගැනීම සඳහා අදහස් ලබාගැනීමට සහ නවක උපාධිධාරීන් වෙනුවෙන් රැකියා අවස්ථා ගවේෂණයට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් සහ ආදි විද්‍යාර්ථයින්ගේ සංගමයක් පිහිටුවීමට සැලසුම් කිරීම
- අධ්‍යයන වැඩසටහන්හි ගුණාත්මකභාවය වර්ධනයට සහ පර්යේෂණ ප්‍රමාණය වැඩි කිරීමට විද්‍යාගාර සඳහා අති නවීන තාක්ෂණය සහ පහසුකම් ස්ථාපනය කිරීම



ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමඟ එක්ව සාත්තු සේවක අංශයේ කුසලතා පරීක්ෂා කිරීම සඳහා NVQ 3 සහ NVQ 4 මට්ටම් සඳහා ලිඛිත හා යෝග්‍යතා පරීක්ෂණ ඊශ්‍රායලයේ දී පැවැත්වීම



නයිටා සහතිකලාභී තරුණ ව්‍යවසායකයන් හට නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ තම ව්‍යාපාරය වැඩිදියුණු කිරීමට ලංකා බැංකුවේ පූර්ණ දායකත්වය යටතේ සහනදායී පොළියක් යටතේ ණය ලබා දීමේ වැඩසටහන







BMICH හි පැවති ආයතනීය ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය-CGTTI





පුහුණු අංශයන් තුළ පුහුණුව ලබාදෙන අතරතුර-CGTTI





උපදේශකවරයෙකු වන එන්.ටී. බණ්ඩාර මහතා චීනයේ පැවති Second Belt and Road International Skills Competition ජාත්‍යන්තර කුසලතා තරඟයට සහභාගී වී 04 වන ස්ථානය දිනා ගන්නා ලදී



ජාත්‍යන්තර නිපුණතා තරඟය 2024 ජුනි 26-24 අතර චීනයේ Chongqing හිදී පැවැත්විණි - Univotec



Industry Expo ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ හොඳම නවෝත්පාදන සම්මාන - Innovation Arena 2024 Univotec

# 09. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (OCUSL)

## 9.1. හැඳින්වීම

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2014 අංක 31 දරණ පනත මඟින් ස්ථාපිත වී ශ්‍රී ලංකාවේ ධීවර, සාගර, සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා ධීවර, සාගර, විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දෙස් විදෙස් පිළිගත් උසස් අධ්‍යාපන දැනුමක් ලබා දීමේ ජාතික වගකීම ඉටු කරනු ලබන්නේය.

**දැක්ම**

සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ සඳහා නව්‍ය විසඳුම් ලබාදීම

**මෙහෙවර**

කලාපයේ සමුද්‍ර හා ධීවර අධ්‍යාපනයේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය වීම

## 9.2. අරමුණු

2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වන කොටසේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමේ අරමුණු පහත අයුරින් දක්වා ඇත.

- ධීවර, සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම
- යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම
- ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම
- ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම
- විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම
- ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම
- ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම

## 9.3. 2024 වර්ෂයේ ජයග්‍රහණ

### 9.3.1. ජාත්‍යන්තර සබඳතා - අවබෝධතා ගිවිසුම්

- ඇමෙරිකා එක්සත් ජනපදයේ නොටර්ඩෑම් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අතර වසර 2024 සහ 2028 දක්වා පස් අවුරුදු කාලසීමාවක් සඳහා බෙංගාල බොක්ක සාගර සීමාවේ සාගර සහ වායුගෝලීය විද්‍යාව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට 2024.06.12 දින අවබෝධතා ගිවිසුම් ගතවීම. ව්‍යාපෘතිය මඟින් අධ්‍යයන සංවර්ධනය, පර්යේෂණ සහ ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍ය ප්‍රජාවගේ කුසලතා වර්ධනය අරමුණු කෙරේ.
  නොටර්ඩෑම් විශ්වවිද්‍යාලය සහ වොෂින්ටන් විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 62,000ක ඇස්තමේන්තුගත මුදලින් 60,000ක මූල්‍ය ආධාර ප්‍රදානය සිදු කර ඇත.

- සහයෝගී අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා චීන විද්‍යා ඇකඩමිය යටතේ පවතින දකුණු චීන මුහුදු සාගර විද්‍යා ආයතනය සමඟ විශ්වවිද්‍යාලය අවබෝධතා ගිවිසුමක් (MOU) සකස් කර ඇත. මෙම යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර, අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
- චිනයේ සන් යැට් සෙන් (Sun Yat - Sen University) විශ්වවිද්‍යාලය සමඟ අධ්‍යයන හා පර්යේෂණ සබඳතා සඳහා ගිවිසුම් ගතවීමට විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත.

**9.3.2. උසස් අධ්‍යයන අංශය**

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පස්වන උපාධි ප්‍රදානෝත්සවය 2024.11.20 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වා උපාධිලාභී සිසුන් 239 දෙනෙකු සඳහා උපාධි ප්‍රදානය සිදු කිරීම.
- වෘත්තීය අධ්‍යාපනය සඳහා ප්‍රවිශ්ය වන සිසුන් සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම අරමුණු කර ගනිමින් රැකියා විරහිත තරුණ ප්‍රජාව වෘත්තීය නිපුණත්වයෙන් බල ගන්වා වෘත්තීය අධ්‍යාපනය වෙත නැඹුරු කිරීමේ අපේක්ෂාවෙන් **"නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය"** ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය උසස් අධ්‍යයන අංශ සිසුන් 160 දෙනෙකු සඳහා ද 2024 වර්ෂයේ සිට "නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය" ක්‍රියාත්මක කිරීම.
- ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි (B.Tech in Aquaculture and Seafood Technology) පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණු කටයුතු සඳහා විද්‍යාගාර පහසුකම් සැපයීම අරමුණු කර Aquaculture and Anatomy Laboratory විද්‍යාගාරය 2024 ජූලි මස 18 වන දින ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයීය නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය ප්‍රමිතිකරණය කිරීමේ වැඩමුළුවක් 2024 ජූනි මස 22 වන දින සියලු පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීම. වැඩමුළුව සඳහා විශ්වවිද්‍යාල පද්ධතියේ නාවික ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන විශ්වවිද්‍යාල වන මොරටුව, කොතලාවල ආරක්ෂක, විවෘත, පේරාදෙණිය, කැළණිය සහ සිනෙක් විශ්වවිද්‍යාල දායකත්වය දක්වන ලද අතර, ක්ෂේත්‍රය නියෝජනය කරමින් කොළඹ නැව් තටාකාංගනය, මාස්ටර් ඩයිවර්ස්, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය සහ ජෝන් කීල්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සහභාගී විය.
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය ඉතිහාසයේ නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සම්බන්ධ සාර්ථක ඉදිරි පියවරක් ලෙස විශ්වවිද්‍යාලයීය නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවේ පළමු කාන්තා කැඩෙට් නිලධාරිනිය පත්වීම නාවික ක්ෂේත්‍රයේ සංධිස්ථානයකි.
- සාගර විශ්වවිද්‍යාලයේ ප්‍රථම විදේශ ශිෂ්‍ය සහභාගිත්ව අධ්‍යයන දැනුම හුවමාරු වැඩසටහන කොරියා මැරිටයිම් සාගර විශ්වවිද්‍යාලය (Korea Maritime Ocean University) වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශ සිසුන් සමඟ ඒකාබද්ධව 2024 ජූලි මස 24 දින සිට 30 දක්වා කාලසීමාවේ පැවැත්වීම.
- ධීවර හා සාගර විද්‍යා පීඨයේ ධීවර හා සමුද්‍රීය අධ්‍යයන අංශය මඟින් සූර්ය වියලන භාවිතයෙන් ධීවර ප්‍රජාවට සහ පාරිභෝගික ජනතාවට සෞඛ්‍යාරක්ෂිතව හා ගුණාත්මකව වියළි මුහුදු ආහාර නිපදවීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම සහ අවශ්‍ය සූර්ය වියලන උපකරණ නිපදවීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- ධීවර හා සාගර විද්‍යා පීඨයේ ධීවර හා සමුද්‍රීය අධ්‍යයන අංශය මඟින් දකුණු මුහුදු තීරයේ සංචාරක හෝටල් සම්බන්ධ කර ගනිමින් සාගර පරිසර පද්ධතිය සුරැකීමේ වැඩපිළිවෙලක් ලෙස මුහුදු තණකොළ (Sea Grass) වගා ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර හා සාගර විද්‍යා පීඨයේ ධීවර හා සමුද්‍රීය අධ්‍යයන අංශය ඇක්වාපොනික් තාක්ෂණය මඟින් තිරසාර මත්ස්‍ය හා භෝග වගා කිරීමේ මෙවලම් නිර්මාණය කිරීම හඳුන්වා දී ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.

- සාගර විද්‍යා අධ්‍යයන අංශය විසින් ජගත් සාගර දිනය 2024 ජුනි මස 07 දින සැමරීම සඳහා “Catalyzing Action for Our Ocean & Climat” තේමාව යටතේ වැඩසටහනක් සංවිධානය කර සාගර සංරක්ෂණය සහ සමුද්‍රීය ක්ෂේත්‍රය ආශ්‍රිතව පවත්නා අවස්ථා හඳුනා ගැනීම සහ වෙරළ තීරයේ සුරැකීම සඳහා සිදු කළ යුතු කාර්යයන් පිළිබඳව සිසුන් සහ කාර්යමණ්ඩල දැනුවත් කිරීම.
- මුහුදු ජෛව තාක්ෂණ උපාධි පාඨමාලාවේ (B.Sc. in Marine Biotechnology) විෂයමාලා සැකසීම් කටයුතු සිදු කිරීම.

### 9.3.3. වෘත්තීය තාක්ෂණ අංශය

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය තාක්ෂණ අංශයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි ඩිප්ලෝමා පාඨමාලා හදාරා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 05 සම්පූර්ණ කරන ලද සිසුන් සඳහා තෙවන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2024.11.20 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වා සිසුන් 206 දෙනෙකු සඳහා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන මඟින් පවත්වන ලද පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් (NVQ) 387ක් නිකුත් කර ඇති අතර ජාතික වෘත්තීය සුදුසුකම් නොවන සහතිකපත් (Non NVQ) ඇතුළුව 563ක් නිකුත්කර ඇත.
- රේඛීය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක **“නිපුණතා සිසු දිරිය”** ශිෂ්‍යාධාර ලබා දීමේ වැඩසටහන සමඟ සම්බන්ධීකරණයෙන් වෘත්තීය තාක්ෂණ අංශයේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.
- වෘත්තීය තාක්ෂණ අංශයේ ශිෂ්‍ය ප්‍රජාව උදෙසා වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයක් (Career Guidance Unit) ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන (ගාල්ල, යාපනය) විසින් පෙර දැනුම ඇගයීමේ ක්‍රමය (RPL) යටතේ ස්කූබා කිමිදුම්කරු සහ ධීවර යාත්‍රා නියමු ශිල්පීන් (ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් - NVQ Level 04) සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් 53ක් (NVQ) නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## 9.4 සිසුන් බඳවාගැනීම

- **උසස් අධ්‍යයන අංශය - අභ්‍යන්තර සහ බාහිර උපාධි පාඨමාලා**

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍රය | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | උපාධි පාඨමාලා | ඉලක්කය | බඳවාගැනීම් | ඉලක්කය | බඳවාගැනීම් 2024.12.31 දක්වා |
| 01. | නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | 50 | 63 | 65 | - |
| 02. | නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | 80 | 53 | 65 | - |
| 03. | වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය | 50 | 54 | 55 | - |
| 04. | ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය | 60 | 53 | 55 | - |
| 05. | සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය | 30 | 35 | 30 | - |
| 06. | ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 80 | 70 | 70 | - |
| උප එකතුව | | **350** | **328** | **340** | - |
| 07. | දුරස්ථ අධ්‍යයන උපාධි පාඨමාලා | 200 | 141 | 150 (2024/2025) | 97 |
| | | | | 200 (2025/2026) | 116 |
| 08. | පශ්චාත් උපාධි පාඨමාලා | 22 | 16 | 20 | 10 |
| එකතුව | | **572** | **485** | **710** | **223** |

- **වෘත්තීය තාක්ෂණ අංශය**

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍රය | නිපුණතා සම්මත මට්ටම (ජාතික වෘත්තීය සුදුසුකම් - NVQ / ජාතික වෘත්තීය සුදුසුකම් නොවන - Non NVQ) | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|---|
| | පාඨමාලා | | ඉලක්කය | බඳවාගැනීම් | ඉලක්කය | බඳවාගැනීම් 2024.12.31 |
| 01. | ධීවර හා ජලජීවී වගාව | NVQ | 655 | 400 | 609 | 305 |
| | | Non NVQ | 681 | 566 | 669 | 372 |
| 02. | සමුද්‍රීය හා නාවික විද්‍යාව | NVQ | 355 | 298 | 636 | 448 |
| | | Non NVQ | 85 | 216 | 90 | 165 |
| 03. | තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන | NVQ | 144 | 75 | 110 | 33 |
| 04. | ජංගම පුහුණු | Non NVQ | 415 | 132 | 416 | 613 |
| 05. | පෙර දැනුම් ඇගයීම් ක්‍රමය (RPL) | | | | | 53 |
| එකතුව | | | **2,335** | **1,687** | **2,530** | **1,989** |

## 9.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත් දේශීය සිසුන් සඳහා පමණක් දැනට විවෘතව පවතින උපාධි පාඨමාලාවන්හි අධ්‍යයන අවස්ථා මෙරට ජාත්‍යන්තර පාසල් සිසුන් සහ විදේශීය සිසුන් සඳහා ද ලබාදීම
- ජාත්‍යන්තර සිසුන් සඳහා විශ්වවිද්‍යාලයීය පීඨයක් ස්ථාපිත කිරීම
- නව උපාධි පාඨමාලා දෙකක් ආරම්භ කිරීම - සමුද්‍රීය කටයුතු පිළිබඳ උපාධි පාඨමාලාව (B.Sc.in Maritime Affairs) සහ මුහුදු ජෛව තාක්ෂණ විද්‍යා උපාධි පාඨමාලාව (B.Sc.in Marine Biotechnology)
- යාත්‍රා සහ යාත්‍රා ගොඩනැඟීමේ (Boat and Ship Building) NVQ පාඨමාලා ආරම්භ කිරීම
- යෝජිත කොරියන් අධාර යටතේ පහසුකම් සහිත විශ්වවිද්‍යාල පරිශ්‍රයක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින්, එහි ඉදිරි පියවර සඳහා කටයුතු සම්පාදනය කිරීම
- විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය මඟින් නව උපාධි පාඨමාලාවක් හඳුන්වා දීම - යාපනය විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීව අර්ධකාලීන බාහිර උපාධි පාඨමාලාවක් වශයෙන් විද්‍යාවේදී නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ උපාධිය හඳුන්වා දීම (B.Sc. Hons. in Maritime Transportation and Logistics Management)
- ජාතික කොරියා නාවික සහ සාගර විශ්වවිද්‍යාලය (National Korea Maritime & Ocean University ) සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවයෙන් මුහුදු ජෛව තාක්ෂණ විද්‍යාපති උපාධි පාඨමාලාවේ (M.Sc.in Marine Biotechnology) විෂය මාලා සැකසීම් කටයුතු ආරම්භ කිරීම
- සාගර පරිසරය පිළිබඳ දැනුම සහ පුහුණුව ලබාදීම සඳහා Centre of Excellence (Indian Ocean Rim Association - IORA) භෞතිකව ආරම්භ කිරීම

# 10. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය (NIBM)

## 10.1. හැඳින්වීම

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපාරික පාසලයි. මෙම ආයතනය ගෝලීය ප්‍රවණතා සමඟ සමීපව වර්තමාන අවශ්‍යතාවලට සරිලන පරිදි ඔවුන්ගේ නිෂ්පාදන නිරන්තරයෙන් යාවත්කාලීන කරයි. කළමනාකරණය, පුහුණුව සහ අධ්‍යාපනයේ ප්‍රමුඛයෙකු බව ඔප්පු කරමින් වසර ගණනාවක් පුරා අනන්‍යතාවය වර්ධනය කර ඇත. ශිෂ්‍ය, ශිෂ්‍යාවන් රාශියකට වඩා හොඳ අනාගතයක් නිර්මාණය කර ගැනීමට මංපෙත් විවර කර දී ඇත.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ සහයෝගයෙන් කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය යටතේ 1968 දී පිහිටුවන ලද ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය වසර 56ක් පුරා ක්‍රියාත්මක වේ. ඉන් පසුව පාර්ලිමේන්තු පනතක් මඟින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ලෙස සංස්ථාගත කරන ලදී (1976 අංක 23 දරණ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත මඟින්). මෙම පනතට 1991 අංක 28 දරණ පනත හා 2014 අංක 02 දරණ පනත යටතේද යම් යම් සංශෝධන ගෙන එන ලදී.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියා කරයි. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ප්‍රධාන ශාඛාව අංක 120/5, විජේරාම මාවත, කොළඹ 07, පිහිටා ඇත. ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය (NIC) - කිරුළපන, ව්‍යාපාර පාසල (SOB) - රාජගිරිය යන ස්ථාන වල පිහිටා ඇති අතර අනෙකුත් ශාඛා කුරුණෑගල, මහනුවර, පේරාදෙණිය, ගාල්ල සහ මාතර යන ප්‍රදේශවල පිහිටා ඇත. මෙම ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනමන, ස්වයං පාලන, ජාත්‍යන්තරව පිළිගත් ආයතනයකි. 2009 වර්ෂයේදී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ගෞරව තත්ත්ව සම්මානයෙන් පිදුම් ලැබූ අතර ISO 9001:2015 සහතිකය ද ලබාගෙන ඇත.

**දැක්ම**
තමන්ගේ ජීවිත සහ අන් අයගේ ජීවිත පරිවර්තනය කළ හැකි චින්තකයින් බිහි කිරීමට කැප වූ සංවිධානයක් බවට පත්වීම

**මෙහෙවර**
ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් බිහි කිරීම වෙනුවෙන් අත්දැකීම් සහිත ඉගෙනීම හරහා නවෝත්පාදනයන් පෝෂණය කිරීම සඳහා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම

## 10.2 කාර්යයන්

- රාජ්‍ය සහ පෞද්ගලික යන අංශවල කාර්මික හා වාණිජ ව්‍යාපාරවල කළමනාකරුවන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීම
- කළමනාකරණයේ නිර්මාණාත්මක සහභාගීත්වය සඳහා වෘත්තිකයන් පුහුණු කිරීම සහ දැනුවත් කිරීම
- කළමනාකරණය පිළිබඳ විශේෂඥ සේවා සැපයීම, කාර්යසාධන ප්‍රමිතීන් ස්ථාපිත කිරීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම
- කාර්යසාධන සංවර්ධනය සඳහා මානව දායකත්වය ප්‍රශස්ත කිරීම සඳහා වෙනත් ක්‍රියාකාරකම් සිදු කිරීම
- පරිසරය පිළිබඳ වඩා හොඳ ඇගයීමක් සඳහා කළමනාකරණයේ අංශ සහ අදාළ සමාජ-ආර්ථික සංසිද්ධි පිළිබඳ පර්යේෂණ සහ දත්ත රැස් කිරීම
- බාහිර සංවිධානවලට කළමනාකරණ තොරතුරු සේවා සැපයීම සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවක පිරිස් පුහුණු කිරීම
- ආයතනික අංශයයේ පද්ධති, ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා උපදේශන සේවා සැපයීම, සැලසුම් ක්‍රියාවලියට සහාය වීම සහ සාමාන්‍යයෙන් වෙනස් වන පාරිසරික සාධක මඟින් එල්ල වන තර්ජනවලට මුහුණ දීම සඳහා අවශ්‍ය ප්‍රයත්නයන් සඳහා උපකාර කිරීම
- අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් හරහා ආයතනවල ඵලදායිතාව වැඩිදියුණු කිරීමට පහසුකම් සැලසීම

## 10.3. 2024 වර්ෂයේ ජයග්‍රහණ

- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වඩාත්ම ගෞරවනීය ආයතනය යන නාමයෙන් පිදුම් ලබන ලදී.
- ශ්‍රී ලංකා "නිපුණතා එක්ස්පෝ 2024" ප්‍රදර්ශනය සඳහා ප්ලැටිනම් අනුග්‍රාහකයා ලෙස සහභාගී විය.
- ආනයන අපනයන ක්‍රියා පටිපාටි පිළිබඳ වැඩමුළුවක් කුරුණෑගල ශාඛාවේදී සාර්ථකව පවත්වන ලදී.
- රොබෝ විද්‍යාව සහ ලෙගෝ 2024 තරඟය සාර්ථකව සංවිධානය කරන ලදී.
- NIBM- Beyond Books (OBL EXPO) 2024 මාර්තු මස 7, 8 සහ 9 යන දිනවල හැව්ලොක් සිටි සාප්පු සංකීර්ණයේදී පැවැති අතර එය සිසුන් අතර ප්‍රායෝගික කුසලතා පෝෂණය කිරීමට ආයතනයේ කැපවීම කොතරම්ද යන්න පිළිබඳව සාක්ෂි සහිතව දැකගත හැකි විය. මෙම ප්‍රදර්ශනය ඉගෙනුම ලබන්නන් විසින් අත්කරගත් විශිෂ්ට ප්‍රතිඵල ප්‍රදර්ශනය කිරීමක් ලෙස පැවති අතර, කර්මාන්ත අභියෝගවලට මුහුණ දීම සඳහා සහ අනාගත සංවර්ධනය සඳහා දායක වීමට අවශ්‍ය කුසලතාවලින් සිසුන් සන්නද්ධ කිරීමේ වැදගත්කම පෙන්වා දෙන ලදී.
- NIBM- Beyond Books (OBL EXPO) - 2024 දී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයෙහි නව නිර්මාණාත්මක කේන්ද්‍රස්ථානය වන ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයේ සිසුන් විසින් සිත් ඇදගන්නා සුළු විලාසිතා දැක්මක් සමඟින් නව්‍යකරණය සඳහා වූ සිය හැකියාව ප්‍රදර්ශනය කිරීම.
- Flipped Classroom Model සමඟ ඒකාබද්ධ වූ නව්‍ය මාර්ගගත මිශ්‍ර ඉගෙනුම් (Online Blended Learning) වේදිකාව හඳුන්වාදීමත් සමඟ ඩිජිටල්කරණ පාඨමාලා එළිදක්වන ලදී. තාක්ෂණය සහ නව්‍ය ඉගැන්වීම් ක්‍රම හරහා අධ්‍යාපනය පරිවර්තනය කිරීම සඳහා ආයතනයේ දැක් වූ කැපවීම මෙමඟින් අවධාරණය විය.
- OBL එක්ස්පෝ- රොබෝ විද්‍යා තරඟය සහ ප්‍රදර්ශනය සාර්ථකව සංවිධානය කිරීම.
- OBL එක්ස්පෝ- බහුමාධ්‍ය ප්‍රදර්ශනය සාර්ථකව සංවිධානය කිරීම.
- ක්‍රීඩා සංවර්ධනය, මයික්‍රොසොෆ්ට් ඇෂුවර්, මෘදුකාංග තත්ත්ව ඉංජිනේරු, ත්‍රිමාණ ක්‍රීඩා සංවර්ධනය සහ ව්‍යාපෘති සංවර්ධනය සම්බන්ධයෙන් පරිගණක හා ඉංජිනේරු පාසල (SOCE) විසින් වැඩමුළු කිහිපයක් සාර්ථකව පවත්වන ලදී.
- ව්‍යාපාර පාසල මඟින් (SOB) සිදුවීම් කළමනාකරණය සහ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධව වැඩමුළු කිහිපයක් සාර්ථකව පවත්වන ලදී.
- මහනුවර සහ පිට පළාත්වල පාසල් කිහිපයක් සඳහා Navigating Future School වැඩසටහන සාර්ථකව පවත්වන ලදී.
- මහනුවර ශාඛාවේ ව්‍යාපාර පාසල මඟින් රැකියා පොළක් (Career Fairs) සංවිධානය කරන ලදී.
- මහනුවර ශාඛාවේ ව්‍යාපාර පාසල මඟින් සංවිධානය කරන ලද අරමුදල් රැස්කිරීම සඳහා "සංක්‍රම" සංගීත වැඩසටහන පැවැත්වීම.
- මහනුවර ශාඛාවේ භාෂා පාසල විසින් "පොත් සමාජය" දියත් කරන ලදී.

## 10.4. සිසුන් බඳවාගැනීම

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍රය | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | බඳවාගැනීම් | ඉලක්ක | බඳවාගැනීම් 2024.12.31 දක්වා |
| 01. | කෘෂිකාර්මික හා වැවිලි සම්පත් | 125 | 30 | 210 | 56 |
| 02. | කලා නිර්මාණ හා මාධ්‍ය (කලා නිර්මාණ හා දෘශ්‍ය) | 445 | 415 | 445 | 409 |
| 03. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 250 | 178 | 250 | 144 |
| 04. | මූල්‍ය බැංකු හා කළමනාකරණය | 2,555 | 2,754 | 2,675 | 2,657 |
| 05. | හෝටල් කළමනාකරණය | - | - | 102 | 39 |
| 06. | මානව සම්පත් කළමනාකරණය | 770 | 363 | 645 | 344 |
| 07. | තොරතුරු තාක්ෂණය හා බහුමාධ්‍ය තාක්ෂණය | 4,350 | 5,539 | 4,590 | 4,268 |
| 08. | භාෂා | 1,970 | 1,472 | 1,563 | 1,210 |
| 09. | වෛද්‍ය හා සෞඛ්‍ය විද්‍යාව | 360 | 298 | 360 | 125 |
| 10. | කාර්යාල කළමනාකරණය | - | - | 90 | 101 |
| 11. | වෙනත් | 675 | 650 | 820 | 938 |
| **එකතුව** | | **11,500** | **11,699** | **11,750** | **10,291** |

## 10.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- ආසියාව සහ යුරෝපය තුළ NIBM ආයතනය සැලකිය යුතු අධ්‍යාපනික පිළිගැනීමක් ලබා ගැනීම
- සිසුන් සඳහා අවශ්‍ය ජාත්‍යන්තර නිරාවරණය ලබා දීම
- බහුතර සේවක පිරිසක් සඳහා අවශ්‍ය ජාත්‍යන්තර අත්දැකීම් ලබා දීම
- NIBM ප්‍රධාන කාර්යාලය සහ සියලුම කලාපීය මධ්‍යස්ථානවල සිදුවන මෙහෙයුම් ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා යටිතල පහසුකම් සපයා දීම
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ එක්ව විෂයමාලා සංවර්ධනය කිරීම
- සිසුන්ගේ රැකියා අවස්ථා නිර්මාණය සහ කාර්මික සංවර්ධනය සඳහා කර්මාන්ත නායකයින් සමඟ සහයෝගීතාවය ඇති කර ගැනීම
- උපාධිය ලබන සිසුන් තුළ වෘත්තීය කුසලතා කේන්ද්‍ර කර ගනිමින් සියලුම අධ්‍යයන වැඩසටහන් ප්‍රතිසංස්කරණය කිරීම
- ආයතනයේ ලියාපදිංචි වන බහුතර පූර්ණකාලීන සිසුන් ආයතනයේ හෝ හවුල්කාර සංවිධානවල අර්ධකාලීන රැකියා අවස්ථා ලබා ගැනීම හෝ නව ව්‍යාපාර ආරම්භ කිරීම
- මනා පුහුණුවක් හා සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් ආයතනය සතු වීම මගින් විශිෂ්ට සේවා ස්ථාන ඵලදායී මට්ටමක් ලඟා කර ගැනීම
- වඩා හොඳ උසස් අධ්‍යාපන අවස්ථා අපේක්ෂා කරන අනාගත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සාධාරණ මිලකට උසස් තත්ත්වයේ සුදුසුකම් පිරිනැමීම
- 2028 වනවිට සියලුම අධ්‍යයන හා අනධ්‍යයන ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම හෝ ඩිජිටල් වේදිකා මත කළමනාකරණය කිරීම
- 2028 වනවිට ආයතනය විසින් පූර්ණ පර්යේෂණ හා සංවර්ධන පහසුකමක් ස්ථාපිත කිරීම

# 11. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM හරිත සරසවිය)

## 11.1. හැඳින්වීම

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය හෙවත් NSBM හරිත සරසවිය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2011 ඔක්තෝබර් 7 වන දින පිහිටුවන ලදී. NSBM හරිත සරසවිය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පළකරන ලද අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් උපාධි ප්‍රදානය කිරීමේ බලය පැවරී ඇත. NSBM හරිත සරසවිය 2016 ඔක්තෝබර් මස 26 දින උත්සවත්ශ්‍රීයෙන් විවෘත කරන ලදී.

NSBM හරිත සරසවිය හෝමාගම, පිටිපන අක්කර 40ක වපසරියක පිහිටා ඇති, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත ස්වයං මූල්‍ය ආයතනයක් වේ. NSBM හරිත සරසවිය ව්‍යාපාර, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු, විද්‍යා, නීති සහ නිර්මාණ යන අංශ ඔස්සේ උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා රැසක් ශ්‍රී ලාංකීය හා විදේශීය සිසුන් හට පිරිනමනු ලබයි.

**දැක්ම**
ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම උපාධි පිරිනැමීමේ විද්‍යායතනය බවට පත්වීම සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්වීම.

**මෙහෙවර**
ව්‍යාපාර ඉල්ලුමට සරිලන, ගෝලීයව තරගකාරී හා වගකිව යුතු උපාධිධාරීන් බිහි කිරීම, සියලු පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ සමාජයට දායක වීම.

## 11.2. කාර්යයන්

- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ඉල්ලුම සඳහා උපාධිධාරීන් බිහි කිරීම
- නවෝත්පාදනයන්, සොයා ගැනීම් සහ නිර්මාණශීලීත්වය තුළ ජාතික හා ජාත්‍යන්තර ආධිපත්‍යය සාක්ෂාත් කර ගැනීම
- ගෝලීය කර්මාන්ත හා ගෝලීය දැනුම් මධ්‍යස්ථාන සමඟ සම්බන්ධ වීම
- ජාතියේ බුද්ධිමය, සංස්කෘතික සහ සමාජ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සන්නිවේදන පරිසරයක් නිර්මාණය කිරීම
- ආයතනික වර්ධනය අඛණ්ඩව වැඩිදියුණු කිරීම

## 11.3. සිසුන් බඳවාගැනීම

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍රය | 2023 ඉලක්ක | 2023 බඳවාගැනීම | ඉලක්ක | 2024.03.31 බඳවාගැනීම් |
|---|---|---|---|---|---|
| 01. | කලා නිර්මාණය සහ මාධ්‍ය (දෘශ්‍ය හා රංගනය) | 2,200 | 145 | 4,450 | 25 |
| 02. | විදුලි, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ | | 54 | | 29 |
| 03. | මූල්‍ය, බැංකු හා කළමනාකරණය | | 1134 | | 413 |
| 04. | හෝටල් සහ සංචාරක ව්‍යාපාරය | | 245 | | 93 |
| 05. | තොරතුරු සන්නිවේදනය සහ බහු මාධ්‍ය | | 1536 | | 626 |
| 06. | Mechatronics තාක්ෂණය | | 31 | | 43 |
| 07. | වෛද්‍ය සහ සෞඛ්‍ය විද්‍යාව | | 316 | | 105 |
| 08. | ගොඩනැඟිලි සහ ඉදිකිරීම් | | 17 | | 9 |
| | **එකතුව** | **2,200** | **3,478** | **4,450** | **1,343** |

2024 මැයි මස 27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමෙහි එළඹි තීරණ අනුව සීමාසහිත ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM) ඇපයෙන් සීමිත සමාගමක් බවට පත් කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත. මෙම තීරණය මත මෙම ආයතනයේ තොරතුරු 2024 වර්ෂයේ පළමු කාර්තුව සඳහා පමණක් ඇතුළත් කර ඇත.

# 12. සී/ස නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)

## 12.1. හැඳින්වීම

නිපුණතා සංවර්ධන අරමුදල යනු, කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකායේ නිර්දේශය මත 1998 දී නියමු ව්‍යාපෘතියක් ලෙස පිහිටුවන ලද්දකි. මෙම කාලය තුළ ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල එයට අනුග්‍රහය දැක්විය.

1999 අගෝස්තු 20 වන දින, සීමාසහිත වගකීම් සමාගමක් ලෙස, 1982 අංක 17 දරණ සමාගම් ආඥාපනත යටතේ සී/ස නිපුණතා සංවර්ධන අරමුදල සංස්ථාගත කරන ලදී. ලි.ප. අංකය: N (PBS) 832

1999 සැප්තැම්බර් මාසයේදී සමාගමේ කොටස් මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් රු.මි. 100ක මුදලක් අනුමත කළ අතර අරමුදල විසින් එය සුරක්ෂිත ලෙස ආයෝජනය කරන ලදී. නිපුණතා සංවර්ධන අරමුදල ස්වයං ආදායම් උත්පාදන ආයතනයක් ලෙස ස්ථාපනය කරන ලද අතර රජය විසින් සපයන ලද රු.මි. 100ට අමතරව ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය සහ තවත් පෞද්ගලික ආයෝජකයෙකු ද ආරම්භයේදී අරමුදලට දායකත්වය සපයා ඇත.

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල 2007 අංක 07 දරණ නව සමාගම් ආඥාපනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස නැවත ලියාපදිංචි කරන ලද අතර (ලියාපදිංචි අංක PB 833) දැනට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

**දැක්ම**
නිපුණතා සංවර්ධනයෙහි ජාතික නායකත්වය

**මෙහෙවර**
නිපුණතා සංවර්ධනය තුළින් ව්‍යවසාය තරඟකාරීත්වය උද්දීපනය කිරීම

## 12.2. අරමුණු

- ඉහළ පුහුණුවලත්, දක්ෂ, අභිප්‍රේරිත සහ ඵලදායී ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම
- කර්මාන්තයේ සේවා යෝජකයන් අතර ඇති පරතරයට ගැලපෙන රැකියා විස්තරය සහ පුහුණු සේවකයින් සැපයීම සඳහා දේශීය සේවා යෝජකයාගේ අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළේ ඇති අවස්ථාවන්ට අදාළ අවශ්‍යතා සපුරාලීම සඳහා තාක්ෂණික පුහුණු පද්ධතියක් සැපයීම
- දේශීය මෙන්ම ගෝලීය ආර්ථික ක්‍රමයට අවශ්‍ය රැකියා අපේක්ෂාවන් සහ ඵලදායිතාව ඉහළ නැංවීමට අදාළ නිපුණතා අවශ්‍යතා ඉහල නැංවීම

## 12.3. කාර්යයන්

- රැකියා ප්‍රවිෂ්ඨ පුහුණුව, නිපුණතා සංවර්ධනය සහ සේවක ප්‍රති පුහුණුව ලබාදීම
- පුහුණුව, නිපුණතාවය සහ අභිප්‍රේරණය සහිත ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සඳහා ව්‍යවසාය පදනම් කරගත් පුහුණු කිරීම් පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම
- පුහුණු ආයතන සහ සේවා පක්ෂය අතර සම්බන්ධතා සම්පාදනය කිරීම
- තෝරාගත් මාතෘකාවලට අදාළව පුහුණු වැඩසටහන් පැවැත්වීම
- සේවාදායක ආයතනයන්ගේ ඉල්ලීම්වලට අදාළව සේවාදායකස්ථ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- රැකියා ප්‍රවිෂ්ඨ පුහුණු වලට අදාළව තොරතුරු තාක්ෂණ, ව්‍යාපාරික ඉංග්‍රීසි සහ ලේකම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විශේෂ වැඩසටහන් පැවැත්වීම සහ උපදේශන සේවා ලබාදීම

## 12.4. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍රය | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කගත වැඩසටහන් ප්‍රමාණය | පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය | ඉලක්කගත වැඩසටහන් ප්‍රමාණය | පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය 2024.12.31 දක්වා |
| 01. | විවෘත වැඩසටහන් | 243 | 80 | 172 | 102 |
| 02. | සේවදායකයස්ථ වැඩසටහන් | 60 | 63 | 51 | 96 |
| 03. | ශාස්ත්‍රීය පුහුණු පාඨමාලා හා විශේෂ වැඩසටහන් | 09 | 02 | 16 | 05 |
| 04. | රාජ්‍ය හා පෞද්ගලික සහයෝගිතා වැඩසටහන් | 06 | 06 | 04 | 04 |
| එකතුව | | **318** | **151** | **243** | **207** |

## 12.5. 2025 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක

රාජ්‍ය හා පෞද්ගලික අංශවල සේවක පුහුණුව හා ප්‍රති පුහුණුව මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථික සංවර්ධනයට ක්‍රියාශීලි ලෙස දායක වන ශ්‍රම බලකායක් ගොඩනැංවීම නිපුණතා සංවර්ධන අරමුදලේ අරමුණ වේ.

| අනු අංකය | පුහුණු ක්ෂේත්‍රය | 2025 |
|---|---|---|
| | | ඉලක්කගත වැඩසටහන් ප්‍රමාණය |
| 01. | විවෘත වැඩසටහන් | 313 |
| 02. | සේවදායකයස්ථ වැඩසටහන් | 120 |
| 03. | ශාස්ත්‍රීය පුහුණු පාඨමාලා හා විශේෂ වැඩසටහන් | 38 |
| 04. | වෙනත් වැඩසටහන් | 30 |
| 05. | රාජ්‍ය හා පෞද්ගලික සහයෝගිතා වැඩසටහන් | 04 |

ඉහත සියලුම වැඩසටහන් තුළින් පහත සඳහන් ප්‍රතිඵල ලබා කර ගැනීමට ඉලක්ක කර ඇත.

- විදේශීය හා දේශීය රැකියා අපේක්ෂා කරන තරුණ ප්‍රජාව සඳහා භාෂා කුසලතා ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ඉංග්‍රීසි).
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන් තුළින් පාඨමාලා සම්පූර්ණ කරන සිසුන් සඳහා මෘදු නිපුණතා සහ මූලික තොරතුරු තාක්ෂණ කුසලතා ලබා දීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින්ගේ නිපුණතා පරතරය පියවීම සඳහා පුහුණු වැඩසටහන් ලබාදීම.
- තෝරාගත් රැකියා සඳහා ප්‍රවේශ වැඩසටහන් පැවැත්වීම.



නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවේ
පළමු කැඩෙට් නිලධාරිනිය පත්වීම-OCUSL



ඇක්වාපොනික් තාක්ෂණය හඳුන්වා දීම-OCUSL



NIBM ලොජිස්ටික් සිසුන් සඳහා වැඩමුළුව
University (UrFU)




NIBM-SOB ඒකකය විසින් සංවිධානය කරන ලද
SUSTAINOVATION24 තිරසාරත්වය පිළිබඳ
ක්ෂේත්‍රයේ ප්‍රථම අන්තර් විශ්වවිද්‍යාල තරඟය



“නව පරිපාලන සේවා නිලධාරින් / සංවර්ධනය සඳහා කාර්යාල ක්‍රියාපටිපාටි සහ ආචාරධර්ම පිළිබඳ වැඩමුළුව රජය සහ රජය යැපෙන ආයතන සඳහා නිලධාරින් බඳවා ගැනීම”– SDFL



OBT “පුහුණුව” - SDFL